# පාරිසරික විශ්ලේෂණය

## හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය

කාර්යක්ෂමව ආත්මික අස්වැන්න නෙළීම සඳහා ඇදහිලිවතුන් සන්නද්ධ කිරීම අරමුණු කරගෙන සකසන ලද වැඩසටහනක අංගයක් ලෙස **හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මෙම පාඨමාලාව ඉදිරිපත් කරයි.

මෙම පුහුණුවෙහි මූලික තේමාව වනුයේ යේසුස්වහන්සේ ඉගැන්වූ දෙය ඉගැන්වීමය. සාමාන්‍ය මිනිසුන් වූ ධීවරයින්, අයබදු අය කරන්නන් වැනි අය රැගෙන බලයෙන් යුක්තව එවකට පැවති ලොවෙහි ශුභාරංචිය පතුරුවීමට සමත් වන අයුරින් එල දරන කිතුනුවන් බවට පත් කිරීමට ඔවුන්ගේ ජීවිත වෙනස් කළා වූ දෑ ඉගැන්වීමය.

මෙම අත්පොත අධ්‍යයන ඒකක රැසකින් සමන්විත විෂය මාලාවක එක් පොතක් පමණි. මෙතුළින් ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ ඉලක්කය සපුරාගනු වස් ඇදහිලිවන්තයා ලබා ගත් දර්ශනයක් තුළින් එය නියෝජනය කිරීම, ගුණවත් කිරීම, සංවිධානය හා ක්‍රියාත්මක කිරීම යන අංශ තුළින් ඉදිරියට රැගෙන යනු ඇත.

# පටුන


| | | |
|---|---|---|
| අත්පොත භාවිත කරන ක්‍රමය | . . . . . . | I |
| කණ්ඩායම් අධ්‍යයනය සඳහා යෝජනා | . . . . . . | II |
| පාඨමාලාව හඳුන්වා දීම | . . . . . . | 1 |
| පාඨමාලාවෙහි අරමුණු | . . . . . . | 2 |
| 1. පරිසරය | . . . . . . | 3 |
| 2. පාරිසරික විශ්ලේෂණය | . . . . . . | 13 |
| 3. බයිබලීය පදනම: පැරණි ගිවිසුම | . . . . . | 23 |
| 4. බයිබලීය පදනම: නව ගිවිසුම | . . . . . | 31 |
| 5. පෞද්ගලික පාරිසරික විශ්ලේෂණය | . . . . . | 40 |
| 6. ජන සමූහයක් විශ්ලේෂණය කිරීම | . . . . . | 60 |
| 7. ප්‍රදේශයක් විශ්ලේෂණය කිරීම | . . . . . | 77 |
| 8. ජාතියක් විශ්ලේෂණය කිරීම | . . . . . | 89 |
| 9. කලාපයක් විශ්ලේෂණය කිරීම | . . . . . | 100 |
| 10. දැනට පවතින කිතුනු සංවිධානයක් විශ්ලේෂණය කිරීම | . . | 112 |
| 11. සැලසුම් කිරීම සඳහා උපක්‍රම | . . . . . | 127 |
| උප-ග්‍රන්ථය | . . . . . . | 135 |
| ස්වයං-පරීක්ෂණ සඳහා පිළිතුරු | . . . . . | 139 |

# අත්පොත භාවිත කරන ක්‍රමය

## අත්පොතෙහි සැකසුම

සැම පාඩමකම අන්තර්ගත වන කරුණු පහත සඳහන් පරිදි වේ. එනම්:

**අරමුණු :** අදාළ පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් ඔබ ළඟා විය යුතු ඉලක්කයන් මෙය වේ. පාඩම ඇරඹීමට පෙර මෙය කියවන්න.

**ප්‍රධාන පදය :** මෙම පදය එම පරිච්ඡේදයෙහි ප්‍රධාන සංකල්පය තහවුරු කරයි. එබැවින් එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයෙහි අන්තර්ගතය :** එක් එක් අංශය බැගින් අධ්‍යයනය කරන්න. අත්පොතෙහි මුද්‍රණය කර නොමැති බයිබල් පාඨ සඳහා ඔබගේ බයිබලය පෙරළා කියවා බලන්න.

**ස්වයං- පරීක්ෂණය :** ඔබ පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසානයෙහි එයට නියමිත පරීක්ෂණය කර බලන්න. ඔබගේ බයිබලය හෝ මෙම අත්පොත පරිහරණය නොකර එම පරීක්ෂණයට පිළිතුරු සැපයීමට උත්සහා කරන්න. ස්වයං-පරීක්ෂණය අවසන් කළ පසුව මෙම පොතෙහි අවසානයෙහි ඇති පිළිතුරු සෝදිසි කොට බලන්න.

**වැඩිදුර අධ්‍යයනය සඳහා :** මෙම කොටසින් ඔබ හට තව දුරටත් දේව වචනය අධ්‍යයනය කිරීමටත්, ඔබගේ අධ්‍යයන නිපුනතා දියුණු කර ගැනීමටත්, ඔබ උගත් කාරණා පෞද්ගලික ජීවිතයට හා සේවයට අදාළ කරගැනීමටත් සහාය සපයනු ඇත.

**අවසාන පරීක්ෂණය / විභාගය :** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාව හැදෑරීමට ලියාපදිංචි වී ඇත්නම් පාඨමාලාව සමඟ අවසාන පරීක්ෂණය ද ඔබට ලැබී ඇත. එබැවින් පාඨමාලාව අවසානයෙහි දී ඇති උපදෙස් අනුගමනය කරමින් අවසාන පරීක්ෂණය සම්පූර්ණ කොට ශ්‍රේණිගත කිරීම සඳහා යොමු කළ යුතු වේ.

# අවශ්‍ය වන අමතර ආම්පන්න

බයිබලයෙහි පැරණි අනුවාදයක් ඔබ සතු විය යුතුය.

# කණ්ඩායම් අධ්‍යයනය සඳහා යෝජනා

## පළමුවන රැස්වීම

**ආරම්භය :** යාච්ඤාවෙන් සහ හැඳින්වීමෙන් ආරම්භ කරන්න. ශිෂ්‍යයන් සමඟ සුහද වී ඔවුන් ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියාකාරකම් තහවුරු කරගැනීම :** රැස්වීම මගපෙන්වන්නේ කවුද, වේලාව, ස්ථානය හා සැසි වාරයන් සඳහා දින නියම කරගන්න.

**ප්‍රශංසාව හා නමස්කාරය :** ඔබගේ පුහුණු සැසි වාරවලට ශුද්ධාත්මයාණන්වහන්සේගේ අභිමුඛයට ආරාධනා කර සිටින්න.

**සිසුන් හට අත්පොත් බෙදා දීම :** අත්පොතෙහි මුල් පිටුවෙහි සඳහන් පොතෙහි මාතෘකාව, සැකසුම, පාඨමාලා අරමුණු ආදිය හඳුන්වා දෙන්න.

**පළමුවන පැවරුම පවරන්න :** සිසුන් විසින් මී ළඟ සැසි වාරයට පෙර කියවා ස්වයං- පරීක්ෂණය කළ යුතු වැඩ කොටස පවරා දෙන්න. එක් රැස්වීමක දී ඔබ සම්පූර්ණ කරන්නා වූ පරිච්ඡේද ප්‍රමාණය රැඳී පවතිනුයේ එම පරිච්ඡේදයෙහි දිග, අන්තර්ගතය හා කණ්ඩායමෙහි හැකියාව මත වෙනු ඇත.

## දෙවන සහ ඉන් මතු රැස්වීම්

**ආරම්භය :** යාච්ඤා කරන්න. නවක සිසුන් වේ නම් පිළිගෙන අත්පොත් බෙදා දී ඒ අය ලියාපදිංචි කරවන්න.
පැමිණීම සටහන් කරන්න. ප්‍රශංසාවේ සහ නමස්කාරයෙහි කාලයක් පවත්වන්න.

**පුනරීක්ෂණය :** මීට පෙර රැස්වීමේ දී ඔබ අධ්‍යයනය කළ කාරණා සැකෙවින් ඉදිරිපත් කරන්න.

**පාඩම :** සෑම පරිච්ඡේදයකම අන්තර්ගත කොටස් **තද කලු අකුරින් මුද්‍රණය කර ඇති මාතෘකා** පෙළගැස්මක් අනුසාරයෙන් එම කොටස සාකච්ඡා කරන්න. සිසුන්ට මීට පෙර ඉගැන්වූ කරුණු පිළිබඳව ප්‍රශ්න කරන්න. නැත්නම්, ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව සපයන්න. ඔබගේ සිසුන්ගේ ජීවිත හා සේවාවන්ට පාඩම අදාළ කරන්න.

**ස්වයං පරීක්ෂණය :** සිසුන් විසින් සම්පූර්ණ කරන ලද ස්වයං පරීක්ෂණය සෝදිසි කොට බලන්න (සටහන : ඔබගේ සිසුන් ස්වයං පරීක්ෂණයෙහි පිළිතුරු පත්‍ර පරිහරණය ඔබ අනුමත නොකරන්නේ නම්, සෑම පාඩම් ඒකකයක අවසානයෙහි ඇති පිළිතුරු පත්‍ර ගළවා ඉවත් කරන්න).

**වැඩිදුර අධ්‍යයනය සඳහා :** ඔබ මෙම ව්‍යාපෘති කණ්ඩායම් විලසින් හෝ ඒක-පුද්ගල විලසින් ඉටු කළ හැකිය.

**අවසාන විභාගය :** ඔබගේ කණ්ඩායම සම්මාන සඳහා මෙම පාඨමාලාවට ඇතුළු වී සිටී නම්, ඔබ හට මෙම පාඨමාලාව සමඟම අවසාන විභාගය ලැබී ඇත. ඔබගේ සිසුන් ප්‍රමාණයට සෑහෙන විභාග ප්‍රශ්න පත්‍ර පිටපත් සංඛ්‍යාවක් සූදානම් කරගන්න. පාඨමාලාව අවසානයෙහි විභාගය පවත්වන්න.

**පාඨමාලා ඒකකය :** සංවිධානය කිරීම
**පාඨමාලාව :** පාරිසරික විශ්ලේෂණයෙහි මූලධර්ම

# පාඨමාලාව හඳුන්වා දීම

ශුභාරංචි ප්‍රකාශන සේවය (ධර්මදූත සේවය) සඳහා ආත්මික සම්පත් සංවිධානය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරන්නා වූ පාරිසරික විශ්ලේෂණ මූලධර්ම මෙම පාඨමාලාව තුළින් හඳුන්වා දෙයි.

මෙම අධ්‍යයනය, ශුභාරංචිය ලොවට දියත් කිරීම සඳහා සැලසුම් කිරීමෙහි දී පාරිසරික විශ්ලේෂණයෙහි පවතින වැදගත්කම අවධාරණය කොට දක්වයි. නව ගිවිසුමෙහි මෙන්ම පැරණි ගිවිසුමෙහි ද පාරිසරික විශ්ලේෂණය අර්ථ දක්වා, පුනරීක්ෂණය කොට පෙන්වා ඇත. පෞද්ගලික පාරිසරික විශ්ලේෂණයක් කිරීමට සහ ජන කොටස්, භූගෝලීය ක්ෂේත්‍ර / ප්‍රදේශ, ජාති, ලොවෙහි විවිධ කලාප සහ ක්‍රිස්තියානි සංවිධාන ඇසුරින් විශ්ලේෂණයන් සඳහා අවශ්‍ය උපදෙස් සපයා දී ඇත.

හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් සපයන්නා වූ පුහුණුවෙහි *"සංවිධානය අධ්‍යයන"* ඒකකයෙහි විෂය මාලාවට ඇතුළත් පාඩම් මාලා තුනෙහි දෙවන පාඩම් මාලාව මෙය වේ. මින් පෙර *"අරමුණු මගින් කළමණාකරනය"* පාඩම් මාලාව ද, මින් අනතුරුව *"අරමුණු මගින් කළමනාකරණය"* නම් පාඨමාලාව ද මෙම ඒකකයට ඇතුළත් වේ.

කාර්යක්ෂම සේවාවක් සඳහා අවශ්‍ය වන නායකත්වය අවබෝධ කරගැනීම, සැලසුම් කිරීම සහ සංවිධානය මනාව වටහා ගැනීම පිණිස පාඨමාලාවෙහි යෝජිත අනුපිළිවෙළට මෙම පාඩම් මාලා තුන අධ්‍යයනය කරන ලෙස නිර්දේශ කරන්නෙමු.

# පාඨමාලාවෙහි අරමුණු :

මෙම පාඨමාලාව අවසානයෙහි ඔබ හට පහත සඳහන් දෑ කළ හැකි වනු ඇත. එනම් :

- "පාරිසරික විශ්ලේෂණය" යන පදය අර්ථ දැක්වීමට හැකි වේ.
- පාරිසරික විශ්ලේෂණය සඳහා පරමාර්ථය හඳුනා ගැනීම.
- පාරිසරික විශ්ලේෂණය සඳහා පැරණි ගිවිසුමෙහි උදාහරණ හඳුනා ගැනීම.
- පාරිසරික විශ්ලේෂණය සඳහා නව ගිවිසුමෙහි උදාහරණ හඳුනා ගැනීම.
- පෞද්ගලික පාරිසරික විශ්ලේෂණයක් කිරීම.
- භූගෝලීයමය වූ ක්ෂේත්‍රයක් විශ්ලේෂණය කිරීම.
- දේශයක් විශ්ලේෂණය කිරීම.
- ලෝකයේ නියමිත කලාපයක විශ්ලේෂණය කිරීම.
- දැනට පවත්නා ක්‍රිස්තියානි සංවිධානයක් විශ්ලේෂණය කිරීම.
- හාවස්ටයිම් ජාත්‍යන්තර ජාලයෙහි "REAP" සැලසුම පැහැදිලි කිරීම.
- ශුභාරංචි ප්‍රකාශනයෙහි දී ශිල්පීය ක්‍රම සැලසුම් කිරීම සඳහා පාරිසරික විශ්ලේෂණය භාවිත කිරීම.

# පළමුවන පරිච්ඡේදය

# පරිසරය

## අරමුණ :

මෙම පරිච්ඡේදය අවසන් කළ පසුව ඔබ හට පහත සඳහන් දෑ කිරීමට හැකි වනු ඇත. එනම්:

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට.
- "පරිසරය" නම් පදය අර්ථ දැක්වීමට.
- මනුෂ්‍යයාගේ පළමුවන පරිසරය විස්තර කර දීමට.
- නූතන ලොවෙහි පරිසරය විස්තර කර දීමට.
- පළමුවන මුල් පරිසරයෙහි සිට නූතන පරිසරය දක්වා වෙනස් වීමට හේතුව පැහැදිලි කර දීමට.
- නූතන පරිසරය මනුෂ්‍යයා හට ආත්මිකව බලපෑම් චිල්ල කරන ආකාර තුනක් හඳුනාගැනීමට.
- මෙම පාපිෂ්ට පරිසරයෙන් මිනිසා ගළවාගැනීම පිණිස දෙවියන්වහන්සේගේ සැලසුම සංකෂිප්තව දැක්වීමට.
- සභාවෙහි සේවය / කාර්යභාරය හා පරිසරය අතර පවතින සම්බන්ධතාවය පහදා දීමට.

## ප්‍රධාන පදය :

> **මනුෂ්‍යයාගේ දුෂ්ටකම පොළොවෙහි මහත් බව ද, ඔහුගේ සිතේ කල්පනාවල කවර අරමුණත් නිරන්තරයෙන්ම නපුරුවම තිබෙද බව ද ස්වාමීන්වහන්සේ දුටු සේක (උත්පත්ති 6:5).**

### හැඳින්වීම

නැවත උත්පාදනය ලද සැම ඇදහිලිවන්තයෙකු හට දෙවියන්වහන්සේගේ කැඳවීම වනුයේ සභාව නමින් හඳුන්වන ශ්‍රේෂ්ඨ ආත්මික ව්‍යුහයෙහි පංගුකාරයින් වීමය. සභාව වෙත පවරා ඇති ප්‍රධානතම කාර්ය නම්, සැම ජාතීන් වෙත ශුභාරංචිය රැගෙන යාම වේ.

> **එබැවින් නුඹලා ගොස් සියලු ජාතීන් ගෝලයින් කරන්න. පියාණන්ගෙත්, පුත්‍රයාණන්ගෙත්, ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බෞතීස්ම කරන්න. මා විසින් නුඹලාට අණ කළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. මම ද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමඟ සිටිමි (මතෙව් 28:19-20).**

> **"...මෙසේ ක්‍රිස්තුස්වහන්සේ වධ විඳින්ටත්, තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටින්ටත් ... සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව් කමාව ද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්ටත්"... (ලූක් 24:46-47).**

මෙම අභියෝගය සම්පූර්ණ කිරීම පිණිස ගන්නා වූ ප්‍රයත්නයන් වෙත "පරිසරය" නම් වූ සාධකයක් මගින් බලපෑම් ඇති වේ.

මෙම පාඩමෙහි දී ඔබ හට පරිසරය නම් විෂය හඳුන්වා දී එය අර්ථ දැක්වීමට හා සභාවෙහි කාර්යභාරය සඳහා මෙහි සම්බන්ධතාවය පැහැදිලි කර දෙනු ඇත.

## පරිසරය

"පරිසරය" යන ව්‍යුහයට යම් පුද්ගලයෙකු වටා පවතින ශාරීරික/ භෞතික, සමාජයීය, සාංස්කෘතිකමය හා ආත්මික සාධක ඇතුළත් වේ. එම පුද්ගලයා ජීවත් වන්නා වූ, රාජකාරී කරන්නා වූ සහ මෙහෙකරන්නා වූ සමාජයෙහි සියලුම සාධක ඇතුළත් වේ.

භෞතික පරිසරයට අයත් වනුයේ මනුෂ්‍යයෙකු හට දැකිය හැකි තමා අවට ඇති සියලුම භෞතික දෑය. එයින් ඔහුගේ රට, නගරය, ගම හෝ තමා ජීවත් වන ස්ථානය සනිටුහන් කරයි. තමාගේ දෑසින් දැකිය හැකි සියලුම දෑ එනම් ගස් කොළ, සතුන්, ගොඩබිම, කඳු ඇතුලුව ගොඩනැගිලි වැනි සියලුම දෑ භෞතික පරිසරයට අයත්ය.

**භෞතික පරිසරය** වියළි කාන්තාරයක්, ශීත කඳුවැටියක්, ඝන කැළෑවක් හෝ දිවයිනක් විය හැකිය. එය වගා භෝග ඉතා සරුවට වැඩෙන සමුද්‍ර දේශගුණයක් සහිත අගනා පරිසරයක් විය හැකිය. එසේ නැත්නම් අත්‍යාවශ්‍ය ආහාර පවා සපයා ගැනීමට අසීරු අයහපත් දේශගුණික තත්ත්වයන් පවතින දුෂ්කර පරිසරයක් විය හැකිය.

**සමාජයීය පරිසරය** ලෙස හඳුන්වන්නේ කිසියම් භෞතික පරිසරයක වෙසෙන ජන කොටසය. ඔබ වෙසෙන, වැඩ කරන හා සේවය කරන ස්ථානවල වෙසෙන ජනතාව ඔබගේ සමාජයීය පරිසරය වේ. සෑම සමාජයකම වෙසෙන පුද්ගලයෝ කිසියම් ප්‍රදේශයක සාමාජිකයෝ වෙති. මෙම පවුල් කිසියම් කණ්ඩායමකට, කුලයකට හෝ ගෝත්‍රයකට ගොනු වී සිටිය හැකිය. මෙම කණ්ඩායම තුළම තවත් කාණ්ඩ වෙන් විය හැකිය. එනම් : දිළිඳු, පොහොසත් හෝ අධ්‍යාපනය ලද, නොලද ලෙස විය හැකිය. ජාතියක් සෑදෙනුයේ මෙවන් විවිධ "මිනිස් කණ්ඩායම්" කිහිපයක් එක් වීමෙනි. මෙම අධ්‍යයනයෙහි පසුව කොටසක දී ඔබ මෙය ඉගෙනගනු ඇත. යම් පරිසරයක් තුළ ජනතාව සංවිධානය වී ඇති ආකාරය "සමාජයීය ආකෘතිය" ලෙස නම් කරනු ලැබේ.

**සංස්කෘතිකමය පරිසරය** ලෙසින් හඳුන්වන්නේ කිසියම් ජන කොටසක් තුළ පිළිගැනීමට ලක් වූ ජීවිත රටාවක් හා හැසිරීම් පද්ධතියකි. මෙම රටාවන්ට භාෂාව, සිරිත් විරිත්, චාරිත්‍ර වාරිත්‍ර සහ ජීවත් වීම සඳහා පරිහරණය වන භාණ්ඩ තත්ත්වය ද ඇතුළත් වේ.

සංස්කෘතියට එම ජන සමාජයෙහි සංගීතය, චිත්‍ර කලාව, විද්‍යාව, සාහිත්‍යය, අධ්‍යාපන පද්ධතිය සහ දේශපාලනමය ව්‍යුහය ආදිය ඇතුළත් වේ. යම් කිසි සංස්කෘතියක් වර්ධනය වනුයේ ආගමික හා දේශපාලනමය බලපෑම් මත හා දිගුකාලීනව යම් යම් චාරිත්‍ර පිළිපැදීමේ ප්‍රතිඵලයක් විලසිනි.

එක් එක් ජාතීන් අතර සංස්කෘතිය වෙනස් වන අතර, සමහර විට එකම ජාතිය තුළ වෙසෙන ජන කණ්ඩායම් අතර පවා සංස්කෘතිකමය වෙනස්කම් පැවතිය හැකිය. උදාහරණයක් ලෙසට බයිබලීය වකවානුවෙහි ජීවත් වූ යුදෙව් ජන සමාජයෙහි සහ අන්‍ය ජාතීන් අතර පැවති සංස්කෘතිය වෙනස් විය. යුදෙව්වරු මාංශ ආහාරයට නොගත් අතර, චර්මඡේදනය කළහ. අන්‍ය ජාතීහු මාංශ අනුභව කළ අතර, චර්මඡේදන සිරිත අනුගමනය නොකළහ. මෙම ජන සමාජ දෙක ආගම, චාරිත්‍ර හා සංස්කෘතිකමය ආකෘතිය අනුව එකිනෙකාට වෙනස් වූහ.

ආත්මික පරිසරය යනු මිනිසාගේ ආත්මයට බලපාන කාරණා සම්බන්ධව යෙදෙන දේය. දෙවියන්වහන්සේ ත්‍රිත්වයෙහි දෙවියන්වහන්සේය. එනම් : පිය වූ දෙවියන්වහන්සේ, පුත්‍ර වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ ශුද්ධාත්ම දෙවියන්වහන්සේය. මනුෂ්‍යයා මවනු ලැබුවේ ත්‍රිත්වයෙහි ජීවියෙකු ලෙස දෙවියන්වහන්සේගේ ස්වරූපයට අනුවය. මනුෂ්‍යයා හට ශරීරය, ප්‍රාණය හා ආත්මයක් ඇත.

ආත්මික පරිසරය නම් මිනිසාගේ ආත්මයට හා ප්‍රාණයට බලපෑම් ඇති කරන කොටසය. සාතන්ගේ පාලනය යටතෙහි පවතින නපුරු ආත්මික බලවේග ඇත. එසේම දෙවියන්වහන්සේගේ පාලනය යටගෙහි පවතින යහපත් ආත්මික බලවේගයන් ද ඇත. මෙම ආත්මික බලවේග නිරතුරුව මිනිසාගේ ප්‍රාණය හා ආත්මය උදෙසා සටන් වදී.

(හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය ආත්මික පරිසරය යන විෂය පුළුල් ලෙස ආවරණය කරමින්, *"ආත්මික ශිල්පීය උපක්‍රම : ආත්මික සටන සඳහා අත්පොත"* නම් පාඨමාලාවක් ඉදිරිපත් කොට ඇත.)

මනුෂ්‍යයාගේ භෞතික, සමාජයීය, සංස්කෘතිකමය හා ආත්මික සාධක සහිත පරිසරය අවබෝධ කරගැනීම සඳහා අප දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයෙහි එතුමා සපයා දී ඇති වාර්තාව පුනර්-ක්ෂණය කර බැලිය යුතු වේ. මේ සඳහා අප ඉතිහාසයෙහි ඉතා පුරාතනයට එනම්, පොළොවෙහි කාලයාගේ ආරම්භයට යොමු විය යුතු වෙමු.

## සියලු දේවල ආරම්භය

දෙවියන්වහන්සේ සැම කල්හිම වැඩ විසූ බව බයිබලය උගන්වයි. එතුමා හට ආරම්භයක් හෝ අවසානයක් නොමැත. එතුමාගේ වාස ස්ථානය ස්වර්ගය වේ. දෙවියන්වහන්සේ ස්වකීය වාසභවනය තමාම ස්වර්ගයෙහි සාදාගත් සේක. එසේම, උන්වහන්සේ මිනිසා හට වාසය කිරීමට වාස ස්ථානයක් නිමවූ සේක, එය පොළොව නම් වේ. පවතින සියලුම දෑ දෙවියන්වහන්සේ විසින් මවන ලදී.

මක්නිසාද සිංහාසනය වේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා, ස්වර්ගවල සහ පොළොවෙහිත් ඇති පෙනෙන්නා වූ දේවල් ද, නොපෙනෙන්නා වූ දේවල් ද යන සියල්ල උන්-වහන්සේ තුළ මවන ලද්දේය. සියලු දේ උන්වහන්සේ කරණකොටගෙන ද, උන්වහන්සේ උදෙසා ද මවා තිබේ.

> **උන්වහන්සේ සියල්ලට පළමුවෙන් සිටින සේක. සියල්ල ද උන්වහන්සේ තුළ පවතින්නේය (කොලොස්සි 1:16-17).**

ආරම්භයේ දී දෙවියන්වහන්සේ මැවූ සියල්ල යහපත් විය.

> **දෙවියන්වහන්සේ තමන් මැවූ සියල්ලම දුටු සේක. බලව, ඒ ඉතා යහපත්ව තිබුණේය (උත්පත්ති 1:31).**

## නපුරෙහි ආරම්භය

දෙවියන්වහන්සේ විසින් මවන ලද දේ අතර දේව දූතයින් ද විය. මේ අතුරින් දෙවියන්වහන්සේ මැවූ එක් විශේෂ දේව දූතයෙකු ලුසිෆර් නම් වීය. බයිබලය විස්තර කරන පරිදි ලුසිෆර් ආරම්භයේ දී සර්ව සම්පූර්ණව, ඉතා අලංකාරව සිටි අතර, ස්වර්ගයෙහි වැදගත් තනතුරක් ද දැරීය.

ලුසිෆර් තමා සතු වූ අලංකාරත්වය හා උසස් ස්ථානය පිළිබඳව අහංකාර විය. ඔහු තවත් සමහර දේව දූතයින් ද කැටිව දෙවියන්වහන්සේට එරෙහිව කැරැළි ගැසීමක් සංවිධානය කළේය. අහංකාරයෙන් යුක්තව ලුසිෆර් දෙවියන්වහන්සේට වඩා ශ්‍රේෂ්ඨ වීමට සිතීය. මෙලෙස ස්වර්ගයෙන් දෙවියන්වහන්සේගේ රාජ්‍යය නෙරපා දැමීමට ලුසිෆර් උත්සාහ දැරීය.

මෙම පාපය හේතුකොටගෙන ලුසිෆර් හා කැරැළි ගැසීමට සහභාගි වූ සියලුම දේව දූතයින්ව ස්වර්ගයෙන් නෙරපා පොළොවට හෙළනු ලැබී ය. ඉන් පසු ලුසිෆර් සාතන් හෝ යක්ෂයා නමින් හඳුන්වනු ලැබීය. ඔහුගේ සගයින් වූ දේව දූතයින් යක්ෂ සේනාව නම් විය. ඔබට මෙම

ඓතිහාසික සිද්ධි මාලාව යෙසායා 14:12-15 හා එසකියෙල් 28:14-16 හි කියවා බැලිය හැකිය. ලෝකයෙහි පවතින සියලුම නපුරු දුෂ්ට කාරණා පිටුපස අධර්මිෂ්ඨකම් පිටුපස සිටින සියලු පාපය පිටුපස ඇති ආත්මික බලවේගය නම් යක්ෂයාය.

## පළමුවන පරිසරය

දෙවියන්වහන්සේ මුලින්ම අපගේ ලෝකය මැවූ කල එය සර්ව සම්පූර්ණ පරිසරයක්ව පැවතීය. දෙවියන්වහන්සේ තමන්ගේ මැවීමේ සියළු ක්‍රියා දෙස බලා, "එය යහපත්ය" (උත්. 1) පැවසූ සේක. දෙවියන්වහන්සේ ස්වකීය ස්වරූපයට අනුව මිනිසා මැවූ කල, මිනිසාද සම්පූර්ණව සිටියේය. ඔහු පාප රහිතව දෙවියන්වහන්සේ සමග ආත්මික සහභාගිකමින් යුක්තව විසීය. (උත්පත්ති 1:26 සහ 2 වන පරිච්ඡේදය)

දෙවියන්වහන්සේ කාන්තාව මවා පළමු යුවළට පැවසුයේ බෝවී දරුවන් ඇති කරන ලෙසය. ආදම් සහ ඒවා තමුන් වාගේම පාප රහිත, දේව භක්තික ජනතාවකින් ලෝකය ජනාකීර්ණ කළ යුතුව පැවතුනි. (උත්පත්ති 2: 18-25, 1: 28).

ආදම් සහ ඒවා විසූ පළමුවන ස්ථානය ඒදන් නම් වූ උයනක් වීය. මෙම උයන දෙවියන්වහන්සේගේ පුදුම වූ මැවිලිවලින් ගහන වූ අලංකාර පරිසරයක් විය.

> **ස්වාමි වූ දෙවියන්වහන්සේ නැගෙනහිර දිශාවෙහි, ඒදන්හි උයනක් වවා තමන් සෑදූ මනුෂ්‍යයා එහි සිටවූ සේක. දැකීමට ප්‍රිය වූ කෑමට හොඳ වූ සියලු ගස්ද ... ස්වාමි වූ දෙවියන්වහන්සේ භූමියෙන් හට ගැන්වූ සේක. උයන තෙමන පිණිස ඒදනෙන් ගංගාවක් නික්ම ගියාය ... (උත්පත්ති 2 :8-10)**

දෙවියන්වහන්සේ සර්ව සම්පූර්ණ පරිසරයක් මැවූසේක. නමුත් මේ වන විට සාතන් ස්වර්ගයෙන් පොළොවට හෙලනු ලැබ සිටි බව මතක තබාගන්න. දෙවියන්වහන්සේ විසින් මනුෂ්‍යයාව පිහිටුවන ලද මෙම සම්පූර්ණ පරිසරයෙහි සාතන් භයානක වෙනසක් ඇති කිරීමට ක්‍රියාකාරී විය.

## පාපය පරිසරයට ඇතුල්වීම

දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මවනු ලැබූ මිනිසා හට බුද්ධිමත් මනසක් හා තීරණ ගැනීමේ ශක්තියක් හිමි විය. මිනිසා හට දෙවියන්වහන්සේට කීකරු වීමට හෝ අකීකරු වීමට තෝරාගත හැකි විය. පාපය මුලින්ම ආරම්භ කරනු ලැබුවේ සාතන් බව ඔබට මතක ඇති. මෙලෙස නපුර පැවති බැවින් මිනිසා හට යහපත හෝ නපුර තෝරාගැනීමට හැකියාව තිබුණි. මිනිසා නපුර තෝරාගත්තේය. මනුෂ්‍යයාගේ පළමුවන අකීකරු වීම සමහර අවස්ථාවල "මිනිසාගේ වැටීම" ලෙසින් නම් කරනුයේ එමඟින් මිනිසා ධර්මිෂ්ඨකමෙහි සිට පාපයට වැටීම නිසා වේ. මෙම දුක්ඛිත සිදුවීම සහිත කථාව මුළුමනින්ම උත්පත්ති 2-3 පරිච්ඡේද වල ඔබට කියවා බැලිය හැකිය.

ඒදන් උයනෙහි ආදම් සහ ඒවාට අනුභවය සඳහා බොහෝ ගස් ගණනාවක් වීය. එනමුත් ඔව්හු මගහැර යා යුතු වූ එක් ගසක්ද විය.

> **ස්වාමි වූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාට ආඥාකරමින් : "නුඹට උයනේ සියලු ගස්වලින් කැමති ලෙස කන්ට පුළුවන. එහෙත් යහපත හා නපුර දැනගැනීමේ ගහෙන් කන්ට එපාය, මක්නිසාද එයින් කෑ දවසෙහි ඒකාන්තයෙන් නුඹ නසින්නෙහි ය."යි කී සේක. (උත්පත්ති 2:16-17).**

මනුෂ්‍යයාහට තෝරාගැනීමෙහි බලය සතුවිය. ඔහුට දෙවියන්වහන්සේට කීකරු වීමට හෝ අකීකරුවීමට හැකි විය. සාතන් පළමු මිනිසා හා ස්ත්‍රිය දෙවියන්වහන්සේට විරෙහිව අකීකරු වීමට යොමු කරවීය. ඔවුන්ගේ අකීකරුකම හේතුවෙන් පරිසරයට පාපය ඇතුළුවිය.

## පරිසරය වෙනස්වීම

පාපය මිනිසාට මෙන්ම පරිසරයටද භයානක වෙනස්වීම් ගෙන දුනි. දෙවියන්වහන්සේ ආදම් සහ ඒවට පාපයෙහි වන්දිය මරණය බව අනතුරු අඟවා දී තිබුණි. මෙම මරණයට ආත්මික මෙන්ම ශාරීරික මරණයද අතුලත් වීය. ආත්මික මරණය නම්, දෙවියන්වහන්සේ සමග දැරූ සම්බන්ධතාවය අහිමි වීමය. ශාරීරික මරණය නම්, ඇත්ත වශයෙන්ම සිරුර මිය යාමය. ආදම් සහ ඒවා පව් කිරීම හේතුකොට ගෙන මුළු මිනිස් සංහතිය වෙතම පාපය හා මරණය හිමි විය.

**එහෙයින් එක් මනුෂ්‍යයෙකු කරණ කොටගෙන පාපයත් පාපය කරණකොට ගෙන මරණයත් ලෝකයට ඇතුල් වුණක් මෙන් සියලු මනුෂ්‍යයන් පව්කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමුණුණේය. (රෝම 5:12)**

ආදම් සහ ඒවගේ වැටීම හේතුකොටගෙන සියළු මනුෂ්‍යයන් වෙතට පාපය යොමු වී තිබේ. එහි අරුත නම් උපදින සෑම කෙනෙකුම මුලික පාප ස්වභාවය උරුම කරගෙන උපදින බවය. ශාරීරික ලක්ෂණ උපතින්ම උරුමකරගෙන උපදින විලසින්ම ආත්මික ලක්ෂණයක් වූ මුලික පාප ස්වභාවයද උරුම කරගෙන උපත ලබනු ඇත.

එක් එක් තැනැත්තා තමාගේ පාපිෂ්ඨ ස්වභාවය මගින් පොලඹවනු ලැබ දෙවියන්වහන්සේට විරෙහිව මුරණ්ඩු වෙමින් පෞද්ගලිකව පව් කරනු ලැබේ.

**නමුත් එක් එක් මනුෂ්‍යයා තම තමාගේ තෘෂ්ණාවෙන් අදිනු ලබන කල්හිද පොලඹවනු ලබන කල්හිද පරීක්ෂා කරනු ලබයි.**

**එවිට තෘෂ්ණාව පිළිසිඳගත් කල්හි පාපය වදන්නීය. පාපයද සම්පූර්ණ වූ කල්හි මරණය උපදවයි. (යාකොබ් 1: 14-15)**

මුලික පාපිෂ්ඨ ස්වභාවය හා පෞද්ගලික පාප ක්‍රියා හේතුවෙන් සියළු මනුෂ්‍යයෝ ආත්මික හා ශාරීරික මරණයට මුහුණ දෙති.

**මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීන ව සිටිති. (රෝම 3:23)**

මිනිසාගේ භෞතික පරිසරයද ශාප ලැබීය. භූමිය කටු ගොකටු බිහිකරන බව දෙවියන්වහන්සේ පැවසු සේක. දැඩි වෙහෙස මහන්සිය (දහඩිය) මිනිසා තම භෞතික පරිසරය හා දරන්නා වූ සම්බන්ධතාවය සනිටුහන් කරයි.

**උන්වහන්සේ ආදම්ට කථාකොට : නුබේ භාර්යාවගේ හඬට ඇහුම්කන්දී නොකන්ට මා අණ කළ ගහෙන් කෑ බැවින් නුඹ නිසා භූමිය ශාප ලද්දීය. නුබේ ජීවිතයේ සියලු දවස්වලට නුඹ වෙහෙසින් යුක්තව එයින් කන්නෙහිය.**
**එය නුඹට කටුද ගොකටුද උපදවන්නේය, නුඹ වනයෙහි පලා කන්නෙහිය.**

**නුඹ භූමියෙන් ගන්නා ලද බැවින් එයට හැරී යන තෙක් නුබේ මුහුණේ ඩහදියෙන් යුක්තව කෑම කන්නෙහිය. මක්නිසාද නුඹ දුවිලිය, දුවිල්ලට හැරී යන්නෙහි යයි කීසේක. (උත්පත්ති 3: 17-19).**

මනුෂ්‍යයාගේ පාපය හේතුවෙන් මුළු ලෝකයම දූෂ්‍ය විය.

> **"... නුඹේ වෙශ්‍යාකම්වලින්ද දුෂ්ඨකමින්ද දේශය කිලුටු කෙළෙහිය. ඒ නිසා වැහිවලා නැවතුණෝය, අන්තිම වර්ෂාවද නොආයේය. (යෙරමියා 3:2-3)**

වැඩිකල් නොගොස්ව දෙවියන්වහන්සේ තමා මැවූ ලොව දෙස බැලුසේක.

> **මනුෂ්‍යයාගේ දුෂ්ටකම පොළොවෙහි මහත් බවද ඔහුගේ සිතේ කල්පනාවල කවර අරමුණක් නිරන්තරයෙන් නපුරුවම තිබෙන බවද ස්වාමින්වහන්සේ දුටුසේක. (උත්පත්ති 6:5)**

පාපය නිසා මනුෂ්‍යයාගේ පරිසරය වෙනස් වූ ආකාරය පිළිබඳ සාරාංශයක් පහතින් දැක්වේ:

1. **මිනිසා ආත්මිකව වෙනස් විය :** ඔහු තව දුරටත් දෙවියන්වහන්සේ සමග සහභාගිකමින් තොරවිය. "ආත්මික මරණය" යනු පාපය හේතුවෙන් දෙවියන්වහන්සේගෙන් සදාකාලිකව වෙන් වීමය. අනාගතයෙහිදී බිහිවීමට සිටින සියලුම පරම්පරාවල අය මූලික පාපිෂ්ඨ ස්වභාවය උරුම කරගෙන උපදිනු ඇත.

2. **මිනිසා ශාරීරිකව වෙනස් විය :** ඔහුගේ සිරුර ක්‍රමයෙන් වියපත් වී අවසානයෙහි මිය යයි, මිනිසා ඔහුව මවනු ලැබූ දූවිල්ල වෙතට නැවත හැරී යයි.

3. **පොළොව ශාප ලද්දීය :** පරිසරය යටත් වූ ශාපය පෙන්නුම් කිරීම පිණිස "කටු ගොකටු" භාවිත කොට ඇත. මිනිසා තමා ජීවත් වන පාපිෂ්ඨ පරිසරය සමග නිරන්තරයෙන් මහත් අපහසුතාවයනට මුහුණ දෙනු ඇත.

## වර්තමාන පරිසරය

මිනිසා ජීවත්වන ලොවෙහි නූතන පරිසරය තවමත් දුෂ්ටය. කිසියම් දිනක දෙවියන්වහන්සේ මෙම දුෂ්ට ලෝකය විනාශ කොට, නව ස්වර්ගයක් අහසක් හා නව පොළොවක් මවන තුරු මුළු මැවිල්ලම පාපය මගින් ඇති කරන ලද භයානක පරිසරයෙන් මිදීමට කෙඳිරිගාමින් සිටී.

> **මක්නිසාද මුළු මැවිල්ල මේ දක්වා එක්ව කෙඳිරිගාමින් ගාවිනා විඳින බව දනිමුව. (රෝම 8:22)**

## මනුෂ්‍යයා හට බලපාන ක්‍රමය

නූතන ලෝකයෙහි පවතින පාපිෂ්ඨ වූ පරිසරය මිනිසා හට ආත්මිකව බලපායි. මිනිසාට විරෙහිව ආත්මික බලවේග තුනක් ලොවෙහි ක්‍රියාත්මක වේ. ඒවා නම්: ලෝකය, මාංශය සහ යක්ෂයාය.

1. **ලෝකය :** යක්ෂයා ලෝකයෙහි පවතින නපුරු පාලක පද්ධතිය සමගින්, සියලු පාපයෙන්, භාණ්ඩ තණ්හාවෙන් හා දේව අභක්තික වූ දර්ශනවාදයන් තුළින් ක්‍රියාත්මක වේ.

2. **මාංශය :** සියලු මනුෂ්‍යයෝ පාපීව උපදී. සාතන් මිනිසා තුළ පවතින මූලික පාපිෂ්ඨ ස්වභාවය තුළින් ක්‍රියා කරමින් මිනිසාව පාප ක්‍රියා කිරීමට යොමු කරවයි. මෙම මූලික පාපිෂ්ඨ ස්වභාවය (බයිබලයෙහි "මාංශය" ලෙසට හඳුන්වන) භයානක පව්කාර අධර්මිෂ්ඨ වූ ක්‍රියාවන් ප්‍රතිඵල ලෙස ගෙන දෙමින් ක්‍රියා කරයි.

3. **යක්ෂයා :** සාතන් තවමත් තම අරමුණු ඉටු කර ගැනීම සඳහා පරිසරයෙහි ක්‍රියාකාරීව සිටී. යක්ෂයා තවත් යකුන් තුළින් මෙන්ම තම කැමැත්ත යක්ෂයාට යටත් කරදී ඇති කාන්තාවන් හා පුරුෂයන් තුළින් ක්‍රියා කරයි.

## බේරීයාමට මාර්ගයක්

මෙම පාපිෂ්ඨ පරිසරයෙන් මිදීමට දෙවියන්වහන්සේ මාර්ගයක් සපයා දී තිබේ. මනුෂ්‍යයා හට ආත්මික මරණයෙහි ඇති භයානක ප්‍රතිඵලවලින් මිදීමට හැකියාව ඇත. (දෙවියන්වහන්සේගෙන් වෙන්වීම)

> **මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. (යොහන් 3 ඃ16 )**

යේසුස්වහන්සේ තුළින් මනුෂ්‍යයාහට සදාකාලික ශාරීරික මරණයෙහි බලපෑමෙන්ද මිදීමට හැකිය. ශාරීරික ලෙස මිය යන්නාවූ සියලු සැබෑ ඇදහිලිවතුන් කිසියම් දිනක ශාරීරික මරණයෙන් සදාකාල ජීවනයට උත්ථාන වනු ඇත.

> **මක්නිසාද ස්වාමීන්වහන්සේම මහත් ශබ්දයක්ද උත්තම දේවදූතයෙකුගේ හඬද දෙවියන් වහන්සේගේ හොරණෑ නාදයද ඇතුව ස්වර්ගයෙන් බස්නා සේක. ක්‍රිස්තුස්වහන්සේ තුළ මළාවූ අය පළමු කොට නැගිටින්නෝය.**
>
> **එවිට ජීවත්ව ඉතුරුව සිටින අපි එකවිටම ඔවුන් සමග ස්වාමින්වහන්සේ සම්මුඛ වන පිණිස වලාකුල්වලින් අහසට ඇදගනු ලබන්නෙමුව. මෙසේ අපි නිතරම ස්වාමින්වහන්සේ සමග සිටින්නෙමුව. (1 තෙසලෝනික 4 ඃ 16-17)**

අප ජීවත්වන්නාවූ පාපිෂ්ඨ ලෝකය යම් කිසි දිනක දෙවියන්වහන්සේ විනාශ කොට නව පොළොවක් සහ නව ස්වර්ගයක් අළුතින් නිමවන සේක.

> **එහෙත් සොරෙකු මෙන් ස්වාමින්වහන්සේගේ දවස පැමිණෙන්නේය. ඒ දවසේදී අහස මහත් ඝෝෂාවකින් පහවන්නේය. මහාභූත යෝද තද උෂ්ණයෙන් නාස්ති වී යන්නෝය. පොළොවද එහි තිබෙන කර්මාන්තද දාලයන්නේය.**
>
> **එහෙත් ධර්මිෂ්ඨකම වාසයකරන අලුත් අහසක් ද අලුත් පොළොවක්ද උන්වහන්සේගේ පොරොන්දුවේ හැටියට අපි බලා සිටිමුව. (2 පේතෘස් 3 ඃ 10, 13)**

ලෝකය තවමත් පාපයෙහි ශාපයට යටත්ව පැවතියත් ඇදහිලිවතුන් හට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් එම ශාපයෙන් මිදී සදාකාල අධික ජීවනය සහිතව ජීවත්විය හැක. යේසුස්වහන්සේ පැවසුයේ,

> **"... මා ආවේ ඔවුනට ජීවනය ලැබෙන පිණිසත් එය අධික ලෙස ලැබෙන පිණිසත්ය. (යොහන් 10 ඃ10 )**

ඔබගේ මූලික පාපිෂ්ඨ ස්වභාවය දෙවියන්වහන්සේගේ බලයෙන් වෙනස් කොට ආත්මික ඵල වන ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, මෘදුකම, යහපත්කම, විශ්වාසය, කරුණාවන්තකම හා පමණ දැන ක්‍රියා කිරීම නිපදවීමට වෙනස් විය හැක. (ගලාති 5 ඃ 22-23) ඔබ තවමත් ලෝකයෙහි ජීවත් වුවද එම පාපකාරී පරිසරයෙහි පංගුකාරකයක් විය යුතු නොවේ.

**ඔබ ලෝකයෙන් ඔවුන් අහක් කරන පිණිස නොව, නපුරාගෙන් ඔවුන් ආරක්ෂා කරන පිණිස යාච්ඤා කරමි. මා ලෝකයෙන් නොවන්නාක් මෙන්ම ඔව්හුද ලෝකයෙන් නොවෙති. (යොහාන් 17 ඃ 15-16)**

ඔබ මේ ලෝකයේ ජීවත් වන්නේ මේ පාපිෂ්ඨ ලෝකයේ සුබ අස්න පැතිරවීම සඳහාය.

**ඔබගේ වචනය සත්‍යතාවය. ඔබ මා ලෝකයට එවූවාක්මෙන්ම මමද ඔවුන් ලෝකයට යැව්මි (යොහන් 17 ඃ18)**

අපට ප්‍රිතිවිය හැක්කේ, යේසුස්වහන්සේ

**උන්වහන්සේ දැන් තිබෙන නපුරු ලෝකයෙන් අප ගළවන පිණිස අපගේ පියවූ දෙවියන්වහන්සේ කැමැත්ත ලෙස අපේ පව් නිසා තමන්ම පාවාදුන්සේක. (ගලාති 1 ඃ 4)**

පරිසරය සහ සභාවෙහි මෙහෙය (කාර්යය භාරය)

සියලු ජාතීන් වෙත ශුභාරංචිය ව්‍යාප්ත කිරීම පිණිස සභාවෙහි සේවාව කෙරෙහි පරිසරය ඉතා වැදගත්ය.

**පළමුව ඃ** ඔබ දැනට ඉගෙන ගෙන ඇති පරිදි සියලුම සේවාවන් සිදු කරනුයේ නපුරු වූ ලෝක පරිසරයකය. ඔබ මෙය වටහා ගතහොත් ඔබගේ සේවාවන් කෙරෙහි සතුරාගේ පහරදීම් දැක මවිතයට පත් නොවනු ඇත.

**දෙවනුව ඃ** මෙලොවෙහි එකිනෙකින් හාත්පසින්ම වෙනස් වන්නාවූ විවිධ පරිසරයන් පවතී. සෑම මිනිසෙකුම තමා ජීවත්වන ලෝකයෙහි නපුරු පරිසරය මගින් පොදුවේ බලපෑමට ලක් වන්නාක් මෙන්ම එම පුද්ගලයා ජීවත්වන සුවිශේෂි පරිසරය මගින් ඔහු වෙත විශේෂ බලපෑම් ඇතිවේ. ඔබහට සුවිශේෂි ලෙස යම් පරිසරයක් හදුනා ගැනීමට හැකි වූ කල එහි වෙසෙන පුද්ගලයන්ට සඵලවත් ලෙස ශුභාරංචිය ඉදිරිපත් කිරීමට හැකියාව ලැබෙන ඇත.

## ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. “පරිසරය” යන පදය අර්ථ දක්වන්න.

3. මිනිසාගේ පළමුවන පරිසරය විස්තර කරන්න.

4. නූතන ලොවෙහි පරිසරය විස්තර කරන්න.

5. මුල් පරිසරයේ සිට දැනට ලොවෙහි පවතින පරිසරයට මාරු වීමට මුල්වූ හේතුව කුමක්ද?

6. නූතන ලොවෙහි පරිසරය මනුෂ්‍යයා හට ආත්මිකව බලපාන ආකාර තුන හඳුන්වන්න.

7. මෙම පාපිෂ්ඨ පරිසරයෙන් මිනිසාව මුදවා ගැනීමට දෙවියන්වහන්සේගේ සැලැස්ම කුමක්ද?

8. පරිසරය සභාවෙහි සේවයට සම්බන්ධ වන්නේ කෙලෙසද?

(ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම පොතේ අවසාන පරිච්ඡේදයට පසු සඳහන් කර ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. උත්පත්ති 3 වන පරිච්ඡේදය කියවා බලා පළමු වන පරීක්ෂාව සඳහා සාතන් පරිසරය භාවිත කළ අන්දම නිරීක්ෂණය කර අධ්‍යයනය කරන්න. දෙවියන්වහන්සේ මැවූ උයන සර්වසම්පූර්ණ විය. නමුත් එහි එක් ගසක් තහනම් කර තිබුණි. මනුෂ්‍යයා හට තේරා ගැනීමක් දී තිබුණි. එනම් දෙවියන්වහන්සේට කීකරු වී එම ගස මග හැර ගොස් උන්වහන්සේ සපයා දී තිබූ සර්ව සම්පූර්ණ පරිසරයෙහි දිගටම ජීවත්වීමට හෝ අකීකරු වී පරිසරයට පාපය ඇතුළු විමට ඉඩ හැරීමය. උත්පත්ති 3 වන පරිච්ඡේදයෙහි ඒව තහනම් කරන ලද ගස අසල වූ පරිසරයෙහි සිටියාය. බයිබලයෙහි නපුර පිළිබඳව අනතුරු දක්වමින් සඳහන් කරනුයේ...

   **එයින් වැළකී, එහි නොගොස්, එයින් අහකට හැරී යන්න. (හිතෝපදේශ 4:15)**

   **ඒවට ඇසුණි :** වළක්වන ලද ගස සහිත පරිසරයෙහි සිට සාතන්ගේ හඬ
   **ඇය දුටුවාය :** පරිසරයෙහි ප්‍රියමනාප වූ දෙයක්, එනම් තහනම් කරන ලද ගෙඩිය දුටුවාය.
   **ඇය ගත්තාය :** ඇය පරිසරයෙන් පාපිෂ්ඨ වූ දෙය ගත්තාය.
   **ඇය කෑවාය :** තහනම් ගෙඩිය කෑවාය. කෑමට පෙර නපුර බාහිර දෙයක් විය. එය ඇයට ආත්මිකව බලපෑමක් නොකළාය. නමුත් ඇය එය කෑ විට, පව්කළාය, පාපිෂ්ඨ විය.
   **ඇය දුන්නාය :** ඒව ආදම්ගේ භාර්යාව වූ බැවින් ආදම්ගේ "සමාජයීය" පරිසරයෙහි කොටසක් විය. ඇය තහනම් ගෙඩිය ඔහුට දීමෙන් ඔහු කෙරෙහි බලපෑමක් කළාය. මනුෂ්‍යයෝ බොහෝ විට තමුන් ජීවත් වන පරිසරයෙහි වෙසෙන ඇයගේ බලපෑම හේතුවෙන් පාපයට පෙළඹෙති.
   **ආදම් අනුභව කළේය :** ඔහුට තහනම් ඵලය භුක්ති විඳීමට සහභාගි විය. පාපයෙහි චක්‍රය ඇරඹී අතර එය මුළු ඉතිහාසය පුරා දිවයනු ඇත. සියලු මනුෂ්‍යයෝ පව්කරුවන් වූ අතර ලොවෙහි පිරිසරය පාපිෂ්ඨ විය.

2. උත්පත්ති 13 ඃ 8-11 සඳහන් වන පරිදි ලොත් විසින් තෝරාගත් භෞතික පරිසරය විස්තර කරන්න.

3. ලොත් තෝරාගත්තාවූ සොදොම නගරයෙහි පැවති ආත්මික පරිසරය කුමනාකාර වීද? උත්පත්ති 13 ඃ 13 සහ 18 -19 පරිච්ඡේද බලන්න.

4. උත්පත්ති 6 ඃ 5 හි සඳහන් වන ආත්මික පරිසරය සහ එළිදරව් 21 ඃ 10-27 සඳහන් වන ආත්මික පරිසරය සංසන්දනය කර බලන්න.

# දෙවන පරිච්ඡේදය

# පාරිසරික විශ්ලේෂණය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් වූ කළ ඔබ හට පහත සදහන් දෑ ඉටු කළ හැකි වනු ඇත.

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට
- "පාරිසරික විශ්ලේෂණය" යන පදය අර්ථ දැක්වීමට
- මෙම පාඨමාලාව තුළදී සාකච්ඡා කරන්නා වූ පාරිසරික විශ්ලේෂණ ක්‍රම හයක් හඳුනා ගැනීමට
- සියලු ජාතීන් වෙන ශුභාරංචිය රැගෙන යාමෙහිදී පාරිසරික විශ්ලේෂණයෙහි ඇති වැදගත්කම පෙන්වීමට හේතු හතක් නම් කිරීමට
- පාරිසරික විශ්ලේෂණයෙහිදී වළක්වාලිය යුතු උපද්‍රව හයක් සාරංශගත කිරීමට

## ප්‍රධාන පදය

**මක්නිසාද දෙවියන් වහන්සේගෙන් උපන් යමක් ඇත්ද එය ලෝකයෙන් ජයගන්නේය. ලෝකයෙන් ජයගෙන තිබෙන්නේ අපේ ඇදහිල්ලය. (1 යොහන් 5:4)**

## හැඳින්වීම

මෙම පරිච්ඡේදය ශුභාරංචිය, ලොව වෙතට ව්‍යාප්ත කිරීමෙහිදී ජනතාව වෙසෙන පරිසරය හා එමගින් ඇතිවන බලපෑම අවබෝධ කරගැනීමට සහාය දක්වන "පාරිසරික විශ්ලේෂණය" නම් නිපුණතාවය හඳුන්වා දෙනු ඇත.

"පාරිසරික විශ්ලේෂණ" අර්ථ දක්වා ඇති අතර එවැනි විශ්ලේෂණ ක්‍රම හඳුන්වා දී ඇත. වළක්වා ගත යුතු උපද්‍රව පිළිබඳව සාකච්ජා කරන අතර පාරිසරික විශ්ලේෂණයන්හි වැදගත්කම පහදා දෙයි.

## වෙනස් වූ පරිසරයන්

අවසාන පරිච්ඡේදයෙහි පරිසරයට අයත් දේ ලෙස කෙනෙකු වටා පවතින භෞතික, සමාජයීය, සංස්කෘතිකමය හා ආත්මික සාධක සලකන බව ඔබ ඉගෙන ගත්තෙහිය. එසේම ලෝකය පාපිෂ්ඨ බවත් මිදුම්කරුවෙකු අවශ්‍ය වන්නා වූ පාපිෂ්ඨ ස්ත්‍රී පුරුෂයන්ගෙන් එය ගහණයව පවතින බවත් ඉගෙන ගන්නට ලැබිණි.

සියලුම සේවාවන් සිදුකරනුයේ මෙලොවෙහි එම පොදු පරිසරයෙහිය. නමුත් මෙම පාපිෂ්ඨ වූ ලොවෙහි පොදු පරිසරයෙහි එකිනෙකින් බොහෝ සේ වෙනස් වූ විවිධ පරිසරයන් පවතී. උදාහරණයක් ලෙස සහරා කාන්තාරයෙහි වෙසෙන කුඩා ගෝත්‍රික කණ්ඩායමක පරිසරය නිව්යෝර්ක් නුවර වැනි නූතන නගරයක වෙසෙන වැසියන්ගේ පරිසරයට හාත්පසින්ම වෙනස් වේ.

මෙලොව පවතින දුෂ්ට පරිසරය පොදු වශයෙන් එහි වෙසෙන සියලුම මනුෂ්‍යයන් කෙරෙහි බලපාන අයුරින්ම, එක් එක් පුද්ගලයා වෙසෙන සුවිශේෂ පරිසරය ද ඔහු කෙරෙහි දැඩිව බලපානු ඇත. ඔබ

හට ඔවුන් වෙසෙන පරිසරය අවබෝධ කරගැනීමට හැකි වූ කල වඩා හොදින් ශුභාරංචි පණිවිඩය ප්‍රදානය කළ හැකි වනු ඇත.

## පාරිසරික විශ්ලේෂණය

"පාරිසරික විශ්ලේෂණය" ඔබහට කිසියම් නිශ්චිත පරිසරයක් අවබෝධකර ගැනීමට උපකාරී වනු ඇත. යමක් විශ්ලේෂණය කිරීම යනු සම්පූර්ණ ඒකකයක් සෑදී ඇති කුඩා ඒකක සියල්ලම මනාව විස්තරාත්මකව සොයා බලමින් පුළුල්ව අධ්‍යයනය කිරීමය. "පාරිසරික විශ්ලේෂණය" යනු පරිසරයට ඇතුලත් සියලුම අංග එනම් භෞතික සමාජයීය සංස්කෘතිකමය හා ආත්මික යන සාධක අධ්‍යයනය කිරීමය. එක් එක් සුවිශේෂ පරිසරයක් ඔබ විස්තරාත්මකව අධ්‍යයනය කරනු ඇත.

## පාරිසරික විශ්ලේෂණ ක්‍රම

ලොවෙහි ශුභාරංචිය පතළ කිරීම සදහා ඉතා වැදගත් වන්නා වූ පාරිසරික විශ්ලේෂණ ක්‍රම හයක් මෙම පාඨමාලාවෙහිදී සාකච්ජා කෙරෙනු ඇත. එහි සෑම අංගයක්ම පසුව ඇති පරිච්ජේදවලදී විස්තරාත්මකව අධ්‍යයනයට යොමුවනු ඇත.

**පෞද්ගලික විශ්ලේෂණය :** මෙය ඇදහිලිවන්තයෙකු ලෙස ඔබගේම පරිසරය පිළිබඳවත් ඔබ පිළිබඳවත් කෙරෙන විශ්ලේෂණයකි.

**ජන කොටසක් විශ්ලේෂණය :** ලෝකය සෑදී ඇත්තේ විවිධ වූ ජනකොටස් සමූහයකිනි. මෙම කොටස් විවිධ භාෂාවන් කථා කරති, විවිධ චාරිත්‍ර පවත්වති, ඔවුහු විවිධාකාරයෙන් සංවිධානය වී සිටිති. සෑම භූගෝලීයමය වූ පෙදෙසක්, දේශයක්ම, ලොවෙහි කලාපයක්ම සෑදී ඇත්තේ විවිධ වූ ජන කොටස් සමූහයකිනි.

**ප්‍රදේශයක් / ක්ෂෙත්‍රයක් විශ්ලේෂණය:** ක්ෂේත්‍රයක් යනු කිසියම් දේශයකදී ඇති සුවිශේෂ භූගෝලීය ප්‍රදේශයකි. එය ප්‍රාන්තයක්, නගරයක්, ගමක්, ප්‍රාදේශීය කොට්ඨාශයක්, දිස්ත්‍රික්කයක් හෝ ප්‍රධාන පළාතක් විය හැකිය.

**දේශයක් විශ්ලේෂණය:** දේශයක් ලෙසට නම්කරනුයේ දේශපාලනමය සීමාවන් ඇතුළත් එකමුතු කරන ලද ජනකොටස් ඇතුලත් වූ ඉඩම් ප්‍රමාණයකි. ඔවුහු එකමුතුව එකම රාජ්‍යයක් යටතෙහි ජීවත් වෙති.

**කලාපයක් විශ්ලේෂණය :** ලෝකයෙහි එක් කලාපයක් ලෙස ගැනෙනුයේ සුවිශේෂ ලෙස එකට එක් වූ රටවල් කිහිපයකින් යුත් කොටසකි. උදාහරණයක් ලෙස, මධ්‍යම ඇමරිකාවේ කලාපයට කොස්ටරිකා, නිකරාගුවා, බෙලීස්, පැනමාලහොන්ඩුරස් සහ එල් සැල්වදෝරය අයත් වේ.

**දැනට පවත්නා ක්‍රිස්තියානි සංවිධානයක් විශ්ලේෂණය :** මෙයට අයත් වනුයේ ක්‍රිස්තියානි සේවය උදෙසා පිහිටුවන ලද දේවස්ථාන, සභාවන්, නිකායන් සහ සංවිධාන වේ.

## පාරිසරික විශ්ලේෂණයන්හි වැදගත්කම

ශුභාරංචිය ව්‍යාප්ත කිරීමෙහිදී පරිසරය අවබෝධ කරගැනීම වැදගත් වනුයේ එය . . .

## ඇදහිලිවන්තයන් හට සේවයෙහි තමා සතු ස්ථානය ගවේෂණය කරගැනීමට උපකාරීවන බැවිනි.

"පෞද්ගලික පාරිසරික විශ්ලේෂණය" නම් පාඩමෙහිදී ඔබ ඔබගේ ආත්මික ශක්තීන්, දුර්වලතා, කැදවීම හා දීමනා විශ්ලේෂණය කොට බලනු ඇත. මෙම විශ්ලේෂණය වැදගත් වනුයේ එමගින් ඔබහට සේවයෙහි නියමිත සුවිශේෂී ස්ථානය සොයාගැනීමට උපකාර වන බැවිනි. එමගින් සේවයෙහිදී වඩා කාර්යක්ෂමවීමට ඔබ ගණුදෙනු කළ යුතු දුර්වලතා හඳුනාගැනීමටත් දෙවියන් වහනසේ උදෙසා ඔබට භාවිත කලහැකි දක්ෂතා හඳුනා ගැනීමටත් අවස්ථාව ලැබේ.

## සෑම පුද්ගලයෙකු හටම බලපෑමක් ඇති කරයි.

ශුභාරංචිය ව්‍යාප්ත කිරීමේදී, සෑම පුද්ගලයෙකුම නූතන ලෝකයෙහි නපුරු පරිසරයෙන් බේරී නොමැති බව අවබෝධ කරගැනීම ඉතා වැදගත්ය. ඕනෑම සංස්කෘතියකට, ගෝත්‍රයකට, ජාතියකට අයත් සෑම මිනිසෙක්ම ගැළවුම්කරුවෙකු අවශ්‍ය වන්නා වූ පව්කරුවෙකි. සෑම සංස්කෘතියකම නපුර පවතින අතර නොඇදහිලිවන්ත සැම මිනිසෙකු තුළම මූලික පාපිෂ්ට ස්වභාවයක් පවතී. ඔබ සේවය කරන්නා වූ මෙලොව පවතින සෑම පරිසරයකම සාතන් ක්‍රියාත්මක වෙමින් පවතිනු ඇත. ඔබ නිරතුරුවම ලෝකයට, මාංශයට හා යක්ෂයාට එරෙහිව සටනෙහි නිරත වනු ඇත.

## ශුභාරංචිය පරිසරයට සම්බන්ධ කරයි.

ජනතාව හට ශුභාරංචිය අවබෝධ කරගැනීමට ඇති හැකියාව කෙරෙහි ඔවුන්ගේ පරිසරය බලපායි. උදාහරණයක් ලෙස ඔබ ශුභාරංචිය ප්‍රකාශ කළ යුත්තේ සවන් දෙන්නා හට තේරුම් යන භාෂාවකිනි.

එසේම ඔබ ශුභාරංචිය ප්‍රකාශ කළ යුත්තේ සංස්කෘතිකමය හා සමාජයීය අයුරින් පිළිගත හැකි විලාසයකිනි. සමහර ජන කොටස් වල ජනතාවට ශුභාරංචියට සවන් දීමට පෙර ඒ සඳහා ඔවුන්ගේ ගෝත්‍රික නායකයාගේ අනුමැතිය හා පිළිගැනීම ලබාගැනීමට ඔබට සිදුවේවි. ඔබ ශුභාරංචි පණිවිඩය ඉදිරිපත් කරන විලාසය ඔබගේ ශ්‍රාවකයන්ගේ සාමාජයීය හා අධ්‍යාපනික මට්ටම මත රදා පවතී. එබැවින් ඔවුනට සරිලන පරිදි ඔබගේ පණිවිඩය ඉදිරිපත් කිරීම සකසා ගැනීමට සිදුවේවි

සමහර අවස්ථාවලදී කිසියම් සංස්කෘතියකදි ඔබව පිළිගැනීම සදහා ඔබගේ ජීවිත රටාව පවා වෙනස් කිරීමට සිදුවනු ඇත. උදාහරණයක් ලෙස, ප්‍රේරිත වූ පවුල්තුමා මස් අනුභව කළ කෙනෙකු වුවත් ඔහු මෙහෙකළා වූ සමහර සංස්කෘතියන්හිදී ඔහු එයින් වැළකී සිටියේය. ඔහු මෙම ජනතාව වෙතට ශුභාරංචිය ව්‍යාප්ත කරන ලෙස තම ජීවිත රටාව නිසි ලෙස වෙනස් කර ගත්තේය.

> **එබැවින් සෑම මාගේ සහෝදරයාට බාධාවක් වේනම්, මාගේ සහෝදරයාට බාධා නොපැමිණෙන ලෙස කිසි කලෙක මාංශ නොකන්නෙමි. (1 කොරින්ති 8:13)**

ඔබ කිසිම විටෙක දෙවියන්වහන්සේගේ ලිඛිත වචනයට එරෙහිව යමින් ජීවිත රටාව වෙනස් නොකළ යුතුය. එනමුත් ශුභාරංචිය පතළ කිරීම වේගවත් කිරීම සඳහා ඔබගේ පෞද්ගලික ජීවිතයෙහි සරල පැවතුම් ක්‍රම වෙනස් කිරීමට හැකියාව ඇති විට එසේ කළ යුතුය.

බොහෝ සමාජයන්හි එහි පවතින ශුභාරංචිය කාර්යක්ෂම ලෙස සන්නිවේදනය කිරීමට භාවිතකර ගත හැක. එසේ කිරීම සදහා ඔබ එම ජනතාවගේ සංස්කෘතිකමය පරිසරය අවබෝධ කරගත යුතුය. සංස්කෘතිය ජනතාව දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුලත් කරවන පාලමක් ලෙස හෝ එයින් ඉවත්කර තබන බාධකයක් ලෙස භාවිත කළ හැකිය.

## ශුභාරංචිය ඉගැන්වීම සඳහා පරිසරය භාවිත කිරීමට හැකියාව සපයා දෙයි.

යේසුස්වහන්සේ ශුභාරංචිය ඉගැන්වීමට පරිසරය භාවිත කළ සේක. උන්වහන්සේ ජනතාවට ඉතා සමීප පොදු භාණ්ඩ එනම්, තිරිඟු, මාළු, මල් (ඉටිපන්දම්) පහන් රුක් සහ ගොඩනැගිලි වැනි එම සංස්කෘතියෙහි පරිසරයෙහි තිබූ දෑ භාවිත කරමින් කතන්දර පැවසූ සේක.

යේසුස්වහන්සේ තම ශිෂ්‍යයන්ව කෘතිම පරිසරයකට රැගෙන නොගිය සේක. උන්වහන්සේ ඔවුන්ව කන්‍යාරාමයක හෝ දෙව් සිප් හලක තනිකර නොතැබූහ. යේසුස්වහන්සේ මනුෂ්‍යයනට ඉගැන්වූයේ කාන්තාවන් හා පුරුෂයින් ජීවත් වූ, වැඩකළා වූ, සේවය කළා වූ ස්වභාවික පරිසරයෙහිම සිටය. උන්වහන්සේ ඔවුන්ගේ පෞද්ගලික තත්වයට ශුභාරංචිය සම්බන්ධව කළසේක. ඔවුහු උගත් කරුණු අදාළ කරගැනීම සඳහා පුහුණු බිම තම පරිසරය වේ.

(හාවස්ටයිම් ජාත්‍යන්තර ජාලයෙහි දර්ශනය මෙය වේ. ඔබහට ඔබගේම පරිසරයේ සිට ඉගෙනීම සඳහා එය ඔබ වෙත පැමිණ ඇත්තේ එබැවිනි)

## සරු ආත්මික බිම හඳුනාගැනීම

ස්වභාවික ලෝකයේ ගොවියෝ තම බීජ වැපිරීමට පෙර පස විශ්ලේෂණය කොට බලති. ඔවුහු මෙසේ කරනුයේ මූලික හේතු තුනක් සඳහාය. එනම්,

**පළමුවෙන්,** ඔවුන්ගේ ප්‍රයත්නයන් ඉතා හොඳින්ම කැටිකල හැකි ඉතාමත්ම හොඳ පස තෝරා ගනු ඇත. ඉතාම සරු බිම ඉතාම ලොකු අස්වැන්න ලබාදෙන බව ඔවුහු දනිති.

**දෙවනුව,** නිසරු පස හඳුනා ගෙන එය ගොවිතැන සඳහා සූදානම් කළ හැක්කේ කෙලෙසද කියා තීරණය කරති. සමහර සංස්කෘතීන් වල ගොවි මහතුන් පස සරු කිරීම සඳහා වාණිජ ලෙස නිපයූ පොහොර භාවිත කරති. තවත් සමහරු ගස් කොලන් කපා දමා එය පොළොව මත ගිනි තබයි. එයින් ලැබෙන අළු ස්වභාවික පොහොර ලෙස භාවිත කරති.

**තුන්වනුව,** ඔවුහු වගාකිරීම සඳහා හොඳම ක්‍රමය තීරණය කරනු පිණිස පස විශ්ලේෂණය කරති. උදාහරණ ලෙස වැසි ජලය පමණක් සෑහේද නැතිනම් වාරිමාර්ග ජලය භාවිත කළ යුතුද? තමා පැළ කරන්න යන්නේ මොනවාද? අස්වැන්න නෙලන්නේ කෙලෙසද?

ගොවියෙකු ස්වභාවික ලෝකයේ කරන වැඩ කොටස ආත්මික ලොවෙහි පාරිසරික විශ්ලේෂණය මගින් සිදුකෙරෙන දෙයට අපත් එවන් වූ සමාන හේතු උදෙසා ජනකොටස්, ප්‍රදේශ, ජාතීන්, කලාප ආදිය විශ්ලේෂණය කරමු.

**පළමුව,** ආත්මිකව ඉතාමත්ම සරු වූ ක්ෂේත්‍ර නිගමනය කිරීමට අපට අවශ්‍ය වේ. සමහර ප්‍රදේශ ආත්මික අස්වැන්න සඳහා සූදානම්ව පවතී. දෙවියන්වහන්සේගේ කෙතෙහි අස්වැන්න නෙළීමට ගොවියෝ මද බව බයිබලය පවසයි.

ආත්මික අස්වැන්න නෙලීමේ බලකාය සීමා සහිත බැවින් අපගේ ප්‍රයත්නයන් ආත්මිකව අස්වැන්න නෙළීමට හොඳින් කරල් පැසී ඇති ප්‍රදේශ කෙරෙහි යොමු කිරීමට අවශ්‍ය වේ.

**දෙවනුව,** තවමත් ආත්මිකව ශුභාරංචියට විවෘතභාවයක් නොදක්වන ප්‍රදේශ අස්වැන්න සඳහා සූදානම් කිරීමට ක්‍රම තීරණ කිරීමට අපට අවශ්‍ය වේ. සමහර මනුෂ්‍යයන්, ප්‍රදේශ, ජාතීන් සහ කලාප ශුභාරංචිය භාරගැනීමට එතරම් සූදානමින් නොපවතී. එබැවින් එසේ වීමට හේතුව සහ ආත්මිකව එම පස වෙනස් කිරීමට හැකි ක්‍රම මොනවා දැයි අප සොයා බැලිය යුතුය.

**තුන්වෙනුව,** භාවිත කිරීමට ඉතා යහපත් ක්‍රම අප තීරණය කරමු. එය අපව විශ්ලේෂණය කිරීම සඳහා තවත් එක් ප්‍රධාන හේතුවක් වෙත යොමු කරයි. එය නම්...

## එමගින් ඔබගේ ධර්මදූත සේවයට බලපාන සාධක හඳුන්වා දෙයි.

සභාවට පැවරී ඇති ධර්මදූත සේවය ශුභාරංචිය පැතිරවීමය. මෙම කාර්යය ඉටු කිරීම සඳහා භාවිත කරන්නාවූ "උපක්‍රමය" කෙරෙහි පරිසරය බලපායි. "උපක්‍රමය" යනු කිසියම් ඉලක්කයක් සපුරා ගැනීම පිණිස යොදා ගන්නාවූ ක්‍රමයක් හෝ සැලසුමකි. ඔබ මුළු ලොවටම ශුභාරංචිය පතුරුවන්නට යනවා නම් එය ඉටු කර ගැනීමට සුදුසු ක්‍රම හා සැලසුම් ඇතුළත් "උපක්‍රම" ඔබ සතු විය යුතුය. (මෙම පාඨමාලාවෙහි අවසාන පරිච්ඡේදයෙහිදී උපක්‍රම හා සැලසුම් පිළිබඳ විස්තරාත්මකව ඉගෙන ගනු ඇත.)

එකම සැලැස්මක් සෑම ස්ථානයකදීම එක ලෙසම ක්‍රියාත්මක නොවේ. මෙයට හේතුව වනුයේ, ස්වභාවික ලෝකයෙහි කිසිම වගා භූමි දෙකක වැවෙන පැළ එක සමාන නොවන්නාක් මෙන්ම ලොවෙහි කිසිම මනුෂ්‍යයන් දෙදෙනෙකු එක හා සමාන නොවීමත් කිසිම පරිසර දෙකක් එක සමාන නොවීමත්ය.

ඔබ ජන කොටස්, භූගෝලීයමය ප්‍රදේශ, ජාතීන් හා කලාප විශ්ලේෂණය කර බැලීමෙන් මෙම විවිධ පරිසරයන්හි වෙසෙන ජනතාව වෙත කාර්යක්ෂම ලෙස ශුභාරංචිය ගෙන යාමට උපකාරී වන තොරතුරු රැස්කර ගත හැකි වනු ඇත. විවිධාකාර වූ දේශපාලනමය පද්ධතීන් පවතින බැවින් ශුභාරංචිය බෙදා ගැනීම උදෙසා සුදුසු ක්‍රම තීරණය වනුයේ පරිසරය මත වේ.

උදාහරණයක් ලෙස, සමහර රටවල තවදුරටත් විවෘත ධර්මදූත රැස්වීම් පැවැත්විය නොහැක. තව සමහර රටවල සභාවන් පිහිටුවීමට තවදුරටත් ඉඩම් ලබා ගත නොහැක. තවත් රටවල ශුභාරංචිය ප්‍රකාශ කිරීම උදෙසා මිෂනාරීවරුන්ට රටට පිවිසීමට වීසා බලපත්‍ර ලබා ගත නොහැක.

එවන් නීති රීති පැවතීම නිසා ඔබ පරාජිත ලෙස වැඩය අත්හැර දැමිය යුතු නොවේ. ඔබට කළ හැක්කේ එවන් පරිසරයකට යෝග්‍ය අයුරින් ඔබගේ ශුභාරංචි ප්‍රකාශක ක්‍රමය සකසා ගැනීම පමණකි. උදාහරණ ලෙස ඔබට මිෂනාරී සේවකයෙකු ලෙස රටට පිවිසිය නොහැකි විට, සාමාන්‍ය කම්කරුවෙකු ලෙස රැකියාව කිරීමට වීසා බලපතක් හිමි කරගෙන වැඩ කරන ගමන් ශුභාරංචිය බෙදා ගන්න. විවෘත එළිමහන් රැස්වීම් වෙනුවට ඔබහට පෞද්ගලික ශුභාරංචි ප්‍රකාශන ක්‍රමය භාවිත කළ හැකිය. සභාවල (පල්ලිවල) රැස්වීම් පැවැත්වීම වෙනුවට ඇදහිලිවතුන්ගේ නිවෙස් වල රැස්වෙන කුඩා කණ්ඩායම් රැස්වීම් භාවිත කළ හැකිය.

පරිසරය විශ්ලේෂණය කිරීම මගින් ඔබ හට සභාව පිහිටුවිය යුතු ස්ථානය පිළිබඳවත් මනුෂ්‍යයන්ට පහසුවෙන් එක් රැස්විය හැකි වේලාවනට රැස්වීම් පැවැත්වීම පිළිබඳවත් සොයා ගත හැකිය. පරිසරය විශ්ලේෂණය කර බැලීම තුළින් ඔබ හට භෞතිකව, සංස්කෘතිකමය, සමාජයීය හා ආත්මිකව කාර්යක්ෂම ලෙසත් පිළිගත හැකි ලෙසත් ශුභාරංචිය බෙදා ගැනීමට උපක්‍රම හඳුනා ගැනිමට හැකි වේවි.

## දෙවියන්වහන්සේ මිනිසා සමඟ ගනුදෙනු කරන ආකාරයට සම්බන්ධතාවයක් පවත්වයි.

මනුෂ්‍යයන්ගේ පාපය හේතුකොටගෙන ඔවුන්ගේ පරිසරයෙහි පැවති අති මහත් දුෂ්ඨ බව විනිශ්චය කරමින් දෙවියන්වහන්සේ පොළොව මතට මහත් ජලගැල්මක් එවූ සේක.

> **මනුෂ්‍යයාගේ දුෂ්ඨකම පොළොවෙහි මහත් බව ද, ඔහුගේ සිතේ කල්පනාවල කවර අරමුණත් නිරන්තරයෙන් නපුරුවම තිබෙන බවද ස්වාමින්වහන්සේ දුටු සේක. තවද ස්වාමින්වහන්සේ**

> **පොළොවෙහි මනුෂ්‍යයා සෑදූ බැවින් තැවී තමන් සිතෙන්ම ශෝක වූ සේක. ස්වාමින්වහන්සේ: මා විසින් මවන ලද මනුෂ්‍යයා භූමිය මතුපිටින් නැතිකර දමන්නෙමි: මනුෂ්‍යයන් ද මෘගයන් ද බඩගායන සත්වයන් ද ආකාශයේ පක්ෂීන් ද නැති කර දමන්නෙමි: මක්නිසාද මම ඔවුන් සෑදූ බැවින් තැවෙමි යි කී සේක. (උත්පත්ති 6:5-7)**

සොදොම හා ගොමෝරාව පිළිබඳ කථාව උත්පත්ති 18-19 හි කියවා බලන්න. එම නගරවලට දෙවියන්වහන්සේ විනිශ්චය එවනු ලැබුවේ එහි පැවති පාපිෂ්ඨ වාතාවරණය (පරිසරය) නිසාය.

යෝනා පොතෙහි සඳහන් නිනිවේ කථාව කියවා බලන්න. මෙම නුවරෙහි පැවති පාපිෂ්ඨ බව හේතුවෙන් දෙවියන්වහන්සේ නගරය මතට විනිශ්චය එවීමට සැලසුම් කළ සේක. එනමුත් මුළු නගරයම පසුතැවිලි වූ කල, එනම් එම නුවර වැසියන්ගේ ජීවිත හා නුවර පරිසරය සම්පූර්ණ-යෙන් වෙනස් වූ කල, දෙවියන්වහන්සේ ඔවුන් සමඟ වෙනස් අයුරකින් ක්‍රියා කළ සේක.

දෙවියන්වහන්සේ මනුෂ්‍යයා හා සමඟ ක්‍රියා කිරීමෙහිදී පරිසරය එයට බලපෑ ආකාරය විදහා දක්වන තව බොහෝ බයිබලීය උදාහරණ තිබේ. එබැවින් දෙවියන්වහන්සේ මනුෂ්‍යයා සමඟ ගනුදෙනු කරන ආකාරය වටහා ගැනීමට ඔබට අවශ්‍ය නම් ඔබ පරිසරය අවබෝධ කරගැනීම අවශ්‍යය.

## මගහැරිය යුතු උපද්‍රව

පාරිසරික විශ්ලේෂණය බයිබලීය සංකල්පයකි. මීළඟ පාඩම් දෙකෙහිදී මේ සඳහා පැරණි හා අලුත් ගිවිසුමෙහි සඳහන් වන පදනම විස්තරාත්මකව අධ්‍යයනය කරනු ලැබේ. එනමුත් මෙම අධ්‍යයනය පෙරට ගෙනයාමට පෙර ඔබ වැළකී සිටිය යුතු උපද්‍රව කිහිපයක් ඔබට හඳුන්වා දෙමු.

මෙම උපද්‍රව හඳුනාගැනීම පිණිස අපි මනුෂ්‍යයන් දොළොස් දෙනෙකු විසින් කරන ලද පාරිසරික විශ්ලේෂණයක් පිළිබඳ බයිබල් කතාවක් භාවිත කරමු. පළමුවෙන්ම ගණන් කථාවේ පරිච්ඡේද 13-14 කියවා බලන්න.

මෙම කථාවෙහි පෙන්වා දී ඇති පරිදි පාරිසරික විශ්ලේෂණයෙහි සුවිශේෂී වූ උපද්‍රව කිහිපයක් පවතී. මෙලෙස වළක්වාලිය යුතු උපද්‍රව කිහිපයක් පහතින් දැක්වේ. ඒවා නම්:

### ස්වාභාවික හේතුකාරක (තර්ක) මත පමණක් විශ්ලේෂණය නොකරන්න :

පාරිසරික විශ්ලේෂණයෙහිදී ඔබ රැස්කරගන්නා තොරතුරු වැඩි ප්‍රමාණයක් ස්වාභාවික ලෝකයෙහි දෑ නිරීක්ෂණයෙන් හා අධ්‍යයනයෙන් හිමි කර ගන්නා කරුණු වේ. එනමුත් ඔබ ස්වාභාවික ලෝකයෙන් ඔබ්බට ගොස් ආත්මික ලෝකය බැලිය යුතුය.

ඔත්තු බැලීමට කානාන් දේශයට ගිය චර පුරුෂයෝ ස්වාභාවික ලෝකයෙහි සිට යෝධයන් දුටුවෝය. ඔවුහු මෙහිදී කළ අත්වැරැද්ද නම්, ස්වභාවික තර්කානුකූල දෙය ඇසුරින් පමණක් පාරිසරික විශ්ලේෂණයෙහි යෙදීමය. ස්වාභාවික තර්කයට අනුව යෝධයෝ ඉතා විශාලව පෙනුනි.

කිසිවිට ආත්මික තීරණ ගැනීම ස්වාභාවික සාධක මත පමණක් පදනම් කර නොගන්න. ඔබගේ ක්‍රම වලට මගපෙන්වීමක් ලබා ගැනීම සඳහා ස්වාභාවික වාතාවරණය අධ්‍යයනය කරන්න. එනමුත් කාරණා ආත්මිකවද විශ්ලේෂණය කිරීමට මතක තබා ගන්න.

### පැවරී ඇති කාර්යය පිළිබඳව මවිතයට පත් නොවන්න.

කානාන් දේශය අධ්‍යයනය කළාවූ චර පුරුෂයන්ගෙන් දස දෙනෙකු පැවරී ඇති කාර්යයෙහි බැරෑරුම්කම දැක මවිත වූහ. ඔව්හු යෝධයින්ව දුටුවේ පරාජය කිරීමට අසීරු විශාල

අය ලෙසය. ඔව්හු තමුන්ගේ නොහැකියාව දෙසත් සතුරාගේ බලය දෙසත් බැලූහ. ඔව්හු ප්‍රස්ථාව වෙනුවට බාධාව දුටුවෝය.

කිසියම් පරිසරයක් විශ්ලේෂණයෙහිදී ඔබට බොහෝ බාධක ඉස්මතු වී පෙනේවි. එනමුත් එහි කළ යුතු කාර්යභාරයෙහි අතිමහත් බව කෙරෙහි නොව දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ බව කෙරෙහි අවධානය යොමු කරන්න. ඔබගේ දුර්වලකම් දෙස නෙත් යොමු නොකර දෙවියන්වහන්සේගේ හැකියාව දෙස යොමු වන්න. සතුරාගේ බලය ගැන මවිත නොවන්න, මන්ද ඔබ තුළ සිටින තැනැන්වහන්සේ ලෝකයෙහි සිටින තැනැත්තාට වඩා බලවත්ය.
(1 යොහන් 4:4 සහ 5:4)

## අසුබවාදී වාර්තා මගින් බලපෑමට ලක් නොවන්න :

ගණන් කථාව 13 වන පරිච්ඡේදයෙහි චර පුරුෂයන් දස දෙනා සැපයූ අසුබවාදී වාර්තාව දෙවියන්වහන්සේගේ ජනතාවගේ තීරණය කෙරෙහි බලපෑමක් ඇති කළේය. ඔබ දෙවියන්වහන්සේ උදෙසා යම් කාර්යයක් කිරීමට සූදානම් වන කල, එය කළ නොහැකි බව පැවසීමට බොහෝ අය සිටීවි. ඔව්හු අසුබවාදී අදහස් වලින් හා වාර්තා වලින් ඔබව පුරවාවි.

එනිසා ඔවුන්ට ඔබ වෙත බලපෑම් එල්ල කිරීමට ඉඩ නාරින්න. ඔබ එසේ ඉඩ දුන්නහොත් ඉශ්‍රායෙල්වරු කාන්තාරයෙහි ඔබ මොබ ගිය විලසින් ඔබත් ආත්මික කාන්තාරයක ඔබ මොබ ඇවිදිමින් සිටිනු ඇත. මෙලෙස දෙවියන්වහන්සේ උදෙසා අලුත් ක්ෂේත්‍ර වලට අවතීර්ණ වීමත්, අත්පත් කර ගැනීමත් යන වටිනා ප්‍රස්තාවන් අහිමි කර ගනු ඇත.

## බියගුළු හෝ අවිශ්වාසී නොවන්න :

ඉශ්‍රායෙල්වරුන්ට කානාන් නම් වූ පොරොන්දු දේශයෙන් පිටත සිටින්නට සිදුවූයේ ඔවුන් විසින් සිදු කළ විශ්ලේෂණයෙහි ප්‍රතිඵලයක් ලෙසට ඔවුන් දැක්වූ බය හා අවිශ්වාසය බැවිනි.

> **තවද උන් වහන්සේ සතළිස් අවුරුද්දක් අප්‍රසන්නව සිටියේ කවුරුන් කෙරෙහිද? පව්කළාවූ තමුන්ගේ මළකඳන් කාන්තාරයේ වැටුණාවූ තැනැත්තෙක් කෙරෙහි නොවේද? තමන්වහන්සේගේ විශ්‍රාමස්ථානයට ඔව්හු ඇතුල් නොවන්නෝ යයි උන්වහන්සේ දිවුරුවේ අකීකරු වූ තැනැත්තන් ගැන නොවේද? මෙසේ නොඇදහිලිකාරකම නිසා ඔවුන්ට ඇතුල්වන්ට නුපුළුවන් වූ බව අපට පෙනෙන්නේය. (හෙබ්‍රෙව් 3:17-19)**

ඔබ යම්කිසි දෙයක් පිළිබඳව ඉගෙන ගත් කරුණු නිසා ඇති වූ බය හෝ අවිශ්වාසය හේතුවෙන් එම ස්ථානයේ පිටතින් නැවතී සිටීමට  ඉඩ නාරින්න.

## කරුණු රැස්කිරීමේ පරමාර්ථයෙන් පමණක් කරුණු රැස් නොකරන්න.

ඔබ විශ්ලේෂණයක් කරනුයේ කිසියම් අරමුණක් සහිතව මිස පරිසරයක් පිළිබඳ කරුණු රැස් කිරීමට නොවේ.

කානාන් දේශයට ගියාවූ චර පුරුෂයෝ එහි පරිසරය, ජනතාව සහ එහි නිෂ්පාදන පිළිබඳව තොරතුරු රැසක් රැස් කළහ. එහෙත් ඔව්හු ඉගෙන ගත් කරුණු මත ක්‍රියා නොකළහ. ඔව්හු දෙවියන්වහන්සේ වෙනුවෙන් දේශය හිමි කර ගැනීමට යොමු නොවූහ.

ඔබහට තොරතුරු රැස් කරමින් සැලසුම් කරමින් ඔබේ මුළු කාලයම වැය කළ හැකිය. එනමුත් ඔබ අස්වැන්න නෙළීමට කෙතට බැස ඔබගේ ශිල්පීය උපක්‍රම එයට අදාළ කරගෙන ක්‍රියා

නොකළ හොත් මනුෂ්‍යයන් වෙතට ශුභාරංචිය ළඟා නොවනු ඇත.

## "එහෙම වුනොත්" කෙරෙහි නොව "කෙසේද" යන්න කෙරෙහි අවධානය යොමු කරන්න.

ගණන් කථාවෙහි 13 වන පරිච්ඡේදයෙහි කානාන් දේශය වෙත යැවූ චර පුරුෂයන්ට පැවරුනේ එම කලාපය අත් කරගැනීම "කෙසේ" කළ යුතුද කියා තීරණය කිරීමට මිස ඔව්හු එය අත්කර ගත "යුතුද නැද්ද" යන්න නොවේ. වසර හතළිහකට පසුව නැවත වරක් ඉශ්‍රායෙල්වරු කානාන් නුවර සීමාවට පැමිණි කල, නැවත දේශය විමසීමට චරපුරුෂයින් යවන ලදි. මෙවර යැවූ මිනිසුන් පළමු කණ්ඩායමට වඩා හොඳින් තම කාර්යය වටහා ගත්හ. මොව්හු දෙවියන්වහන්සේ උදෙසා දේශය හිමි කරගත "යුතුද" කියා නොව එය හිමි කර ගත යුතු "ක්‍රමය" තීරණය කළ යුතු වේ. (යොෂුවා 2)

ඇදහිලිවතුන් ලෙස අපට නියම කර අත්තේ ජාතීන් වෙතට ශුභාරංචිය පතළ කිරීමටය. එබැවින් විශ්ලේෂණයක් කිරීමේදී අප එය කරනුයේ දී ඇති ප්‍රදේශයේ ජනතාව වෙතට ශුභාරංචිය වඩාත්ම ක්‍රියාශීලීව ගෙන යා හැකි ක්‍රමය තීරණය කිරීම උදෙසාය.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. "පාරිසරික විශ්ලේෂණය" යන පදය අර්ථ දක්වන්න.

3. මෙම පාඨමාලාවෙහිදී ඔබ ඉගෙනීමට යන "පාරිසරික විශ්ලේෂණ" වර්ග හයක් හඳුන්වා දෙන්න.

4. සියලු ජාතීන් වෙත ශුභාරංචිය පැතිරවීමට සභාවට පැවරී ඇති කාර්යය ඉටු කිරීම සඳහා පාරිසරික විශ්ලේෂණයෙහි වැදගත්කම පෙන්වීමට හේතු හතක් නම් කරන්න.

5. පාරිසරික විශ්ලේෂණයෙහිදී වැළකී සිටිය යුතු උපද්‍රව හයක් හඳුන්වා දෙන්න.

(ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම පොතේ අවසාන පරිච්ඡේදයට පසු සඳහන් කර ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. පාවුලුතුමා පරිසරය ශුභාරංචියට බාධාවක් කර නොගෙන එය පාලමක් ලෙස යොදා ගත්තේය. පහත සඳහන් කොටස් අධ්‍යයනය කර ඔහු ශුභාරංචිය බෙදා ගැනීම සඳහා භාවිත කළ ක්‍රමය (ශිල්පීය ක්‍රමය) කෙරෙහි පරිසරය බලපෑ ආකාරය බලන්න.

   - ඔහු "පහත" මට්ටමේ සිටි අයට එම තත්වයේ සිට මෙහෙ කළේය: රෝම 12:16

   - ඔහු සංස්කෘතියට ගැළපෙන භාෂාව භාවිත කළේය : ක්‍රියා 22:1-2

   - ඔහු තමාගේ හැසිරීම, සංස්කෘතිකමය හෝ ආගමික ඇදහිල්ලට හානි නොවන පරිදි සකසා ගත්තේය : 1 කොරි. 8: 10-13, රෝම 14: 15

   - ඔහු තමාගේ ජුදෙව් සංස්කෘතිය, ශුභාරංචිය පිළිගත් අය මත බලෙන් පැටවූයේ නැත : ක්‍රියා 15: 1-32.

2. ස්වාභාවික තර්කයන්ට අනුව පමණක් විශ්ලේෂණය කළ විට, සිදුවන දෙය පිළිබඳ උදාහරණයක් ක්‍රියා 27 හි සඳහන්වේ. නැවේ සේවක මණ්ඩලය ස්වාභාවික තර්කයන්ට අනුකූලව කාරණා විශ්ලේෂණය කළහ. ඔවුන්ගේ විශ්ලේෂණයට අනුව නැව පිටත්විය යුතු විය. නමුත් පාවුලුතුමාට ආත්මික එළිදරව්වක් ලැබී තිබුණි. මෙය නැව ගමන් කිරීමට සුදුසු කාලය නොවන බව දෙවියන්වහන්සේ ඔහුට එළිදරව් කර දී තිබුණි.

3. යම් කාරණයක් විශ්ලේෂණය කර බලා එහි වාතාවරණය අනුව මවිතයට පත්වූ අවස්ථාවක් පිළිබඳ 2 රාජාවලිය 6: 14-17 උදාහරණයක් සපයයි. ගෙහාසි සිත යොමු කළේ භාරදූර කාර්යය කෙරෙහි මිස දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ බව කෙරෙහි නොවේ.

# තුන්වන පරිච්ඡේදය

# බයිබලීය පදනම : පැරණි ගිවිසුම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසාන කළ පසු ඔබ හට:

- පරණ ගිවිසුමෙහි ඇතුළත් පාරිසරික විශ්ලේෂණ පිළිබඳව උදාහරණ හඳුනා ගැනීමට හැකි වනු ඇත.

## හැඳින්වීම

බයිබලය පාරිසරික විශ්ලේෂණයන්ගෙන් පිරී පවතී. එය පොළොවෙහි මිනිසාගේ පරිසරය හා එම පරිසරයෙහි බලපෑම්වලට මිනිසාගේ ප්‍රතිචාර පිළිබඳව වාර්තාවකි. උදාහරණයක් ලෙස බයිබලය මිනිසාගේ අතීත, වර්තමාන හා අනාගත පරිසරය විශ්ලේෂණය කරයි. දෙවියන්වහන්සේගෙන් ඈත්ව සිටි ස්ත්‍රී, පුරුෂයන්ගේ ජීවිත සැබෑ ඇදහිලිවන්තයන්ගේ ජීවිත හා ප්‍රතිවිරුද්ධව සන්සන්දනය කරමින් ආත්මික තත්වය විශ්ලේෂණය කරයි. එසේම එය අපගේ ආත්මික සතුරන්ව විශ්ලේෂණය කරයි.

මෙම පාඩමෙහිදී සහ මීළඟ පාඩමෙහිදී ඔබ පාරිසරික විශ්ලේෂණයන් පිළිබඳ බයිබලීය උදාහරණ ඉගෙන ගනු ඇත. මෙම විෂය හා සම්බන්ධිත බයිබලීය උදාහරණ ඉතා මහත් රාශියක් ඇති බැවින් සියලු උපුටා ගැනීම් විශ්ලේෂණය කිරීම උගහටය. එබැවින් ප්‍රධාන පරිච්ඡේද කිහිපයක් පමණක් තෝරාගෙන ඇත.

(මෙම පාඩමෙහි ස්වභාවය අනුව "ප්‍රධාන පදයක", "ස්වයං පරීක්ෂණයක" හෝ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසක් ඇතුළත් නොවේ.)

## උත්පත්ති

පරිච්ඡේද 1-2 : දෙවියන්වහන්සේ සර්ව සම්පූර්ණ පරිසරයක් මවයි.

පරිච්ඡේද 3 : පාපය පරිසරයට ඇතුළු වේ.එය බලපෑ ක්‍රමය කුමක්ද? පාපයෙන් පසුව දෙවියන්-වහන්සේ ආදම් සහ ඒවගේ තත්වය විශ්ලේෂණය කළේ කෙලෙසද?

පරිච්ඡේද 6: 5-6 :පාපයෙන් පසුව උත්පත්ති 1-2 සඳහන් පරිසරය පාපයෙන් පසුව වෙනස් වූ ආකාරය සලකා බලන්න.

පරිච්ඡේද 6-7 : දෙවියන්වහන්සේ පොළොවෙහි දුෂ්ඨ පරිසරය විශ්ලේෂණය කොට එය පිළිබඳව ගනුදෙනු කරන සේක.

පරිච්ඡේද 11 : බාබෙල් කොතෙහි කතාව කියවන්න.මෙහිදී දෙවියන්වහන්සේ කර ඇති විශ්ලේෂණය හා මනුෂ්‍යයා කර ඇති විශ්ලේෂණය හා සංසන්දනය කර බලන්න.

13: 6-13 : තීරණ මගින් ඉරණම අධිෂ්ඨානය වේ. ලොත් විසින් පරිසරය පිළිබඳව ආත්මික

ප්‍රඥාවෙන් තොරව ස්වාභාවික තර්කයට අනුකූලව විශ්ලේෂණය කොට වැරදි තීරණයක් ගත්තේය.

ඊසාක් : ඔහුගේ පරිසරයෙන් එල්ල වූ අභියෝගයන් මගින් ඔහු සීමා නොවීය.(24:34-35, 25: 32, 26: 12-14 බලන්න)

පරිච්ඡේද 22 : ආබ්‍රහම් ස්වාභාවික ලෝකයෙහි සිදුවිය නොහැකි සිදුවීමක් විශ්ලේෂණය කොට දෙවියන්වහන්සේගේ සැලැස්ම උදෙසා බලා නොසිට කාරණා තම අතට ගත්තේය.

පරිච්ඡේද 37-48 : දිව්‍යමය එළිදරව් කිරීමක් මගින් යෝසෙප් වර්තමාන හා අනාගත පරිසර විශ්ලේෂණය කොට මුළු මහත් පරම්පරාවක්ම සාගතයෙන් බේරා ගත්තේය.

## නික්මයාම

පරිච්ඡේද 2 : මෝසෙස්ගේ මව භයානක පරිසරයක් විශ්ලේෂණය කොට තම පුතුගේ ජීවිතය බේරා ගත්තේය.

පරිච්ඡේද 2-3 : මෝසෙස් තම පරිසරය විශ්ලේෂණය කොට එයට වැරදි අයුරින් ප්‍රතිචාර දක්වා, කාන්තාරයට පළා ගියේය.

පරිච්ඡේද 6:9 : ඉශ්‍රායෙල් ජනතාව දෙවියන්වහන්සේගේ පණිවුඩය කෙරෙහි ප්‍රතිචාර දැක්වීමට පරිසරය මගින් ඇති කළ බලපෑම සලකා බලන්න.

පරිච්ඡේද 7-13 : ඵාරාවෝ නිසියාකාරව පරිසරය විශ්ලේෂණය කළෙහි නම්, ඔහු සමඟ දෙවියන්වහන්සේගේ ක්‍රියා කිරීම නිසි ලෙස වටහා ගෙන නිසියාකාරව එයට ප්‍රතිචාර දක්වන්නට ඇත.

පරිච්ඡේද 14 : ස්වාභාවික තර්ක වලට අනුව පරිසරය විශ්ලේෂණය කිරීම නිසා ඉශ්‍රායෙල් ජනතාව අතර මං විය. දෙවියන්වහන්සේ මැදිහත්කම් කොට ඔව්හු මුදා ගත් සේක. අපහට ස්වාභාවික හේතු සාධක මත පමණක් පිහිටා අවස්ථාවන් විශ්ලේෂණය කළ නොහැක.

පරිච්ඡේද 15:22-27 : ඉශ්‍රායෙල් මාරාහි වතුර ළඟදී පරිසරයට ඔවුන් දැක්වූ ප්‍රතිචාරය කෙලෙසද? දෙවියන්වහන්සේ පරිසරය භාවිත කළේ කෙසේද?

පරිච්ඡේද 32 : ආරොන් තම පාපය පිළිබඳව ජනතාවට (පරිසරයට) දොස් තබයි.

පරිච්ඡේද 18:1-27 : පරිසරය පිළිබඳව යෙත්‍රෝගේ විශ්ලේෂණයෙන් නව සංවිධානය කිරීමක් බිහි විය.

## ලෙවී කථාව

ලෙවී කථාව පොත දෙවියන්වහන්සේ විසින් තම ජනතාවට දුන් ආඥා පිළිබඳ වාර්තාවයි. ඉන් නීති බොහොමයක් ස්වාභාවික පරිසරයට අදාළ ඒවාය. උදා: ආහාරපාන, සෞඛ්‍ය, පවිත්‍රතාවය යනාදිය. තව කිහිපයක් දේශපාලනමය පරිසරය හා සම්බන්ධ ඒවාය. උදා: අසමගිකම් හා ගැටලු නිරාකරණය කරන ක්‍රම වේ. තවත් කිහිපයක් ආත්මික පරිසරය හා සම්බන්ධ ඒවාය. උදා: ඔවුන්ගේ පාපය පිළිබඳව දෙවියන්වහන්සේ ගනුදෙනු කරන ක්‍රමය වේ.

## ගණන් කථාව

පරිච්ඡේද 13-14 : ආත්මික හා ස්වාභාවික විශ්ලේෂණය අතර වෙනස පෙන්නුම් කරයි. චර පුරුෂයන් දසදෙනෙක් තම ස්වාභාවික තර්කයට අනුව දේශය නිරීක්ෂණය කළහ. දෙදෙනෙක් ආත්මික අවබෝධයකින් යුතුව දේශය දෙස බලා විශ්ලේෂණය කළහ.

පරිච්ඡේද 16 : කෝරා අවස්ථාව විශ්ලේෂණය කොට අයහපත් තීරණයක් ගත්තේය. ඔහුගේ විශ්ලේෂණයේ වරද කුමක්ද?

පරිච්ඡේද 22-25: බාලාක් හා බාලාම්ගේ කථාව කියවන්න. බාලාක්ගේ විශ්ලේෂණයේ ප්‍රතිඵලය වූයේ ඔහු බාලාම්ගෙන් ඉල්ලීමක් කිරීමට යොමු වීමය.

> සටහන: නික්මයාම, ගණන් කථාව, ද්විතීය කථාව යන පොත් වල සඳහන් වනුයේ ඉශ්‍රායෙල් ජනතාවගේ බය හා අවිශ්වාසය නිසා දෙවියන්වහන්සේ ඔවුන්ට පොරොන්දු වූ දේශයට ඇතුළු වීමට ප්‍රතික්ෂේප කළ බැවින් කාන්තාරයේ ඔබ මොබ ගිය කාලයේ සිදුවූ කාරණා පිළිබඳවය. මෙසේ වසර හතළිහක් තුළ දෙවියන්වහන්සේගේ ජනතාව පරිසරය විශ්ලේෂණය කළ අයුරු හා ඒ සම්බන්ධව ක්‍රියා කළ ආකාරය පිළිබඳ මනා පාඩම් ඉගෙන ගත හැකිය.

## ද්විතීය කථාව

පරිච්ඡේද 1-4 : මෙම පරිච්ඡේදවල ඉශ්‍රායෙල්වරුන්ගේ ගමන පිළිබඳව ඓතිහාසික සමාලෝචනයක් ඉදිරිපත් කරයි. ඔව්හු දෙවියන්වහන්සේ සමඟ දැරූ සම්බන්ධතාවය කෙරෙහි පරිසරයත් ඔවුන් එයට දැක්වූ ප්‍රතිචාරයත් බැලපෑ ආකාරය සලකා බලන්න.

පරිච්ඡේද 6 : යහපත් මෙන්ම සශ්‍රීක පරිසරයක් ඔබ දෙවියන්වහන්සේ සමඟ දරන සම්බන්ධතාවය කෙරෙහි අසුබ ලෙස බලපෑ හැක්කේ කෙසේද?

## යෝෂුවා

පරිච්ඡේද 2 : චරපුරුෂයන් දෙදෙනෙකු සිදු කළ පාරිසරික විශ්ලේෂණය පළමුවරට ගණන් කථාව 13-14 හි සඳහන් චර පුරුෂයන්ගේ විශ්ලේෂණයෙන් වෙනස් වන ආකාරය සලකා බලන්න. විශ්ලේෂණය කිරීමකින් අනතුරුව බාධකවල ඇති තත්වය ඇදහිල්ල කිසි විටක අවතක්සේරු කොට නොසලකයි. ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලය හා සංසන්දනය කර බලන කල එම බාධක කුඩා ලෙස දකී.

පරිච්ඡේද 7 : යෝෂුවා ආත්මික පරිසරයට සංවේදීව නොසිටි බැවින් පරාජය අත් විඳීය.

පරිච්ඡේද 9 : දෙවියන්වහන්සේගේ මන්ත්‍රණයෙන් තොරව ස්වාභාවිකව පමණක් විශ්ලේෂණයෙහි යෙදීමේ ප්‍රතිඵල. මේ සඳහා 14 පදය සලකා බලන්න.

සටහන : යෝෂුවා පොතෙහි සඳහන් දේශය හිමි කර ගැනීම සඳහා වූ විවිධාකාරවූ සටන් උදෙසා සූදානම්වීමට පාරිසරික විශ්ලේෂණය ඉතා වැදගත් විය. සාමාන්‍යයෙන් සටන් සැලැස්ම පදනම් කරනු ලැබුවේ පාරිසරික විශ්ලේෂණයන් මතය. මෙය පැරණි ගිවිසුමෙහි බොහෝ සටන් පිළිබඳ සත්‍යයකි. මෙය ආත්මිකව අදාළ කර ගත හැකිද?

## විනිශ්චයකාරයන්ගේ පොත

විනිශ්චයකාරයන්ගේ පොත දෙවියන්වහන්සේගේ ජනතාව පාලනය කළාවූ රජවරුන් පිළිබඳ ඓතිහාසික වාර්තාවකි. සමහර රජවරු යහපත් වූ අතර තව සමහරු දුෂ්ට වූහ. එසේම දෙවියන්වහන්සේගේ ජනතාව බැඳීම් වලින් මුදා ගනු සඳහා දෙවියන්වහන්සේ විසින් ඔසවනු ලැබූ දේවභක්තික විනිශ්චයකාරවරුන් පිළිබඳව ද මෙම පොත වාර්තා කරයි. දේව භක්තික මෙන්ම අභක්තික නායකත්වය මගින් ජනතාව කෙරෙහි මෙන්ම පරිසරය කෙරෙහිද ඇති කරන ලද බලපෑම් මින් අවධාරණය කෙරේ. මෙලෙස ඔවුන්ගේ පරිසරයෙහි බලපෑම් වලට දෙවියන්වහන්සේගේ ජනතාව ප්‍රතිචාර දැක්වූ ආකාරය මත දෙවියන්වහන්සේ ඔවුනට ආත්මිකව ප්‍රතිචාර දක්වන ක්‍රමය තීරණය විය.

## රූත්

මෙම කෙටි පොත කියවා නයෝමි ඇගේ පරිසරය අධෛර්යයෙන් යුතුව විශ්ලේෂණය කළ ආකාරයත් රූත් ඇදහිල්ලෙන් ප්‍රතිචාර දැක්වූ ආකාරයත් (1 වන පරිච්ඡේදය) සලකා බලන්න. බෝවස් හා සම්බන්ධ සිදුවීමෙහිදී නයෝමි එය විශ්ලේෂණය කොට ප්‍රතිචාර දැක්වූ පිළිවෙළ හා බෝවස් රූත්ගේ පසුබිම විශ්ලේෂණය කළ ආකාරය පිළිබඳවත් සලකා බලන්න. බෝවස් රූත්ව මුදවා ගැනීම සඳහා තම සංස්කෘතියේ පරිසරයට අනුකූලව ක්‍රියා කළහ. (4 වන පරිච්ඡේදය)

## 1 සාමුවෙල්

2:11-3:21: ඒලී තම නිවැසියන් අතර ආත්මික තත්වය නිසි ලෙස විශ්ලේෂණය කර නොගත්තේය.

15:1-35: සාවුල් දේව ආඥාවට වඩා ස්වාභාවික ප්‍රඥාව මත පිහිටා විශ්ලේෂණය කළේය. එබැවින් ඔහුට රාජ්‍යය අහිමි විය.

## 2 සාමුවෙල්

12 පරිච්ඡේදය: නාතාන් අනාගතවක්තෘ විසින් බලවත් ආත්මික විශ්ලේෂණයක් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස දාවිත් තම පාපය පිළිබඳව පසුතැවිලි වීය.

## 1 රාජාවලිය

9:1-10:29: සාලමොන්ගේ ස්වාභාවික පරිසරය කෙබඳු වීද?

11:1-43: පරිසරය සාලමොන්ගේ ආත්මික භාවයට බලපෑවේ කෙසේද?

## 2 රාජාවලිය

මෙම පොත දෙවියන්වහන්සේගේ ජනතාව පාලනය කළ විවිධ රජවරු පිළිබඳ වාර්තාවකි. පරිසරය දේවභක්තික හා අදේවභක්තික නායකයන් මගින් බලපෑමට ලක් වූ අයුරු සලකා බලන්න. මෙය මනුෂ්‍යයන් කෙරෙහි කෙලෙස බලපෑවේද?

## 1 හා 2 ලේකම්

මෙම පොත්වල දෙවියන්වහන්සේගේ ජනතාවගේ ආගමික ඉතිහාසය වාර්තා කොට තිබේ. ඔබ මෙම පොත් කියවන අතර ආත්මික නායකයන් හා දුෂ්ට නායකයන් මගින් පරිසරයට එල්ලවූ බලපෑම් නිරීක්ෂණය කර බලන්න.

## එස්රා

එස්රා යෙරුසලමෙහි පරිසරය විශ්ලේෂණය කොට එහි දේව මාළිගාව නැවත ප්‍රතිසංස්කරණය කළ යුතු බව වටහා ගත්තේය. ප්‍රතිසංස්කරණ කාලය තුළ ඔහුට එම පරිසරයේ විසූ අයගෙන් බොහෝ එදිරිවාදිකම් පැන නැගුනි. මේ එක් එක් අවස්ථාවෙහිදී ඔහු ආත්මික දැක්මකින් යුතුව නියමාකාරයෙන් ප්‍රතිචාර දක්වීය. 9-10 පරිච්ඡේදවල දෙවියන්වහන්සේගේ ජනතාවගේ පාපය ඔහු විශ්ලේෂණය කළ ආකාරයත් එයට ප්‍රතිචාර දැක්වූ ආකාරයත් සලකා බලන්න.

## නෙහෙමියා

නෙහෙමියා නම් වූ මනුෂ්‍යයෙකු විසින් යෙරුසලමෙහි පවුරු නැවත ගොඩනැංවීම පිළිබඳ සඳහන් වන මෙම පොතෙහි පාරිසරික විශ්ලේෂණය අවධාරණය කොට තිබේ. විශේෂයෙන්ම 2:11-20 යෙරුසලමෙහි තත්වය පිළිබඳ ඔහුගේ විශ්ලේෂණය බලන්න. මුළු පොත පුරාම නෙහෙමියා පරිසරය විශ්ලේෂණය කොට අසුබවාදී සාධක කෙරෙහි ඇදහිල්ලෙන් ප්‍රතිචාර දැක්වීය. එසේ නොවිනි නම්, ස්වාමින්වහන්සේ උදෙසා ඔහුගේ කාර්යය බාධා වීමට ඉඩ තිබුනි.

## එස්තර්

2 පරිච්ඡේදය: මොර්දෙකයි යම් තත්වයක් විශ්ලේෂණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙසට, එස්තර් දෙවියන්වහන්සේ හට භාවිත කිරීමට හැකි වන පරිදි නිසි ස්ථානයෙහි සිටියාය.

3-9 පරිච්ඡේද : එස්තර් තමා සිටියාවූ පරිසරය විශ්ලේෂණය කොට මුළු ජාතියක් ගළවා ගැනීම සඳහා සැලැස්මක් සකස් කරන ලදි.

## යෝබ්

යෝබ් නම් වූ ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකු හට සාතන් ශාරීරිකව, මානසිකව, භෞතිකව, සමාජයීයව හා ආත්මිකව පහර දීම වාර්තා කරයි. යෝබ් තමාගේ තත්වය විශ්ලේෂණය කර බැලීය. ඔහුගේ මිත්‍රයෝ නුසුදුසු වූ ස්වාභාවික විශ්ලේෂණ කළෝය, පොත දෙවියන්වහන්සේගේම විශ්ලේෂණයකින් උච්චස්ථානය කරා ළං වෙයි.

## ගීතාවලිය

1:1-3: දේවභක්තික මනුෂ්‍යයාගේ පරිසරය විශ්ලේෂණය කොට ඇත.

3:6: පරිසරයෙහි බලවේගයකට බිය නොවන්න.

11:4-5, 14:2-3, 17:3 : දෙවියන්වහන්සේ මුළු මැවිල්ලම විශ්ලේෂණය කරයි.

19: 12, 14 පද පරිච්ඡේද 26, 51, 69 40:2-3, 119:59 : දාවිත් තමාවම විශ්ලේෂණය කර ගනිමින් සෑහෙන කාලය ගෙවීය. ගීතාවලියෙන් එවැනි අවස්ථා කිහිපයක් මෙහි දී ඇත.

පරිච්ඡේද 78, 105-107: ඉශ්‍රායෙල් ජාතිය විශ්ලේෂණය කිරීම.

පරිච්ඡේද 115: 4-8, 135:15-18, බොරු පිළිම විශ්ලේෂණය.

## හිතෝපදේශ

මෙම පොතෙහි බොහෝ ඡේද දුෂ්ඨ පරිසරය විශ්ලේෂණය කරමින් අනතුරු අඟවයි. (1:10-19, 2:10-22, 4:14-19, 7:6-27, 9:13-18 බලන්න)

පරිච්ඡේද 5, 14:7 : සමහර පරිසර වලින් අප පලා යා යුතුය. (විශේෂයෙන්ම 5:8 සලකා බලන්න)

6: 6-11 : කුහුඹුවාගේ පරිසරය අධ්‍යයනය කර ඉගෙන ගත හැකි දේ බලන්න.

6: 27-28, 22 :24-25 : ස්වාභාවික හා ආත්මික පරිසර යන දෙකම අපට බලපායි.

20:4 : ඔබගේ පාරිසරික විශ්ලේෂණය ඔබ කරන දෙයින් ඔබව වැළැක්වීමට ඉඩ නොතබන්න.

21:2 : දෙවියන්වහන්සේ අපගේ හදවත විශ්ලේෂණය කරන සේක.

21:29, 4: 26 : "තමාගේ මාර්ගය කල්පනා කර බලන්න" හා "නුඹේ පාද වල මාවත සමතලා කරන්න" යයි අපට පවසා තිබේ. මෙය පෞද්ගලික විශ්ලේෂණයකි.

24: 30-34 : අලසයාගේ කෙත විශ්ලේෂණය කර ඇත.

27:23 : "ඔබගේ රැළේ තරම දැනගෙන ඉන්න" යනු අප වගකීම දරන පුද්ගලයන් පිළිබඳව දැනගෙන වටහාගෙන පසුවන්න යනුයි.

## දේශනාකාරයා

මෙම පොත "අහස යට" දෙවියන්වහන්සේගෙන් තොරවූ ජීවිතය පිළිබඳ විශ්ලේෂණයකි. මෙහි කතෘ (සාලමොන්) වර්තමාන ලෝකයෙහි පරිසරයෙහි පවතින සෑම දෙයක්ම විශ්ලේෂණය කර ඒ සියල්ල නිෂ්ඵල බව සොයා ගනී. ඔහුගේ විශ්ලේෂණයෙහි නිගමනය දේශනාකාරයා 12: 13-14 හි සඳහන් වේ.

## සාලමොන්ගේ ගීතය

මෙම පොත අපහට විවාහයේ සම්බන්ධතාවය තුළින් උදාහරණවත් කරමින් ක්‍රිස්තුස්වහන්සේ සහ සභාව අතර පවතින සම්බන්ධතාවය පෙන්වා දෙයි. මනාලියා හා මනාලියගේ පෞද්ගලික විශ්ලේෂණ සලකා බලන්න.

## යෙසායා - දානියෙල්

යෙසායා සිට දානියෙල් දක්වා පොත් ප්‍රධාන අනාගතවකතෘවරු, නමින් හැඳින්වේ. එහි විවිධ අනාගතවකතෘවරු දේව ආනුභාවයෙන් යුක්තව විවිධ ජාතීන් උදෙසා දෙන ලද දීර්ඝ අනාගතවාක්‍ය ඇතුළත් වෙයි.

මෙම පොත් කියවා බලා එම ජාතීන් ජීවත් වූ පරිසරයන්හි පැවති පාපිෂ්ඨ බව සලකා බලන්න. ඔවුන්ගේ පාපිෂ්ඨ පරිසරයන් නිසා දෙවියන්වහන්සේ ඒ සමඟ ගනුදෙනු කිරීමට සැලසුම් කළ ආකාරය දක්වන අනාගතකීම් සටහන් කර තබන්න. එම ජාතීන්ගේ පරිසරවල පැවති සමහර කාරණා නූතන යුගයේ මෙලොවෙහි රටවල පවතී යයි ඔබට පෙනී යනවාද? දානියෙල් හා ඔහුගේ මිත්‍රයන් තිදෙනාගේ කථාව සහිත 1-3 පරිච්ඡේද හා 6 වෙනි පරිච්ඡේදය සලකා බලන්න. ඔව්හු දෙවියන්වහන්සේ සමඟ පැවති ආත්මික සම්බන්ධතාවයට හානි කිරීමට ඔවුන්ගේ පාපිෂ්ඨ පරිසරයට ඉඩ නෑරියෝය.

## හොෂෙයා - මලාකි

හොෂෙයා සිට මලාකි දක්වා පොත් "සුළු අනාගතවකතෘවරු" නමින් හඳුන්වනු ලැබේ. එසේ කිරීමට හේතුව ඔවුන්ගේ පණිවුඩ වටිනාකමින් සුළු නිසා නොව අනාගතවාක්‍ය කෙටි නිසාය.

මෙම අනාගතවක්තෘවරු දේව ආනුභාවය යටතෙහි විවිධ ජාතීන්ගේ පරිසරයන් විශ්ලේෂණය කළෝය. එම විවිධ පාපිෂ්ඨ පරිසරය හා සමඟ දෙවියන්වහන්සේ ගනුදෙනු කිරීමට සැලසුම් කළ ආකාරය සලකා බලමින් මෙම පොත් සමාලෝචනය කර බලන්න. එම ජාතීන්ගේ පරිසරයෙහි පැවති යම් කාරණා නූතන ලෝකයෙහිද තිබෙන බවට ඔබ දකින්නෙහි ද? ආමොස් 4: 6-13 හි දෙවියන්වහන්සේ තමාගේ ජනතාව සමඟ ක්‍රියා කිරීමට පරිසරය භාවිත කළ ආකාරය පැහැදිලි කර ඇති කොටස කියවා බලන්න. ඔව්හු තමුන්ගේ පරිසරය නිසියාකාරව විශ්ලේෂණය කොට පසුතැවිලි වී නම්, දෙවියන්වහන්සේ එයට ප්‍රතිචාර දක්වමින් සමාව දී සුවය ලබා දෙනු ඇත.

## ඔබගේ අධ්‍යයනය දිගටම පවත්වාගෙන යන්න...

පැරණි ගිවිසුමෙන් උපුටා ගත් මෙම කෙටි උදාහරණ මගින් පරිසරය නිසියාකාරව වටහා ගැනීම හා එයට නිසි ප්‍රතිචාර දැක්වීම කෙතරම් වැදගත් දැයි පෙන්වා දෙයි. දෙවියන්වහන්සේගේ ජනතාව . . .

> ... භය හා අවිශ්වාසයෙන් යුතුව පරිසරය විශ්ලේෂණය කළ විට හෝ කිසිම විශ්ලේෂණයක් නොකළ විට පරාජය වූහ.
>
> ... ආත්මික අවබෝධයකින් යුතුව පරිසරය විශ්ලේෂණය කළ විට මහත් ජයග්‍රහණ හිමි කර ගත්හ.
>
> ... ඔව්හු තම පරිසරයට ඔවුන්හට ආත්මිකව සුබවාදී ලෙසට මෙන්ම අසුබවාදී ලෙසටද බලපෑම් කිරීමට ඉඩ හළහ.
>
> ... ඔව්හු ජීවත් වූ පරිසරයට, වැඩ කළ හා සේවයෙහි යෙදුනු පරිසරයට බලපෑම් ඇති කළහ.

... තමුන්ගේ පරිසරයෙහි පැවති සංස්කෘතිය තුළ දෙවියන්වහන්සේගේ සැලැස්ම ඉටු කිරීමට සේවය කළහ.

පැරණි ගිවිසුමෙහි පාරිසරික විශ්ලේෂණ පිළිබඳ තව බොහෝ උදාහරණ ඇත. මෙම අධ්‍යයනය තවදුරටත් සිදු කරමින් විෂය පිළිබඳ ඔබගේම පෞද්ගලික සටහන් සාදාගෙන පුළුල් ලෙස මෙය ඉගෙන ගන්න.

# හතරවන පරිච්ඡේදය

# බයිබලීය පදනම : නව ගිවිසුම

**අරමුණ :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් අනතුරුව ඔබ හට :

- නව ගිවිසුමෙහි ඇතුළත් පාරිසරික විශ්ලේෂණ හඳුනා ගැනීමට හැකි වනු ඇත.

## හැඳින්වීම

මින් පෙර පරිච්ඡේදයෙහි ඔබ පාරිසරික විශ්ලේෂණය පිළිබඳ පැරණි ගිවිසුමෙහි පදනම අධ්‍යයනය කළෙහිය. මෙම පාඩමෙහිදී ඔබ නව ගිවිසුම් පදනම සමාලෝචනය කරනු ඇත.

(පසුගිය පාඩමෙහිදී මෙන්ම මෙම පාඩමෙහිදී ද එහි රටාව අනුව "ප්‍රධාන පදයක්", "ස්වයං-පරීක්ෂණයක්" හා "වැඩිදුර අධ්‍යයනයක" යන අංග ඇතුළත් නොවේ)

පාරිසරික විශ්ලේෂණය පිළිබඳ නව ගිවිසුම් උදාහරණ කිහිපයක් පහතින් දැක්වේ.

## ශුභාරංචි පොත්

### මතෙව්, මාර්ක්, ලූක් සහ යොහන්

ශුභාරංචි, යේසුස්වහන්සේගේ සේවා කාලයෙහි පැවති පරිසරය පිළිබඳ වාර්තාවක් මෙන්ම උන්වහන්සේ පරිසරය පිළිබඳ විශ්ලේෂණය භාවිත කිරීම පිළිබඳ වාර්තාවකි. එම හේතුව නිසා මෙම පොත් හතරම එක් කොට සලකා බලමු. ශුභාරංචි වල යේසුස්වහන්සේගේ සේවය කෙරෙහි අවධානය යොමු කරන්න. විශේෂයෙන්ම යේසුස්වහන්සේ පහත සඳහන් දෑ පිළිබඳව ක්‍රියා කළ අයුරු සලකා බලන්න.

එනම්,

> ... මනුෂ්‍යයන්ගේ අවශ්‍යතා හඳුනාගැනීමට හා ඒවා සැපයීමට පරිසරය විශ්ලේෂණය කළ ආකාරය
>
> ... උන්වහන්සේව උගුලට අසුනොවන පිණිස උන්වහන්සේගේ විවේචකයන්ගේ ප්‍රශ්න විශ්ලේෂණය කළ ආකාරය.
>
> ... මනුෂ්‍යයන්ගේ සිතුවිලි හා ක්‍රියා විශ්ලේෂණය කළ සේක. (උදා: ලෙස: තමාගේ වස්තුව නිසා යේසුස්වහන්සේගේ කැඳවීමට යහපත් ප්‍රතිචාරයක් නොදැක්වූ යෞවනයා, යූදස්ගේ පරමාර්ථය හා සැලසුම්, පේතෘස්ගේ කැපවීමෙහි සත්‍ය මට්ටම... යනාදිය)
>
> ... උන්වහන්සේ මෙහෙ කළාවූ නුවරවල වර්තමාන තත්වය විශ්ලේෂණය කොට බැලීය. (උදා : මතෙව් 23:37-39, ලූක් 13:34-35, සහ මතෙව් 11:21-24)

ශුභාරංචි පොත් අපහට ක්‍රිස්තුස්වහන්සේගේ වකවානුවෙහි පැවති ආගමික පරිසරය පිළිබඳ විශ්ලේෂණයක් සපයයි ලියන්නෝ, පරිසිවරු හා සද්දුසිවරු පිළිබඳව සපයා දී ඇති තොරතුරුවලට අනුව පෙන්නුම් වන්නේ කුමක්ද?

පාරිසරික විශ්ලේෂණය සම්බන්ධ විවිධ ආකාර වූ තොරතුරු ඇතුළත් පද කිහිපයක් පහතින් දැක්වේ.

මතෙව් 7:15-20 : සත්‍ය වූත් අසත්‍ය වූත් සේවාවන් විශ්ලේෂණය කිරීමට ක්‍රමය

මතෙව් 13 : සරු පසක් හඳුනාගැනීමට විශ්ලේෂණය කිරීම.

මතෙව් 10:5-15, මාර්ක් 6:10-11 : ඔබ සේවය කරන කළ පරිසරය විශ්ලේෂණය කොට ගැළපෙන අයුරින් ප්‍රතිචාර දක්වන්න.

මාර්ක් 13:5-37 : පොළොවහි අනාගත තත්වය පිළිබඳ විශ්ලේෂණය.

ලූක් 14:7-14, 28-32 : පාරිසරික විශ්ලේෂණවල වැදගත්කම තහවුරු කරන උදාහරණ.

## ක්‍රියා පොත

2:41-47, 5:42 : යෙරුසලමෙහි පළමුවන සභාවේ ආත්මික පරිසරය මෙම පදවලින් විශ්ලේෂණය කෙරේ.

6:1-6 : ප්‍රථම උපස්ථාදායකයින් තෝරා ගැනීම සඳහා අවශ්‍ය වූ විට ඒ පිළිබඳ කළාවූ විශ්ලේෂණය.

6:7 : යෙරුසලම පිළිබඳ විශ්ලේෂණය.

8:17-24 : සීමොන් නම් මනුෂ්‍යයෙකු පිළිබඳ පේතෘස්ගේ විශ්ලේෂණය.

10:34-11:18 : දෙවියන්වහන්සේ අන්‍යජාතීන් මධ්‍යයෙහි ක්‍රියා කිරීම පිළිබඳ පේතෘස්ගේ විශ්ලේෂණය.

11:27-30 : යුදයෙහි පැවති තත්වය පිළිබඳ විශ්ලේෂණය.

13-28 පරිච්ඡේද : මෙම පරිච්ඡේද වලදී පාවුල් බොහෝ නගර වල සංචාරය කරමින් විවිධ ආකාරයෙහි ජනකොටස් වලට මෙහෙ කළේය. එම විවිධ පරිසරයන් පාවුල් විශ්ලේෂණය කළ ආකාරයත්, එයට ගැළපෙන ලෙස ශුභාරංචිය හැසිරවූ ආකාරයත් සලකා බලන්න.

27 පරිච්ඡේදය : ප්‍රතිවිරුද්ධ වූ විශ්ලේෂණ දෙකක් හා එහි ප්‍රතිඵල.

## රෝම පොත

1:7-8 : පාවුල් රෝම වැසියන්ව විශ්ලේෂණය කරයි. ඔවුන් පිළිබඳව පාවුල් පැවසූ කාරණා තුන මොනවාද?

1:21-32 : දේව මහිමයෙන් පහතට වැටී සිටින දුෂ්ඨ මනුෂ්‍යයන්ගේ පරිසරය පිළිබඳ විස්තරයක්.

3:9-19, 23, 5:12 : දෙවියන්වහන්සේගෙන් තොර ලෝකය පිළිබඳ විශ්ලේෂණය.

10:1-3, 21 : ඉශ්‍රායෙල් ජාතිය පිළිබඳ විශ්ලේෂණය.

11:2-4 : එලියා ප්‍රොපේතවරයාගේ විශ්ලේෂණය නැවත මතක් කිරීම.

16:17-18 : සභාවෙහි බෙදීම් ඇති කරන්නන් පිළිබඳ විශ්ලේෂණයක් කිරීම.

## 1 කොරින්ති

8 පරිච්ඡේදය : පාවුල් බොරු දෙවිවරු ( රූප ) විශ්ලේෂණය කරයි.

9:19-22 : පාවුල්ගේ පෞද්ගලික විශ්ලේෂණය.

10:27-33 : ඔබගේ පරිසරය ප්‍රවේශමෙන් විශ්ලේෂණය කරන්න. ඔබගේ ක්‍රියා තුළින් අන් අයට බාධාවක් නොවන්න.

16:8-9 : එපීස නුවර පිළිබඳ විශ්ලේෂණය.

## 2 කොරින්ති

1:8-9 : ආසියාව පිළිබඳ විශ්ලේෂණය.

2:12-13, 7:5, 8:1-5, 11:9 : මකිදෝනිය පිළිබඳ විශ්ලේෂණය.

4:7, 5:17 : ක්‍රිස්තුස්වහන්සේගේ ඇදහිලිවතුන් පිළිබඳ විශ්ලේෂණය.

9:1-4 : අකාය පිළිබඳ විශ්ලේෂණය.

1 වෙනි හා 2 වෙනි කොරින්ති පොත් වල පාවුල් තුමා කොරින්තියේ සභාව විශ්ලේෂණය කරයි. ඔහුගේ විශ්ලේෂණයෙන් එහි සභාව පිළිබඳව ඔබ ඉගෙන ගත්තේ මොනවාද?

## ගලාති

1:6-7 3:1-5 4:9-20 5:1, 7-8 6:15 : මෙම පදවල සපයා ඇති තොරතුරු වලට අනුව ගලාතියෙහි සභාව පිළිබඳ එළිදරව් වන්නේ මොනවාද?

1:4 : නූතන ලෝකය පිළිබඳ විශ්ලේෂණය.

1:11-2:21 : පාවුල් තුමා පිළිබඳව කළාවූ විශ්ලේෂණය.

3 පරිච්ඡේදය : ආබ්‍රහම් තුමා පිළිබඳව කළාවූ විශ්ලේෂණය.

5:16-21, 6:7-8 : මාංශයෙන් පාලනය වූ ජීවිතයක් පිළිබඳ විශ්ලේෂණය.

5:22-26 : දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ විසින් පාලනය වූ ජීවිතයක් විශ්ලේෂණය කිරීම.

6:3 : ඔබ ඔබව විශ්ලේෂණය කරන ආකාරය ගැන ප්‍රවේසම් වන්න.

## එපීස

1:3 : ඇදහිලිවතුන්ට ක්‍රිස්තුස්වහන්සේ තුළ හිමිවන්නාවූ ආත්මික ආශිර්වාද පිළිබඳ පාවුල්තුමාගේ විශ්ලේෂණය වේ. ඔහු එපීස පොතෙහි මින් කිහිපයක්ම හඳුන්වා දෙයි. පහත සඳහන් පරිච්ඡේද වල පාවුල් තුමාගේ විශ්ලේෂණයට අනුව එහි ලැයිස්තුවක් පිළියෙල කරන්න.

2:1-3, 11-12 : ස්වාමින්වහන්සේව හඳුනාගැනීමට පෙර "පසුගිය කාලවලදී" අපගේ ස්වරූපය කෙලෙස වීද? විශ්ලේෂණය.

2:4-10, 13-22 : දැන් අපි යේසුස්වහන්සේව දන්නා බැවින් අපගේ ස්වභාවය කෙලෙසද යන වග.

3:7-8, 4:1, 6:19-20 : පාවුල් තුමා පිළිබඳ පෞද්ගලික විශ්ලේෂණය.

4:3-6 : එකම සත්‍ය වූ කිස්තුස්වහන්සේගේ ශරීරය පිළිබඳ විශ්ලේෂණය.

4:11-16 : ආත්මික දීමනාවල පරමාර්ථය විශ්ලේෂණය කිරීම.

4:17-5:9 : "පසුගිය කාලවලදී" අපගේ හැසිරීම හා ඇදහිලිවතුන් ලෙසට හැසිරීමට දී ඇති උපදෙස් අතර ප්‍රතිවිරුද්ධතාවය පිළිබඳ පාවුල්ගේ විශ්ලේෂණය අධ්‍යයනය කරන්න.

6:11-18 : අපගේ සත්‍ය වූ ආත්මික සතුරන් පිළිබඳ මෙම විශ්ලේෂණයෙන් එළිදරව් වන්නේ මොනවාද?

## පිලිප්පි

1:12-14, 19 : පාවුල් තුමා තමාගේ වාතාවරණය පිළිබඳ කළ විශ්ලේෂණය.

1:15-18 : සේවය සඳහා විවිධ අදහස් පිළිබඳ කළ විශ්ලේෂණය.

1:20-25 : මරණයෙහි හා ජීවනයෙහි වාසි පිළිබඳ කළ විශ්ලේෂණය.

2:5-8 : යේසුස්වහන්සේගේ මනස පිළිබඳ කළ විශ්ලේෂණය.

2:25-30 : පාවුල් තුමාගේ මිතුරා වන එපප්‍රොදිතස් පිළිබඳ කළ විශ්ලේෂණය.

3:3-14 : පාවුල්ගේ පෞද්ගලික විශ්ලේෂණය.

3:18-21 : කුරුසියෙහි සතුරන් පිළිබඳ විශ්ලේෂණය.

4:11-13 පාවුල් තුමා තමාගේ වාතාවරණය විශ්ලේෂණය කර බලා ඒ අනුව ක්‍රියා කළ ආකාරය.

4:14-18 : පාවුල් තුමා මෙම පදවල සපයන තොරතුරු වලට අනුව පිලිප්පියෙහි සභාව පිළිබඳව ඔබට ඉගෙන ගත හැකි කරුණු මොනවාද?

## කොලොස්සි

කොලොස්සි සභාවෙහි ඇදහිලිවතුන් ලෙසින් ප්‍රකාශ කරන්නාවූ කොටසක් වැරදි ඉගැන්වීම් ගෙන ආවෝය. කොලොස්සි සභාවෙහි සිදුවීම පිළිබඳව පාවුල්ගේ විශ්ලේෂණයට අනුව ඔබට පෙනී යන කරුණු මොනවාද? ඔහුගේ විශ්ලේෂණය එම තත්වය විසඳීමට ඔහුට උපකාරී වූයේ කෙසේද? එම සිදුවීම නිවැරදි කිරීමට හා බොරු ධර්ම වලින් වැළකී සිටීමට පාවුල් දෙන අණ කුමක්ද?

## 1 සහ 2 තෙසලෝනික

මෙම පොත් වල සපයා ඇති තොරතුරු ඇසුරින් තෙසලෝනික සභාව පිළිබඳව ඔබට ඉගෙන ගත හැක්කේ මොනවාද? පාවුල් තුමා මෙම සභාවෙහි පැවති බවට පැසසුම් කරන යහපත් කාරණා මොනවාද? ඔව්හු තවදුරටත් දියුණු විය යුතු අංශ මොනවාද?

## 1 තිමෝති

1 සහ 2 තිමෝති නම්, තරුණ දේව සේවකයෙකු හට ලියූ පොත්ය. පොත් දෙකම කියවා, සාර්ථක ලෙස ශුභාරංචිය පකාශ කරන සේවකයෙකු තුළ තිබිය යුතු ගුණාංග ලෙස පාවුල් විශ්ලේෂණය කරන කාරණා නිරීක්ෂණය කර බලන්න.

1:4-7 : සමහර මනුෂ්‍යයන්ව සත්‍ය ශුභාරංචියෙන් ඈත් කරන හේතු කිහිපයක් විශ්ලේෂණය කිරීම.

1:8-10 : ව්‍යවස්ථාවෙහි පරමාර්ථය විශ්ලේෂණය කිරීම.

1:11-16, 2:7 : පාවුල් තුමා විසින් ස්වයං විශ්ලේෂණය.

1:18-20 : පාවුල් තුමා මෙම පදවල සඳහන් කරන විශ්ලේෂණයට අනුව හිමේනියස් හා අලෙක්සැන්දර් පිළිබඳව ඔබට ඉගෙන ගත හැකි කාරණා මොනවාද?

3:1-13 : සභා නායකයන් සඳහා අවශ්‍ය වන්නාවූ ගුණාංග පිළිබඳ විශ්ලේෂණය.

4:1-5 : අවසාන කාලයෙහි තත්වයන් පිළිබඳ විශ්ලේෂණය.

4:6-6:21 : තිමෝති දෙවියන්වහන්සේගේ යහපත් දාසයෙකු බවට පත් කරන්නාවූ කාරණා පිළිබඳ පාවුල් තුමාගේ විශ්ලේෂණය.

## 2 තිමෝති

1:5-6, 13-14, 3:15 : මෙම පදවල සඳහන් තොරතුරු ඇසුරින් තිමෝතිගේ පරිසරය පිළිබඳව ඔබට ඉගෙන ගත හැකි කරුණු මොනවාද?

1:11-12, 2:9-10, 3:10-11, 4:6-8, 18 : පාවුල්ගේ ස්වයං විශ්ලේෂණය.

1:15-18 :ආසියාවෙහි පැවති තත්වය හා ඔනෙසිපොරස් නම් මනුෂ්‍යයෙකු පිළිබඳ විශ්ලේෂණය.

3:1-9, 13, 4:3-5 : අවසාන කාලය පිළිබඳ විශ්ලේෂණය.

3:16-17 : දේව වචනයෙහි පරමාර්ථය පිළිබඳ විශ්ලේෂණය.

4:9-17 : පාවුල් තුමා සම්බන්ධව සිටි විවිධ පුද්ගලයින් පිළිබඳ විශ්ලේෂණය.

## තීතස්

තීතස් පොත පාවුල් තුමා ලියන ලද්දේ තරුණ දේව සේවකයෙකු සඳහාය. ශුභාරංචියෙහි යහපත් දාසයෙකු වීමට තිබිය යුතු අවශ්‍යතා ලෙස පාවුල් විශ්ලේෂණය කරනුයේ මොනවාද? එයට අමතරව පහත සඳහන් ඡේද අධ්‍යයනය කරන්න. එනම්:

1:9-16, 3:10-11 : දේව භක්තික නොවන මනුෂ්‍යයන් පිළිබඳ විශ්ලේෂණය.

3:3-7 :"අප දැනට" ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින තැන හා "පෙරසිටි" තත්වය සංසන්දනාත්මකව විශ්ලේෂණය.

## පිලෙමොන්

එක් පරිච්ඡේදයකින් යුත් මෙම කෙටි පොත කියවන්න. මෙම පදවල සඳහන් තොරතුරු මත පදනම් වී පාවුල් තුමා ක්‍රියා කළ වාතාවරණය, සිදුවීම ඔබට විශ්ලේෂණය කළ හැකිද?

## හෙබ්‍රෙව්

3-4 පරිච්ඡේද : දෙවියන්වහන්සේගේ යහපත් කාරණා වලට ඉශ්‍රායෙල් හට ඇතුළු වීමට නොහැකි වීමට හේතුව විශ්ලේෂණය කිරීම.

5:12-14 : දේව වචනයෙහි දක්ෂ නොවන ඇදහිලිවතුන් පිළිබඳ විශ්ලේෂණය.

7 පරිච්ඡේදය : මාංශයෙහි ජීවිතයෙහි පොරබැදීම් පිළිබඳ විශ්ලේෂණය.

8 පරිච්ඡේදය : ආත්මයාණන් තුළ ජීවනය පිළිබඳ පරස්පර විශ්ලේෂණය.

11 පරිච්ඡේදය : දෙවියන්වහන්සේ තුළ ශ්‍රේෂ්ඨ ස්ත්‍රී පුරුෂයන්ගේ ජීවිත තුළ පැවති ඇදහිල්ල හා එහි වැදගත්කම විශ්ලේෂණය කිරීම.

12 පරිච්ඡේදය : තරවටු කිරීමේ පරමාර්ථය විශ්ලේෂණය කිරීම.

හෙබ්‍රෙව් පොත මිනිසා සමඟ දෙවියන්වහන්සේ ඇති කරගත් පැරණි ගිවිසුම හා නව ගිවිසුම ඉදිරිපත් කරයි. මිනිසා සමඟ එතුමාගේ සම්බන්ධතාවයෙහි විවිධ සැලසුම් විශ්ලේෂණය කරයි.

## යාකොබ්

1:6-8 : දෙසිත් ඇති මිනිසා පිළිබඳ විශ්ලේෂණය.

1:12-14 : පරීක්ෂාවේ පරිසරයන් පිළිබඳ විශ්ලේෂණය.

1:17 : සියලු යහපත් දීමනා වල උල්පත පිළිබඳ විශ්ලේෂණය.

1:27 : පවිත්‍ර ආගමක පදනම් පිළිබඳ විශ්ලේෂණය.

2:1-9 : විශ්ලේෂණය අනිසි ලෙස භාවිතය.

2:20-24 : ආබ්‍රහම් පිළිබඳ පෞද්ගලික විශ්ලේෂණය.

2:25-26 : රාහබ් පිළිබඳ පෞද්ගලික විශ්ලේෂණය.

3:1-13 : අපගේ පරිසරයට බලපාන අපගේම දිව පිළිබඳ බිය උපදවන විශ්ලේෂණය.

3:14-16 : වියවුල් පවතින පරිසරයන් පිළිබඳ විශ්ලේෂණය.

4:1-3 : යුද්ධ හා සටන් බිහි වන තත්වයන් පිළිබඳ විශ්ලේෂණය.

5:1-6 : පොහොසත් මනුෂ්‍යයන් පිළිබඳ විශ්ලේෂණය.

5:16-18 : එලියා පිළිබඳ පෞද්ගලික විශ්ලේෂණය.

## 1 පේතෘස්

මෙම පරිච්ඡේදවල පේතෘස් දුක් විඳීමේ පරිසරය පිළිබඳ ගනුදෙනු කරයි. ඔහුගේ විශ්ලේෂණයට අනුව දුක් විඳීමේ පරිසරයේ පරමාර්ථය, ප්‍රතිඵල හා ඇදහිලිවතුන් හැටියට එයට දැක්විය යුතු ආකල්පය පිළිබඳව ඔහු එළිදරව් කරනුයේ කුමක්ද? පොත නැවතත් කියවා දේව භක්තික හැසිරීම තුළින් සභාව තුළ සුදුසු වාතාවරණයක් බිහි කිරීමට ඇදහිලිවතුන්ට දී ඇති උපදෙස් පිළිබඳ සලකා බලන්න.

## 2 පේතෘස්

2-3 පරිච්ඡේද : වංචාකාර වූ මිනිසුන් පිළිබඳ විශ්ලේෂණය.

යූද්ගේ සහ පේතෘස්ගේ විශ්ලේෂණය සංසන්දනය කර බලන්න.

## 1 යොහන්

ඔබ සැබවින්ම දෙවියන්වහන්සේ දනියිද කියා දැනගැනීමට හැකි ක්‍රම කිහිපයක් යොහන් සපයයි. 1 යොහන් පොත කියවා මේවා ලැයිස්තුවක් සාදන්න.

1:6-10 : ස්වයං-විශ්ලේෂණයේ ඇති වැදගත්කම.

2:15-17, 5:19 : ලෝකය විශ්ලේෂණය කිරීම.

2:18-19 : අන්ත ක්‍රිස්තුස්ගේ ආත්මය සහිත අය විශ්ලේෂණය කරන හා හඳුනා ගන්නා ක්‍රමය.

4:1-6 : මෙම උපදෙස් මත පදනම් වී ඇති ආත්ම විශ්ලේෂණය.

5:4 : ඕනෑම පරිසරයකින් ජයගන්නා ක්‍රමය.

## 2 යොහන්

4 පදය : ඔහුගේ ලිපිය ලද ඇදහිලිවන්තයින් පිළිබඳ විශ්ලේෂණය.

7-11 පද : වංචාකාරයන් පිළිබඳ විශ්ලේෂණය.

## 3 යොහන්

1, 3-8 පද : ගායස් නම් මනුෂ්‍යයෙකු පිළිබඳ විශ්ලේෂණය.

9-12 පද : දිමේත්‍රියස් සහ දියෝත්‍රෙපස්ගේ වෙනස් වූ ආදර්ශ විශ්ලේෂණය කිරීම.

## යූද්

4 පදය :"මනුෂ්‍යයන් වගයක්" පිළිබඳ විශ්ලේෂණය ඇරඹී මුළු පරිච්ඡේදය පුරාවට අවධානය යොමු වේ. මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් මෙම මනුෂ්‍යයන් පිළිබඳව අප ඉගෙන ගන්නේ මොනවාද?

5 පදය : ඊජිප්තුව පිළිබඳ විශ්ලේෂණය.

6 පදය : නපුරු දේව දූතයන් පිළිබඳ විශ්ලේෂණය.

7 පදය : සොදොම සහ ගොමෝරාව පිළිබඳ විශ්ලේෂණය.

## එළිදරව්

අප දැන් දන්නා ආකාරයට, එළිදරව් පොත මෙලොවෙහි අවසාන කාලයෙහි සිදුවීම් පිළිබඳ තත්වයන් විශ්ලේෂණය කිරීමකි. පොත මුළුමනින්ම කියවා එම තත්වයන් සටහන් කර ගන්න.

2-3 පරිච්ඡේද : ආසියාවෙහි සභා සතෙහි පරිසරයන් පිළිබඳ විශ්ලේෂණයකි. මෙහි සඳහන් කිසියම් ගුණාංග නූතන සභාවේ ඔබට දැකිය හැකිද?

21-22 පරිච්ඡේද : දෙවියන්වහන්සේ මැවීමට යන නව අහසේ හා නව පොළොවේ පරිසරය පිළිබඳ විශ්ලේෂණය.

# පස්වැනි පරිච්ඡේදය

# පෞද්ගලික පාරිසරික විශ්ලේෂණය

### අරමුණුඃ

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කළ විට ඔබහට පහත සඳහන් දේ කිරීමට හැකි වනු ඇත.
එනම් :

- ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න
- "පුද්ගලික පාරිසරික විශ්ලේෂණය" පැහැදිලි කරන්න
- පුද්ගලික පාරිසරික විශ්ලේෂණයක ඇතුළත් වන්නේ කුමක්ද කියා සවිස්තරව පැහැදිලි කිරීම
- පුද්ගලික පාරිසරික විශ්ලේෂණයක අරමුණු හඳුන්වන්න
- පුද්ගලික පාරිසරික විශ්ලේෂණයක් කරන්න
- ඔබේ විශ්ලේෂණයේ ප්‍රතිඵල ඔබේ සේවය ඉටුකිරීමට භාවිත කරන්න

### ප්‍රධාන පදයඃ

**නුඹලා ඇදහිල්ලෙහි සිටිනවාද කියා නුඹලාම පරීක්ෂා කර බලාපල්ලාඃ (2 කොරින්ති 13:5)**

## හැඳින්වීම

ඔබ පාරිසරික විශ්ලේෂණයට හැඳින්වීමක් ලබාගෙන එහි බයිබලය සම්බන්ධ පදනම පරීක්ෂාකර ඇත. මෙම පරිච්ඡේදයන් සමඟ, විවිධ පරිසර විශ්ලේෂණය කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන පාඩම් මාලාවක් ඔබ ආරම්භ කරන්නේය. එක පාඩමක් අනෙක මත ගොඩනැගෙන නිසා ඊළඟ පාඩමට යන්න පෙර එක් එක් පාඩම සම්පූර්ණ කරන්න. පුද්ගලීක පාරිසරික විශ්ලේෂණයක් කරන්නේ කෙසේදැයි මෙම පාඩමේ ඔබ ඉගෙන ගන්නේය.

## පුද්ගලික පාරිසරික විශ්ලේෂණය

පුද්ගලික පාරිසරික විශ්ලේෂණයක් යනු ඔබේම පරිසරය පිළිබඳ අධ්‍යයනයකි. ඔබේ ජීවිතේ සෑම කොටසකම විශ්ලේෂණයක් එයට ඇතුළත් වන අතර ඔබේ සම්බන්ධතා ඔබේ භෞතික, අධ්‍යාපනික මූල්‍ය සහ ආත්මික පරිසරද මෙයට ඇතුළත් වේ.

## පුද්ගලීක විශ්ලේෂණයේ අරමුණ

පුද්ගලීක විශ්ලේෂණයේ අරමුණු මෙසේයඃ

## ඔබේ ආත්මික තත්වය තීන්දු කරගැනීමටඃ

ඔබේ ආත්මික තත්ත්වය නිශ්චිත කර ගැනීමට ඔබ ඔබවම පරීක්ෂා කළ යුතු යැයි බයිබලය සඳහන් කරයි.

**නුඹලා ඇදහිල්ලෙහි සිටිනවාද කියා නුඹලාම පරීක්ෂා කර බලාපල්ලා: නුඹලාවම සෝදිසි කර බලාපල්ලා (2 කොරින්ති 13:5)**
**නුමුත් එක් එක්කෙනා තම තමාම සෝදිසිකොට ... (1 කොරින්ති 11:28)**

"ඇදහිල්ලට" සම්බන්ධව ඔබ ඔබවම පරීක්ෂා කළ යුතුයි. මෙයින් අදහස්වන්නේ දේව වචනය පදනම් කරගෙන ඔබගේ අධ්‍යාත්මික තත්වය විශ්ලේෂණය කිරීමයි. "සෝදිසි කිරීම (ඔප්පු කිරීම)" යනු පරීක්ෂා කිරීමට තව වචනයකි. බයිබලයේ මෙසේ සදහන් වේ.:

**සියල්ල සෝදිසිකර බලා යහපත් දේ තදින් අල්ලාගනිල්ලා: (1 තෙසලෝනික 5:21)**

ඔබ ඔබවම සෝදිසි කර ගැනීමට ඔබේ ජීවිතයේ ආත්මික විශ්ලේෂණයක්ද ඇතුළත් වන නමුත් එයට ප්‍රායෝගික අංශවල විශ්ලේෂණයක්ද ඇතුළත් වේ. ඔබේ කායික තත්වය, මුදල් අධ්‍යාපනය, ආදිය වැනි දේවල් මෙයට ඇතුළත් වේ. ඔබේ ජීවිතයේ "සෑමදේම" ඔබ "සෝදිසි කිරීම" හෝ පරීක්ෂා කිරීම අවශ්‍යය.

මිනිසාට ශරීරයක්, ප්‍රාණයක් සහ ආත්මයක් ඇත. ශරීරයට සිදුවන දේ ඔබගේ ආත්මික තත්ත්වයට බලපාන්නේය. ප්‍රාණයේ සහ ආත්මයේ තත්ත්වය අධ්‍යාත්මික ශරීරයට බලපාන්න පුළුවන. "ඔබ සියල්ල" පරීක්ෂාකරන්නේ මේ නිසා වේ.

තවද ජීවිතයේ සෑම කොටසක්ම පරීක්ෂා කිරීම වැදගත් වන්නේ ජීවිතයේ ප්‍රායෝගික කාරණා පිළිබද ඇත්තාවූ සැලකිලි දේව සැලැස්මට බාධා කරන්න පුළුවන් නිසාය. ලෞකික දේට ඔබේ ජීවිතය තුළ දේව වචනයේ ක්‍රියාකාරිත්වයට බාධා කළ හැක:

**මේ ලෝකය සම්බන්ධ කරදරද වස්තු මායාවද අනිකුත් දේවලට තෘෂ්ණාවද පැමිණීම කරණකොටගෙන වචනය යට කරනු ලැබ එල නොදෙන්නෝ වෙති. (ශු. මාක් 4:19)**

ජීවිතයේ ප්‍රායෝගික කාරණා පිලිබද ඇත්තාවු සැලකිලි ආත්මික එලදායීකත්වයට බාධා කළ හැක:

**කටු අතරේ වැටුණ ඒවා නම් වචනය අසා, තමුන්ගේ ජීවිත ගමනේ දී එහි වෙහෙසීම්වලින් ද වස්තුවෙන් ද සැප ජීවිකාවෙන් වචනය යටව, සම්පූර්ණ එල නොදරන්නෝය. (ශු. ලූක් 8:14)**

ජීවත්වීමේ කාරණාවලට පැටලීම ආත්මික සටනට බාධා කළ හැක.

**හේවාකම් කරන්නා වූ කිසිවෙක්, ඔහු හේවායෙකු මෙන් ලියාගත් අය සතුටු කරන පිණිස, මේ ජීවිතයේ කාරණාවලට පටලැවෙන්නේ නැත. (2 තිමෝති 2:4)**

ඔබ ස්වාමීන්වහන්සේගේ නැවත ඒමට හරියාකාරව සූදානම් නොවීමට තරම් ජීවිතයේ ප්‍රායෝගික කාරණාවලට ඔබව යටපත් කළ හැක.

**එහෙත් ඒ දවස මලපතක් මෙන් හදිසියෙන් නුඹලා කෙරේ නොපැමිණෙන පිණිස, අධික කෑමෙන් ද බීමත්කමින්ද මේ ජීවිතයේ වෙහෙසින්ද නුඹලාගේ සිත් බර නොවන හැටියට බලාගනිල්ලා. (ශු. ලූක් 21:34)**

"බලාගනිල්ලා" යන්නෙන් තේරුම් වන්නේ ජීවිතයේ සෑම අංශයකම ඔබ ස්වාමීන් වහන්සේගේ නැවත පැමිණීමට සූදානම් බව නිශ්චිත වන පිණිස ඔබ ඔබවම පරීක්ෂා කිරීමයි.

## ඔබේ ආත්මික  දුර්වලතා හඳුන්වා ගැනීමට:

ස්වෝත්සාහයෙන් තමාගේ තත්ත්වය දියුණු කරගැනීම ඔබේ දුර්වලතා හඳුන්වාගැනීමේ අරමුණ වන්නේ නැත. පාවුලුතුමා මෙසේ කිරීමට උත්සාහකර අසාර්ථක වුණ සැටි බලාගැනීමට රෝම හත්වැනි පරිච්ඡේදය කියවන්න. ඔබේ දුර්වලතා වෙනස් කිරීමට ඔබට තනියම කළ නොහැක.

ඔබේ දුර්වලතා හඳුනාගැනිමේ අරමුණ නම් ඔබගේ ජීවිතය වෙනස් කිරීමට දෙවියන්වහන්සේගේ ක්‍රියා පිළිවෙළ සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඔබ අවසර දීමටය. වෙනස්වීම ආරම්භ වන්නේ අලුතෙන් උපත ලැබීමේ අත්දැකීමත් සමඟය.

**එබැවින් යමෙක් ක්‍රිස්තුස් වහන්සේ තුළ  සිටින්නේ නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය, මෙන්න, සියල්ලම අලුත් වී තිබේ. (2 කොරින්ති 5:17)**

වෙනස්වීම් දිගටම සිදුවන්නේ ඔබේ පව් සහ දුර්වලතා දෙවියන්වහන්සේට කියාදෙමින් දෙවියන් වහන්සේගේ සමාව පිළිගැනීමෙන්ය:

**අපට පාපය නැතැයි කියමු නම්, අපි අපම රවටාගනිමුව, සැබෑවද අප තුළ නැත. අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක. (1 යොහන් 1:8-9)**

ඔබ වෙනස්වන්නේ ජීවිතයේ අවස්ථාවන් තුළින් ඔබව වෙනස්කිරීමේ දෙවියන්වහන්සේගේ ක්‍රියා පිළිවෙළ සමඟ ඔබ සහයෝගයෙන් කටයුතු කළ විටයි.

**තවද දෙවියන්වහන්සේට ප්‍රේමකරන්නන්ට, එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබූවන්ට, සියලු දේම යහපත පිණිස එකට ක්‍රියාකරන බව අපි දනිමුව. මක්නිසාද උන්වහන්සේ පූර්වයෙන් ඇඳිනගත්තවුන් තමන්වහන්සේගේ පුත්‍රයා බොහෝ සහෝදරයන් අතරේ කුලුඳුලා වන පිණිස, ඒ පුත්‍රයාණන්ගේ ස්වරූපයට සමානවෙන්ට පූර්වයෙන් නියම කළ සේක. (රෝම 8:28-29)**

"සියලු දේම" ජීවිතයේ යහපත් හා නපුරු අවස්ථාවන් යන දෙකම ඔබව යේසුස්වහන්සේගේ ප්‍රතිරූපයට අනුකූල කිරීමට දෙවියන්වහන්සේ විසින් භාවිතකරන සේක. ඔබ වෙනස්වන්නේ ඔබ ලෝකයේ මිම්මට වඩා දෙවියන්වහන්සේගේ මිම්මට අනුකූල වූ විටය.

**එබැවින් සාහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමාන වූ, ශුද්ධ වූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ යාගයක කොට ඔප්පුකරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි. එය නුඹලාගේ ආත්මික සේවය වේ. නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත් වූ පිළිගත යුතු වූ සම්පූර්ණ වූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස සිත අලුත් කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා. (රෝම 12:1-2)**

වෙනස්වීම් එන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය තුළින් පමණි. රෝම හත්වැනි පර්ච්ඡේදයේ ස්වෝත්සාහයෙන් තමාගේ තත්ත්වය දියුණු කර ගැනීමේදී පාවුලුතුමා අසාර්ථක විය. ඔහු වෙනස්වන්න සමත්වූයේ ආත්මයාණන්වහන්සේගේ බලය තුළ, ඔහුගේ ජයග්‍රහණය රෝම අටවැනි පර්ච්ඡේදයේ සටහන් කර තිබේ. මේ නිසා පාවුලුතුමා වාර්තා කළේ:

**උන්වහන්සේද: මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණවන්නේයයි මට කී සේක. එබැවින් ක්‍රිස්තුස්වහන්සේගේ ශක්තිය මා කෙරෙහි**

**පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටුකරන්නෙමි. එහෙයින් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා පැමිණෙන දුර්වලකම්වලටත් අන්තරායවලටත් හිගකම්වලටත් පීඩාවලටත්, විපත්තිවලටත් ප්‍රසන්නව සිටිමි. මක්නිසාද මම දුර්වලව සිටිනකලම ශක්තිමත්ව සිටිමි. (2 කොරින්ති 12:9-10)**

පාවුලුතුමා ඔහුගේ දුර්වලතා හඳුනා ගත්තේය. නමුත් ඒවාට ඔහුව අධෛර්යයමත් කිරීමට ඔහු ඉඩ දුන්නේ නැත. දෙවියන්වහන්සේගේ බලයට මෙම දුර්වලතා වෙනස් කිරීමට පුළුවන් බව ඔහු අවබෝධ කරගත්තේය. ඔබ ඔබගේ දුර්වලතා හඳුනාගෙන ඔබේ ජීවිතය වෙනස් කිරීමේ දෙවියන්වහන්සේගේ ක්‍රියා පිළිවෙළ සමඟ සහයෝගයෙන් කටයුතු නොකරන්නේ නම්, එවිට ඔබ දිගටම යළි යළිත් අසාර්ථක වේ.

## ඔබගේ අධ්‍යාත්මික හැකියාවන් (ශක්තීන්) හඳුන්වා ගැනීමට:

ඔබගේ දුර්වලතා දෙස යොමුවීමෙන් ඔබ සේවය ඵලදායී වන්නේ නැත. ඔබ ඵලදායි වන්නේ දෙවියන්වහන්සේ ඔබට දී තිබෙන අධ්‍යාත්මික හැකියාවන් අවධාරණය කිරීමෙනි. මතෙව් 25:14-30 හිදී තලෙන්ත පිළිබඳ උපමාවේ එක් එක් සේවකයාට යොමුවීමට තිබුණේ ඔහුට තිබූ දේ මත, මිස ඔහුට නොතිබූ දේ මත නොවේ.

ඔබ ඔබගේ අධ්‍යත්මික හැකියාවන් හඳුනාගන්නේ සේවය පිණිස මිස නිකමට ඔබගේ හැකියාවන් තුළ කීර්තිමත් වීමට නොවේ. ඉහත උපමාවේ දැක්වෙන ආකාරයට ඔබට තිබෙන සෑම හැකියාවක්ම දෙන ලද්දේ ස්වාමීන්වහන්සේ විසින්ය. මෙම උපමාවේ සේවකයන් මෙන්, අධ්‍යත්මික ශක්තීන්, තලෙන්ත සහ හැකියාවන් දේව මහිමය සඳහා භාවිත කිරීම ඔබගේ වගකීම වේ.

තවද මතක තබාගන්න. ඔබේ ශක්තීන් කොපමණක් හඳුන්වාගත්තත් තව දියුණුවීමට සෑමවිටම ඉඩ ඇත. පාවුලුතුමා ඔහුගේ ශක්තීන් විශ්ලේෂණය කළ නමුත් ඔහු ප්‍රකාශ කළේ ඔහු ජීවත්වූයේ,

**මා දැනටම ලබාගෙන සිටිනවාත් දැනටම සම්පූර්ණ වී සිටිනවාත් නොවේ. නුමුත් යමක් පිණිස ක්‍රිස්තුස් යේසුස්වහන්සේ මා අල්ලාලත් සේක්ද, ඒක අල්ලාගන්ට වීර්යකරමින් මමත් දුවගෙන යමි. සහෝදරයෙනි, මම තවමත් අල්ලාගත්තෙමියි නොසිතමි. නමුත් එකක් කරමි, එනම්, පසුසෙන් තිබෙන දේ මතකනැතිකොට ඉස්සරහට තිබෙන ඒවා දෙසම බලාගන යමින්, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ උතුම් කැඳවීමේ දිනුම පිණිස දිනුම්පළ කරා දුවමි.**

**එබැවින් අපෙන් යම් පමණ දෙනෙක් සම්පූර්ණව සිටිද්ද, ඔව්හු ඒ ආකාරයෙන් කල්පනා කරත්වා. (පිලිප්පි 3:12-15)**

ඔබ ඔබගේ අධ්‍යත්මික ශක්තීන් හඳුන්වාගන්නා විට සාර්ථකත්වය මැනෙන්නේ ඔබ කවුරුන් ද යන කාරණාව මත නොවන බව මතක තබාගන්න. එය මැනෙන්නේ ඔබට දෙවියන්වහන්සේ තුළ කුමක් විය හැකිද යන්න මගිනි. බයිබලයේ යෝබ්ගේ පොතෙහි ප්‍රධාන පණිවුඩය නම් ධර්මිෂ්ඨ මිනිසෙකුට පවා තවදුරටත් දෙවියන්වහන්සේ සමඟ අත්දැකීම් ලබාගැනීමෙන් වාසියක් අතුළත් කරගත හැකි බවයි.

## ඔබේ ආත්මික දීමනා හඳුන්වාගැනීමට:

ආත්මික දීමනා සේවයේ වැඩකිරීමට හැකිවන පිණිස ආත්මයාණන්වහන්සේ විසින් දෙන ලද විශේෂ හැකියාවන් වේ. මෙම විෂයය කොපමණ වැදගත් ද කිවහොත් හාවස්ට්ටයිම්

ජාත්‍යාන්තර ආයතනය සම්පූර්ණ අත්පොතක් මෙය කැප කරන්නේය.

*"ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය"* යන පාඩම් මාලාව ආත්මික දීමනා විස්තරාත්මකව පැහැදිලි කරයි. ඔබට ආත්මික දීමනා තේරෙන්නේ නැතිනම් හෝ දෙවියන්වහන්සේ ඔබට දී තිබෙන දීමනා හඳුන්වාගෙන නැත්නම්, ආත්මික දියුණුවේ මෙම අංශය මෙම පාඩම් මාලාව ඔබට උපකාරී වේ.

සෑම ඇදහිලිවන්තයෙකුටම එක ආත්මික දීමනාවන්වත් තිබෙන බව (1 කොරින්ති 12:4-11) සහ ඔබ ඔබේ දීමනා සොයාගෙන දියුණු කිරීමට වගකිය යුතු බව බයිබලය උගන්වයි. (2 තිමෝති 1:6)

ආත්මික දීමනාවල ලයිස්තුවක් මෙසේය:

**විශේෂ දීමනා:** මෙම දීමනා දෙන්නේ දෙවියන්වහන්සේගේ සෙනඟ සේවයේ වැඩවලට සූදානම් කිරීම භාවිත කිරීමටයි.

-ප්‍රේරිතයෝ
-අනාගතවක්තෘවරු
-ශුභාරංචිය ප්‍රකාශකරන්නෝ
-සභාපාලකයෝ
-ගුරුවරු

**කතාකිරීමේ දීමනා:** මෙම දීමනා දෙවියන්වහන්සේගේ සත්‍යය පැහැදිලි කරයි.

-ධර්මවාක්‍යකීම
-ඉගැන්වීම
-අවවාදය (අනුශාසනාව)
-ප්‍රඥාවේ වචනය
-දැනගැනීමේ වචනය

**සේවයකරන දීමනා:** මෙම දීමනා දෙවියන්වහන්සේගේ වැඩ කිරීමට හැකියාව ලබාදෙයි.

-සේවය කිරීම
-උපකාර
-නායකත්වය
-ආණ්ඩු කිරීම
-දීම
-කරුණාව පෙන්වීම
-ආත්ම විමසීම
-ඇදහිල්ල
-ආගන්තුක සත්කාරය

**ලකුණු දීමනා:** මෙම දීමනා දෙවියන්වහන්සේගේ ආධිපත්‍යය තහවුරු කරයි.

-අන්‍යභාෂා
-භාෂා තේරුම්කරදීම
-ආශ්චර්ය ක්‍රියා
-සුවකිරීම්

## ඔබගේ සේවයකිරීමේ ස්ථානය තීන්දුකරගැනීමට:

ඔබගේ ආත්මික දීමනාව හඳුන්වාගැනීම ඔබේ සේවයේ ස්ථානය සොයාගැනීමට පළමු පියවර පමණයි. ඔබ ඔබේ දීමනා සොයාගත් පසු, දෙවියන්වහන්සේට අවශ්‍යවන්නේ ඔබ ඒවා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ කොතැන භාවිත කිරීමද යන්න ඔබ සොයා ගැනීම වේ.

ඔබේ බයිබලයේ 1 කොරින්ති 12 කියවන්න. සභාව මනුෂ්‍ය ශරීරයකට සමාන වන්නේ කෙසේදැයි මෙම පරිච්ඡේදය පැහැදිලි කරයි. මනුෂ්‍ය ශරීරයක සෑම කොටසටම විශේෂ කාර්යයක් තිබෙන ලෙසම ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ සෑම සමාජිකයෙකුටම එසේම තිබේ. ඵලදායක වීමට, ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළ ඔබේ සේවයේ ස්ථානය ඔබ සොයාගත යුතුයි. දේව කැමැත්ත දැනගැනීමට, ඔබ ඔබවම යාගයක් ලෙස, උන්වහන්සේ කැමති ලෙස භාවිත කිරීමට ඔප්පු කළ යුතුයි.

එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයන් ජීවමානවූ, ශුද්ධවූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ යාගයක් කොට ඔප්පුකරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි. එය නුඹලාගේ ආත්මික සේවය වේ.

> **නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී, දෙවියන්වහන්සේගේ කැමැත්ත එනම් යහපත්වූ පිළිගත යුතුවූ සම්පූර්ණවූ දෙය කුමක්ද කියා දැනගන්නා පිණිස සිත, අලුත්කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා. (රෝම12:1-2)**

ඔබ ඔබේ ආත්මික දීමනා සොයාගෙන, ඇත්මික ශක්තීන් හා දුර්වලතා විශ්ලේෂණයකර, ඔබේ ජීවිතය සඳහා දේව කැමැත්ත සෝදිසිකර හෝ පරීක්ෂා කළ යුතුයි. (ඔබට මෙම ක්‍රියා පිළිවෙළෙහි උපකාර කළ හැකි *"දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීම"* නමැති පාඩම් මාලාවක් හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයට තිබේ).

ගලාති 5:20 හි මාංසයේ පව්වලින් එකක් නම් "පක්ෂවාදිකම්" ය. පක්ෂවාදීවීම යන්නෙහි අර්ථය වන්නේ ඔබ වෙනත් කෙනෙකුගේ ආකාරයට සැරසී ඔවුන්ව අනුකරණයෙහි යෙදීමයි. ඔබ අනෙක් අයගේ සේවය අනුකරණය කිරීම දෙවියන්වහන්සේට අවශ්‍ය නොවේ. උන්වහන්සේට අවශ්‍ය වන්නේ ඔබ ඔබේ සේවයේ ස්ථානය හා උන්වහන්සේ ඔබගේ ජීවිතය සඳහා සැලසුම් කළ මෙහෙය සොයා ගැනීම වේ.

> **නුමුත් එකිනෙකා තම තමාගේ වැඩය සෝදිසි කෙරේවා, එවිට ඔහුට වෙන කෙනෙක් ගැන නොව තමා ගැන පමණක්ම පාරට්ටුව තිබේ. (ගලාති 6:4)**

## ඔබගේ සේවය ඉෂ්ටකිරීමට ක්‍රමානුකූල සැලැස්මක් යොදා ගැනීම:

ඔබේ අධ්‍යාත්මික තත්ත්වය, ශක්තීන්, දුර්වලතා, සහ ආත්මික දීමනා හරියාකාරව විශ්ලේෂණය කිරීම ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළ ඔබගේ නිසි ස්ථානය දැනගැනීමට මඟපෙන්වයි. එය ඔබේ සේවයේ ස්ථානය එළිදරව් වීමට මඟපෙන්වයි.

නමුත් ඔබගේ ස්ථානය දැනගැනීම පමණක් ප්‍රමාණවත් නොවේ. දෙවියන්වහන්සේට ඔබ සඳහා තිබෙන මෙහෙය ඉටුකිරීමට ඔබ සැලසුම් කර, ඉන්පසු එම සැලසුම ඔබ ක්‍රියාත්මක කළ යුතුයි.

> **තමාගේ ස්වාමියාගේ කැමැත්ත දැනගනත් සූදානම් නොකළාවූ, ඔහුගේ කැමැත්ත ලෙස නොකළාවූ දාසයා බොහෝ පහර ලබන්නේය. (ශු. ලූක් 12:47)**

ඔබ ඉගෙනගන්නා දේ ඔබේ සේවය සම්පූර්ණ කිරීමට ඔබ භාවිත නොකරන්නේ පුද්ගලික විශ්ලේෂණය ඵලදායී නොවේ.

## තොරතුරු රැස්කරන ආකාරය

**යාච්ඤා කරන්න:**

ඔබේ ආත්මික තත්ත්වය, ශක්තීන්, දුර්වලතා සහ උන්වහන්සේගේ සැලැස්ම තුළ ඔබගේ ස්ථානය ඔබට එළිදරව් කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.

> **දාවිත් මෙසේ කළේය: ස්වාමිනි මා සෝදිසිකොට පරීක්ෂා කළ මැනව, මාගේ හෘදයත් සිතත් විමසා බැලුව මැනව. (ගීතාවලිය 26:2)**

**දේව වචනය පාඩම් කරන්න:**

> **ඔබ ඔබවම පරීක්ෂා කළ යුතු නොවෙනස්වන මිම්ම දේව වචනයයි. ස්වාමිනි, සදාකාලේටම ඔබගේ වචනය ස්වර්ගයෙහි පිහිටා තිබේ. (ගීතාවලිය 119:89)**

**ආත්මික දීමනා භාවිතකරන්න:**

ආත්මික දීමනා ඔබේ විශ්ලේෂණයට උපකාරයක් විය හැක. උදාහරණයක් ලෙස, ස්වාමීන්වහන්සේ ඔබගේ ආත්මික ජීවිතයේ දුර්වලතාවක් සම්බන්ධව අවබෝධයක් දීමට හෝ විමසීමේ දීමනාව හෝ දැනගැනීමේ වචනයේ දීමනාව තුළින් ඔබට උපස්ථානය කිරීමට තවත් පුද්ගලයකු පාවිච්චි කළ හැක.

**ආත්මික නායකයන්ගෙන් උපදේශය ලබාගන්න:**

ඔබගේ විශ්ලේෂණයේ ඔබට උපකාර කරන්න ඔබගේ ආත්මික නායකයාගෙන් ඉල්ලා සිටින්න. දෙවියන්වහන්සේ ඔබට මඟපෙන්වන්න නායකයන් දෙන සේක. ඔබගේ ආත්මික ශක්තීන් සහ දුර්වලතා විශ්ලේෂණය කරන ලෙස ඔබගේ නායකයාගෙන් ඉල්ලන්න. ඔබගේ සේවයේ විශේෂ අංශයන් සම්බන්ධව ඔබ සමඟ යාච්ඤා කරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටින්න.

**ලිඛිත වාර්තාවලින් උපදෙස් ලබාගන්න:**

සමහර ලිඛිත වාර්තා ඔබගේ විශ්ලේෂණයේ දී භාවිත කිරීමට හැක. උදාහරණයක් වශයෙන්, ඔබේ පුද්ගලික මුදල් පිළිබඳ විශ්ලේෂණයේදී ලිඛිත ඇයවැය වාර්තාවක්, බැංකු ගිණුම් විස්තර හෝ චෙක්පොත් වාර්තා භාවිත කළ හැක.

**සම්මුඛ සාකච්ඡා පවත්වන්න:**

ඔබගේ ආත්මික දුර්වලතා සහ ශක්තීන් පිළිබඳව සමීප පවුල් සාමාජිකයෙකුගෙන් සහ/හෝ මිතුරකුගෙන් අදහස් විමසන්න.

**ඔබවම නිරීක්ෂණය කරන්න:**

ඔබවම විවිධ සේවා අවස්ථාවන් වලදී නිරීක්ෂණය කරන්න. ඔබගේ ශක්තීන් දුර්වලතා සහ සේවයේ ඵලදායීකත්වය සටහන් කරන්න. කුමන ආත්මික දීමනා ප්‍රත්‍යක්ෂ ලෙස පෙනේද?

විවිධ සත්‍ය ජීවිත අවස්ථාවන්වලදී ඔබවම නිරීක්ෂණය කරන්න. පීඩනය හෝ වෙහෙස යටතේ දී ඔබ කෙසේ ප්‍රතිචාර දක්වන්නේද? ඔබගේ ජීවිතය තුළ ආත්මික ඵල ප්‍රත්‍යක්ෂ ලෙස පෙනේද?

## පුද්ගලික පාරිසරික විශ්ලේෂණය

මතු සඳහන් වන කටුසටහන ඔබගේ පුද්ගලික විශ්ලේෂණය කිරීමට භාවිත කරන්න.

## ඔබගේ සම්බන්ධතා විශ්ලේෂණය කරන්න

දේව වචනය සහ මුළු කිතුනු ජීවිතය සම්බන්ධතා මත පදනම් වී ඇත. එමනිසා දෙවියන්වහන්සේ සහ අන්‍යයන් සමඟ ඔබගේ සම්බන්ධතා විශ්ලේෂණය කිරීම වැදගත්ය:

> **උන්වහන්සේ ඔහුට කතාකොට: තාගේ මුළු හෘදයෙන් ද තාගේ මුළු ආත්මයෙන් ද තාගේ මුළු බුද්ධියෙන් ද තාගේ දෙවිවූ ස්වාමීන්වහන්සේට ප්‍රේම කරව. මේක උතුම් වූ පළමුවෙනි ආඥාවය. මෙය හා සාමන එකක් තිබේ, එනම්, තට මෙන් තාගේ අසල්වාසියාට ප්‍රේම කරව යනුය.**
>
> **මේ ආඥා දෙක පිට මුළු ව්‍යවස්ථාවත් අනාගතවාක්‍යයත් පිහිටා තිබේයයි කී සේක. (ශු. මතෙව් 22:37-40)**

මතු සඳහන් වන දේ සමඟ ඔබගේ සම්බන්ධතා විශ්ලේෂණය කරන්න.

### දෙවියන්වහන්සේ:

-ඔබ නැවත උත්පාදනය ලැබූ ඇදහිලිවන්තයෙකුද?

-ඔබ වතුරෙන් බව්තිස්ම වී තිබේද?

-ඔබ දෙවියන්වහන්සේ සමඟ සහභාගිකමෙන් ගමන් කරනවාද? ඔබගේ ජීවිතයේ ඔබ යම්

-ක්‍රියා පිළිවෙළක් ගත යුතු ඔබ දන්නා පාපය තිබේද?

-ඔබ ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් බව්තිස්ම ලබාගෙන තිබේද?

-ඔබ විධිමත් ක්‍රමයකට අනුකූලව බයිබලය කියවන්නේද?

-ඔබ ඔබගේ බයිබල් අධ්‍යයන පුරුදු වඩා දියුණු කරගන්නේ කෙසේද?

-ඔබ ක්‍රමානුකූලව යාච්ඤා කරන්නේද?

-ඔබ ඔබගේ යාච්ඤා ජීවිතය වඩා දියුණු කරන්නේ කෙසේද?

-ඔබ ප්‍රාදේශිය ක්‍රිස්තියානි සභා සමුහයක ක්‍රියාශීලී කොටසක්ද?

-ඔබගේ ජීවිතයේ ශුද්ධාත්ම ඵලවල සාක්ෂිය තිබේද? (මේවායේ ලයිස්තුවක් සඳහා ගලාති

5:22-23 බලන්න.)

-දෙවියන්වහන්සේ සමඟ ඔබගේ ආත්මික සම්බන්ධතාවේ කුමන අංශවල ඔබ අපරිණත සහ දියුණුවීමට අවශ්‍ය බව ඔබට හැඟේද?

## ඔබගේ සහකාරයා:

-ඔබගේ සහකාරයා සමඟ හොඳ සම්බන්ධතාවක් ඔබට තිබේද? (දෙදෙනා එකමුතුව සිටී ද? සන්නිවේදනය ඇත්ද? එකට කාලය ගත කරනවාද? යනාදිය)

-ඔබ එකට යාච්ඤා කර, දේව වචනය පාඩම් කර, සභාවට සහභාගී වෙනවාද? එසේ නොවේ නම් මෙම ප්‍රතිපත්තීන් ඔබගේ සම්බන්ධතාවයට ඇතුළත් කිරීම සඳහා ඔබට කුමක් කළ හැකිද?

-ඔබගේ සහකාරයා සමඟ ඔබගේ සම්බන්ධතාවේ ශක්තීන් සමහරක් මොනවාද?

-ඔබගේ සහකාරයා සමඟ ඔබගේ සම්බන්ධතාවේ දුර්වලතා සමහරක් මොනවාද?

-ඔබට මෙම දුර්වලතා දියුණු කළ හැක්කේ කෙසේද?

-ඔබගේ සහකාරයා සමඟ ඔබගේ සම්බන්ධතාව ඔබගේ සේවයට බාධා කරනවාද?

-ඔබගේ සහකාරයා සමඟ ඔබගේ සම්බන්ධතාව සේවයට බාධාවක් නොමැතිව වාසියක් බවට පත් කිරීමට ඔබට කුමක් කළ හැකිද?

## ඔබගේ සේවා යෝජකයා:

-ඔබගේ සේවා යෝජකයා සමඟ ඔබට හොඳ සම්බන්ධතාවක් තිබේද?

-එසේ නොවේ නම්, ඔබට එය දියුණු කළ හැක්කේ කෙසේද?

-ඔබ ඔහුට ගෞරවය සහ සැලකිල්ල දක්වනවාද?

-ඔබගේ රැකියාවේ සියලුදේම ඔබ කරන්නේ දෙවියන්වහන්සේට කරන ලෙසද? (1 කොරින්ති 10:31)

## ඔබේ දරුවන්:

-ඔබේ දරුවන් සමඟ හොඳ සම්බන්ධතාවක් තිබේද?

-ඔබගේ දරුවන් සමඟ ඔබගේ සම්බන්ධතාවය ඔබට වඩා දියුණු කළ හැක්කේ කෙසේද?

-ඔබගේ දරුවන් හොඳට හික්මවා ඇත්ද?

-ඔවුන් හොඳට හික්මවා නැත්තේ කුමන අංශවලද?

-මෙම අංශවල හික්මවීම වඩා දියුණු කිරීමට ඔබට කුමක් කළ හැකිද?

-ඔබේ දරුවෝ යේසුස්වහන්සේ ගැළවුම්කරුන් ලෙස පිළිගෙන ඇත්ද?

-ඔබගේ දරුවන්ට මෙම තීරණය ගැනීමට උපකාර කිරීමට ඔබට කුමක් කළ හැකිද?

-ඇදහිලිවන්තයන් වන ඔබේ දරුවන්ගේ ආත්මික වැඩීම විශ්ලේෂණය කරන්න. තව දුරටත් ආත්මිකව වර්ධනයවීමට ඔබට ඔවුන්ට උපකාර කළ හැක්කේ කෙසේද?

-ඔබ සභාවේ නායකයෙකු නම්, ඔබ තීතස් 1:6 සහ 1 තිමෝති 3:4-5 හි දක්වා ඇති ලෙස ඔබගේ පවුල හසුරුවාගෙන තිබේද? එසේ නොවේ නම්, මෙම සම්මතයට ගෙන ඒමට කුමන වෙනස්වීම් කරන්න අවශ්‍ය වේද?

## අන් පවුල් සාමාජිකයෝ:

-ඔබට පවුලේ කිසියම් සමාජිකයෙකු සමඟ සම්බන්ධතාවල අපහසුතාවයක් තිබේද? එසේ වේ නම් ඔවුන් කව්ද සහ හේතුව කුමක්ද?

-මෙම සම්බන්ධතාවය වැඩි දියුණු කිරීමට ඔබට කුමක් කළ හැකිද?

## ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය (සභාව) තුළ අන් අය:

-සභාවේ අන් සාමාජිකයන් සමඟ සම්බන්ධතාවල ඔබට දුෂ්කරතා තිබේද? එසේ වේ නම්, ඔබට දුෂ්කරතා තිබෙන්නේ කා සමඟද?

-මෙම කිතුනු සහෝදරයා හෝ සහෝදරිය සමඟ ඔබගේ සම්බන්ධතාව හරිගස්වා ගැනීමට ඔබට කුමක් කළ හැකිද? (වෙන ඇදහිලිවන්තයෙකු සමඟ සහභාගිකම සදා ගැනීම සඳහා බයිබලීය ක්‍රම මතෙව් 18:15-17දී ද ඇත.)

## නොඇදහිලිවතුන්:

-ඔබ නොඇදහිලිවතුන් සමඟ සම්බන්ධතා ඇද්ද? නැතහොත් ඔබව කිතුනුවන්ගෙන් පමණක් වටකර ඇත්ද? (ඔබට ඔවුන් සමඟ කිසිම සම්බන්ධයක් නැතිනම් ඔබට නැතිවූ අයව දිනාගැනීමට නොහැක.)

-ඔබ සමඟ සම්බන්ධයක් තිබෙන නොඇදහිලිවන්තයන්ට ස්වාමීන්වහන්සේ වෙතට දිනාගැනීමට ඔබට කුමන පියවර ගත හැකිද?

-ශුභාරංචිය බෙදාගැනීමේ අරමුණු උදෙසා නොඇදහිලිවතුන් සමඟ තව සම්බන්ධ තහවුරු කිරීමට කුමක් කළ හැකිද?

-ඔබට ඇදහිලිවන්තයන් සමඟ, බයිබලයට අනුකූල නොවන සහ දෙවියන්වහන්සේ සමඟ ඔබේ සම්බන්ධතාවට බාධා කරන සම්බන්ධතා තිබේද? එසේ නම්, මෙම අවස්ථාවන් නිවැරදි කිරීමට ඔබට කුමක් කළ හැකිද?

## ඔබගේ කායික තත්ත්වය විශ්ලේෂණය කරන්නː

-ඔබගේ ශරීරය ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාලිගාව යැයි බයිබලය පවසයි. ඔබගේ ශරීරය දෙවියන්වහන්සේගේ වාසස්ථානය නිසා, ඔබ එය යෝග්‍ය පරිදි වගබලා ගත යුතුය. (1 කොරින්ති 3:16-17)

-මිනිසා ශරීරය, ප්‍රාණය සහ ආත්මය වන බැවින් ඔබගේ කායික තත්ත්වය ඔබට අධ්‍යාත්මිකව බලපානවා ඇත. ඔබව ශාරීරිකව යහපත් ලෙස බලා නොගත හොත්, ඔබට පහසුවෙන් අධ්‍යාත්මිකව අධෛර්යවත් විය හැක. දෙවියන්වහන්සේගේ වැඩ වල යෙදීමට බලය හා ශක්තිය ඔබට නොතිබේ.

-ඔබේ ශරීරයේ බර අනවශ්‍ය ලෙස වැඩිද?

-ඔබේ ශරීරයේ බර අනවශ්‍ය ලෙස අඩුද?

-ඔබ මත්පැන්, සිගරැට්ටු හෝ මත්ද්‍රව්‍ය වැනි හානිකර ද්‍රව්‍ය භාවිත කරන්නේද?

-ඔබ අත ඇති මුදල් අනුව සහ/හෝ පරිසරය ඉඩදෙන තරම් නිවැරදි ආකාරයට ආහාර ගැනීමට ඔබ උත්සාහ කරනවාද?

-ඔබ විධිමත්ව ව්‍යායාමයේ යෙදෙනවාද?

-ඔබ ස්වාමීන්වහන්සේට කරන සේවයට බාධා කරන කිසියම් කායික තත්ත්වයක් ඔබට තිබේද? එසේ නම් ඒවා ගැන ඔබට කුමක් කළ හැකිද? (සමහර දේවල් ආහාරය සහ ව්‍යායාමය මඟින් ඔබට දියුණු කළ හැක. අනෙක් ඒවා දෙවියන්වහන්සේට සුව කළ හැක.)

## ඔබගේ අධ්‍යාපනික මට්ටම විශ්ලේෂණය කරන්නː

-ඔබගේ වර්තමාන අධ්‍යාපනික මට්ටම කුමක්ද?

-සේවයේ වැඩ කටයුතුවලට වාසියක් වන ලෙසට ඔබගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීමට ඔබට කුමක් කළ හැකිද? (හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඩම් මාලා හැදෑරීම එක මාර්ගයකි)

(ඔබට වැඩි අධ්‍යාපනයක් ලබාගැනීමට අවකාශයක් තිබුණේ නැතිනම් අධෛර්යවත් නොවන්න. යේසුස්වහන්සේ ධීවරයන් වැනි සාමාන්‍ය මිනිසුන් තෝරාගෙන ඔවුන්ව සේවයේ බලවත් ලෙස පාවිච්චි කළ සේක. ඔබගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීමට අවකාශ ඔබට තිබෙනවා නම් සහ මෙය ඔබට දේව සැලැස්ම යැයි ඔබට අනුබල දෙන්නෙමු.)

## ඔබගේ මුදල් විශ්ලේෂණය කරන්න

-ඔබ ක්‍රමවත්ව දසයෙන් කොටස දෙනවාද? (දසයෙන් කොටස යනු ඔබ උපයන සියලු මුදල්වලින් දෙවියන්වහන්සේට දෙනු ලබන සියයට දහයක ප්‍රතිශතයකි. මෙය බයිබලයට සම්බන්ධ මූලධර්මයකි.)

-ඔබගේ දසයෙන් කොටසට වැඩිපුර ඔබ පඬුරු දෙනවාද?

-පසුගිය වසරේ ඔබ සභාවට දුන් මුළු ප්‍රමාණය කුමක්වීද?

-ඔබ ධර්මදූත සේවාවලට කොපමණ මුදල් දුන්නේද?

-ස්වාමීන්වහන්සේගේ වැඩ කටයුතුවලට වැඩියෙන් දීමට ඔබට තිබීමේ ප්‍රතිඵලය ඇතිවීමට ඔබගේ ජීවන තත්ත්වයේ කුමන හරිගැස්වීම් ඔබට කළ හැකිද?

-ඔබ ණයගැතිද? එසේ නම්, එම ණය ඉවත්කිරීමට ඔබට කුමක් කළ හැකිද?

-ඔබ මුදල් පාලනය කරන අන්දම සපයන, අන්දම බිල් ගෙවන අන්දම ආදිය සම්බන්ධයෙන් ඔබට හොඳ සාක්ෂියක් තිබෙනවාද?

-එසේ නොවේනම්, මෙම අංශයෙහි ඔබට වැඩි දියුණු විය හැක්කේ කෙසේද?

-ඔබ වස්තුව ලබාගැනීමට ප්‍රමාණය ඉක්මවා බලවත් සැලකිල්ලක් දක්වන්නේද? සහ ඔබ භෞතික දේට බොහෝ ළැදිද? මෙම දේවල් ඔබගේ කාලයෙන් සහ බලයෙන් වැඩි කොටසක් අල්ලාගන්නේද?

## ඔබගේ ආත්මික හැකියාවන් විශ්ලේෂණය කරන්න:

-ආත්මික අරමුණුවලට සහ සේවයේ වැඩකටයුතුවලට ඔබ ඔබගේ කාලය නුවණැතිව භාවිත කරන්නේද?

-සේවය කිරීමට වැඩි කාලයක් ලබාදීමට ඔබට කුමන ක්‍රියාවලියන්ගෙන් ඉවත් විය හැකිද?

-සභාව තුළ ඔබ සඳහා ස්වාමීන්වහන්සේට තිබෙන විශේෂ සේවය ඔබ දන්නේද?

-ඔබ එය දැන් ඉෂ්ට කරනවාද? එසේ නැතිනම් හේතුව කුමක්ද?

-ඔබට කුමන ආත්මික දීමනා දී තිබෙනවාද කියා ඔබ දන්නවාද? එසේ නොවේ නම් පහත සඳහන් පියවර ගන්න:

**පළමුවැනි පියවර: නැවත උත්පාදනය වන්න.**

ඔබ නැවත උත්පාදනය විය යුතුයි. ස්වභාවික තලෙන්ත ස්වභාවික ශාරීරික උපත තුළින් එන ලෙසටම ආත්මික දීමනා අලුත උපත තුළින් එන්නේය, ඔබ ස්වභාවික ලොවේ උත්පත්තිය

ලබන්නේ නැතිනම් ඔබට ස්වභාවික තලෙන්ත තිබීමට නොහැක. ඔබ ආත්මික ලොවේ නැවත ඉපදී නැතිනම් ඔබට ආත්මික දීමනා දීමට බැරිය.

> **නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව් කමාව පිණිස යේසුස් ක්‍රිස්තුන්වහන්සේගේ නාමයෙන් බව්තිස්ම ලබාපල්ලා, එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුය. (ක්‍රියා 2:38)**

**දෙවැනි පියවර: ශුද්ධාත්ම බව්තීස්මය ලබාගන්න.**

“ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය” යන හාවස්ට්ටයිම් ජාත්‍යාන්තර ආයතනයේ පාඩම් මාලාවේ ශුද්ධාත්ම බව්තිස්මය ලබාගැනීමේ මූලධර්ම දී තිබේ.

**තුන්වැනි පියවර: ආත්මික දීමනා දැනගන්න.**

ආත්මික දීමනා කුමක්ද යන්න ඔබ දැනගත යුතුයි. ඔබ දන්නේ නැතිනම්, දෙවියන්වහන්සේ ඔබට දෙන ආත්මික දීමනාව හඳුන්වාගැනීමට ඔබට නොහැකි වේ.

**හතරවැනි පියවර: ආත්මික දීමනාවක් සොයන්න.**

> **නුමුත් වඩා උතුම් දීමනාවලට ආශාවෙයල්ලා. තවද ඊටත් වඩා උතුම් මාර්ගයක් මම නුඹලාට පෙන්වමි. (1කොරින්ති 12:31)**

අප සැමදෙනාටම දැනටම එක දීමනාවක් හෝ තිබේ. නමුත් අපට වැඩිපුර දීමනා ඉල්ලිය හැක. ඔබට දැනට ලැබී නැති දීමනාවක් ඔබට ලබාගත හැකි බව මෙම පදයෙන් අදහස් වේ.

**පස්වැනි පියවර: අත් තැබීම**

ඔබගේ ආත්මික නායකයා ලවා ඔබ මත අත් තබාගෙන ඔබට ඔබගේ ආත්මික දීමනාව එළිදරව් කිරීමට දෙවියන්වහන්සේට යාච්ඤා කරගන්න.

> **වැඩිමහල්ලන්ගේ අත් තැබීම ඇතුව අනාගතවාක්‍යයෙන් නුඹට දෙනලද නුඹ තුළ තිබෙන දීමනාව ව්‍යවහාර නොකර නොසිටින්න. (1 තිමෝති 4:14)**

එක සිට පහ දක්වා පියවරවල ප්‍රතිඵලයක් වශයෙන් ඔබගේ ආත්මික දීමනාව දෙවියන්වහන්සේට එළිදරව් කිරීමට හැකි වන සේක. මෙය සිදුවූයේ නොමැතිනම්, මතු සඳහන් පියවර අනුගමනය කරන්න.

**හයවැනි පියවර: ඔබේ ආත්මික අසාවන් විශ්ලේෂණය කරන්න.**

ඔබගේ ජීවිතය තුළ කුමන දීමනා දියුණු වෙනවා දැකීමට ඔබ ආශා වන්නේද? ඒවා ගැන සිතීමේ දී හෝ භාවිතකිරීමේ දී කුමන දීමනා ඔබට වැඩියෙන්ම ප්‍රීතිය ගෙනදේද? ඔබ ඉගැන්වීමෙන් ආස්වාදයක් ලබනවාද? ඔබ ආගන්තුක සත්කාර කිරීමෙන් සහ මිනිසුන් ඔබගේ නිවස තුළට ගැනීමෙන් ආස්වාදයක් ලබනවාද? දෙවියන්වහන්සේගේ වැඩ කටයුතු වලට විශාල මුදල් ප්‍රමාණ දීමට ඔබට නිතර හැඟෙනවාද?

**සත්වැනි පියවර: කිතුනු නායකයෙක් මඟින් විශ්ලේෂණයක් ලබා ගන්න.**

ඔබගේ ආත්මික දීමනා කිතුනු නායකයෙකු ලවා විශ්ලේෂණය කරගන්න. ඔබගේ කිතුනු සේවය පිළිබඳව ඔවුන් නිරීක්ෂණය කර තිබෙන්නේ කුමක්ද? ඔබ ඔවුන්ට පෙනෙන්නේ හොඳ කළමනාකාරයෙකු, ගුරුවරයෙකු යනාදී ලෙසින්ද? ඔවුන්ගේ අදහස අනුව, කුමන දීමනාව, හෝ මෙහෙයන්වල ඔබ ඵලදායී වී තිබේද?

**අටවැනි පියවර: ඔබගේ අතීත කිතුනු සේවය විශ්ලේෂණය කරන්න.**

කුමන දීමනා/ සේවයන් වලදද ඔබ බොහෝ ප්‍රීතිය අත් දුටුවේද? ඔබ වැඩියෙන්ම ඵලදායි වූයේ කුමන අංශවලද?

**නමවැනි පියවර: ඔබට තිබේ යැයි ඔබ සිතන දීමනා හඳුන්වාගන්න.**

ඔබ තිබෙනවා යැයි සිතන දීමනාව, ලේඛනයක් සදාගන්න. මෙම ලේඛනය පදනම් වී ඇත්තේ:

-අධ්‍යයනය තුළින් දීමනා ගැන ඔබ ලබාගත් දැනුම

-යාච්ඤාව තුළින් දෙවියන්වහන්සේ ඔබට එළිදරව් කර ඇති දීමනා

-ප්‍රධාන කිතුනු නායකයෙක් ඔබගේ ජීවිතය තුළ නිරීක්ෂණය කළ දේ

-ඔබ පෙර සේවය කළ අංශවල ඔබගේ ඵලදායිකත්වය විශ්ලේෂණය කිරීම මත වේ

(හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය"* නමැති පාඨමාලා-වත් ඔබගේ දීමනා හඳුන්වාගැනීමේ දී උපකාරී වේ.)

**දසවැනි පියවර: ඔබ වට ඇති ආත්මික අවශ්‍යතා දෙස බලන්න**

ඔබගේ වටපිටාවේ, සමාජයේ හෝ සභාවේ කුමන අවශ්‍යතා සපුරනු ලබන්නේ නැතිද? ගුරුවරුන්, ශුභාරංචිය ප්‍රකාශකරන්නන්, කළමණාකාරයන් ආදියට අවශ්‍යතාවයක් ඇත්ද? මෙම අවශ්‍යතා වල ලයිස්තුවක් සාදාගන්න.

**එකළොස් පියවර: ආත්මික අව්‍යතාවයක් සපුරන්න**.

ආත්මික අවශ්‍යතාවල ලේඛනය ඔබට දෙවියන්වහන්සේ දී ඇතැයි විශ්වාස කරන දීමනාවල ලේඛනය හා සංසන්දනය කරන්න. අව්‍යතාවයක් හඳුනාගත් පළියටම එම අවශ්‍යතාවය සපුරාලන්න දීමනාව තිබෙන්නම අවශ්‍ය නොවන බව තේරුම් ගත යුතුය. නමුත් ආත්මික දීමනාවක් සමඟ දෙවියන්වහන්සේ ඔබට දී තිබේ යැයි ඔබ විශ්වාස කරන දීමනාවක් අනුරූප වන්නේ කොතැනද යන්න ඔබට නිශ්චය කරගත හැක.

මෙම අවශ්‍යතාවය සපුරන්න කැපවීමක් කරන්න. උදාහරණයක් වශයෙන් ඔබගේ සභාව තුළ ගුරුවරුන්ට අවශ්‍යතාවයක් ඇත්නම් සහ ඔබට ඉගැන්වීමේ දීමනාව තිබෙන බව ඔබ විශ්වාස කරන්නේ නම්, මෙම අවශ්‍යතාවය සපුරන්න ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙන්න.

**දොළොස්වැනි පියවර: ඔබගේ සේවය තක්සේරු කරන්න.**

ඔබගේ දීමනාව භාවිතකොට යම් අංශයක සේවය කිරීමට පසු, ඔබගේ සේවය තක්සේරු කරන්න. මෙම දීමනාව භාවිත කිරීමේදී ඔබ ඵලදායී වේද? එය ඔබට විශාල ප්‍රීතියක් ගෙනදේ ද? ඔබට ප්‍රතිඵල පෙනෙන්නේද? ඔබගේ සභා පාලකයා හෝ ආත්මික නායකයා ප්‍රතිඵල දකින්නේ ද? එසේ නම්, දෙවියන්වහන්සේ ඔබගේ ආත්මික දීමනාව දැනගැනීමට ඔබට මඟපෙන්වනවා ඇත.

ඔබ තෝරාගත් අංශය ඔබගේ ආත්මික හැකියාවන් සමඟ ගැළපෙන්නේ නැතිනම් සහ ඔබ ඵලදායි නැතිනම්, ඔබගේ පුළුවන් විය හැකි දීමනා ලේඛනය විමර්ශනය කළ සේවය කරන්න වෙන අංශයක් ඔබට පෙන්වන ලෙස දෙවියන්වහන්සේගෙන් අයදින්න.

## ඔබගේ විශ්ලේෂණයේ ප්‍රතිඵල යොදන්න.

ඔබ සම්පූර්ණ කළ විශ්ලේෂණය ඔබගේ ජීවිතයට සහ සේවයට යෙදුවේ නැත්නම් එයින් කිසි ප්‍රයෝජනයක් ලබා ගත නොහැක. යම් දෙයක "යෙදවීම" යන්නෙන් තේරුම් වන්නේ එය ඵලදායී ලෙස ඔබට යම් දෙයක් ඉෂ්ට කරන්න අවශ්‍ය වන ඕනෑම වේලාවක දෙවියන්වහන්සේ වෙනුවෙන් ඕනෑම වැඩක් කිරීමට ඔබට සැලැස්මක් තිබිය යුතුයි. දෙවියන්වහන්සේ සැලසුම් කිරීමේ දෙවි කෙනෙකි. උන්වහන්සේ මෙම විශ්වය සැලසුම් කර මැවිල්ලේ දී උන්වහන්සේගේ සැලසුම ක්‍රියාවට නැගූ සේක. මෙම ලොවේ අත්තිවාරමේ සිට, පව්කාර මනුෂ්‍ය වර්ගයාගේ ගැළවීම සඳහා දෙවියන්වහන්සේ සැලසුම් කළ සේක. උචිත වේලාව පැමිණි විට, යේසුස්වහන්සේව සියලු දෙනාගේම පව් වෙනුවෙන් මිය යෑමට මේ ලොවට එවීම මඟින් උන්වහන්සේ එම සැලැස්ම ඉෂ්ට කළ සේක.

යේසුස්වහන්සේ මිනිසුන්ගේ සහ ස්ත්‍රීන්ගේ ජීවිතවල ක්‍රියා කිරීමට ගිය සෑමවිටකම, උන්වහන්සේ ඔවුන්ට සූදානම්වෙන්න කැදෙවූ සේක. උන්වහන්සේ අන්ධ මිනිසුන්ට දිය පොකුණුවලට ගොස් සෝදන්න යැයි පැවසූ සේක. උන්වහන්සේ ගෝලයින්ට උන්වහන්සේ හට රොටී සහ මාළුවන් ගෙනදීමට අණ කළ සේක. උන්වහන්සේ කොරුන්ට ඔවුන්ගේ යහන ගෙනයාමට පැවසූ සේක.

ඔබගේ ජීවිතය තුළ දෙවියන්වහන්සේගේ ක්‍රියා සමඟ ඔබ සහයෝගයෙන් කටයුතු කළ යුතුයි. ඔබ මෙය නිශ්චිතවම කිරීමට නම්, සැලසුම් කළ යුතුයි. ඔබ ඔබගේ පුද්ගලික විශ්ලේෂණයේ ප්‍රතිඵල යෙදවූ විට ඔබ ඔබම ගැන ඉගෙන ගත් දේ දේව මහිමය සඳහා භාවිත කිරීමට ඔබ සැලසුම් කරයි.

ඔබගේ විශ්ලේෂණයේ ප්‍රතිඵල යොදාගැනීමට පහත සඳහන් වන මඟ පෙන්වන මූලධර්මය භාවිත කරන්න. එක් එක් කොටස ගැන යාච්ඤා කිරීමට මතක තබාගන්න. උන්වහන්සේගේ සැලැස්ම ඔබට එළිදරව් කරන ලෙස දෙවියන්වහන්සේගෙන් අයදින්න. ඉන්පසු එක් එක් සැලැස්ම සපයා තිබෙන අවශ්‍යතාවයන්හි ලියන්න.

### 1. ඔබගේ ආත්මික තත්ත්වය තීන්දු කරගන්න.

ඔබගේ විශ්ලේෂණය සමාලෝචනය කර ඔබගේ වර්තමාන ආත්මික තත්ත්වය සම්පිණ්ඩනය කර ඡේදයක් ලියන්න. ඔබගේ ආත්මික තත්ත්වයට ඔබගේ සම්බන්ධතා, ඔබගේ කායික තත්ත්වය, ඔබගේ මුදල්, අධ්‍යාපනය, ශක්තීන් සහ දුර්වලතා බලපාන ආකාර ද මෙම සාරාංශයේ ඇතුළත් කරන්න.

සැලැස්මක් සාදාගන්න. ඔබගේ ආත්මික තත්ත්වය වැඩි දියුණු කිරීමට වර්ධනය සහ පර්ණත භාවයෙන් වැඩිවීමට, දෙවියන්වහන්සේ සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඔබට කුමක් කළ හැකිද?

මම කරන්නාවූ දේ නම්:

## 2. ඔබගේ ආත්මික දුර්වලතා හඳුන්වාගන්න:

ඔබගේ විශ්ලේෂණය සමාලෝචනය කර ඔබගේ ආත්මික දුර්වලතා ලැයිස්තුවක් ලියා ගන්න. එක් එක් දුර්වලතාවට යාබදව එම දුර්වලතාව සම්බන්ධව ඔබ ගන්නා සැලසුම සටහන් කරන්න.

| දුර්වලතා | එය හා සම්බන්ධව මම ක්‍රියාවට නගන සැලැස්ම මම කරන දේ- |
|---|---|
| ______________________ | ______________________________________ |
| ______________________ | ______________________________________ |

## 3. ඔබගේ ආත්මික ශක්තීන් හඳුන්වාගන්න:

ඔබගේ විශ්ලේෂණය සමාලෝචනය කර ඔබගේ ආත්මික ශක්තීන් ලැයිස්තුවක් සාදාගන්න. එක් එක් ශක්තියට යාබදව දේව මහිමය සඳහා එය භාවිත කිරීමේ ඔබගේ සැලසුම සටහන් කරන්න.

| ශක්තිය | දේව මහිමය සඳහා එය භාවිත කිරීමේ දී මගේ සැලැස්ම මම කරන දේ |
|---|---|
| ______________________ | ______________________________________ |
| ______________________ | ______________________________________ |

## 4. ඔබගේ ආත්මික දීමනා හඳුන්වාගන්න:

ඔබගේ ආත්මික දීමනා විශ්ලේෂණය සමාලෝචනය කරන්න. ඔබට තිබෙනවා යැයි ඔබ විශ්වාස කරන ආත්මික දීමනා ලැයිස්තුගත කරන්න. එක් එක් දීමනාවට යාබදව දේව මහිමය සඳහා එම දීමනාව භාවිත කිරීමේ ඔබගේ සැලැස්ම සටහන් කරන්න.

| ආත්මික දීමනාව | මම මෙම දීමනාව පාවිච්චි කරන ආකාරය මම කරන දේ |
|---|---|
| ______________________ | ______________________________________ |
| ______________________ | ______________________________________ |

## 5. ඔබගේ සේවයේ ස්ථානය දැනගන්න.

ඔබගේ සමස්ත පුද්ගලික විශ්ලේෂණය සමාලෝචනය කරන්න. යාච්ඤාවෙන් යුක්තව මෙම ප්‍රකාශනය සලකා බලා සම්පූර්ණ කරන්න:

මම විශ්වාස කරන්නේ සභාවේ මගේ සේවයේ ස්ථානයය:

## 6. ඔබගේ සේවය ඉෂ්ට කරන්න සැලැස්මක් ක්‍රමානුකූලව දක්වන්න:

දෙවියන්වහන්සේ ඔබට දී තිබේයැයි ඔබ විශ්වාස කෙරෙන සේවය ඉෂ්ට කරන්න ඔබ ආරම්භ කරන්නේ කෙසේද? සැලැස්මක් ක්‍රමානුකූලව දැක්වීමට උපකාර කිරීමට එකළොස්වැනි පරිච්ඡේදය පාඩම් කරන්න.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න

2. "පුද්ගලික පාරිසරික විශ්ලේෂණය" යන පදය පැහැදිලි කරන්න

3. පුද්ගලික පාරිසරික විශ්ලේෂණයක ඇතුළත් වන්නේ කුමක්ද?

4. පුද්ගලික පාරිසරික විශ්ලේෂණයක අරමුණු හයක් ලැයිස්තුගත කරන්න

(ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම පොතේ අවසාන පරිච්ඡේදයට පසු සඳහන් කර ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. විනිශ්චයවරුන් 13-16 හි සැම්සන්ගේ කථාව කියවන්න. මෙන්න පුද්ගලික විශ්ලේෂණයකින් ප්‍රයෝජනයක් ලැබෙන්න තිබූ මිනිසෙක් පිලිස්තිවරුන් සමඟ සටනට යන විට ඔහු ඔහුගේම සත්‍යය ආත්මික තත්ත්වය අවබෝධ කරගෙන තිබුණේ නැත.

   -ඔහුගේ විශ්ලේෂණයෙන් එළිදරව් විය හැකිව තිබුණු ආත්මික ප්‍රශ්න සමහරෙක් මොනවාද?

   -ඔහුගේ ජීවිතයේ ඉරණමට බලපාන්න තිබූ වෙනස්වීම් ඔහුට කරන්න පුළුවන්වී ද?

   -ඔහුට කරන්න තිබුණේ මොන වෙනස්වීම්ද?

2. බැත්ෂෙබා සමඟ දාවිත්ගේ පාපයට පසු දාවිත් ඔහුගේ පුද්ගලික ආත්මික තත්ත්වය විශ්ලේෂණය කරන ගීතාවලියේ 51 කියවන්න. මෙම පරිච්ඡේදය පිළිබඳ කරන ලද පාඩම්වලින්, මෙම ප්‍රශ්නවලට උත්තර දෙන්න:

   -දාවිත් මෙම පරිච්ඡේදය ලියන විට ඔහුගේ ආත්මික තත්ත්වය කුමක් වී ද?

   -දාවිත් ඔහුගේ පව් ගැන කුමක්ද කළේ ද?

   -දාවිත් දෙවියන්වහන්සේට කරන්න යැයි ඉල්ලූ දේ කුමක්ද?

3. දානියෙල් 5හි බෙල්ශෂෙර්ගේ කථාව කියවන්න. මෙන්න පුද්ගලික විශ්ලේෂණයෙන් ප්‍රයෝජනයක් ලැබෙන්න තිබූ තවත් මිනිසෙක් මොහු වේ:

   -ඔහුගේ ආත්මික තත්ත්වය කුමක් වූයේද? (පද 22-23 බලන්න)

   -ඒ ගැන දෙවියන්වහන්සේ කළේ කුමක් ද? (පද 25-28 බලන්න)

   -බෙල්ශෂෙර් ඔහුගේම පුද්ගලික ආත්මික තත්ත්වය ගැන දැන සිටියේ නම්, දේව විනිශ්චය වැළැක්විය හැකිව තිබූ කුමන වෙනස්වීම් ඔහුට ඔහුගේ ජීවිතයේ කරන්න පුළුවන් වී ද?

4. දානියෙල් 4 වැනි පරිච්ඡේදයේ නෙබුකද්නේශර්ගේ කථාව කියවන්න. මෙන්න ඔහුගේ පරිසරය වැරදි ලෙස විශ්ලේෂණය කිරීම නිසා දුක්වින්දාවූ මිනිසෙක්

   -පද 29-30 හි ඔහුගේ පාරිසරික විශ්ලේෂණය පද 34-35 සමඟ සංසන්දනය කරන්න. ඒවා වෙනස් වන්නේ කෙසේද?

   -ඔහුගේ සත්‍ය ආත්මික තත්ත්වය පිළිබඳ ඔහුට දැනුමක් ලැබීමට කුමක්ද වුණේ? (පද 31-33 බලන්න)

   -නෙබුකද්නේශර් ඔහුගේ පුද්ගලික තත්ත්වය හරියාකාරව විශ්ලේෂණය කොට ඔහුට තිබූ සියල්ල දෙවියන්වහන්සේගෙන් බව පිළිගත් විය කුමක්ද සිද්ධ වුණේ? (34-37 පද බලන්න.)

5. ලූක් 12:16-21හි සඳහන් පොහොසත් තරුණයාගේ අධ්‍යාත්මික කාරණා ඔහුගේ පුද්ගලික විශ්ලේෂණයෙන් බැහැර කර තිබූ කථාව කියවන්න. ඔහුගේ පුද්ගලිත විශ්ලේෂණය පදනම් වී තිබුණේ සදාකාලික වටිනාකමක් ඇති දේ මත නොව මේ ලොවේ භෞතික දේ මතයි.

6. ලූක් 18:9-14 කියවන්න. පරිසිවරයාගේ පුද්ගලික විශ්ලේෂණය පව්කාරයාගේ පුද්ගලික විශ්ලේෂණය හා එකට සංසන්දනය කරන්න. කුමන විශ්ලේෂණය අවංක වූයේද?

7. බයිබලයේ විනිශ්චයවරුන්ගේ පොත දෙවියන්වහන්සේගේ සෙනඟ පාලනය කළ රජවරුන් කීපදෙනෙක්ගේ වාර්තාව දේ. ඔවුන්ගෙන් සමහරෙකු යහපත් රජවරු විය. අන් අය නපුරු විය. විනිශ්චයවරුන්ගේ ග්‍රන්ථය මුල සිට අගට කියවා එක් එක් රජ ගැන පුද්ගලික විශ්ලේෂණයක් කරන්න. ඔවුන්ගේ ශක්තීන් සහ දුර්වලතා කුමක් වූයේද? පුද්ගලික විශ්ලේෂණයකින් ඔවුන්ට වාසියක් ලබාගන්න තිබුනේ කෙසේද? ඔවුන්ගේ ඉරණමට බලපාන්න තිබූ වෙනස්වීම් ඔවුන්ට කරන්න පුළුවන් වීද?

8. ගණන් කථාව 12 කියවන්න. මිරියම් හා ආරොන් දෙවියන්වහන්සේ තුළ ඔවුන්ගේ ආත්මික තත්ත්වය හරියාකාරව විශ්ලේෂණය කළේ නැත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කුමක්ද සිද්ධ වුණේද?

9. ගණන් කථාව 16හි කෝරා සහ ඔහුගේ ගෝලයෝ ඒ හා සමාන වැරුද්දක් කළහ. ඔවුන්ගේ වැරදි විශ්ලේෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් කුමක් සිද්ධ වුණිද?

10. 1 රාජාවලියේ 19 කියවන්න. මේ වෙලාවේ දී එළියා ඔහුගේ පරිසරය විශ්ලේෂණය කළේ කෙසේද? දෙවියන්වහන්සේ ඔහුගේ විශ්ලේෂණය නිවැරදි කළේ කෙසේද?

# සයවන පරිච්ඡේදය

# ජන සමූහයක් විශ්ලේෂණය කිරීම

### අරමුණ:

ඔබ පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට කිරීමට හැකි වන්නේ:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "ජන සමූහය" යන පදය අර්ථවිග්‍රහ කිරීමට
- ජන සමූහ විශ්ලේෂණයක අන්තර්ගතය පැහැදිලි කිරීමට
- ජන සමූහ විශ්ලේෂණයේ පරමාර්ථයන් හඳුනාගැනීමට
- ජන සමූහය විශ්ලේෂණය කිරීමට
- මෙම ජන සමූහය තුළ ශුභාරංචිය පැතිරවීමට ඔබගේ විශ්ලේෂණය භාවිත කරන්න.

### ප්‍රධාන පදය

**උන්වහන්සේ ඉදිරියෙහි ප්‍රකාශ නුවූ කිසි මැවිල්ලක් නැත. උන්වහන්සේගේ ඇස් ඉදිරියෙහි සියල්ල වැස්මක් නැතුව ඇරී තිබේ. අපෙන් ගණන්ගන්නේ උන්වහන්සේය. (හෙබ්‍රෙව් 4:13)**

## හැඳින්වීම

පසුගිය පරිච්ඡේදයේ සේවයට සූදානම් වීම සඳහා ඔබ ඔබවම විශ්ලේෂණය කළේය. මෙම පරිච්ඡේදයේ ඔබ සේවය කරන වෙනස් පරිසර, විශ්ලේෂණය කරන්නේ කෙසේදැයි විස්තර කරන පාඩම් මාලාවක් අරඹයි.

මෙම පරිච්ඡේදයේ ජන සමූහයක් විශ්ලේෂණය කරන්නේ කෙසේදැයි ඔබ ඉගෙන ගන්නේය. ඉදිරි පරිච්ඡේදවල බොහෝ විවිධ මිනිස් කණ්ඩායම් වලින් සමන්විත ලෝකයේ විවිධ ප්‍රදේශ ජාතීන් සහ කලාප විශ්ලේෂණය කරන්නේ කෙසේදැයි ඔබ ඉගෙන ගන්නේය.

## ජන සමූහයක්

මෙලොවේ මිනිසුන් බාධක කීපයක් මගින් වෙන්වී ඇත. මෙම බාධක ශුභාරංචිය පැතිරවීමට බලපානු ඇත. විශාල කඳු, සාගර සහ මිටියාවත් වැනි භූගෝලීය බාධක ඇත. තවද රටවල් වෙන්කරන දේශපාලන බාධක ද ඇත.

නමුත් මිනිසුන් සංස්කෘතික බාධකවලිනුත් වෙන්වී ඇත. පොදු වශයෙන්, සංස්කෘතිය යන්නෙන් අදහස් වන්නේ ලෝකයේ මිනිසුන් වෙසෙන වෙනස් ක්‍රමවලටය. භාෂාව, විශ්වාස, වටිනාකම්, සමාජීය ව්‍යුහය, චාරිත්‍ර ආදිය වැනි දේ සංස්කෘතියට ඇතුළත් වේ.

මෙම සංස්කෘතික බාධකවල ප්‍රතිඵලයක් වශයෙන් විවිධ "ජන සමූහ" අපේ ලොව පුරාම බිහි වී ඇත. ජන සමූහයක් යනු විවාහයන් සහ සමීපව ඇසුරු කෙරෙන ජීවිතයන් පොදු වශයෙන් ජන සමාජය තුළ පමණක් සිදුවන මිනිස් කණ්ඩායමකි. උදාහරණයක් වශයෙන් ජන සමූහයක් යනු විශේෂ ගෝත්‍රයක්, කුලයක් වශයෙන් හෝ පෙළපතක් වේ.

යේසුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයින්ට ශුභාරංචිය සියලු ජාතීන්ට දේශනාකරන්නැයි පැවසූ විට, උන්වහන්සේ "ජාතීන්" ට භාවිත කළ ග්‍රීක වචනය, "එත්නොස්" නම් වේ. ජාතියක් සැදී ඇත්තේ "එත්නොස්"(ethnos) හො"ජන සමූහ"කණ්ඩායම් කීපයකින්ය.

පොදු වශයෙන් ජාතියක් වෙත ශුභාරංචිය පැතිරවීම නොසෑහේ. එම ජාතිය තුළ සෑම ජන සමූහයක්ම ශුභාරංචිය අසනවා යැයි ඔබ නිසැක විය යුතුයි. මෙය කළ විට, මුළු ජාතීයටම ශුභාරංචිය ලැබෙනවා ඇත. යේසුස්වහන්සේ ශුභාරංචිය සියලු මනුෂ්‍යයන්ට දේශනා කරන්නැයි අණ කළ සේක. ඔබ මෙම අණ ඉටුකිරීමට නම්, ඔවුන් වෙතට යන්නේ කෙසේදැයි තීන්දු කිරීමට ජන සමූහ විශ්ලේෂණය කළ යුතු වන අතර. ඔවුන් වෙතට යන්න සැලසුමක් සාදාගෙන, ඉන් පසු සැලසුම ක්‍රියාවට නැංවිය යුතුය.

## ජන සමූහයක විශ්ලේෂණය

ඔබ ජන සමූහයක් විශ්ලේෂණය කරන විට, එකම ගෝත්‍රය, වංශය හෝ පෙළපතේ කොටසක් වන විශේෂ පුද්ගලයන් කණ්ඩායමක් ඔබ අධ්‍යනය කරන්නේය. ඔබ ඔවුන්ව සමාජීය, සංස්කෘතික, දේශපාලනික සහ ආත්මික ලෙස හඳාරන්නේය. එසේම ඔවුන්ට ශුභාරංචිය පිළිගැනීමට බලපාන පිටස්තර බාහිර බලපෑම් ඔබ විශ්ලේෂණය කරන්නේය.

## ජන සමූහයක් විශ්ලේෂණය කිරීමේ අරමුණ

ඔබගේ අධ්‍යයනයේ අරමුණ ශුභාරංචියත් සමඟ ජන සමූහයක් වෙතට යෑමයි. එය ශුභාරංචිය දේශනා කිරීමේ අරමුණින් කරන පර්යේෂණයක් මිස පර්යේෂණයක් කළ යුතු නිසාම කෙරෙන්නක් නොවේ. ඔබ අධ්‍යයනයට පෙලඹ වූ මුල් පරමාර්ථය සම්පූර්ණ කර නොගෙන සම්පූර්ණ කාලයම අධ්‍යයන කටයුතු සඳහා පමණක් නොයෙදවීමට වගබලා ගන්න.

ජන සමූහයක සංස්කෘතිය පිළිබඳ ඔබගේ අධ්‍යයනය ඔවුන් වෙතට යෑමේ හොඳම ක්‍රමය තීන්දු කර ගැනීමට ඔබට උපකාරී වේ. ඔවුන්ගේ සංස්කෘතිය පිළිබඳ ඔබ ඉගෙනගත් දේ අවධාරණය කර ගනිමින් එයට ගැළපෙන ආකාරයට ඔබට ශුභාරංචිය ඉදිරිපත් කළ හැක.

උදාහරණයක් ලෙස පාවුලුතුමා යුදෙව්වන්ට සේවය කළ විට ඔහු ක්‍රිස්තුස්වහන්සේගේ යුදෙව් පෙළපත පිළිබඳ අවධාරණයෙන් කියා සිටි අතර ඉශ්‍රායෙල්හි මෙසියස්වහන්සේ වශයෙන් උන්වහන්සේව ඉදිරිපත් කළේය. ඔහු විජාතීන්ට සේවය කළ විට, ඔහු ශුභාරංචියේ විවිධ පැති පිළිබඳව අවධාරණය කළේය.

ශු:මතෙව්, ශු:මාර්ක්, ශු:ලූක්, ශු:යොහන් යන පොත් තවත් උදාහරණ වේ. ඒවා ලියන ලද විශේෂ සමූහවල සංස්කෘතීන්වලට සම්බන්ධ ශුභාරංචියේ වෙනස් පැති එම පොත් සියල්ල, අවධාරණය කරයි.

ඔබ ජනතාවගේ සංස්කෘතිය ශුභාරංචිය ඉදිරිපත් කිරීමට පාලමක් ලෙස භාවිත කළ විට එය වඩා පහසුවෙන් පිළිගනු ලැබේ. ජනතාවකගේ සංස්කෘතිය අවබෝධ කරගැනීම විශේෂ ජනතාවකට දොරවල් විවෘත කිරීමට ආත්මික යතුරු ඔබට දේ.

ඔබ ජන සමූහයක් විශ්ලේෂණය කරන පිණිස මෙම ප්‍රශ්නවලට උත්තර දෙන්න

**කුමන ජන කොටසක් වෙතට ශුභාරංචිය ගෙන යා යුතුද?**

ඔබ ශුභාරංචියත් සමඟ යන්න උත්සාහ කරන්නේ කවුරු වෙතටද? මෙම සමූහයා සිටින්නේ කොතැනද?

**ඔව්හු කොයි ආකාරයේද?**

ඔවුන් වෙතට යෑම සඳහා ඔබ ඔවුන්ගේ චාරිත්‍ර, ප්‍රශ්න, සමාජීය ව්‍යුහය, ආත්මික තත්ත්වය, ආදිය ගැන කුමක් දැනගැනීමට අවශ්‍යද?

**ඔවුන් වෙතට යා යුත්තේ කවුද?**

ඔවුන් වෙතට යෑමට සුදුසුම මනුෂ්‍යයෙකු හෝ ස්ත්‍රියක්ද? නැතහොත් ඔවුන්ගේම කෙනෙකු තුළින් හෝ පිටකෙනෙකු තුළින් ද? ඔවුන් වෙතට යෑම සඳහා මෙම තැනැත්තාට අවශ්‍ය වන සුදුසුකම් මොනවාද? නිශ්චිත ජන සමූහ වෙතට යෑම සඳහා දෙවියන්වහන්සේට විශේෂ පණිවුඩකාරයෝ සිටිති. විජාතීන් වෙතට යෑමට දෙවියන්වහන්සේ පාවුලුතුමාව පාවිච්චි කළ සේක. පේදුරුතුමාව වඩාත්ම ඵලදායි ලෙස පාවිච්චි කරන ලද්දේ යුදෙව්වන් වෙතට යෑමට වේ.

**ඔවුන් වෙතට යා යුත්තේ කෙසේද?**

කුමන ක්‍රම භාවිත කළ යුතුද? වැඩියෙන්ම ඵලදායි වන්නේ කුමන ක්‍රමද? මෙම ප්‍රශ්න වලට පිළිතුරු ලබා ගැනීමෙන් මෙම සෙනඟ වෙතට යෑමේදී ඔබගේ භූමිකාව තීන්දු කරගැනීමට සහ ඔවුන් වෙතට ශුභාරංචිය සමඟ යෑමට සැලැස්මක් ක්‍රමානුකූලව සකසා ගැනීමට උපකාරී වේ.

## තොරතුරු රැස්කරන ක්‍රමය

ඔබගේ විශ්ලේෂණයට තොරතුරු රැස් කළ හැකි ක්‍රම නම්,

**යාච්ඤාව**

මෙම සමූහය ගැන ඔබ දැනගැනීමට අවශ්‍ය වන දේ එළිදරව් කිරීමට සහ ශුභාරංචිය සමඟ ඔවුන් වෙතට යෑමට ඔබහට උදව්කරන ලෙස දෙවියන්වහන්සේගෙන් අයදින්න. දෙවියන්වහන්සේට සියලු මනුෂ්‍යයන් ගැන දිව්‍යමය අවබෝධය තිබේ. (හෙබ්‍රෙව් 4:13)

**ලිඛිත ද්‍රව්‍ය අධ්‍යනය කරන්න**

ජන සමූහය ගැන පාඩම් පොත් සහ ලිඛිත ද්‍රව්‍ය කියවන්න. තොරතුරු ලබා ගත හැකි ප්‍රභවවලින් ලැයිස්තුවක් මෙම අත්පොතෙහි උපග්‍රන්ථයේ ඇතුළත් වේ.

**නිරීක්ෂණය**

ඔබම පුද්ගලිකව සමූහය නිරීක්ෂණය කරන්න.

**සම්මුඛ සාකච්ඡාව**

ඔබ අධ්‍යයනය කරන සමූහයේ නායකයන් සහ සාමාජිකයන් වන අයගෙන් ප්‍රශ්න අසන්න. දැනටමත් මෙම සෙනඟට සේවය කරන ඇදහිලිවන්තයන් සිටි නම්, ඔවුන් මෙම මනුෂ්‍යයන් පිළිබඳ ඉගෙනගෙන ඇත්තේ කුමක්දැයි සොයාගැනීම පිණිස ඔවුන් සමඟ සම්මුඛ සාකච්ඡාවක් පවත්වන්න. (මෙම පාඩම් මාලාවේ උපග්‍රන්ථයේ සම්මුඛ සාකච්ඡා සාම්පල ඇතුළත් කර ඇත.)

**ජන සමූහයක් විශ්ලේෂණය කිරීමට පහත සඳහන් වන සැලකිල්ල භාවිත කරන්න. නිශ්චිත ජන සමූහයක් පිළිබඳ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු දීමට ඔබට නොහැකි වන්න පුළුවනි. නමුත් ඔබට තොරතුරු ලබාගත හැකි ඒවාට පිළිතුරු දෙන්න.**

## කුමන මනුෂ්‍යයන් වෙතට ශුභාරංචිය සමග යන්නේද?

1. ඔබ ශුභාරංචිය සමග යාමට උත්සාහ කරන්නේ කවුරුන් වෙතටද?

2. ඔවුන් ”ජන සමූහය” වන්නේ කෙසේද? ඔවුන්ට පොදු වශයෙන් පහත සඳහන් වන සාධක කීපයක් තිබිය යුතුයි. ඔබ අධ්‍යයනය කරන සමූහයට අදාළ වන ඒවා ලකුණු කරන්න.

   -එකම භාෂාව
   -පොදු දේශපාලනික පක්ෂපාතභාවය
   -එකම ජාතිය හෝ ජන වාර්ගික සමානකම්
   -පොදු ආගමික විශ්වාස
   -පොදු නෑකම්
   -සම අධ්‍යාපනික මට්ටම්
   -එකම ප්‍රදේශයක පදිංචිය
   -එක සමාන සමාජ පන්ති හෝ කුලයන්
   -පොදු සංස්කෘතිය (දේවල් කිරීමේ පිළිගත් ක්‍රම)
   -පොදු විශේෂ අසාවන්
   -පොදු ආර්ථික මට්ටම (එනම් සියල්ලන් දුගී, මධ්‍යම පන්තිය හෝ ධනවත්)
   -අද්විතීය සෞඛ්‍ය තත්ත්වයන්
   -වෙනස් නීත්‍යානුකූල සමාජ තත්ත්වය (එනම් සියල්ලන් සිරකරුවන්, අනාථයන්, නීති විරෝධීව පදිංචිව සිටින අය ආදිය)
   -එක සමාන වයස
   -පොදු සැලකිය යුතු ප්‍රශ්න
   -එකම කණ්ඩායමේ කොටසක් නිසා වෙනස්කම් අත්දකින්නා වූ කොටසක්

ඔබට මෙම කණ්ඩායමේ දක්නට ලැබෙන තවත් පොදු විශේෂ ගුණාංගයන් මොනවාද?

3. මෙම සමූහයේ මිනිසුන් සංඛ්‍යාව කොපමණද? නිවැරදි සංඛ්‍යා ලේඛන ලබාගත නොහැකි නම් ජන ගහනයේ සාධාරණ තක්සේරුවක් සාදාගන්න. ශුභාරංචිය ඔවුන් වෙතට යෑමට අවශ්‍ය සේවකයන් ගණන තීන්දු කිරීමට මෙය උපකාරයක් වේ.

## භූගෝලීය විශ්ලේෂණය

1. මේ සෙනඟ බහුතරයක් වෙසෙන්නේ කුමන විශේෂ පෙදෙසකද?

2. වෙන කුමන භූගෝලීය පොදෙස්වල ඔවුන්ව සොයාගත හැක්කේ ද?

   (සටහන: මෙම ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී මෙම මනුෂ්‍යයන්ව නිශ්චිතව හඳුන්වාගන්න. හුදෙක් “ඉන්දියාවේ සියලු ජනයා” ලෙස නොවේ. කුමන විශේෂ ජනයාද? උදාහරණයක් ලෙස ඉන්දියාවේ විශේෂ ගමක විශේෂ කුලයක් ඔබ හඳුන්වන්න. එක් එක් ගම සහ එක් එක් කුලය වෙතට ශුභාරංචිය යෑමේදී ඔබ භාවිත කරන ක්‍රම වෙනස් විය හැක.)

3. එම රටෙහි සිතියමක් ලබාගෙන හෝ ඇඳ ඔබට ශුභාරංචිය ගෙන යෑමට අවශ්‍ය විශේෂ

කණ්ඩායමේ පිහිටීම ලකුණු කරන්න.

4. මෙම මනුෂ්‍යයන් වෙසෙන ප්‍රාදේශීය බිම් ප්‍රමාණයේ සිතියමක් ලබාගන්න නැත්නම් අඳින්න. ඔබ ලකුණු කළ බිම් ප්‍රමාණවල සෙනග තුළ දෙවියන්වහන්සේ ක්‍රියා කරන ලෙසට මෙම සිතියම් පිළිබඳව යාච්ඤා කරන්න. පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු දීමටත් මෙම සිතියම් භාවිත කරන්න.

5. කුමන භූගෝලීය සාධක ශුභාරංචිය පතුරුවීමට බාධාවක් වෙයිද? (උදාහරණ ලෙස ඔවුන් වෙසෙන ප්‍රදේශ වෙත යෑම අපහසුද?)

6. ශුභාරංචිය පතුරුවීමට උපකාර කිරීමට කුමන භූගෝලීය සාධක භාවිත කළ හැකිද? (උදාහරණ ලෙස ඒවා ඔස්සේ සහ පිහිටු විය හැකි වෙළඳාමේ හෝ සංචාරයේ ස්වභාවික මාර්ග තිබේද?)

7. මෙම කණ්ඩායම  පිහිටී ස්ථානය වර්ෂයේ එක්තරා කාලවලදී මෙම සෙන.වෙතට යෑමට හා ශුභාරංචිය පතුරුවීමට  වඩාත් සුදුසු කාල ඇත්ද? (උදාහරණයක් ලෙස දෙවියන්වහන්සේ ඔබට එසේ කිරීමට විශේෂයෙන් මග පෙන්නුවහොත් හැර, දුෂ්කර පෙදෙසකට තද වර්ෂා කාලයේ ගමන් කිරීමට වඩා වියළි කාලයේ ගමන් කිරීම වඩා ප්‍රායෝගික වේ. නැතහොත් ගමනා ගමනයට අපහසු විය හැක.)

8. ඔවුන්ගේ වර්තමාන පිහිටීමේදී මෙම සෙනග වෙතට යෑමේදී බාධා හෝ උපකාර විය හැකි මතු සඳහන් සාධක පිළිබඳ තොරතුරු ලබාගන්න.

-ප්‍රධාන නගරයට සමීපතම දුර ප්‍රමාණය
-රටේ අගනුවරට දුර ප්‍රමාණය
-පිළිගත් ගුවන් තොටුපළවලට දුර ප්‍රමාණය
-භාවිත කළ හැකි ගුවන් ධාවන පථය හෝ ජලයෙහි ගොඩබහින ස්ථානයට දුර ප්‍රමාණය
-ඔවුන්ට දුරකථන සේවය තිබේද?
-ඔවුන්ට විදුලි ලිපි සේවය තිබේද?
-සමීපතම දුම්රිය පොළට දුර ප්‍රමාණය
-සමීපතම භාවිත කළ හැකි මෝටර් රථ මාර්ගයට දුර ප්‍රමාණය
-සමීපතම බෝට්ටුවකින් යාත්‍රා කළ හැකි ගඟ හෝ මුහුදට දුර ප්‍රමාණය

## ඔව්හු කුමන ආකාරයේද?

**සමාජ විශ්ලේෂණය:**

1. මෙම ජන සමූහයේ මූලික සමාජ ඒකකය කුමක්ද? උදාහරණ ලෙස එක පුරුෂයෙක්/එක භාර්යාවක් සහ ඔවුන්ගේ ළමයිද? නැතහොත් භාර්යාවන් කීපදෙනෙක් සිටිත්ද? පියා මව හා ළමයින් යන මූලික පවුල් ඒකකය තුළ සෙනග වෙනම ජීවත්වේද? නැතහොත් පවුලේ අනෙක් ඥාතීනුත් ඔවුන් සමඟ එකට වෙසෙනවාද? (නැන්දලා මාමලා සහ අනෙකුත් ඥාතීන් සියලුදෙනාම එකම නිවසෙහි)?

2. පවුලේ නායකයා කව්ද? පියාද, මවද, නැන්දම්මාද වෙන කෙනෙක්ද? ශුභාරංචිය පැතිරවිය හැකි පාලම් ලෙස පවුල් සම්බන්ධතා ඔබට භාවිත කළ හැක. උදාහරණයක් ලෙස එක්තරා සංස්කෘතියක පියා නිවස පාලනය කරන්නේ නම්, ශුභාරංචිය දීම සඳහා ඔහු ඔබගේ පළමු ඉලක්කය විය යුතුය. ඔහු ශුභාරංචි පණිවුඩය පිළිගත් පසු ඔහුගේ පවුල ද ඔහු පස්සේ

බොහෝ විට ගමන් කරයි.

3. සමාජයේ නායකයන් කව්ද? මෙම මනුෂ්‍යයන් වෙසෙන ගමේ හෝ නගරයේ නායකයා, ගෝත්‍රික ප්‍රධානියා වශයෙන් හෝ කුලයේ මූලිකයා කව්ද? ඔබ ශුභාරංචිය ඔවුන් වෙතට ගෙන ගියොත් ඔවුන්ට වෙන අයවත් ශුභාරංචි පණිවුඩය පිළිගැනීමට මඟ පෙන්විය හැක.

4. මෙම සමූහයේ තීරණ ගන්නේ කව්ද? මෙම තීරණ ගන්නේ කෙසේද? ශුභාරංචිය බෙදාගැනීමට ගමට හෝ ගෝත්‍රයට ඇතුල්වීමට පෙර ඔබ අවසර ලබාගත යුතු නම්, තීරණ ගන්නේ කව්ද සහ ඒවා කෙසේද ලබා ගන්නේ යන්න ඔබට දැනගැනීමට අවශ්‍ය වේ.

5. ඔවුන් ප්‍රජාව සමඟ හවුල් වන්නේ කොහේද? සමූහයක් ලෙස ඔවුන්ගේ සැලකිල්ලට බඳුන්වන්නේ කුමක්ද? ඔබ ශුභාරංචිය ඉදිරිපත් කිරීමේදී මෙම සැලකිලි පිළිබඳව ඔබට අවධාරණය කළ හැක. මෙම අවශ්‍යතා සපුරන්න පණිවුඩය සම්බන්ධ කරගන්න.

6. "බාහිර අයට" ඔවුන් කොපමණ විවෘතද? (ඔවුන්ගේම ජන සමූහයේ කොටසක් නොවන මනුෂ්‍යයන්ට) ශුභාරංචිය බෙදාගැනීමට ඔබ මුලින්ම මෙම කණ්ඩායමට ඇතුල් වූ විට ඔබ අත්දකින පිළිගැනීමේ මට්ටමට, මෙය දැනගැනීම ඔබව සූදානම් කරයි.

7. ඔවුන්ගේ සමාජ මට්ටම කුමක්ද? ඔවුන් උසස් පන්තියද, මධ්‍යම පන්තියද, පහළ පන්තියද? මෙම සෙනඟ ශාරීරික හෝ ද්‍රව්‍යමය අවශ්‍යතා සහිත පහළ පන්තියේ නම්, ඔවුන්ගේ කණ්ඩායමට ඇතුල් වී ඔවුන් සමඟ ශුභාරංචිය බෙදා ගැනීමේ ක්‍රමයක් ලෙස වෛද්‍ය සේවයක් හෝ ආහාර දීමේ වැඩ සටහනක් භාවිත කිරීමට ඔබට හැක.

8. කුමන රැකියා නියෝජනය වේද? මෙම සෙනඟ ජීවත්වීමට අදායමක් උපයන්නේ කෙසේද? ඔවුන්ගේ කණ්ඩායමට ඇතුල්වීමට ඔවුන්ගේ රැකී රක්ෂා ඔබට කෙසේ භාවිත කළ හැකිදැයි කල්පනා කරන්න. උදාහරණයක් ලෙස, ඔවුන්ගේ වැඩපොළේ බයිබල් අධ්‍යයන පාඩමක් ඇරඹීමට ඔබට හැකිය නැතහොත් ඔබ ගොවීයන් සමඟ වෙනස් කෘෂිකාර්මික ක්‍රම පිළිබඳව බෙදාගැනීමක් කළ හැක.

9. සමූහයේ මූල්‍ය සහ ද්‍රව්‍යමය සම්පත් පාලනය කරන්නේ කව්ද? සහ/හෝ එක් එක් පවුල් ඒකකය තුළ පාලනය කරන්නේ කවුද? (ණය, වෙළඳ පොළ, ඉඩම්, රැකියා පාලනය කරන්නේ කවුද)? සභාවට ඉඩම් ගැනීම සහ ශුභාරංචිය පතුරුවන්න මුදල් ලබාගැනීමට ඔබට ඔවුන්ගේ උපකාරය අවශ්‍ය විය හැක.

**සංස්කෘතික විශ්ලේෂණය**

ඔවුන් ශුභාරංචිය පිළිගැනීම සඳහා බලපෑ හැකි සංස්කෘතික සිරිත් විරිත් පාඩම් කරන්න. සලකා බැලීමට අවශ්‍ය කරුණු කීපයක්.

1. විශ්වාස සහ වටිනාකම්:

අ. මෙම සෙනඟගේ කුමන සංස්කෘතික වටිනාකම්, ඇදහිලි හෝ සිරිත් ඔවුන්ට ශුභාරංචිය අවබෝධ කරගැනීමට උපකාර විය හැකිද? (උදාහරණ ලෙස ජනතාවට පවුලෙහි වැදගත්කම ගැන බලවත් නිශ්චිත හැඟීම් ඇත්නම්, පවුල පිළිබඳව ශුභාරංචිය තුළින් අවධාරණය කිරීම ඔවුන් වෙතට යෑමට පාලමක් වේ.)

ආ. ජනතාවගේ කුමන සංස්කෘතික වටිනාකම්, විශ්වාස හෝ සිරිත් ඔවුන්ට ශුභාරංචිය

අවබෝධ කර ගැනීමට බාධාවක් විය හැකිද?

2. සංස්කෘතික සිරිත්:

බයිබලයේ පැහැදිලි ලෙස තහනම් කළ පොදු සංස්කෘතික සිරිත් සමහරක් තිබේද? එසේ නම් ඒවා මොනවාද? ඔබ දේවල් කරන්නාවූ ආකාරය වෙනස්වීම නිසා පමණක් ඔවුන්ගේ සිරිත් වැරදි නොවේ. සිරිත් වැරදි වන්නේ ඒවා දේව වචනයට විරුද්ධ වූ විටයි. ඔබ මෙම ජනතාව වෙතට ශුභාරංචිය සමඟ යෑමේදී පාපී පුරුදු ගැන යම් ක්‍රියා මාර්ගයක් ගැනීමට සිදුවේ. අනෙක් සංස්කෘතික සිරිත් වෙනස් කිරීමට අවශ්‍ය නැත. ජනතාවට ශුභාරංචිය පිළිගැනීමට ඔබගේ සංස්කෘතිය පිළිගන්න අවශ්‍ය නැත.

3. අවශ්‍යතා:

අ. සෙනඟගේ පොදු සැලකිලි, ආකල්ප, පෙලඹවීම්, හැඟීම්, වගකීම් මොනවාද? පහත සඳහන් වන අවශ්‍යතාවලින් වඩා වැදගත් ලෙස සලකන්නේ මොනවාද? ඔවුන්ට මෙම ප්‍රශ්න තිබේද?

-ආහාර අඩුකම
-දුර්වල සෞඛ්‍ය සහ වෛද්‍ය සේවාවන්
-දුර්වල අධ්‍යාපනය
-නුසුදුසු ජලය සහ/හෝ එහි දුර්වල සැපයුම
-මූල්‍ය සම්පත් අඩුකම
-භූගෝලීය සම්පත් අඩුකම
-දුර්වල ප්‍රවාහනය
-දුර්වල සන්නිවේදන පද්ධති
-නිවාස ප්‍රමාණවත් නැතිවීම
-වෙනස්වීම් දරාගැනීමට නොහැකි වීම
-දේශපාලනික පීඩාව
-වෙනත්

ඔවුන්ගේ සංස්කෘතියේ ඔබගේ ශුභාරංචි ඉදිරිපත් කිරීම සහ සේවයේ ක්‍රම සමහර විට මෙම අවශ්‍යතා වලට සම්බන්ධ විය හැක.

ආ. කුමන අවශ්‍යතා හොඳට සපුරා තිබේයැයි පෙනේද? ඔවුන්ට නැත්තේ කුමන අවශ්‍යතාද? සපිරෙන අවශ්‍යතා මෙන්ම සපිරෙන්නේ නැති අවශ්‍යතා දැනගැනීම වැදගත්ය. උදාහරණයක් ලෙස කුසගින්නෙන් පෙලෙන සෙනඟ නැති අවස්ථාවක හොඳට ආහාර තිබෙන සමූහයකට ශුභාරංචිය බෙදාදීම සඳහා ඇතුල්වීමට ක්‍රමයක් ලෙස ආහාර දීමේ වැඩ සටහනක් භාවිත කිරීමට ඔබ කැමති වන්නේ නැත.

4. අධ්‍යාපනය:

ඔවුන්ගේ අධ්‍යාපනික මට්ටම කුමක්ද? සාක්ෂරතා මට්ටම කුමක්ද? සෙනඟගෙන් කී දෙනෙක් ඔවුන්ගේම භාෂාව ලියා කියවනවාද? මේ පිළිබඳව දැනගැනීම වැදගත් වන්නේ සෙනඟට ලියන්න කියවන්න නොහැකි නම් පොත් පත් මත පදනම් වූ ශුභාරංචිය දීමේ මාර්ගයක් සැකසීම නොගැළපෙන නිසාය.

5. සන්නිවේදනය:

අ. ශුභාරංචිය ඉදිරිපත් කිරීමට භාවිත කළ යුතු සුදුසුම භාෂාව (හෝ භාෂා) කුමක්ද? ඔබට අවශ්‍ය වන්නේ මුලින්ම කණ්ඩායමක වැඩිම ප්‍රමාණයක් ඇති සෙනග වෙත යෑම වේ. මේ සඳහා සෙනඟ වැඩි දෙනෙක් භාවිත කරන භාෂාව පළමු විකල්පය ලෙස තෝරාගන්න.

මෙම සංස්කෘතියේ ජනතාව කථාකරන ප්‍රධාන භාෂාව වන්නේ ------------ ය.
ඉතිරිව සිටින ජනතාව වෙතට යෑමට අවශ්‍ය වන අනෙකුත් භාෂා වන්නේ --------

ආ. සමාජ සන්නිවේදනයේ ප්‍රධාන ක්‍රම මොනවාද? සන්නිවේදනය හොඳින්ම ගලායන්නේ යාන්ත්‍රික හෝ සමාජීය නායකයන් තුළින්ද? පවුල් ඔස්සේද? සෑම සමූහයකටම සන්නිවේදන පද්ධතියක් ඇත. විවිධ මට්ටම් තුළ වැදගත් පුවත් පතුරුවන්නේ මෙය මඟිනි.

ඇ. මෙම සෙනඟ වෙතට මෙම මාර්ග තුළින් යා හැකිද?

- -පුවත්පත් (ඔවිහු ක්‍රිස්තියානි ප්‍රචාරක දැන්වීම් පිළිගන්නවහුද?)
- -මුද්‍රිත පොත්පත් (ඉලක්ක කරගත් ජනතාවට කියවන්න පුළුවන්ද?)
- -ගුවන් විදුලිය (විකාශන ස්ථාන ක්‍රිස්තියානි ප්‍රචාරයට අවසර දෙනවාද?)
- -රූපවාහිනිය (විකාශන ස්ථාන ක්‍රිස්තියානි ප්‍රචාරයට අවසර දෙනවාද?
- -පටිගත කරන යන්ත්‍ර ( පටිගත කරන යන්ත්‍ර වලට සෙනඟට ප්‍රවේශය තිබේද?)
- -චිත්‍රපටි, වීඩියෝ ටේප් (මෙම පෙදෙසෙහි උපකරණ තිබේද?)
- -දුරකථන (ඉලක්ක කරන ජනතාවට දුරකථන තිබේද?)

ඈ. සන්නිවේදනයේ ප්‍රධාන ක්‍රමය කුමක්ද?

**බාහිර ආභාෂ**

1. දේශපාලනික පද්ධතිය හෝ නවීකරණයේ පිටස්තර බලවේගවල ප්‍රතිඵලයක් වශයෙන් කණ්ඩායම තුළ කුමන වෙනස්වීම් සිදුවෙමින් පවතිනවාද?

2. මෙම වෙනස්වීම් වලින් ඕනෑම එකක් ශුභාරංචිය පතුරුවන්න උපකාර කිරීමට භාවිත කළ හැකිද?

3. සෙනගට ශුභාරංචිය බෙදාදීම සඳහා තහනම් කරන රජයේ නීති තිබේද? එසේ නම් ඒවා මොනවාද?

4. මෙම සීමා/නීති සමඟ නොගැටී සෙනග වෙත යෑමේදී භාවිත කළ හැකි ක්‍රම මොනවාද?

5. මෙම ජන සමූහය අතර ශුභාරංචිය පැතිරවීමට සංවිධානය වූ කණ්ඩායම් හෝ ව්‍යාපාර විරුද්ධ විය හැකිද? මන්ද?

   දෙවියන්වහන්සේ ඔබව කැඳෙවූ යැයි ඔබට හැඟෙන කණ්ඩායමකට සේවය කිරීමට සීමා හෝ විරුද්ධකම් වලට කිසිවිටක ඔබව වළක්වන්න ඉඩ නොදෙන්න. සමහර මාර්ගවලින් ඔවුන් වෙතට යෑමට ඔබට අවසර නැතිනම් වෙන ක්‍රම භාවිත කරන්න.

**දේශපාලනික විශ්ලේෂණය**

1. මෙම සෙනගගේ දේශපාලනික පද්ධතිය කෙටියෙන් විස්තර කරන්න.

2. මෙම ජනතාව අතරෙහි කුමන දේශපාලනික පක්ෂ ශුභාරංචිය පතුරුවන්න බාධා කළ හැකිද?

3. මෙම ජනතාව අතරෙහි කුමන දේශපාලනික පක්ෂ ශුභාරංචිය පතුරුවීමෙහි උපකාර කළ හැකිද?

4. කුමන රජයේ නීති මෙම ජනතාව සමඟ ඔබගේ සේවයට බාධාවක් විය හැකිද?

5. කුමන රජයේ නීති මෙම ජනතාව සමඟ ඔබගේ සේවයට උපකාරී විය හැකිද?

6. මෙම ජනතාව අතරෙහි ප්‍රධාන දේශපාලනික නායකයන් කව්ද? ඔවුන්ව හඳුන්වාගෙන මෙම ජනතාවට ඔබගේ සේවය සඳහා ඔවුන්ගේ අනුග්‍රහය ලබාගැනීමට ඔබට උත්සාහ කළ හැක.

**ආත්මික විශ්ලේෂණය**

1. මෙම සෙනග අතරෙහි කුමන ආගමික කණ්ඩායම් සොයාගත හැකිද?

2. සෙනගගෙන් කී දෙනෙක් එක් එක් ආගම අදහනවාද?

3. ඔවුන්ගේ වර්තමාන ආගමත් සමඟ ඔවුන් අසතුටු වන්නේ කුමක් නිසාද? උදාහරණ ලෙස, රෝගවලදී අසාර්ථක වන මායාකාර ක්‍රියා මාර්ග ආදිය. එම අතෘප්තීන් ඉලක්ක කර ගෙන ඔබට ශුභාරංචිය යොමු කළ හැක.

4. ඔවුන්ගේ ආගම පිළිපැදීම වැඩිවේද නැතහොත් අඩු වේද?

5. ඔවුන්ගේ ආගමට ලිඛිත ග්‍රන්ථ තිබේද (එනම් මුස්ලිම්වරුන්ට කුරානය ආදිය)? එසේ නම්, ශුභාරංචිය ඉදිරිපත් කිරීමේදී ඒවා පාලමක් ලෙස කෙසේ භාවිත කළ හැකිද? (මෙය සමහර ඒවා සමග පුළුවන් විය හැක. අනෙක් ඒවා සමග බැරි විය හැක.)

6. ඕනෑම ආකාරයක ආගමික වෙනස්වීම් පිළිබඳ මෙම සෙනගගේ ආකල්ප මොනවාද? මෙම ප්‍රශ්නයට පිළිතුරු ඔබට මුහුණපාන්නට තිබිය හැකි ආගමික විරුද්ධතාවයට ඔබව සූදානම් කරයි.

7. කිතුනු ඇදහිල්ල පිළිබඳ ඔවුන්ගේ දැනුම ගැන පහත සඳහන් වන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න. ඔබ ශුභාරංචිය ඉදිරිපත් කිරීමේදී ඔබ කොතැන සිට ඇරඹිය යුතුදැයි තීන්දු කර ගැනීමට මෙම පිළිතුරු ඔබට උපකාරී වේ.

   පහත සඳහන් වන දේ පීළිබඳ මෙම ජනතාවගේ ආකල්ප කුමක්ද?

   දෙවියන්වහන්සේ පිළිබඳ,

   -දෙවිකෙනෙකු සිටින බව ඔව්හු විශ්වාස කරති.
   -දෙවිකෙනෙකු සිටින බව ඔව්හු ප්‍රතික්ෂේප කරති.
   -බයිබලයේ එළිදරව් කර ඇති ලෙස එකම සත්‍ය වූ දෙවියන්වහන්සේ ගැන ඔව්හු

දනිති.
-එකම සත්‍ය වූ දෙවියන්වහන්සේ ගැන ඔව්හු නොදනිති.
-ඔව්හු එකම සත්‍ය වූ දෙවියන්වහන්සේ ගැන දන්නා නමුත් උන්වහන්සේ කෙරෙහි උදාසීන වෙති.
-ඔවුහු එකම සත්‍ය දෙවියන්වහන්සේ ගැන දැනගෙන උන්වහන්සේට විරුද්ධ වෙති.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ,
-යේසුස්වහන්සේ සිටින බව ඔව්හු අදහති.
-යේසුස්වහන්සේ සිටින බව ඔව්හු ප්‍රතික්ෂේප කරති.
-යේසුස්වහන්සේ ඔවුන්ගේ පව් වෙනුවෙන් දිවිපිදූ බව ඔව්හු දනිති.
-යේසුස්වහන්සේ ඔවුන්ගේ පව් වෙනුවෙන් දිවිපිදූ බව ඔව්හු නොදනිති.
-ඔව්හු යේසුස්වහන්සේ ගැන දන්නා නමුත් උන්වහන්සේ කෙරෙහි උදාසීන වෙති.
-ඔව්හු යේසුස්වහන්සේ ගැන දැන උන්වහන්සේට විරුද්ධ වෙති.

ශුද්ධාත්මයාණන්වහන්සේ පිළිබඳ,
-ශුද්ධාත්මයාණන්වහන්සේ සිටින බව ඔව්හු අදහති.
-ශුද්ධාත්මයාණන්වහන්සේ සිටින බව ඔව්හු ප්‍රතික්ෂේප කරති.
-ඔවුන් ශුද්ධාත්මයාණන්වහන්සේ ගැන කිසිවිටකත් අසා නැත.
-ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය ඔවුන්ට තේරෙන්නේ නැත.
-ඔව්හු ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය තේරුම්ගෙන ඇති නමුත් උන්වහන්සේ කෙරෙහි උදාසීන වෙති.
-ඔව්හු ශුද්ධාත්මයාණන්වහන්සේගේ සේවය තේරුම්ගෙන ඇති නමුත් උන්වහන්සේට විරුද්ධ වෙති.

ශුභාරංචිය පිළිබඳ,
-ඔවුන්ට ශුභාරංචිය ගැන කිසිම දැනුමක් නැත.
-ඔවුන්ට ශුභාරංචිය ගැන යම් කිසි දැනුමක් ඇත.
-ශුභාරංචියේ මූලික සත්‍යයන් ඔවුන් අවබෝධ කරගෙන ඇත.
-ශුභාරංචියට පුද්ගලිකව ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය බව ඔවුන් අවබෝධ කරගෙන ඇත.
-ශුභාරංචිය සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවය ඔවුන් හඳුන්වාගෙන ඇත.
-ඔවුන් ශුභාරංචිය පිළිගෙන ඇත.

බයිබලය පිළිබඳ,
-ඔවුන් කිසිවිටකත් බයිබලය ගැන අසා නැත.
-බයිබලය තිබෙන බව ඔව්හු දනිති.
-එය දේව වචනය යනුවෙන් ඔව්හු අදහති.
-දේව වචනය කෙරෙහි ඔව්හු විරුද්ධ වෙයි.
-බයිබලය කෙරෙහි ඔව්හු උදාසීන වෙති.

මෙම ජනතාවට ශුභාරංචිය දීමට වැඩියෙන්ම සුදුසු භාෂාවේ බයිබල් පරිවර්තන තත්ත්වය කුමක්ද? ඔවුන්ගේම භාෂාවට පරිවර්තනය කිරීමට ඉතිරිව තිබෙන්නේ බයිබලයේ කුමන කොටස්ද?

අලුත් ගිවිසුම

පරණ ගිවිසුම

කිතුනුවෝ පිළිබඳ,

ඔවුන්ට කිතුනුවන් ගැන කොපමණ දැනුමක් තිබේද?
-ඔවුන් කිතුනුවන් ගැන කොපමණ දැනුමක් තිබේද?
-ඔවුන් කිතුනුවන් පිළිබඳව අසා ඇත, නමුත් කවදාවත් කිතුනුවකුව මුණගැසී නැත.
-සමහර කිතුනුවන් මුණ ගැසී තිබේ.
-සත්‍ය ඇදහිලිවන්තයෝ ඔවුන් අතර ජීවත් වෙති.

8. මෙම සමූහයේ කිතුනුවන් සිටිනවා නම්, මෙම ප්‍රශ්නවලට උත්තර දෙන්න:
-මෙම සමූහයේ කී දෙනෙක් තමා කිතුනු යැයි කියා සිටිත්ද?
-ඔවුන්ගෙන් කී දෙනෙක් ඇදහිලිවන්තයන්ගේ සමූහයකට ඇතුළත් කර තිබේද? (සභාවකට)
-කී දෙනෙක් ශුභාරංචිය පතුරුවීමේ ක්‍රියාකාරී වන්නේද?
-කී දෙනෙක් කිතුනුවන් වී සිටි නමුත් යේසුස්වහන්සේ අනුගමනය කිරීමෙන් ආපසු හැරී ඇත්ද?
-ඔවුන් දෙවියන්වහන්සේගෙන් ඈත් කරවීමට හේතූන් කුමන ඒවා ලෙස පෙනෙන්නේද?
-මෙම සමූහය අතරෙහි ප්‍රධාන කිතුනුවන් කව්ද?
-මෙම සෙනඟ අතරෙහි "කූඩාරම් තනන" ඇදහිලිවන්තයෝ වෙසෙත්ද? (මෙම සෙනඟ අතරෙහි ලෞකික රැකියාවක නිරත වන අතර ක්‍රියාශීලීව ශුභාරංචිය පතුරුවන ඇදහිලිවන්තයන්)

9. පොදු වශයෙන්, මෙම සෙනඟ අතර ශුභාරංචිය වපුරන්න කාලයක්ද නැතහොත් අස්වැන්න නෙළන්න කාලයක්ද කියා ඔබ සිතන්නේද? සාමාන්‍යයෙන්, යම් පෙදෙසක අස්වැන්න සඳහා ආත්මිකව පරිණත වී ඇති විට වැඩි සේවකයින් අවශ්‍යයි.

10. කුමන කිතුනු සභා හෝ මිෂනාරි සේවාවන් මෙම ජනතාව තුළ කරන්න උත්සාහ කොට අසාර්ථක වී ඇත්ද? ඒවා අසාර්ථක වීමට, ඔබ විශ්වාස කරන ලෙසට, හේතු මොනවාද? ඔබට අනෙක් අයගේ අසාර්ථක වීමට, ඔබ විශ්වාස කරන ලෙසට, හේතු මොනවාද? ඔබට අනෙක් අයගේ අසාර්ථකවීම්වලින් පාඩම් ඉගෙනගෙන එම වැරදීම යළිත් නොකිරීමට හැකි වේ.

11. කුමන කිතුනු සභා හෝ මිෂනාරි සේවාවන් දැන් මෙම ජන සමූහයෙන් වැඩි දෙනෙක් වෙසෙන පෙදෙස තුළ ක්‍රියාකාරීද? ඔවුන්ගේ නම් සහ ලිපින ලබා ගන්න.

12. මේවායින් කුමන ඒවා ඵලදායීද සහ ඒවා ඵලදායි වන්නේ මන්ද? මෙම කණ්ඩායම්වල සාර්ථකත්වයෙන් ඔබට ඉගෙන ගත හැක. මෙම ජනතාවට ශුභාරංචිය පතුරුවීමේදී ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමටත් ඔබට වුවමනා වෙයි. මෙම ජන සමූහයට ශුභාරංචිය ගෙනයෑම සඳහා ඔබ ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන්නේ කෙසේද?

13. කිතුනු සාක්ෂියක් තිබේ නම්, කුමන භාෂාව හෝ භාෂා භාවිතකරන්නෙහිද? දැන් පවතින කිතුනු සාක්ෂිය මගින් දැනට ශුභාරංචිය ලැබී නැති සහ වෙන භාෂාවක් කතාකරන මෙම කණ්ඩායමේ මනුෂ්‍යයන් වෙතට යෑමට ඔබට මගපෙන්වීමක් තිබිය හැක.

14. මෙම ජනතාව අතරෙහි කුමන වර්ගයේ කිතුනු සේවාවක් දැනට කරනු ලැබේද? උදාහරණ ලෙස, ශුභාරංචි සාක්ෂියක් ලෙස භාවිතකරනු ලබන කුසගින්නෙන් පෙළෙන්නන්ට අහාරදීමේ ඵලදායි වැඩසටහනක් දැනටම තිබේ නම්, නැවත එයම නොකරන්න. ඔබගේ

අරමුණ නම් ශුභාරංචිය නොලත් අයට ශුභාරංචිය දීම හා සෙනඟට ශුභාරංචිය දීමේ කාර්ය දෙගුණ කිරීම මිස දැනට පවත්නා සේවාවන් සමඟ තරඟ කිරීම හෝ ඒවා පිටපත් කිරීම නොවේ.

15. මෙම දැන් පවත්නා කිතුනු මිෂනාරි සේවාවන් කෙරෙහි ජනතාවගේ ආකල්ප

-විරුද්ධ
-උදාසීන
-මිත්‍ර

16. මෙම සමූහය අතරෙහි සත්‍ය ශුභාරංචි සභා තිබෙනවා නම් මෙම ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න:
-මෙම සෙනඟ අතරෙහි සත්‍ය ශුභාරංචි සභාවන් කීයක් පිහිටුවා ඇත්ද?
-ඒවා කොපමණ වේගයෙන් වර්ධනය වේද?
-ඔවුන් මුහුණ දෙන දුෂ්කරතා මොනවාද? ඒ මන්ද?
-ඒවායින් සාර්ථක ඒවා මොනවාද? ඒ මන්ද?
-තව සභා පිහිටුවීමට අවශ්‍යතාවයක් තිබේද?

17. ඔබ අධ්‍යයන කරන ජනතාව අතරෙහි කිතුනු සාක්ෂියක් නැත්නම්, වෙනත් කිතුනු ආයතනයක් මේ හා සමාන සමූහයක් වෙත යෑමේ අත්දැකීම් ලබා ඇතිද? මේ හා සමාන සමූහයක් සමඟ ඔවුන්ගේ අත්දැකීම්, ඔබ අධ්‍යනය කරන සමූහය වෙත ශුභාරංචිය ගෙන යෑමේදී භාවිත කළ හැක.

18. මෙම ජන සමූහය තුළ ක්‍රියාකාරී වන්නේ සාතන්ගේ කුමන අධිපතිකම් සහ පරාක්‍රමධාරීන්ද කියා ඔබට තීන්දු කළ හැකිද? සමහර ආත්මික බලවේග සමහර කණ්ඩායම් අතරෙහි සහ සමහර භූගෝලීය පෙදෙස්වල ක්‍රියාකාරී වන බව බයිබලය උගන්වයි. (දානියෙල් 10 බලන්න. විශේෂයෙන් 13 වැනි පදය සලන්න. එපීස 6:10-17 ත් බලන්න.)

කුමන අධිපතිකම් සහ පරාක්‍රමධාරීන් ක්‍රියාත්මක වනවාදැයි යාච්ඤාව එළිදරව් කරයි. සමහරවිට ජනතාවගේ ඉතිහාසය, ප්‍රදේශය, පිළිබඳ ඉතිහාසය පාඩම් කිරීමෙන් ක්‍රියාත්මකවී පවතින ආත්මික බලවේග හඳුන්වාගැනීමට උපකාරී වේ.

උදාහරණයක් ලෙස, ඇමරිකා එක්සත් ජනපදයේ එක ස්ථානයක සම ලිංගික අය බොහෝ දෙනෙක් සිටිති. මෙම ජන සමූහයේ සහ ඔවුන්ගේ නගරයේ සම ලිංගික භාවය පාලනය කරන ආත්මය නිරීක්ෂණය කිරීම මගින් හඳුන්වාගැනීමට බොහෝ පහසුය. එක්සත් ජනපදයේ තව නගරයක් දියුණුවූයේ එම පෙදෙසෙහි රත්තරං සොයාගැනීමට මනුෂ්‍යයන් ඉතා ඕනෑකමින් ක්‍රියාකිරීම නිසාය. අදත් තණ්හාවේ ආත්මය තවම එම නගරය පාලනය කරයි.

ඔබ මෙම ආත්මික බලවේග හඳුන්වාගත් විට, ඔබ ඒවා යාච්ඤාවෙන් බැද මෙම ජනතාව අතරෙහි ක්‍රියාකිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය නිදහස් කළ යුතුය *"ආත්මික උපක්‍රම :ආත්මික සටන පිළිබඳ අත් පොත"* නමැති හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඩම්මාලාව මෙම විෂයය ගැන වැඩිදුරටත් පාඩම් සපයයි.

## ඔවුන් වෙත යා යුත්තේ කව්ද?

මෙම ජනතාව වෙත යා යුත්තේ කව්ද? ඔවුන්ගේ භාෂාව කතා කළ හැක්කේ කාටද? ඔවුන්ගේ සංස්කෘතිය සහ සමාජ සැලැසුම මගින් පිළිගන්නේ කව්ද? ඔවුන්ගේ සංස්කෘතිය සහ සමාජ සැලැස්ම ගැන රැස්කළ තොරතුරු මෙය තීන්දු කිරීමට උපකාර කිරීමට ඔබට භාවිත කළ

හැකිය. තවද උත්සහ කොට සාර්ථක වී හෝ උත්සාහ කොට අසාර්ථක වී ඇති කිතුනු ආයතන පිළිබඳ තොරතුරුත් භාවිත කරන්න. ඔවුන් භාවිත කළ පුද්ගලයන් ඔවුන්ගේ සාර්ථකත්වයට හෝ අසාර්ථකත්වයට බලපෑවා විය හැක.

ශුභාරංචිය බෙදාගැනීමට යන කවරෙකු හෝ,

-ඇදහිලිවන්තයෙක් විය යුතුයි. ඔවුන්ගේ ජීවිත ක්‍රමය, ආකල්ප සහ චර්යාව තුළ මෙම සාක්ෂිය තිබිය යුතුයි.

-හොඳ පුද්ගලික යාච්ඤා සහ බයිබල් අධ්‍යයන පුරුදු තිබිය යුතුයි.

-ජනතාව වෙතට යෑමේදී භාවිතකරන්න යන ක්‍රමවලට හරියාකාරව සුදුසු ආත්මික දීමනා තිබිය යුතුයි.

-සූදානම්ව සිටිය යුතුයි: අවශ්‍ය වෙන අවස්ථාවේදී වැඩෙහි යෙදිය නොහැකි නම් හැකියාවෙන් ඵලක් නැත. පුද්ගලයා යන්න කැමතිද සහ සූදානම්ද?

-සභාව නැමැති ශරීරයට සුදුසු ලෙස ගැළපිය යුතුයි. (මෙම ජනතාවට ශුභාරංචිය සමඟ යෑමේ අරමුණ සදහා වෙන සාමාජිකයන් සමග සහයෝගයෙන් කටයුතු කිරීමට සූදානම් වීම)

-මෙම විශේෂ ජනතාවට සේවය කිරීමට දෙවියන්වහන්සේ විසින් කැඳවනු ලැබ සිටිය යුතු වේ. දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ව විශේෂ කණ්ඩායම්වලට කැඳවන සේක. පාවුලුතුමාව විජාතීන් වෙතට යෑමට කැඳවා පේදුරුතුමා යුදෙව්වන් වෙතට යෑමට කැඳවූ ලෙසටමය.

-මෙම විශේෂ කණ්ඩායම වෙත යෑමට කායිකව, ආත්මිකව සහ අධ්‍යාපනිකව ප්‍රමාණවත් ලෙස සූදානම් විය යුතුයි. ගිඩියන්ට ඔහුගේ හමුදාව විශේෂයෙන් සූදානම්ව සිටි ස්වල්පදෙනා අඩු කිරීමට සිදුවූ බව මතක තබාගන්න.

## ඔවුන් වෙතට යා යුත්තේ කෙසේද?

මෙම ජනතාව වෙතට යා යුත්තේ කෙසේද? කුමන ක්‍රම භාවිත කළ යුතුද? මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා ඔබ ඔවුන්ගේ සංස්කෘතිය සහ සමාජ ව්‍යුහය ගැන ඉගෙනගත් දේ භාවිත කරන්න. ඔවුන්ගේ අවශ්‍යතා සපුරන ක්‍රම මත අවධානය යොමු කරන්න. සන්නිවේදනයේ හොඳම ක්‍රම භාවිත කරන්න. ඔබගේ ක්‍රම බයිබලයට අනුකූල බව නිශ්චිත වන්න. බයිබලයේ මූලධර්ම වලට විරුද්ධවූ කිසිම ක්‍රමයක් භාවිත නොකරන්න.

ශුභාරංචිය පැතිරීමේ උපායන් ලෙස ලෝකයේ වෙනස් පෙදෙස්වල භාවිතකර ඇති විවිධ ක්‍රමවල ලැයිස්තුවක් මෙන්න. මෙම ජන සමූහය වෙත යෑමේදී මේවායින් කුමක් ඵලදායි විය හැකිද?

-ගුවන් විදුලිය
-රූපවාහිනි වැඩ සටහන්
-ක්‍රිස්තියානි සාහිත්‍යය (පොත් පත්, සඟරා, ශුභාරංචි පත්‍රිකා)
-ශ්‍රව්‍ය කැසට් පටි
-විඩියෝ කැසට් පටි
-චිත්‍රපටි
-බයිබල් අධ්‍යයන පන්ති (නිවසේදී, සභාවේදී හෝ සමාජ ශාලාවක)
-තැපැල් මාර්ගික අධ්‍යයනය

-බයිබල් පාසැල් සහ විදුහල්
-ගිහි කිතුනුවන්ට පුහුණුව
-ලෞකික පුවත්පත්/සඟරා
-නිවසින් නිවසට ගොස් සාක්ෂි දැරීම
-සංගීත ප්‍රසංග
-සභාව තුළ විශේෂ ශුභාරංචි මෙහෙයන්
-විවෘත රැස්වීම් (පිටි, උද්‍යාන)
-ළමයින්ට මූලික සහ ද්විතීය අධ්‍යාපනය සපයන කිතුනු පාසැල්
-සෞඛ්‍ය සේවය
-හදිස්සි අවස්ථාවල සහනය (සාගත, ආපදා ආදිය ඇතිවූ විට සාත්තු කිරීම)
-රැකිරක්ෂා සහ රැකියාව, පුහුණුවීමේ උපකාරය (රැකියා හිඟය විශාල ප්‍රශ්නයක් වන තැන්වල)
-ආහාර බෙදීම
-කෘෂිකාර්මික ආධාර
-කිතුනු චිත්‍ර සහ නාට්‍ය
-තරුණයන්, ළමයින්, මිනිසුන්, ස්ත්‍රීන් ආදියට විශේෂ පිටට යන ශුභාරංචි කණ්ඩායම්
-සාක්ෂරතා වැඩ (ලියන්න සහ කියවන්න ජනතාවට ඉගෙනගන්න උපකාර කිරීම)
-රැකියාවල නියුක්ත දෙමව්පියන්ට දරුවන් රැකබලා ගැනීමට ආධාර කිරීම
-බන්ධනාගාර සේවය
-විශේෂ කණ්ඩායම්වලට සේවය (කායිකව හෝ මානසිකව අංගවිකල, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන්, බේබද්දන්, විවාහ නොවූ මව්වරුන්, මහලු අය යනාදිය)

යාච්ඤාව සහ විශ්ලේෂණය මගින් ඔබ ක්‍රම තීන්දු කළාට පසු, මෙම ප්‍රශ්නය අසන්න. මෙම ක්‍රමවලට එරෙහිව ජන සමූහය හෝ පිටස්තර බලවේග මගින් කුමන විරුද්ධතාවයක් පැන නැගිය හැකිද? ඔබ මෙම විරුද්ධතා ගැන කුමක් කරන්නේද?

## සැලැස්මක් ක්‍රමවත්ව දක්වන්න.

ඔබ අධ්‍යයනය කළ ජනතාව ගැන ඔබ ඉගෙනගත් දේ ඔබ භාවිත නොකළහොත් ඔබ සම්පූර්ණ කළ විශ්ලේෂණයන් කිසිම ප්‍රයෝජනයක් නැත. අධ්‍යනය කිරීම තුළින් පමණක් මෙම ජනතාවට ශුභාරංචිය ගෙන යා නොහැක. ඔවුන් වෙතට ශුභාරංචිය ගෙන යෑමට ඔබ සැලැස්මක් සැකසිය යුතුයි. පසුගිය පරිච්ඡේදයේ ඔබගේම පුද්ගලික සේවය ඉෂ්ට කිරීමට ඔබ සැලැසුමක් සැකසුවේය. මෙම පර්ච්ඡේදයේ සහ මින් පසු පරිච්ඡේදවල ලෝකයේ ජනතාව, භූගෝලිය පෙදෙස්, ජාතීන් සහ ප්‍රාදේශීය කොටස් වෙතට යෑමට ඔබ සැලැසුමක් සකසා ගන්නේය. එකළොස්වැනි පර්ච්ඡේදය "සැලසුම් කිරීමට උපක්‍රම" යන්න මෙය කිරීමට ඔබට උපකාර කරයි.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩම්න් ලියන්න

2. "ජන සමූහය" යන පදය පැහැදිලි කරන්න

3. ජන සමූහ විශ්ලේෂණයක ඇතුළත් වන්නේ කුමක්ද?

4. ජන සමූහ විශ්ලේෂණයක අරමුණු මොනවාද?

5. මෙම පාඩමෙහි අධ්‍යයනයේ කොටස ලෙස, ඔබ සත්‍ය වශයෙන් ජන සමූහයක විශ්ලේෂණයක් සම්පූර්ණ කළේද?

6. මෙම කණ්ඩායමට ශුභාරංචිය පතුරවීමට ඔබ ඉගෙනගත් දේ භාවිත කිරීමට ඔබ සැලසුමක් සාදා ඇත්ද? (පරීක්ෂණවලට පිළිතුරු මෙම අත්පොතෙහි අවසාන පරිච්ඡේදයේ අවසානයේ සපයා ඇත.)

(ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම පොතේ අවසාන පරිච්ඡේදයට පසු සඳහන් කර ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

හොෂෙයාහි හත්වැනි පරිච්ඡේදය පාඩම් කරන්න. මෙම පරිච්ඡේදය, ඉශ්‍රායෙල් ජාතියේ කොටසක්වූ ඒප්‍රායිම්වරුන් සහ සමාරිකයන් ලෙස හඳුන්වන ජන සමූහවල දෙවියන්වහන්සේගේ ආත්මික විශ්ලේෂණයයි. මෙම ජනතාව ඔවුන්ගේ සත්‍ය ආත්මික තත්ත්වය හඳුනාගත්තේ නැත. (9 වැනි පදය) "පැසුණු හිසකෙස්" යන්න ආත්මිකව යෙදූ විට, පිරිහෙන ආත්මික ශක්තිය සහ සමීප වන ආත්මික මරණයේ ලකුණක් වේ.

ස්වභාවික ලොවේ පැසුණු හිසකෙස් තිබීම එක දෙයකි. ඒවා තිබී එය දැන නොසිටීම තව දෙයකි. පුද්ගලයෙකුට පැසුණු හිසකෙස් තිබී එය නොදැන සිටීම ස්වභාවයට පටහැනිය. උන්වහන්සේගේ ජනතාව සමඟ දෙවියන්වහන්සේගේ ප්‍රශ්නය ඔවුන්ට පැසුණු හිසකෙස් තිබීම නොව. නමුත් ඔවුන්ට ඒවා තිබී එය ගැන නොදැන සිටීමයි.

පැසුණු හිසකෙස් තිබී එය නොදැන සිටීම පරීක්ෂා නොකරන ජීවිතයක උදාහරණයකි. "ඔව්හු" තමුන්ගේ සිත්වලින් කල්පනා නොකරතියි දෙවැනි පදයේ වාර්තා වී ඇත. තමන්ගේම සිත් තුළ පිරිහෙන ආත්මික ශක්තියේ සහ සමීපවන ආත්මික මරණයේ ලකුණු ඔවුන් හැඳිනගෙන තිබුණේ නැත. (පැසුණු කෙස්)

ඔවුන්ගේ පිරිහෙන ආත්මික ශක්තියට හේතුවූ සමහර දේවල් පහත සඳහන් වී ඇත. ඔබ මෙම ලයිස්තුව පාඩම් කරන අතර ඔබගේ සිතත් පරීක්ෂා කරන්න.

## 1. රැවටිලිකාර පෙනුමක්

6-7 දක්වා පදවල මෙය පැහැදිලි කරයි.දෙවියන්වහන්සේ උදුනක් භාවිත කළ සේක. උදුනේ ගින්න නිවී ගොස් මෙන් පෙනුණි. නමුත් ඇත්ත වශයෙන් දැල්ල යටින් දැවෙමින් තිබුණි. බාහිර හොඳ පෙනුමක් ඇති මනුෂ්‍යයන් ඔබ දන්නවාද? ඔවුන් කිතුනුවකු මෙන් හැසිරේ, කිතුනුවකු මෙන් කතාකරයි, හොඳ ක්‍රියා කරයි, නමුත් අභ්‍යන්තරයේ ගිනි දැල්ල නොදමා දැවෙමින් තිබේ. රිදුණු සිතක්, අමනාපය, කෝපය, දොස් තැබීම, ඊර්ෂ්‍යාව, තණ්හාව, සමාව නොදීම ඇත. ප්‍රශ්නය එළිදරව් කිරීමට දෙවියන්වහන්සේ උදුනේ දොර විවෘත කරන සේක. අපට තිබුණේයැයි සිතූ ජයග්‍රහණය අපිට නැති බව දැනගැනීමට අපට නොයෙක් අවස්ථාවන්වලට අපගේ ජීවිත තුළට පැමිණීමට උන්වහන්සේ අවසර දෙන සේක.

## 2. අසම්පූර්ණ කීකරුකම

අටවැනි පදයේ මෙය පැහැදිලි කිරීමට දෙවියන්වහන්සේ නොපෙරළා පිලිස්සූ රොටියක් භාවිත කළ සේක. ඔවුන් දෙවියන්වහන්සේ අණ කළ සමහර දේවල් කළ නමුත් සමහර දේවල් නොකර තිබුණි. අසම්පූර්ණ කීකරුකම සම්පූර්ණ අකීකරුකම වේ. සැමියාට 85%ක් විශ්වාසවන්ත වන ස්ත්‍රිය සත්‍ය වශයෙන් ඔහුට 100% අවිශ්වාසවන්තයි.

## 3. අස්ථිර විශ්වාසවන්තකම

11 වැනි පදයේ අනුවණ පරෙවියෙකුගේ උදාහරණයෙන් මෙය පැහැදිලි කර ඇත. මෙම ජනතාව ආධාර පොරොන්දු කළ ඕනෑම කටහඬක් පස්සේ ගියහ. එනම් ඊජිප්තුව, අසිරියාව ආදිය ඔබ මොබ බැලීම තුළින් අපගේ ප්‍රශ්න විසඳෙන්නේ නැත. විසඳුම තිබෙන්නේ ඊජිප්තුවේ හෝ අසිරියාවේ නොවේ. විසඳුම ඇත්තේ යේසුස් ක්‍රිස්තුස් ස්වාමින්වහන්සේ තුළයි.

## 4. අවිශ්වාස සේවය

16 වැනි පදයේ හොර දුන්නක් මගින් පැහැදිලි කර ඇත. ඵලදායි නැති බුරුල් දුනුදියකට දෙවියන්වහන්සේ මෙම ජනතාව සංසන්දනය කරන සේක. අපේ කිතුනු සේවයේදී අපි අවිශ්වාස වේ නම් අපිට නිරතුරුවම අරමුණු ඉටුකරගත හැකි නොවේ. අපි කිසිවිටකත් ඉලක්කය කරා යෑමට උත්සාහ නොකරන්නෙමු. දෙවියන්වහන්සේ අපේ ජීවිත සඳහා තිබෙන අරමුණ කරා අපි කවදාවත් ළඟා වෙන්නේ නැත.

දෙවියන්වහන්සේට අපේ ජීවිතවල තිබෙන මෙම දුෂ්කරතාවනුත් හරිගැස්වීමට අවශ්‍ය වී ඇත. දහසය වෙනි පදයේ, "ඔවුන් හැරෙන නමුත් මහෝත්තමයාණන් වෙතට නොවේය" යයි දෙවියන්වහන්සේ කියන සේක. දෙවියන්වහන්සේට අපව සුවකොට, නැවත ප්‍රාණවත් කොට, ආශීර්වාද කොට, පාවිච්චි කිරීමට අවශ්‍යයි. නමුත් මේ සඳහා තිබෙන උන්වහන්සේ වෙතට ආපසු පැමිණීමේ අවශ්‍යතාව ඉටුකිරීමට අපි පසුබට වෙමු. අපි සමහරවිට උන්වහන්සේ වෙත හැරෙන, නමුත් එය අපගේ ප්‍රශ්නය විසදා ගැනීමට පමණක් වේ. අපි දෙවියන්වහන්සේට ආපසු පැමිණෙන්නේ නැත. දෙවියන්වහන්සේ දෙසට හැරීම පමණක් ප්‍රමාණවත් නොවේ. අපි උන්වහන්සේ වෙතට ආපසු පැමිණිය යුත්තේ සම්පූර්ණයෙන්ම යටත් වීමෙන්ය.

# හත්වන පරිච්ඡේදය

# ප්‍රදේශයක් විශ්ලේෂණය කිරීම

**අරමුණ :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසුව ඔබ හට පහත සඳහන් දෑ කිරීමට හැකි වනු ඇත.
එනම්:

- ප්‍රධාන පදය කටපාඩමින් ලිවීමට.
- මෙම අධ්‍යයනයට ගැළපෙන පරිදි "ප්‍රදේශය" නම් පදය අර්ථ දැක්වීමට.
- ප්‍රදේශ විශ්ලේෂණයක අන්තර්ගතය පැහැදිලි කිරීමට.
- ප්‍රදේශ විශ්ලේෂණයක පරමාර්ථය හඳුනාගැනීමට.
- ප්‍රදේශයක් විශ්ලේෂණය කිරීමට.
- මෙම ප්‍රදේශය තුළ ශුභාරංචිය පැතිරවීමට ඔබගේ විශ්ලේෂණය භාවිත කිරීමට

**ප්‍රධාන පදය :**

> **නැගිට දේශයෙහි දිගටත්, හරහටත් පලයන්න. මක්නිසාද ඒක නුඹට දෙන්නෙමි (උත්පත්ති 13:17).**

## හැඳින්වීම

පසුගිය පරිච්ඡේදයේ ඔබ සෙනඟ කණ්ඩායමක් විශ්ලේෂණය කළෙහිය. මෙම පාඩමේ දී ඔබ ශුභාරංචිය ගෙන යෑමේ පරමාර්ථය ඇතිව සුවිශේෂී ප්‍රදේශයක් විශ්ලේෂණය කරනු ඇත.

## ප්‍රදේශයක්

මෙම අධ්‍යයන උදෙසා ප්‍රදේශයක් යන්න අර්ථ විග්‍රහ කෙරෙන්නේ භූගෝලීමය, භාෂාමය, සංස්කෘතීමය නැතහොත් දේශපාලනමය හේතූ මත නිශ්චය කරනු ලබන රටක සුවිශේෂී කොටසක් ලෙස වේ.

**භූගෝලීය ප්‍රදේශයක් යනු :** කඳුවලින් වටවීම නිසා රටක අනෙකුත් කොටස්වලින් වෙන් වූ මිටියාවතක් විය හැකිය. යම් කිසි භූගෝලීමය ප්‍රදේශයක සීමා ඇති වන්නේ ස්වභාවික මූල ද්‍රව්‍යවලිනි.

**භාෂාමය ප්‍රදේශයක් යනු :** රට තුළ ඇති එකම භාෂාව කතා කරන මිනිසුන් වෙසෙන ප්‍රදේශයකි.

**සංස්කෘතිමය ප්‍රදේශයක් යනු :** රට තුළ ඇති එක හා සමාන සෙනඟ කණ්ඩායම් වෙසෙන පෙදෙසකි. නිදසුනක් ලෙස ඔවුන් සියල්ලෝම ගෝත්‍රික කණ්ඩායම්වලට අයත් අය විය හැකිය. නැතහොත් සියල්ලන්ම යම් ආගමික අනුගාමිකයින් විය හැකිය.

**දේශපාලනමය ප්‍රදේශයක් යනු :** නගරයක් හෝ පළාතක් හෝ ගමක් හෝ විය හැකිය. එහි මායිම් රජය මගින් නිර්ණය කරනු ඇත.

## ප්‍රදේශයක විශ්ලේෂණය

ඔබ ප්‍රදේශ විශ්ලේෂණයක් කරන විට රටක් ඇතුළත සුවිශේෂී වූ ප්‍රදේශයක් ඔබ විස්තරාත්මකව විශ්ලේෂණය කරන්නෙහිය. එය වෙනම ප්‍රදේශයක් බවට වෙන් කෙරෙන දේශපාලනමය, භූගෝලීය, භාෂාමය හා සංස්කෘතිකමය කරුණු ඔබ නිර්ණය කරන්නෙහිය. ඔබ එහි ආත්මික තත්ත්වය ද විශ්ලේෂණය කරන්නෙහිය. එමෙන්ම ශුභාරංචිය පිළිගැනීම කෙරෙහි බලපාන ප්‍රදේශයෙන් පිටත බාහිර බලවේග ද විශ්ලේෂණය කරන්නෙහිය.

## ප්‍රදේශයක් විශ්ලේෂණය කිරීමේ පරමාර්ථය

ඔබගේ මෙම අධ්‍යයනයේ පරමාර්ථය වන්නේ රටක විශේෂ ප්‍රදේශයකට ශුභාරංචිය ගෙන යාම වේ. ඒ ශුභාරංචිය පැතිරවීම පිණිස කෙරෙන පරීක්ෂණයක් මිස, පරීක්ෂණයක් කළ යුතු නිසාම කෙරෙන්නක් නොවේ. ඔබ අධ්‍යයනයට පෙලඹවූ මුල් පරමාර්ථය ඉෂ්ට නොකර සම්පූර්ණ කාලයම අධ්‍යයන කටයුතු සඳහා පමණක් නොයෙදීමට වගබලාගන්න. ප්‍රදේශයක් එක්සත් කර එය විශේෂිත තැනක් බවට පත් කරන දේ මඟින් මුළු ප්‍රදේශයේම ශුභාරංචිය පැතිරවීමේ උපක්‍රමයක් ඔබට සැපයීමට ඉඩ ඇත.

ඔබ ප්‍රදේශයක් විශ්ලේෂණය කරන්නේ මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට වේ:

**මෙම ප්‍රදේශය තුළ සිටින්නේ කවර සෙනඟ කණ්ඩායම් ද?**

ඔවුන් කවුරුන් ද, ප්‍රමාණය කොපමණ ද, ඔවුන් සිටින්නේ කොතැන ද?

**මෙම කණ්ඩායම්වලට අයත් පොදු දේ කවරක් ද?**

සුවිශේෂී ප්‍රදේශයක කොටසක් ලෙස මෙම සෙනඟ කණ්ඩායම් එක් කරන්නේ කවරක් ද?

**මෙම ප්‍රදේශය කුමන ආකාරයේ ද?**

ශුභාරංචිය එම සෙනඟ වෙත ගෙන ඒමට මෙම ප්‍රදේශය ගැන ඔබට දැනගැනීමට අවශ්‍ය කවරක් ද?

**මෙම ප්‍රදේශය වෙත යා යුත්තේ කවුරුන් ද?**

මෙම ප්‍රදේශයේ ශුභාරංචිය පැතිරවීමට යොදන සේවකයින්ට තිබිය යුතු සුදුසුකම් කවරේ ද?

**මෙම ප්‍රදේශයේ ශුභාරංචිය පතුරුවන්නේ කෙසේ ද?**

මෙම මුළු ප්‍රදේශය සඳහාම භාවිත කළ හැකි පොදු ක්‍රම ශිල්ප කවරේ ද? වඩාත්ම ඵලදායී වන්නේ කවර ඒවා ද?

මෙම ප්‍රශ්නවලට සපයන පිළිතුරු, යම් ප්‍රදේශයක් වෙතට ළඟා වීමේ ඔබේ භූමිකාව නිර්ණය කිරීමට උපකාරී වන අතර, ශුභාරංචිය එතැනට ගෙන යාමේ සැලැස්ම සැකසීමට ද සහාය වනු ඇත.

## තොරතුරු එක්රැස් කරගන්නේ කෙසේ ද?

ඔබගේ විශ්ලේෂණයට අවශ්‍ය තොරතුරු පහත දැක්වෙන ක්‍රම මගින් එක්රැස් කරගත හැකිය.

**යාච්ඤාව :**

ශුභාරංචිය එම පෙදෙසට ගෙන යාම සඳහා එම පෙදෙස පිළිබඳව ඔබ දැනගත යුත දේ එළිදරව් කරන ලෙසට දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

**ලිඛිත ද්‍රව්‍ය අධ්‍යයනය කිරීම :**

මෙම පෙදස පිළිබඳව පොත්-පත් හා ලිඛිත ද්‍රව්‍ය අධ්‍යයනය කරන්න. මෙම අත්පොතේ උපග්‍රන්ථයේ තොරතුරු සොයාගත හැකි තැන්වල ලැයිස්තුවක් අන්තර්ගතය.

**නිරීක්ෂණය :**

එම ප්‍රදේශයට පෞද්ගලිකවම ගොස් එහි සිටින සෙනඟත්, ප්‍රදේශයත් නිරීක්ෂණය කරන්න.

**සම්මුඛ සාකච්ඡා:**

එම ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් හා නායකයින්ගෙන් ප්‍රශ්න අසන්න. දැනටමත් එහි සේවය කරන ඇදහිලිවතුන් සිටින්නේ නම්, ඔවුන් උගත් දට ඥදැනගැනීමට ඔවුන් හා සමඟ සම්මුඛ සාකච්ඡාවක් පවත්වන්න. මෙහි උපග්‍රන්ථයේ නිදර්ශන සම්මුඛ සාකච්ඡා අන්තර්ගතය.

**යම් ප්‍රදේශයක් විශ්ලේෂණය කිරීමට පහත දැක්වෙන ආකෘතිය භාවිත කරන්න. එම ප්‍රදේශය පිළිබඳ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ඔබට නොහැකි විය හැකිය. එහෙත් ඔබට තොරතුරු ලබාගත හැකි ඒවාට පිළිතුරු සපයන්න.**

## ප්‍රදේශයක් හඳුනාගැනීම

ප්‍රථමයෙන් ඔබ තෝරාගත් ප්‍රදේශය සුවිශේෂී එකක් බවට සහතික වන්න. යම් ප්‍රදේශයක් සුවිශේෂී ලෙස සැලකිය හැක්කේ අවම වශයෙන් පහත දැක්වෙන එක් හේතුවක් හෝ ඇත්නම් පමණි.

- එම ප්‍රදේශයේ සිටින සියලුම දෙනා එකම භාෂාවක් කතා කරති.
- එම ප්‍රදේශයේ සෙනඟ කණ්ඩායම් එකම සංස්කෘතියකට අයත් වෙති. නිදසුන් ලෙස සියලුම සෙනඟ කණ්ඩායම් ගෝත්‍රිකයින්ය. නැතහොත් එකම ආගමකට අයත්ය.
- රටේ අනෙකුත් පෙදෙස්වලින් මෙම පෙදෙස කඳු, ගංගා වැනි ස්වභාවික දේ මගින් වෙන් වී ඇත.
- දේශපාලන වශයෙන් එම පෙදෙස වෙන් වී ඇත.
    - එය ගමක්,
    - නගරයක්,
    - රටක්,
    - ප්‍රාන්තයක්,
    - පළාතක්,

-රටකට අයත් වෙනම ප්‍රදේශයක් හෝ ඒ
ආකාරයේ වෙනත් දෙයක් විය හැකිය.

## මෙම ප්‍රදේශය තුළ සිටින්නේ කුමන සෙනඟ කණ්ඩායම් ද?

1. මෙම ප්‍රදේශය තුළ වෙසෙන්නේ කුමන සෙනඟ කණ්ඩායම් ද? මෙම සැම සෙනඟ කණ්ඩායමකම නමත්, දළ ජනගහනයත් සොයාගන්න.

2. එම ප්‍රදේශයේ සිතියමක් ලබාගන්න. නැතහොත් අඳින්න. එහි සැම සෙනඟ කණ්ඩායමකගේම පිහිටීම ලකුණු කරන්න. මෙම ප්‍රදේශය ගැනත්, එහි සිටින විවිධ සෙනඟ කණ්ඩායම් ගැනත් යාච්ඤා කිරීමට පටන් ගන්න.

3. මුළු ප්‍රදේශයේම සිටින සම්පූර්ණ ජනගහනය කොපමණ ද?

## මෙම කණ්ඩායම්වලට අයත් පොදු දේ කවරක් ද?

පොදුවේ ගත් කළ මෙම කණ්ඩායම් :

අ. සාමාජීයව
ආ. සාංස්කෘතිකව
ඇ. භාෂාමයව
ඈ ආගමිකව
ඉ. දේශපාලනිකව

වෙනස් වන්නේ කෙසේ ද?

අ. සාමාජීයව
ආ. සාංස්කෘතිකව
ඇ. භාෂාමයව
ඈ ආගමිකව
ඉ. දේශපාලනිකව

(සටහන : ඔබට මෙම ප්‍රදේශයේ එක් එක් කණ්ඩායම ගැන "සෙනඟ කණ්ඩායම් විශ්ලේෂණයක්" කිරීමට අවශ්‍ය විය හැකිය. මෙය ඔවුන් වෙතට ළඟා වීමේ උපක්‍රමයක් අවබෝධ කරගැනීමට හා සැලසුම් කිරීමට උපකාරී වනු ඇත.)

## මෙම ප්‍රදේශය කුමන ආකාරයේ ද?

**භූගෝලීය විශ්ලේෂණය :**

1. මෙම ප්‍රදේශයේ ශුභාරංචිය පැතිරවීමට බාධා කෙරෙන භූගෝලීය සාධක කවරේ ද?

2. මෙම ප්‍රදේශයේ ශුභාරංචිය පැතිරවීමට උපකාරී වන භූගෝලීය සාධක කවරේ ද? (නිදසුනක් ලෙස සභාවන් පිහිටුවිය හැකි ස්වභාවික ගමන් හෝ වෙළඳ මාර්ග හෝ තිබේ ද?)

3. සේවය කිරීම සඳහා මුළු ප්‍රදේශයෙහිම ගමන් කිරීමට උචිත කාලගුණ රටා තිබේ ද?

4. ඔබට මෙම ප්‍රදේශයට ළඟා වීමට උපකාරී කෙරෙන පහත දැක්වෙන සාධක ගැන තොරතුරු ලබාගන්න.

   අ. ප්‍රධාන නගර : ඔබගේ සිතියමේ ඒවා ලකුණු කරගන්න. ජනගහනය වැඩිම මෙම ප්‍රදේශවල වේ. එබැවින් ඒවාට ළඟා වීමට ඔබගේ සැලැස්මේ උපක්‍රම සැලසුම් කිරීමට ඔබට අවශ්‍ය වනු ඇත.

   ආ. ගුවන් තොටුපළවල් : ඔබගේ සිතියමේ ඒවා සලකුණු කරන්න.

   ඇ. භාවිත කළ හැකි ගුවන් පථ හා ජලාශ : සිතියමේ ඒවා සලකුණු කරන්න.

   ඈ. මෙම ප්‍රදේශයේ දුරකථන පහසුකම් තිබේ ද?

   ඉ. මෙම ප්‍රදේශයේ විදුලි සන්දේශ පහසුකම් තිබේ ද?

   ඊ. මෙම ප්‍රදේශයේ බස් හෝ දුම්රිය ගමන් පහසුකම් තිබේ ද?

   උ. රථවාහන ගමන් කළ හැකි මාර්ග තිබේ ද?

   ඌ. බෝට්ටුවලින් යා හැකි ගංගා හෝ මුහුදු හෝ තිබේ ද? ඒවා ඔබ සිතියමේ ලකුණු කරන්න.

**සාමාජීය විශ්ලේෂණය :**

1. "පිටතින් පැමිණෙන්නට" (එම ප්‍රදේශයේම නොවන අයට) මේ සෙනඟ කෙතරම් විවෘත ද? මෙය දැනගැනීමෙන්, ශුභාරංචිය බෙදාගැනීමට ඔබ පළමුවෙන්ම එම ප්‍රදේශයට ඇතුලු වන විට ඔබට අත්දැකීමට සිදු වන පිළිගැනීමේ මට්ටමට සූදානම් විය හැකිය.

2. සාමාන්‍යයෙන් එම ප්‍රදේශයේ මූල්‍යමය හා ද්‍රව්‍යමය සම්පත් පාලනය කරන්නේ කවරෙක් ද? ශුභාරංචිය පැතිරවීමට මූල්‍යමය ආධාර හා දේවස්ථානයක් සඳහා දේපළ ලබාගැනීමට ඔවුන්ගේ ආධාර ඔබට අවශ්‍ය වනු ඇත.

**සාංස්කෘතික විශ්ලේෂණය :**

ශුභාරංචිය පිළිගැනීමට බලපාන මෙම ප්‍රදේශයේ ඇති සාංස්කෘතික පුරුදු අධ්‍යයනය කරන්න. පහත දැක්වෙන්නේ ඉන් සමහරකි.

1. විශ්වාසයන් හා අගයන් (වටිනාකම්)

   අ. ශුභාරංචිය අවබෝධ කරගැනීමට සෙනඟට උපකාරී වන මෙම ප්‍රදේශයේ ඇති සංස්කෘතික වටිනාකම් (අගයන්) මොනවා ද?

   ආ. ශුභාරංචිය අවබෝධ කරගැනිමට බාධා කෙරෙන යම් සෙනඟගේ සංස්කෘතික අගයයන්, විශ්වාස හා පුරුදු මොනවා ද?

2. සංස්කෘතික පුරුදු :

පැහැදිලිවම ශුද්ධ ලියවිල්ලෙන් තහනම් කර ඇති ඇතැම් පොදු සංස්කෘතික පුරුදු මෙම

ප්‍රදේශයේ තිබේ ද? එසේ නම් ඒවා කවරේ ද? ඔබ ඒ ගැන කටයුතු කළ යුතුය.

3. අවශ්‍යතා

අ. මුළු ප්‍රදේශයම සමස්තයක් වශයෙන් සැලකිල්ලට ගෙන අතිශයින්ම වැදගත් අවශ්‍යතා හඳුනාගන්න.

- ප්‍රමාණවත් තරම් ආහාර නොතිබීම
- දුර්වල සෞඛ්‍ය හා වෛද්‍ය සේවාවන්
- දුර්වල අධ්‍යාපනය
- අක්‍රමවත් හෝ / හා දුර්වල ජල සැපයුම
- මූල්‍ය සම්පත් ප්‍රමාණවත් නොවීම
- දුර්වල ප්‍රවාහන පහසුකම්
- දුර්වල සන්නිවේදන පද්ධති
- නිවාස ප්‍රමාණවත් නොවීම
- වෙනස්වීම්වලට මුහුණ දීමට නොහැකි වීම
- දේශපාලනික පීඩාවන්
- වෙනත්

මෙම ප්‍රදේශයේ ඔබ ශුභාරංචිය ඉදිරිපත් කරන ආකාරය හා ඔබගේ සේවයේ ක්‍රමවේදයන් මෙම අවශ්‍යතාවන්වලට සම්බන්ධ විය යුතුය.

ආ. මෙම ප්‍රදේශයේ බොහෝ දුරට සපුරා ඇත්තේ කිනම් අවශ්‍යතාවන් ද? ප්‍රදේශයට නොමැත්තේ කිනම් අවශ්‍යතාවන් ද?

4. අධ්‍යාපනය :

මෙම ප්‍රදේශයේ මිනිසුන් බහුතරයක සාමාන්‍ය අධ්‍යාපන මට්ටම කවරක් ද? සාක්ෂරතා මට්ටම කවරක් ද? ඔවුන්ගේම භාෂාව ලිවීමට හා කියවීමට හැකි සංඛ්‍යාව කොපමණ ද? (මෙය දැනගැනීම වැදගත්ය. මන්ද බොහෝ දෙනෙකුට ලිවීමට හා කියවීමට නොහැකි නම්, ලිඛිත ක්‍රම මගින් ශුභාරංචිය පැතිරවීමේ ක්‍රම ඔබ සැලසුම් නොකරනු ඇත.)

පහත දැක්වෙන ඒවා පිළිබඳව ද ඔබට සොයා බැලිය හැකිය.

අ. එම ප්‍රදේශයේ ප්‍රාථමික පාසල් කොපමණ තිබේ ද?
ආ. එම ප්‍රදේශයේ ද්විතීයක පාසල් කොපමණ තිබේ ද?
ඇ. එම ප්‍රදේශයේ විද්‍යාල කොපමණ තිබේ ද?
ඈ. එම ප්‍රදේශයේ බයිබල් විද්‍යාල කොපමණ තිබේ ද?

(අතිරේක පාසල් අවශ්‍ය නම්, මෙම ප්‍රදේශයට ප්‍රවිෂ්ඨ වීමේ එක් මාර්ගයක් අධ්‍යාපනික වැඩසටහන් මගින් විය හැකිය.)

5. සන්නිවේදනය

අ. මෙම ප්‍රදේශයට ශුභාරංචිය ඉදිරිපත් කිරීම සඳහා ඉතාමත් සුදුසු භාෂාව (හෝ භාෂාවන්) කවරේ ද? ප්‍රථමයෙන් ඔබට ළඟා වීමට අවශ්‍ය වන්නේ ප්‍රදේශයක වැඩි සෙනඟක් වෙතය. එබැවින් වැඩි සෙනඟක් භාවිත කරන භාෂාව පළමුවෙන් තෝරාගන්න.

මෙම ප්‍රදේශයේ සෙනඟ කතා කරන ප්‍රධාන භාෂාව ________________

ඉතිරි සෙනඟ වෙතට යාමට පසුව අවශ්‍ය වන අනෙකුත් භාෂාවන් ______________

ආ. මෙම ප්‍රදේශයට ළඟා වීම සඳහා වඩාත් උචිත භාෂාවේ ශුද්ධ ලියවිලි පරිවර්තන තත්ත්වය කුමක් ද?

අලුත් ගිවිසුම :

පැරණි ගිවිසුම :

ඇ. මෙම සෙනඟ වෙතට : පහත දැක්වෙන ඒවා මඟින් ළඟා විය හැකි ද?

- ප්‍රවෘති පත්‍ර (මේවා කිතුනු දැන්වීම් භාර ගන්නෙහි ද?)
- මුද්‍රිත ද්‍රව්‍ය (ළඟා විය යුතු සෙනඟට කියවිය හැකි ද?)
- ගුවන් විදුලිය (කිතුනු වැඩසටහන් ප්‍රචාරණය කිරීමට අවසර ඇද්ද?)
- රූපවාහිනිය (කිතුනු වැඩසටහන් ප්‍රචාරණය කිරීමට අවසර ඇද්ද?)
- පටිගත කිරීම් (මේ සෙනඟට පටිගත කිරීමේ යන්ත්‍ර සොයාගත හැකි ද?)
- චිත්‍රපට, දෘශ්‍ය පට (මෙම සෙනඟට අවශ්‍ය උපකරණ තිබේ ද?)
- දුරකථනය (ළඟා විය යුතු සෙනඟට දුරකථන තිබේ ද?)

ඈ. මෙම ප්‍රදේශය තුළ ඇති ප්‍රධාන සන්නිවේදන මාර්ග කවරේ ද?

**බාහිර බලපෑම් :**

1. දේශපාලන පද්ධතිය හෝ නවීකරණය කිරීමේ බාහිර බලවේග හෝ නිසා මෙම ප්‍රදේශය තුළ සිදු වන වෙනස්කම් කවරේ ද?

2. මේ එකදු හෝ වෙනස් වීමක් ශුභාරංචිය පැතිරවීම සඳහා යොදාගත හැකි ද?

3. මේ ප්‍රදේශය තුළ ශුභාරංචිය පැතිරවීමට එරෙහිව ක්‍රියා කළ හැකි මෙම ප්‍රදේශයෙන් පිට සංවිධානාත්මක කණ්ඩායම් හෝ නියෝජිතයින් හෝ කවරේ ද? ඒ මන් ද?

   දෙවියන්වහන්සේ විසින් ඔබ කැඳවා ඇතැයි හැඟෙන ප්‍රදේශයක සේවය කිරීම වැළැක්වීමට ක්‍රියා කරන බාධක හෝ විරෝධතා හෝ වලට කිසි විටෙකත් ඉඩ නොදෙන්න. ඔවුන් වෙත ළඟා වීමට එක් ක්‍රමයකින් ඉඩ නොදෙන්නේ නම්, වෙනත් ක්‍රමයක් උපයෝගි කරගන්න.

**දේශපාලන විශ්ලේෂණය :**

1. මෙම ප්‍රදේශයේ දේශපාලන පද්ධතිය කෙටියෙන් විස්තර කරන්න.

2. මෙම ප්‍රදේශයේ ශුභාරංචිය පැතිරවීමට බාධා කළ හැකි දේශපාලන කණ්ඩායම් කවරේද?

3. මෙම ප්‍රදේශයේ ශුභාරංචිය පැතිරවීමට උපකාර කළ හැකි දේශපාලන කණ්ඩායම් කවරේ ද?

4. මෙම ප්‍රදේශයේ ඔබගේ සේවයට බාධා පමුණුවන රජයේ නීති කවරේ ද?

5. මෙම ප්‍රදේශයේ ඔබගේ සේවයට උපකාරී වන රජයේ නීති කවරේ ද?

6. මෙම ප්‍රදේශයේ සිටින ප්‍රධාන දේශපාලන නායකයින් කවරහු ද? ඔබ ඔවුන් සමඟ සුහද වී ඔබගේ සේවයට ඔවුන්ගෙන් සහාය ලබා ගැනීමට උත්සාහ කරන්න.

**ආත්මික විශ්ලේෂණය :**

1. මෙම ප්‍රදේශයේ සිටින ආගමික කණ්ඩායම් කවරේ ද?

2. එක් එක් ආගම අනුගමනය කරන සෙනඟ ප්‍රමාණය කොපමණ ද?

3. ඕනෑම ආකාරයක ආගමික වෙනසක් කෙරෙහි මෙම ප්‍රදේශය දක්වන පොදු ආකල්පය කවරේ ද? මෙම ප්‍රශ්නයට පිළිතුර ඔබට මුහුණ පෑමට සිදු විය හැකි ආගමික විරෝධතා වලට ඔබ සූදානම් කරනු ඇත.

4. කිතුනු බවට ප්‍රකාශ කරන කිතුනු සංඛ්‍යාව කොපමණ ද?

5. මෙම ප්‍රදේශයේ ප්‍රධාන කිතුනු නායකයින් හඳුනාගත හැකි ද?

6. මෙම ප්‍රදේශය :

   - සම්පූර්ණයෙන් ආගම නොපැතිරුණු
   - අර්ධ වශයෙන් ආගම පැතිරුණු
   - ප්‍රමාණවත් ලෙස ආගම පැතිරුණු

   ප්‍රදේශයක් ලෙස ඔබ සලකන්නෙහි ද?

7. සාමාන්‍යයෙන් ඔබ විශ්වාස කරන අන්දමට මේ කාලය ශුභාරංචිය වැපිරීමේ කාලයක් ද නැතහොත් නෙළා ගැනීමේ කාලයක් ද?

8. උත්සාහ කළ ද මෙම ප්‍රදේශයේ අසාර්ථක වූ කිතුනු සභාවන් හෝ සේවාවන් හෝ කවරේ ද? මෙම අසාර්ථක වීමට හේතු ඔබ සිතන අයුරින් කවරේ ද? අනෙක් අයගේ අසාර්ථක වීම් තුළින් ඔබට ඉගෙන ගත හැකි අතර, එම වැරදිම නැවත නොකළ යුතුය.

9. මෙම ප්‍රදේශයේ දැනට ක්‍රියාත්මක සැලකිය යුතු කිතුනු සභාවන් හෝ සේවාවන් හෝ කවරේ ද?

10. මේවා අතුරින් සඵල වී ඇත්තේ කවර ඒවා ද? ඒවා සඵල වී ඇත්තේ මන් ද? මේ කණ්ඩායම්වල සාර්ථකත්වයෙන් ඔබට බොහෝ දේ උගත හැකිය. එමෙන්ම මෙම ප්‍රදේශයේ ශුභාරංචිය පැතිරවීමට ඔවුන් හා සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඔබට පුළුවන.

11. මෙම පෙදෙසට ළඟා වීමට ඔවුන් සමඟ ඔබ සහයෝගයෙන් කටයුතු කරන්නේ කෙසේද?

12. දැනට පවතින දේව සේවාවන් ක්‍රියාත්මක වන්නේ කුමන සෙනඟ කණ්ඩායම් සමඟ ද?

13. තමන් සමඟ තවමත් කිතුනු සාක්ෂිකරුවෙකු නොමැති සෙනඟ කණ්ඩායම් මේ ප්‍රදේශයේ සිටිත් ද?

14. මෙම ප්‍රදේශයේ කිතුනු සාක්ෂිකාරයෙක් සිටී නම්, භාවිත කරන භාෂාව හෝ භාෂාවන් හෝ කවරේ ද? මෙම ප්‍රදේශයේ වෙනත් භාෂාවන් කතා කරන, දැනට සිටින කිතුනු සාක්ෂිකරුවන් ළඟා නොවූ සෙනඟ වෙත යාමට ඔබට මඟපෙන්වීමක් ලැබිය හැකිය.

15. මෙම ප්‍රදේශයේ දැනට සිදු වන කිතුනු සේවාවන් කවරේ ද? ඔබගේ සැලැස්ම පිළියෙළ කරන විට ඒවාම නොකිරීමට හා ඒවා සමඟ තරඟ නොකිරීමට වගබලා ගන්න.

16. දැනට පවතින මෙම කිතුනු සේවාවන් වෙත සෙනඟ දක්වන පොදු ආකල්පය කුමක්ද?
    - සතුරු
    - උදාසීන
    - මිතුරු

17. සැබෑ ශුභාරංචි සභා කොපමණ මෙම ප්‍රදේශයේ තිබේ ද?

18. ඒවා වර්ධනය වන්නේ කුමන වේගයකින් ද?

19. ඒවා අත්දකින් අසීරුතා කවරක් ද? ඒ මන් ද?

20. සාර්ථක ඒවා කවර ඒවා ද? ඒ මන් ද?

21. තවත් සභාවන් පිහිටුවීමේ අවශ්‍යතාවක් තිබේ ද?

22. මෙම ප්‍රදේශයේ සාතන් ක්‍රියාත්මක නැතහොත් පාලනය කරන අධිපතිකම් හා පරාක්‍රමයන් ඔබට නිර්ණය කළ හැකි ද? (සාතන්ගේ අධිපතිකම් හා පරාක්‍රමයන් හයවන පරිච්ඡේදයේ විස්තර කෙරිණ)

## මෙම ප්‍රදේශය වෙත යා යුත්තේ කවුරුන් ද?

මෙම ප්‍රදේශයට යා යුත්තේ කවු ද? මෙම ප්‍රදේශයට ළඟා වීමට අවශ්‍ය ප්‍රමාණවත් සේවක පිරිස කොපමණ ද? ජනගහන සංඛ්‍යාව පිළිබඳ විස්තර මෙයට උපකාරී වේ.

මෙම ප්‍රදේශයේ ශුභාරංචිය පැතිරවීම සඳහා සේවකයින්ට තිබිය යුතු සුදුසුකම් මොනවා ද? ශුභාරංචිය බෙදාගැනීමට මෙම ප්‍රදේශයට යන ඕනෑම කෙනෙක් :

- තම ජීවන රටාවෙන් ද, ආකල්පවලින් හා හැසිරීමෙන් ද මේ පිළිබඳ සාක්ෂියක් සහිත ඇදහිලිවන්තයෙක් විය යුතුය.

- පෞද්ගලික යාච්ඤාව සහ බයිබල් අධ්‍යයන වැනි යහපත් පුරුදු සහිත විය යුතුය.

- මෙම ප්‍රදේශයේ සෙනඟ වෙත ළඟා වීමට භාවිත කරන ක්‍රම වේදයන්ට ගැළපෙන ආත්මික දීමනා සහිත විය යුතුය.

- වැඩය කිරීම සඳහා සූදානම්ව සිටිය යුතුය. කාලය නොමැති නම් හැකියාවෙන් වැඩක් නැත. ඒ පුද්ගලයා යාමට ආශාවෙන් සිටින්නේ ද? සූදානම් ද?

- කණ්ඩායමට ගැළපිය යුතුය (ශුභාරංචිය සමඟ ඒ පෙදෙසට ළඟා වීමට යන අනෙකුත් අය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට හැකි විය යුතුය).

- මෙම සුවිශේෂී ප්‍රදේශයේ සේවය කිරීමට දෙවියන්වහන්සේගෙන් කැඳවීම ලද්දෙක් විය යුතුය.

- මෙම ප්‍රදේශයට යාමට ශාරීරිකව, ආත්මිකව සහ ආධ්‍යාපනිකව ප්‍රමාණවත් සූදානමක් තිබිය යුතුය.

## මෙම ප්‍රදේශය වෙත ශුභාරංචිය ගෙන යන්නේ කෙසේ ද?

මෙම ප්‍රදේශය වෙත ශුභාරංචිය ගෙන යන්නේ කෙසේ ද? භාවිත කළ යුතු ක්‍රම ශිල්ප මොනවාද? මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට මෙම ප්‍රදේශය පිළිබඳව ඔබ ඉගෙනගත් භූගෝලීය, භාෂාමය, සංස්කෘතික, දේශපාලනික සහ ආත්මික විශ්ලේෂණයන් භාවිත කරන්න. මෙම ප්‍රදේශයේ සෙනඟ කණ්ඩායම් අතර ඇති කවර සමානකම් පොදු ක්‍රම ශිල්ප භාවිතයට ඉඩ සලසයි ද? විවිධ ක්‍රම ශිල්ප භාවිත කළ යුතු වන්නේ මෙම සෙනඟ කණ්ඩායම් අතර ඇති කවර වෙනස්කම් සඳහා ද? ඔබගේ ක්‍රම ශිල්ප දේව වචනයට අනුකූල වීමට වග බලාගන්න. බයිබලීය මූලධර්මවලට පටහැනි කිසිදු ක්‍රම ශිල්පයක් භාවිත නොකරන්න.

ධර්මය පැතිරවීමේ කවර උපක්‍රම මෙම ප්‍රදේශයේ සාර්ථක වූණි ද? ඔබ දියත් කරන නව ක්‍රම ශිල්ප කවරක් ද? යාච්ඤාවෙන් සහ විශ්ලේෂණයෙන් ඔබ ක්‍රම ශිල්ප තීරණය කළ පසු මෙම ප්‍රශ්නය අසන්න. මෙම ක්‍රම ශිල්පවලට විරෙහිව මෙම ප්‍රදේශයෙහිම සෙනඟ කණ්ඩායම්වලින් හෝ බාහිර බලවේග මගින් හෝ පැනනැගිය හැකි විරෝධතාවන් කවරක් ද?
මෙම විරෝධතාවන්ට ඔබ මුහුණ දෙන්නේ කෙසේ ද?

## සැලැස්මක් සකසන්න

ඔබ අධ්‍යයනය කළ ප්‍රදේශය පිළිබඳව ඔබ උගත් දෑ ඔබ භාවිත නොකරන්නේ නම්, ඔබ දැන් සම්පූර්ණයෙන් අවසන් කළ විශ්ලේෂණයෙන් ප්‍රයෝජනයක් නැත. අධ්‍යයනයෙන් පමණක් මෙම ප්‍රදේශයට ශුභාරංචි පණිවිඩයෙන් ළඟා විය නොහැකිය. ශුභාරංචිය සමඟ එහි යාමට සැලැස්මක් ඔබ සකස් කළ යුතුය. ඔබ විශ්ලේෂණය කළ ප්‍රදේශයට යාම සඳහා සැලැස්මක් සකස් කිරීමට එකොළොස් වන පරිච්ඡේදය "සැලසුම් කිරීම සඳහා උපාය මාර්ග" ඔබට උපකාරී වනු ඇත.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. මෙම පාඩමට අදාළ වන පරිදි "ප්‍රදේශය" යන්න අර්ථ විග්‍රහ කරන්න.

3. ප්‍රදේශ විශ්ලේෂණයක අන්තර්ගත වන්නේ කවරක් ද?

4. ප්‍රදේශ විශ්ලේෂණයක පරමාර්ථ කවරක් ද?

5. මෙම පාඩම අධ්‍යයනය කිරීමේ කොටසක් ලෙස ඔබ සැබවින්ම ප්‍රදේශයක් විශ්ලේෂණය කිරීම සම්පූර්ණ කළෙහි ද?

6. මෙම ප්‍රදේශයේ ශුභාරංචිය පැතිරවීම සඳහා ඔබ උගත් දේ භාවිත කිරීමට සැලැස්මක් ඔබ සකස් කළෙහි ද?

(ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම පොතේ අවසාන පරිච්ඡේදයට පසු සඳහන් කර ඇත.)

# තව දුරටත් අධ්‍යයනය සඳහා

එකිනෙකට වෙනස් ප්‍රදේශ දෙකක විශ්ලේෂණයක් උත්පත්ති 13 වන පරිච්ඡේදයේ සඳහන් වේ. එය අධ්‍යයනය කරන්න. එකක "ජෝර්දාන් මිටියාවත" පිළිබඳවය. අනෙක"කානාන් භූමිය" පිළිබඳවය. ඔබගේ විශ්ලේෂණයේ ප්‍රතිඵල සටහන් කරන්න.

| **ජෝර්දාන් මිටියාවත** | **කානාන් දේශයේ භූමිය** |
| --- | --- |

# අටවන පරිච්ඡේදය

# ජාතියක් විශ්ලේෂණය කිරීම

## අරමුණු:

ඔබ පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය කටපාඩමෙන් ලිවීමට
- "ජාතිය" යන පදය අර්ථවිග්‍රහ කිරීමට
- ජාතියක විශ්ලේෂණයක අන්තර්ගතය පැහැදිලි කිරීමට
- ජාතියක විශ්ලේෂණයේ පරමාර්ථයන් හඳුනාගැනීමට
- ජාතියක් විශ්ලේෂණය කිරීමට
- මෙම ජාතිය තුළ ශුභාරංචිය පැතිරවීමට ඔබගේ විශ්ලේෂණය භාවිත කිරීමට හැකිවනු ඇත.

## ප්‍රධාන පදය

> **යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශකරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ (ලූක් 24:47).**

## හැඳින්වීම

ජාතියක් තුළ සුවිශේෂී ප්‍රදේශයක් හා සෙනඟ කණ්ඩායමක් විශ්ලේෂණය කිරීමට ඔබ උගත්තෙහිය. මෙම පාඩමෙන්, ශුභාරංචිය ගෙන යෑමේ පරමාර්ථය ඇතිව සම්පූර්ණ ජාතියක් විශ්ලේෂණය කරන අයුරු ඔබ ඉගෙන ගනු ඇත.

## ජාතියක්

ජාතියක්, පොදු දේශපාලන පද්ධතියක් මඟින් එක්සත් කරන ලද සෙනඟගෙන් සමන්විතය. එය දේශිය මායිම් මඟින් තහවුරු කළ ප්‍රදේශයකි.

## ජාතියක විශ්ලේෂණය

ඔබ ජාතියක් විශ්ලේෂණය කරන විට, ශුභාරංචිය මුළු ජාතිය පුරාම පැතිරවීමට බල පෑ හැකි, දේශපාලනික, භූගෝලීය, භාෂාමය, සංස්කෘතිය, ආත්මික සාධක හා බාහිර බලවේග නිර්ණය කිරීම සඳහා එය විස්තරාත්මකව අධ්‍යයනය කරන්නෙහිය.

## ජාතියක් විශ්ලේෂණය කිරීමේ පරමාර්ථය

ඔබගේ අධ්‍යයනයේ පැමාර්ථය වන්නේ, ශුභාරංචිය ඔබ සේවය කරන ප්‍රදේශයේ සිය සම්පූර්ණ ජාතිය ජාතිය කරා ගෙන යෑම සඳහා පුළුල් කිරීම වේ. එය තුභාරංචිය පැතිරවීම සඳහා කෙරෙන පර්යේෂණයක් මිස පර්යේෂණයක් කළ යුතු නිසාම කෙරෙන්නක් නොවේ. ඔබ අධ්‍යයනයට පෙලඹ වූ මුල් පරමාර්ථය සම්පූර්ණ කර නොගෙන සම්පූර්ණ කාලයම අධ්‍යයන කටයුතු සඳහා පමණක් නොයෙදවීමට වගබලා ගන්න. ජාතියක් එක්සත් කරන හා එය අනෙකුත් ජාතියන්ගෙන් විශේෂිත කෙරෙන දෑ මුළු ජාතිය පුරාම ශුභාරංචිය පැතිරවීමේ

උපක්‍රමයක් ලෙස අපට සැපයීමට ඉඩ ඇත.

ඔබ ජාතියක් විශ්ලේෂණය කරන්නේ මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමටය.

**මෙම ජාතිය තුළ සිටින සෙනඟ කණ්ඩායම් කවරේද?**

ඔවුන් කවුරුන්ද? කොපමණ සංඛ්‍යාවක්ද? හා ඔවුන් සිටින්නේ කොතැනකද? ශුභාරංචිය ලැබී ඇත්තේ කවරෙකුටද? නොලැබී ඇත්තේ කවරෙකුටද?

**මෙම කණ්ඩායම්වලට පොදුවේ ඇති දේ කුමක්ද?**

මෙම ජාතියේ කොටසක් ලෙස මෙම සෙනඟ කණ්ඩායම් එක්සත් කරන්නේ කවරෙක්ද? ඔවුන් සමාජීයවම, සංස්කෘතිකව, ආගමිකව හා දේශපාලනිකව එක සමාන වන්නේ කෙසේද?

**මෙම ජාතිය කවර ආකාරයේද?**

ශුභාරංචිය සමඟ එහි ජීවත්වන සෙනඟ වෙත යෑමට මෙම ජාතිය පිළිබඳව අප කුමක් දැනගැනීමට අවශ්‍යද?

**මෙම ජාතිය වෙත යා යුත්තේ කවුරුන්ද?**

මෙම ජාතිය තුළ හුභාරංචිය පැතිරවීමට සේවකයින්ට තිබිය යුතු සුදුසුකම් කවරේද?

**මෙම ජාතිය වෙත යා යුත්තේ කෙසේද?**

මුළු ජාතිය සඳහාම භාවිත කළ හැකි පොදු ක්‍රමවේද කවරේද? වඩාත්ම ඵලදායි වන්නේ කවරක්ද?
ජාතියක් වෙතට යෑමේ ඔබේ භූමිකාව නිර්ණය කිරීමට හා ශුභාරංචිය සමඟ එහි යෑමට සැලැස්මක් සැකසීම සඳහා ඔබට සහාය වීමට මෙම ප්‍රශ්නවලට පිළිතුරු ඔබට උපකාරී වනු ඇත.

## තොරතුරු එක්රැස් කරන්නේ කෙසේද?

ඔබගේ විශ්ලේෂණය සඳහා තොරතුරු පහත දැක්වෙන ක්‍රමවලින් එක්රැස් කරගත හැකිය.

**යාච්ඤාව**

ශුභාරංචිය එහි ගෙන යෑම සඳහා එම ජාතිය පිළිබඳව ඔබ දන ගත යුතු දේ එළිදරව් කරන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

**ලිඛිත ද්‍රව්‍ය අධ්‍යනය කිරීම**

එම ජාතිය පිළිබඳව පොත්-පත් හා ලිඛිත ද්‍රව්‍ය අධ්‍යයනය කරන්න. තොරතුරු සොයාගත හැකි තැන්වල ලයිස්තුවක්, මෙම අත්පොතේ උපග්‍රන්තයේ අන්තර්ගතය.

**නිරීක්ෂණය**

ජාතිය මුළුල්ලේම පෞද්ගලිකවම ඇවිද භූමිය හා සෙනඟ නිරීක්ෂණය කරන්න.

**සම්මුඛ සාකච්ඡා**

එම ජාතියේ පුරවැසියන්ගෙන් හා නායකයින්ගෙන් සෙනඟ ගැන ප්‍රශ්න අසන්න. එම ජාතියේ දැනටමත් සේවය කරන ඇදහිලිවතුන් සිටී නම් ඔවුන් උගත් දේ දැනගැනීමට සම්මුඛ සාකච්ඡාවක් පවත්වන්න. මෙහි උපග්‍රන්තයේ නිදර්ශන සම්මුඛ සාකච්ඡා අන්තර්ගතය.

**ජාතියක් විශ්ලේෂණය කිරීමට පහත දැක්වෙන ආකෘතිය භාවිත කරන්න. ජාතියක් පිළිබඳ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ඔබට නොහැකි විය හැකිය. එහෙත් ඔබට තොරතුරු ලබාගත හැකි ඒවාට පිළිතුරු සපයන්න.**

## මෙම ජාතිය තුළ සිටින සෙනඟ කණ්ඩායම් කවරේද?

1. මෙම ජාතියෙහි ජීවත් වන සෙනඟ කණ්ඩායම් කවරේද? ජාතිය තුළ සිටින සෑම කණ්ඩායකම නම හා දළ ජනගහනය ලබා ගන්න.

2. එම ජාතියේ සිතියමක් ලබා ගන්න. නැතහොත් අඳින්න. එහි සෑම සෙනඟ කණ්ඩායමකගේම පිහිටීම ලකුණු කරන්න. විවිධ සෙනඟ කණ්ඩායම්වල පිහිටීම පදනම් කරගෙන එම ජාතිය සුවිශේෂී ප්‍රදේශවලට බෙදා තිබේද? මෙම ජාතිය ගැනත් එහි සිටින විවිධ සෙනඟ කණ්ඩායම් ගැනත් යාච්ඤා කරන්න.

3. මුළු ජාතියේ සිටින සියලුම සෙනඟගේ සම්පූර්ණ ජනගහනය කොපමණද?

## මෙම කණ්ඩායම්වලට අයත් පොදු දේ කවරේද?

මෙම ජාතියේ විවිධ කණ්ඩායම්,

අ. සමාජීයව
ආ. සංස්කෘතිකව
ඇ. භාෂාමයව
ඈ. ආගමිකව
ඉ. දේශපාලනිකව

එක සමාන වන්නේ කෙසේද?

මෙම ජාතියේ සෙනඟ කණ්ඩායම්

අ. සමාජීයව
ආ. සංස්කෘතිකව
ඇ. භාෂාමයව
ඈ. ආගමිකව
ඉ. දේශපාලනිකව

වෙනස් වන්නේ කෙසේද?

(සටහන: මෙම ජාතියේ සෑම විවිධ කණ්ඩායමක් ගැනම, සෙනඟ කණ්ඩායම් විශ්ලේෂණයක්, කිරීමට ඔබට අවශ්‍ය විය හැකිය. එය සෑම කණ්ඩායමක් වෙතට ළඟාවීමට උපක්‍රමයක් අවබෝධ කර ගැනීමට හා සැලසුම් කිරීමට ඔබට උපකාරී වනු ඇත.)

# මෙම ජාතිය කවර ආකාරයේද?

## භූගෝලීය විශ්ලේෂණය

1. මෙම ජාතිය තුළ ශුභාරංචිය පැතිරවීමට බාධා කෙරෙන භූගෝලීය සාධක කවරේද?

2. මෙම ජාතිය තුළ ශුභාරංචිය පැතිරවීමට උපකාරී වන භූගෝලීය සාධක කවරේද? නිදසුනක් වශයෙන් සභාවන් පිහිටුවිය හැකි ස්වභාවික ගමන් හෝ වෙළඳ මාවත් තිබේද?

3. ජාතියේ ඇතැම් ප්‍රදේශවල සේවය කිරීමට වර්ෂය තුළ වඩාත් උචිත කාලය කාලගුණ රටා මගින් පෙන්නුම් කරයිද?

4. මෙම ජාතියට ළඟාවීමට උපකාරී වන පහත දැක්වෙන සාධක ගැන තොරතුරු ලබා ගන්න.

   අ. ප්‍රධාන නගරඃ සිතියමේ ඒවා ලකුණු කරන්න. ජනගහනය අධිකව ඇත්තේ මෙම නගරවල වේ. එබැවින් ඔබගේ සැලැස්මේ ඒවාට ළගාවීමේ උපක්‍රම සැලසුම් කිරීම සහතික වීමට අවශ්‍ය වනු ඇත.

   ආ. පිළිගත් ගුවන්තොටුපළවල්ඃ ඔබගේ සිතියමේ ලකුණු කරන්න.

   ඇ. භාවිත කළ හැකි ගුවන් පථ හා ජලාශඃ ඒවා ඔබ සිතියමේ ලකුණු කරන්න.

   ඈ. දුරකථන පහසුකම් ඇත්තේ එම ජාතියේ කුමන ප්‍රදේශවල ද?

   ඉ. විදුලි සංදේශ පහසුකම් ඇත්තේ කුමන ප්‍රදේශවලද?

   ඊ දුම්රියෙන් හෝ බස්රියෙන් හෝ ගමන් කළ හැකි ප්‍රදේශ කවරේද?

   උ. පා ගමනින් හෝ අසු පිටින් ගමන් කළ යුත්තේ එම ජාතියේ කුමන ප්‍රදේහවලටද?

   ඌ. මෝටර් රථවලට ගමන් කළ හැකි මාර්ග මොනවාද? ඒවා ඔබ සිතියමේ ලකුණු කරන්න.

   එ. බෝට්ටුවලින් යා හැකි ගංගා හෝ ජලාශ හෝ තිබේද? ඒවා ඔබ සිතියමේ ලකුණු කරන්න.

## සමාජීය විශ්ලේෂණයඃ

1. මෙම ජාතියේ සෙනඟ "පිටතින් පැමිණෙන්නන්ට" කෙතරම් විවෘතද? මෙය දැනගැනීමෙන්, ශුභාරංචිය බෙදා ගැනීමට පළමුවෙන්ම මෙම ජාතිය වෙතට යන විට ඔබ අත්දකින පිළිගැනීමේ මට්ටමට සූදානම් විය හැකිය.

2. සාමාන්‍යයෙන්, මෙම ජාතියේ මූල්‍යමය හා ද්‍රව්‍යමය සම්පත් පාලනය කරන්නේ කවරෙක්ද? දේවස්ථානයක් සඳහා දේපළ හා භුභාරංචිය පැතිරවීම සඳහා මුදල් ආධාර ලබාගැනීමට ඔවුන්ගේ සේවාවන් ඔබට අවශ්‍ය විය හැකිය.

**සංස්කෘතික විශ්ලේෂණය**

ශුභාරංචිය පිළිගැනීමට බලපාන, මෙම ප්‍රදේශයේ ඇති සංස්කෘතික පුරුදු අධ්‍යයනය කරන්න. සැලකිල්ලට ගත හැකි කරුණු සමහරක් පහත දැක්වේ.

1. විශ්වාසයන් හා අගයයන්

    අ. ශුභාරංචිය අවබෝධ කර ගැනීමට සෙනඟට උපකාරී වන මෙම ජාතියේ සංස්කෘතික අගයයන්, විශ්වාස හෝ පුරුදු කවරේද?

    ආ. ඔවුන්ට ශුභාරංචිය අවබෝධ කර ගැනීමට බාධා කෙරෙන සංස්කෘතික අගයයන් විශ්වාස හා පුරුදු කවරේද?

2. සංස්කෘතික පුරුදුඃ

    පැහැදිලිවම ශුද්ධ ලියවිල්ලෙන් තහනම් කර ඇති පොදු සංස්කෘතික පුරුදු මෙම ජාතියේ තිබේද? එසේ නම්, ඒවා කවරේද? ඔබ ඒ ගැන කටයුතු කළ යුතුය.

3. අවශ්‍යතාඃ

    අ. සමස්තයක් වශයෙන් මුළු ජාතියම සැලකිල්ලට ගෙන අතිශයින්ම වැදගත්වන අවස්ථා හඳුනාගන්න.

    -ප්‍රමාණවත් තරම් ආහාර නොතිබීම
    -දුර්වල සෞඛ්‍ය හා වෛද්‍ය සේවාවන්
    -දුර්වල අධ්‍යාපනය
    -අක්‍රමවත් හා/හෝ දුර්වල ජල සැපයුම්
    -ප්‍රමාණවත් නොවන මූල්‍ය සම්පත්
    -ප්‍රමාණවත් නොවන භූගෝලීය සම්පත්
    -දුර්වල ප්‍රවාහන පහසුකම්
    -දුර්වල සන්නිවේදන පද්ධති
    -ප්‍රමාණවත් තරම් නිවාස නොතිබීම
    -වෙනස්වීම්වලට මුහුණ දීමට නොහැකි වීම
    -දේශපාලනික පීඩාවන්
    -වෙනත්

    මෙම ජාතිය තුළ ඔබ ශුභාරංචිය ඉදිරිපත් කරන ආකාරය හා ඔබගේ සේවයේ ක්‍රමවේදයන් මෙම අවශ්‍යතාවලට අනුකූල විය හැකිය.

    ආ. මෙම ජාතිය තුළ ඉතා හොඳින් සපුරා ඇතැයි පෙනෙන අවශ්‍යතාවන් මොනවාද? මෙම ජාතියට නොමැත්තේ කවර අවශ්‍යතාද?

4. අධ්‍යාපනය

මෙම ජාතිය තුළ සිටින බහුතරයක සාමාන්‍ය අධ්‍යාපන මට්ටම කවරේද? සාක්ෂරතා මට්ටම කවරේද? තමන්ගේම භාෂාව ලිවීමට හා කියවීමට හැකි සෙනඟ සංඛ්‍යාව කොපමණද? මෙය දැනගැනීම වැදගත්ය. මන්ද යම් ජාතියක කියවීමට හා ලිවීමට නොහැකි බොහෝ අය සිටිත් නම් ශුභාරංචිය පැතිරවීමේ ලිඛිත ක්‍රම ඔබ සැලසුම්

නොකරනු ඇත.

ඔබ පහත දැක්වෙන ඒවා පිළිබඳව ද සොයා බලනු ඇත.

අ. ජාතිය මුළුල්ලේම ප්‍රාථමික පාසල් ප්‍රමාණවත් සංඛ්‍යාවක් තිබේද?
ආ. ජාතිය මුළුල්ලේම ද්විතීයක පාසල් ප්‍රමාණවත් සංඛ්‍යාවක් තිබේද?
ඇ. මෙම ජාතියේ විද්‍යාල කොපමණ තිබේද?
ඈ. මෙම ජාතියේ බයිබල් විද්‍යාල කොපමණ තිබේද?

අතිරේක පාසල් පිළබඳ අවශ්‍යතාවක් මෙම ජාතියට තිබේ නම්, මෙම ජාතියට ළඟාවීමේ එක් ක්‍රමයක් ලෙස අධ්‍යාපනික වැඩ සටහන් භාවිත කළ හැකිය.

5. සන්නිවේදනයඃ

අ. මෙම ජාතිය තුළ ශුභාරංචිය ඉදිරිපත් කිරීමට වඩාත් සුදුසු භාෂාව (හෝ භාෂාවන්) කවරේද? පළමුවෙන්ම ඔබට අවශ්‍යවන්නේ යම් ප්‍රදේශයක වැඩි සෙනඟ සංඛ්‍යාවක් වෙතට ළඟා වීමටය. එබැවින් පළමු තේරීම ලෙස වැඩි සෙනඟක් කතා කරන භාෂාව තෝරා ගන්න.

මෙම ජාතිය තුළ කතා කරන ප්‍රධාන භාෂාව ---------------------
ඉතිරි සෙනඟ වෙතට යෑමට පසුව අවශ්‍යවන අනෙකුත් භාෂාවන් ----------------

ආ. මෙම ජාතිය වෙත ළඟාවීමට වඩාත් උචිත භාෂාවේ ශුද්ධ ලියවිලි පරිවර්තනයේ තත්ත්වය කුමක්ද?

නව ගිවිසුමඃ

පැරණි ගිවිසුමඃ

ඇ. ජාතියේ ඇති අනෙක් භාෂාවන් උදෙසා ද ඒ ආකාරයෙන්ම ශුද්ධ ලියවිලි පරිවර්තන තත්ත්ව විශ්ලේෂණයක් ද කරන්න.

භාෂාවඃ
නව ගිවිසුමඃ
පැරණි ගිවිසුමඃ

ඈ. ඔබගේ සිතියමේ, රටෙහි විවිධ භාෂාමය බෙදීම් පිහිටි ස්ථාන ලකුණු කරන්න. මෙම විවිධ භාෂාවන් කතා කරන්නේ කුමන ප්‍රදේශවලද?

ඉ. මෙම ජාතියේ බහුතර සෙනඟක් වෙතට පහත දැක්වෙන ඒවායින් ළඟා විය හැකිද?

-පුවත්පත් (මේවා කිතුනු දැන්වීම් බාර ගන්නෙහිද?
-මුද්‍රිත ද්‍රව්‍ය (සෙනඟ බහුතරයකට කියවීමේ හැකියාව තිබේද?)
-ගුවන් විදුලිය (ප්‍රචාරක මධ්‍යස්ථාන කිතුනු වැඩ සටහන් ප්‍රචාරණය කිරීමට අවසර දෙන්නේද?)
-රූපවාහිනිය (ප්‍රචාරක මධ්‍යස්ථාන කිතුනු වැඩ සටහන් ප්‍රචාරණය කිරීමට අවසර දෙන්නේද? )

-පටිගත කිරීම් (පටි-සංයුක්ත යන්ත්‍ර සොයා ගැනීමට සෙනඟට හැකිවේද?
-චිත්‍ර පටි, දෘශ්‍ය සංයුක්ත පටි (මෙම ජාතිය තුළ අවශ්‍ය උපකරණ තිබේද?)
-දුරකථනය (සෙනඟ බහුතරයකට දුරකථන පහසුකම් තිබේද?)

ඊ. මුළු ජාතියටම පොදු වූ ප්‍රධාන සන්නිවේදන මාර්ගය කවරේද?

**බාහිර බලපෑම්**

1. දේශපාලනික පද්ධතිය හෝ නවීකරණය කිරීමේ බාහිර බලවේග හෝ නිසා මෙම ජාතිය තුළ සිදුවන වෙනස්වීම් කවරේද?

2. ශුභාරංචිය පැතිරවීමට මේ එකදු හෝ වෙනස්වීමක් භාවිත කළ හැකිද?

3. මෙම ජාතිය තුළ ශුභාරංචිය පැතිරවීමට එරෙහිව ක්‍රියා කළ හැකි මෙම දේශයෙන් බාහිර සංවිධානාත්මක කණ්ඩායම් හෝ නියෝජිතයන් හෝ කවරේද? ඒ මන්ද?

දෙවියන් වහන්සේ විසින් ඔබ කැඳවා ඇතැයි හැඟෙන ජාතියක සේවය කිරීම වැළැක්වීමට ක්‍රියාකරන බාධක හෝ විරෝධතා හෝ වලට කිසි විටෙකත් ඉඩ නොදෙන්න. යම්කිසි ක්‍රම මගින් සෙනඟට ළඟාවීමට ඔබට ඉඩ නොදෙන්නේ නම් වෙනත් ක්‍රම භාවිත කරන්න.

**දේශපාලන විශ්ලේෂණය**

1. මෙම ජාතියේ දේශපාලන පද්ධතිය කෙටියෙන් විස්තර කරන්න.

2. මෙම ජාතිය තුළ සිටින කවර දේශපාලන කණ්ඩායම් ශුභාරංචිය පැතිරවීමට බාධා කරනු ඇත්ද?

3. මෙම ජාතිය තුළ සිටින කවර දේශපාලනික කණ්ඩායම් ශුභාරංචිය පැතිරවීමට උපකාර කරනු ඇත්ද?

4. මෙම ජාතිය තුළ ඔබගේ සේවයට බාධා පමුණුවන රජයේ නීති කවරේද?

5. මෙම ජාතිය තුළ ඔබගේ සේවයට උපකාරී වන රජයේ නීති කවරේද?

6. මෙම ජාතියේ ප්‍රධාන දේශපාලන නායකයෝ කවරහුද? ජාතිය මුළුල්ලේ කෙරෙන සේවය සඳහා ඔවුන්ව හඳුනාගැනීමටත් ඔවුන්ගේ සහය ලබා ගැනීමටත් ඔබට අවශ්‍ය වනු ඇත.

**ආත්මික විශ්ලේෂණය**

1. මෙම ජාතියේ සිටින ආගමික කණ්ඩායම් කවරේද?

2. එක් එක් ආගම අනුගමනය කරන සෙනඟ ප්‍රමාණය කොපමණද?

3. ඕනෑම ආකාරයක ආගමික වෙනසක් කෙරෙහි මෙම ජාතිය දක්වන පොදු ආකල්ප කවරේද? ඔබට මුහුණ පෑමට සිදුවිය හැකි ආගමික විරෝධතා වලට සූදානම් වීමට මෙම ප්‍රශ්නයෙහි පිළිතුරෙන් හැකි වනු ඇත.

4. ප්‍රසිද්ධියේ ඇදහිල්ල ප්‍රකාශ කරන සංඛ්‍යාව කොපමණද?

5. ප්‍රධාන කිතුනු නායකයින් ඔබට හඳුනාගත හැකිද?

6. මෙම ජාතිය:
    -සම්පූර්ණයෙන්ම කිතුනු ආගම නොපැතුරණ
    -අර්ධ වශයෙන් කිතුනු ආගම පැතුරුණ
    -ප්‍රමාණවත් ලෙස කිතුනු ආගම පැතුරුණ
   ජාතියක් ලෙස ඔබ සලකන්නෙහිද?

7. සාමාන්‍යයෙන් ඔබ විශ්වාස කරන අන්දමට මෙම කාලය මෙම ජාතිය තුළ ශුභාරංචිය වැපිරීමේ කාලයක්ද? නැතහොත් නෙළා ගැනීමේ කාලයක්ද?

8. උත්සාහ කළද මෙම ජාතිය තුළ අසාර්ථක වූ කිතුනු සභාවන් හෝ සේවාවන් කවරේද? මේවා අසාර්ථක වීමට හේතු ඔබ සිතන අන්දමට කවරේද? අන් අයගේ අසාර්ථක වීම් තුළින් ඔබට ඉගෙන ගත හැකි අතර එම වැරදිම නැවත නොකළ යුතුය.

9. මෙම ජාතිය තුළ දැනට ක්‍රියාත්මක සැලකිය යුතු කිතුනු සභාවන් හෝ සේවාවන් කවරේද?

10. මේවා අතරින් ඵලදායි ඒවා කවරේද? එසේ ඵලදායි වී ඇත්තේ මන්ද? මේ කණ්ඩායම් වල සාර්ථකත්වයෙන් ඔබට බොහෝ දේ උගත හැකිය. එමෙන්ම මෙම ජාතිය තුළ ශුභාරංචිය පැතිරවීමට ඔවුන් හා සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඔබට පුළුවන.

11. මෙම ජාතියට ළඟාවීමට දැනට පවතින දේව සේවයන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ හැක්කේ කෙසේද?

12. දැනට පවතින දේව සේවාවන් ක්‍රියාත්මක වන්නේ කුමන සෙනඟ කණ්ඩායම් සමඟ ද?

13. තවමත් කිසිඳු කිතුනු සාක්ෂිකරුවෙකු නොමැති සෙනඟ කණ්ඩායම් මෙම ජාතිය තුළ සිටීද?

14. කිතුනු සාක්ෂිකරුවෙකු නොමැති භාෂා කණ්ඩායම් තිබේද?

15. මෙම ජාතිය තුළ දැනට සිදුවන කිතුනු සේවාවන් කවරේද? ඔබගේ සැලැස්ම සකස් කරන විට දැනට පවතින ඒවාම කිරීම හෝ ඒවා සමඟ තර.කිරීම හෝ නොකළ යුතුය. ඔබගේ පරමාර්ථය ශුභාරංචිය නොලැබූ අයට ශුභාරංචිය ගෙන යෑමය.

16. මේ ජාතියේ දැනට පවතින එම කිතුනු සේවාවන් වෙත සෙනඟ දක්වන පොදු ආකල්පය කුමක්ද?

    -සතුරු
    -උදාසීන
    -මිතුරු

17. සැබෑ ශුභාරංචි සභා කොපමණ මේ ජාතියේ තිබේද?

18. ඒවා වර්ධනය වෙන්නේ කුමන වේගයකින්ද?

19. ඒවා අත්දකින අසීරුතාවන් කවරේද? ඒ මන්ද?

20. සාර්ථක කවර ඒවාද? ඒ මන්ද?

21. තවත් සභාවන් පිහිටුවීමේ අවශ්‍යතාවක් තිබේද?

22. මෙම ජාතියේ සාතන් ක්‍රියාත්මක නැතහොත් පාලනය කරන අධිපතිකම් හා පරාක්‍රමධාරීන් ඔබට නිර්ණය කළ හැකිද? (සාතන් පාලනය කරන අධිපතිකම් හා පරාක්‍රමධාරීන් හයවන පරිච්ඡේදයේ විස්තර කර ඇත.)

## මෙම ජාතිය වෙත යා යුත්තේ කවුරුන්ද?

මෙම ජාතිය වෙත යා යුත්තේ කවුරුන්ද? මෙම ජාතිය වෙතට යෑමට අවශ්‍ය ප්‍රමාණවත් සේවක සංඛ්‍යාව කොපමණද? ඔබගේ ජනගහනය ඇස්තමේන්තුව මෙය නිර්ණය කිරීමට උපකාරී වනු ඇත. මෙම ජාතියේ ශුභාරංචිය පැතිරවීම සඳහා සේවකයින්ට තිබිය යුතු සුදුසුකම් මොනවාද? ශුභාරංචිය බෙදා ගැනීමට මෙම ජාතියට යන ඕනෑම කෙනෙක්:

- තම ජීවන රටාවෙන්, ආකල්පවලින් හා චර්යාවෙන් සාක්ෂි සහිත, ඇදහිලිවන්තයෙක් විය යුතුය.

- පෞද්ගලික යාච්ඤාව හා බයිබල් අධ්‍යයන යන යහපත් පුරුදු සහිත විය යුතුය.

- මෙම ජාතියේ සෙනඟ වෙත යෑමට භාවිත කරන ක්‍රමවේදවලට ගැළපෙන ආත්මික දීමනා සහිත විය යුතුය.

- යෑමට සූදානම්ව සිටිය යුතුය. කාලය නොමැති නම් හැකියාවෙන් වැඩක් නැත. ඒ පුද්ගලයා යෑමට කැමතිද? සූදානම්ද?

- කණ්ඩායමට ගැළපිය යුතුය. (ශුභාරංචිය සමඟ ඒ ජාතිය වෙතට ළඟා වීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා අන් අය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට කැමති විය යුතුය.)

- මෙම සුවිශේෂී ජාතියේ සේවය කිරීමට දෙවියන් වහන්සේගේ කැඳවීම ලද්දෙක් විය යුතුය.

- මෙම ජාතියට යෑමට ශාරීරිකව, ආත්මිකව හා අධ්‍යාපනිකව ප්‍රමාණවත් සූදානමක් තිබිය යුතුය.

## මෙම ජාතිය වෙත ළඟාවන්නේ කෙසේද?

මෙම ජාතියට ළඟාවන්නේ කෙසේද? භාවිත කළ යුතු ක්‍රම ශිල්ප කවරෙක්ද? මෙම ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට මෙම ජාතිය පිළිබඳව ඔබ උගත් භූගෝලීය, භාෂාමය, සංස්කෘතික දේශපාලනික හා ආත්මික විශ්ලේෂණයන් භාවිත කරන්න.

මෙම ජාතියේ සෙනඟ කණ්ඩායම් අතර ඇති කවර සමානකම් පොදු ක්‍රම ශිල්ප භාවිතයට ඉඩ සපයයිද? විවිධ ක්‍රම ශිල්ප භාවිත කළ යුත්තේ මෙම සෙනඟ කණ්ඩායම් අතර ඇති කවර වෙනස්කම් සඳහාද?

මෙම ජාතිය කුඩා ප්‍රදේශවලට බෙදෙන්නේත් ඒ එක් එක් ප්‍රදේශවලට ශුභාරංචිය ගෙන යන්නේත් කෙසේද? (ඇතැම් විට ජාතිය තුළ ඇති ප්‍රධාන ප්‍රදේශ සඳහා ප්‍රදේශ

විශ්ලේෂණයක් කිරීමට ඔබට අවශ්‍ය විය හැකිය.)

ඔබගේ ක්‍රමශිල්ප ශුද්ධ ලියවිල්ලට අනුකූල වීමට වගබලා ගන්න. බයිබලීය මූල ධර්මවලට පටහැනි කිසිඳු ක්‍රමශිල්පයක් භාවිත නොකරන්න 80-81 පිටුවල ඇති, ලෝකයේ විවිධ ප්‍රදේශ වල ශුභාරංචිය පැතිරවීමේ උපක්‍රමික ලෙස භාවිත කළ ක්‍රමශිල්ප ලැයිස්තුව බලන්න. මින් කවරක් මේ ජාතියේ ඵලදායි වේද? ඔබ යොදන නව ක්‍රමශිල්ප මොනවාද?

ඔබ යාච්ඤාවෙන් හා විශ්ලේෂණයෙන් ක්‍රමශිල්ප නිර්ණය කළ පසු මෙම ප්‍රශ්නය අසන්න මෙම ක්‍රමශිල්පවලට විරෙහිව, අභ්‍යන්තර හෝ බාහිර හෝ බලවේග මගින් පැනනැගිය හැකි විරෝධතාවන් කවරේද? මෙම විරෝධතාවලට ඔබ මුහුණ දෙන්නේ කෙසේද?

## සැලැස්මක් සකස් කරන්න.

ඔබ අධ්‍යයනය, කළ ජාතිය පිළිබඳව ඔබ උගත් දෑ භාවිත නොකරන්නේ නම් ඔබ දැන් සම්පූර්ණයෙන් අවසන් කළ විශ්ලේෂණයෙන් ප්‍රයෝජනයක් නැත. අධ්‍යයනයෙන් පමණක් මෙම ජාතියට ළගාවිය නොහැකිය. ශුභාරංචිය සමඟ එහි යෑමට සැලැස්මක් ඔබ සකස් කළ යුතුය. ඔබ විශ්ලේෂණය කළ ජාතියට යෑම සඳහා සැලැස්මක් සකස් කිරීමට "සැලසුම් කිරීම සඳහා උපාය මාර්ග" නම් එකළොස්වන පරිච්ඡේදය ඔබට උපකාරී වනු ඇත.

## ස්වයං ඇගයීම

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "ජාතිය" යන පදය අර්ථවිග්‍රහ කරන්න.

3. ජාතියක විශ්ලේෂණයට අන්තර්ගත වන්නේ කුමක්ද?

4. ජාතියක විශ්ලේෂණයේ පරමාර්ථය කුමක්ද?

5. මෙම පාඩම අධ්‍යයනය කිරීමේ කොටසක් ලෙස ඔබ සැබවින්ම ජාතියක් විශ්ලේෂණය කිරීම සම්පූර්ණ කළෙහිද?

6. මෙම ජාතිය මුළුල්ලේම ශුභාරංචිය පැතිරවීම සඳහා ඔබ උගත් දේ භාවිත කිරීමට සැලැස්මක් සකස් කළෙහිද?

(ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම පොතේ අවසාන පරිච්ඡේදයට පසු සඳහන් කර ඇත.)

## තව දුරටත් අධ්‍යයනය සඳහා

ක්‍රියාපොතේ 7 පරිච්ඡේදයේ සඳහන් ඉශ්‍රායෙල් ජාතියේ ඓතිහාසික හා ආත්මික විශ්ලේෂණය අධ්‍යයනය කරන්න.

# නවවන පරිච්ඡේදය

# කලාපයක් විශ්ලේෂණය කිරීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "කලාපය" යන පදය අර්ථවිග්‍රහ කිරීමට
- දේශයක විශ්ලේෂණයක අන්තර්ගතය පැහැදිලි කිරීමට
- කලාපයක විශ්ලේෂණයේ පරමාර්ථය හඳුනාගැනීමට
- කලාපයක් විශ්ලේෂණය කිරීමට
- මෙම කලාපය තුළ ශුභාරංචිය පැතිරවීමට ඔබගේ විශ්ලේෂණය භාවිත කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය**

> **උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා. (මාක් 16:15)**

## හැඳින්වීම

ප්‍රදේශයකද, දේශයකද සෙනඟ කණ්ඩායම් විශ්ලේෂණය කරන ආකාරය ඔබ උගත්තෙහිය. මෙම පාඩමෙන්, කලාපයකට ශුභාරංචිය ගෙන යෑම සඳහා, ලෝකයේ සම්පූර්ණ කලාපයක් විශ්ලේෂණය කරන අයුරු ඔබ ඉගෙන ගනු ඇත.

## කලාපයක්

මෙම අධ්‍යයනය සඳහා කලාපයක් යනු භූගෝලීයව එකිනෙකට ආසන්නව පිහිටි භාෂාමය, සංස්කෘතිකමය, ආගමික හෝ දේශපාලනමය වශයෙන් එක හා සමාන දේශයන් ගණනාවකින් සමන්විත ලෝකයේ කොටසක් වේ.

මධ්‍ය ඇමරිකානු කලාපය මීට හොඳ නිදසුනකි. මෙම කලාපයට අයත් දේශයන් වනුයේ ගෝතමාලාව, නිකරගුවා, කොස්ටාරිකා, හොන්ඩුරාස්, පැනමා, බෙලිංස් හා සැන් සැල්වදෝර්ය. මේ දේශයන්ගේ පිහිටීම භූගෝලීයව සමානය. එකම ආගමක් හා සංස්කෘතියක් ඇති අතර ස්පාඤ්ඤ භාෂාව ප්‍රධාන කතන භාෂාව වේ.

භූගෝලීය පිහිටීම සමාන වූ පමණින් මෙම අධ්‍යයනය සඳහා දේශයන් එකම "කලාපයට" අයත් නොවේ. නිදසුනක් වශයෙන් කොමියුනිස්ට් චීනය පිලිපීන දූපත් අසල පිහිටා තිබේ. එහෙත් මේ කලාප දෙක එකිනෙකට බොහෝ සේ වෙනස්ය. ඔවුන්ගේ භාෂාව, සංස්කෘතිය, ආගම හා දේශපාලන ක්‍රමය එකිනෙකට බොහෝ සේ වෙනස් වේ. ශුද්ධ ලියවිල්ල ප්‍රචාරණය සඳහා මෙම කලාප දෙකේ එකිනෙකට බොහෝ සේ වෙනස් ක්‍රමවේද භාවිත කළ යුතු වේ.

අපගේ කලාපීය විශ්ලේෂණයේ දී අප සොයා බලන්නේ, මධ්‍යම ඇමරිකානු කලාපය මෙන් සංස්කෘතික, දේශපාලනික, ආගමික හා භාෂාමය අතින් එක හා සමාන කලාපයන්ය. අපගේ

පරමාර්ථය වන්නේ ඒවාට ශුභාරංචිය ගෙන යෑම සඳහා සමාන සැලසුම් සකස් කිරීම වේ.

## කලාපයක විශ්ලේෂණය

ඔබ කලාපයක් විශ්ලේෂණය කරන විට, ඔබ එය විස්තරාත්මකව අධ්‍යයනය කරන්නේ, මුළු කලාපය පුරාම ශුභාරංචිය පැතිරවීමට බල පෑ හැකි දේශපාලනික, භූගෝලීය, භාෂාමය, සංස්කෘතික, ආත්මික සාධක හා බාහිර බලවේග නිර්ණය කිරීම සඳහා වේ.

## කලාපයක් විශ්ලේෂණය කිරීමේ පරමාර්ථය

ඔබගේ අධ්‍යයනයේ පරමාර්ථය වන්නේ ඔබ සේවය කරන දේශයන්ගේ සිට මුළු කලාපය පුරාම ශුභාරංචිය පැතිරවීම සඳහා සේවය පුළුල් කිරීම වේ.

කලාපීය විශ්ලේෂණයක් යනු ශුභාරංචිය පැතිරවීම සඳහා කරන පර්යේෂණයන් මිස, පර්යේෂණයක් කළ යුතු නිසා කෙරෙන්නක් නොවේ. ඔබ අධ්‍යයනයට පෙලඹවූ මුල් පරමාර්ථය සම්පූර්ණ කර නොගෙන සම්පූර්ණ කාලයම අධ්‍යයන කටයුතු සඳහා පමණක් නොයෙදවීමට පරෙස්සම් වන්න.

කලාපයක් එක්සත් කරන හා එය අනෙකුත් කලාපයන්ගෙන් විශේෂිත කරන දෑ, ශුභාරංචිය මුළු කලාපය පුරාම පැතිරවීමේ පොදු උපක්‍රමයක් සැලසුම් කිරීමට උපකාරී වනු ඇත. ලෝකය, නිදසුනෙන් පෙන්වූ මධ්‍යම ඇමරිකානු කලාපය මෙන්, කලාප කිහිපයකින් සමන්විතය. සෑහෙන කලාප සංඛ්‍යාවකට අපට ළඟාවිය හැකි වුව හොත් අවසානයේ දී මුළු ලෝකයටම ළඟා වීමට අපට හැකි වේ.

ඔබ කලාපයක් විශ්ලේෂණය කරන්නේ පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමටය.

**මෙම කලාපය තුළ ඇති දේශයන් හා සෙන.කණ්ඩායම් කවරේද?**

මෙම කලාපය තුළ ඇති දේශයන් කවරේද? දේශයන් කොපමණද? ඒවායේ ජනගහනය කොපමණද? සහ ඒවායින් කලාපයක් සෑදෙන්නේ කෙසේද?

**මෙම දේශයන්ට හා සෙනග කණ්ඩායම්වලට ඇති පොදු දේ කුමක්ද?**

ඒවා සමාජීයව, සංස්කෘතිකව, භාෂාමයව, ආගමිකව හා දේශපාලනිකව එක සමාන වන්නේ කෙසේද?

**මෙම කලාපය කවර ආකාරයේද?**

ශුභාරංචිය සමඟ එහි වෙසෙන සෙනඟ වෙත ළඟා වීමට එම කලාපය පිළිබඳව අප දැන ගැනීමට අවශ්‍ය කුමක්ද?

**මෙම කලාපය වෙත යා යුත්තේ කවුරුන්ද?**

මෙම කලාපය තුළ ශුභාරංචිය පැතිරවීම සඳහා සේවකයින්ට තිබිය යුතු සුදුසුකම් කවරේද? කොපමණ සේවක පිරිසක් අවශ්‍යද?

**මෙම කලාපය වෙත යා යුත්තේ කෙසේද?**

මුළු කලාපය සඳහාම භාවිත කළ හැකි පොදු ක්‍රමවේද කවරේද? වඩාත්ම ඵලදායි වන්නේ කවරක්ද?

කලාපයක් වෙත යෑමේ ඔබේ භූමිකාව නිර්ණය කිරීමට හා ශුභාරංචිය සමග එහි යෑමට සැලැස්මක් සැකසීම සඳහා ඔබට සහාය වීමට මෙම ප්‍රශ්නවලට පිළිතුරු ඔබට උපකාරී වනු ඇත.

## තොරතුරු එක්රැස් කරන්නේ කෙසේද?

ඔබගේ විශ්ලේෂණය සඳහා තොරතුරු පහත දැක්වෙන ක්‍රමවලින් එක්රැස් කරගත හැකිය.

**යාච්ඤාව**

ශුභාරංචිය එහි ගෙන යෑම සඳහා එම කලාපය පිළිබඳව ඔබ දන ගත යුතු දේ එළිදරව් කරන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

**ලිඛිත ද්‍රව්‍ය අධ්‍යයනය කිරීම**

කලාපය පිළිබඳව දැනට සපයා ගත හැකි පොත්-පත් හා ලිඛිත ද්‍රව්‍ය අධ්‍යයනය කරන්න. තොරතුරු සොයාගත හැකි තැන්වල ලයිස්තුවක් මෙම අත්පොතේ උපග්‍රන්ථයේ ඇත.

**සම්මුඛ සාකච්ඡා**

මෙම කලාපයට අයත් දේශයන්ගේ නායකයින්ගෙන් හා සෙනඟගෙන් ප්‍රශ්න අසන්න. ඔබ අධ්‍යයනය කරන කලාපයේ ඇදහිලිවතුන්ට අයත් කලාප සේවාවන් දැනටමත් තිබේ නම් ඔවුන් උගත් දේ දැනගැනීමට සම්මුඛ සාකච්ඡා පවත්වන්න. මෙහි උපග්‍රන්ථයේ නිදර්ශන සම්මුඛ සාකච්ඡා අන්තර්ගතය.

**කලාපයක් විශ්ලේෂණය කිරීමට පහත දැක්වෙන ආකෘතිය භාවිත කරන්න. කලාපයක් පිළිබඳ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට ඔබට නොහැකි විය හැකිය. එහෙත් ඔබට තොරතුරු ලබා ගත හැකි ඒවාට පිළිතුරු සපයන්න.**

## කලාපයක් හැඳිනගැනීම

පළමුවෙන් ඔබ කලාපයක් නිසියාකාරව හඳුනාගත් බවට සහතික වන්න.

කලාපයක්:
-භූගෝලීයව එකිනෙකට ආසන්නයෙන් පිහිටා ඇති
-බහුතරයක් එකම භාෂාව කතා කරන
-එක සමාන දේශපාලනික ව්‍යුහයක් ඇති
-බහුතරයක් පොදු ආගමක් අදහන
-දේශවල එක සමාන දේශපාලනික ව්‍යුහයන් ඇති
-බහුතරයක් සංස්කෘතිය එක සමාන වන
දේශයන්ගෙන් සමන්විත වේ.

මේ සියල්ලන්ගෙන්ම එක හා සමාන දේශයන් නොතිබෙන්නට පුළුවන. එහෙත් භූගෝලීයව

කලාපයක දේශයන් එකිනෙකට ආසන්නව පිහිටා තිබිය යුතුමය. එමෙන්ම ශුභාරංචිය ගෙන යෑම සඳහා පොදු උපක්‍රමික සැලසුම් කිරීමට අවම වශයෙන් ඉහත ලයිස්තුවෙන් කරුණු දෙකක් හෝ වැඩි ගණනක් තිබිය යුතුය

## මෙම කලාපය ඇතුළත ඇති දේශයන් හා සෙනඟ කණ්ඩායම් කවරේද?

1. මෙම කලාපයේ ඇති දේශයන් හා වෙසෙන ප්‍රධාන සෙනඟ කණ්ඩායම් කවරේද? සෑම දේශයකම හා/හෝ ප්‍රධාන සෙනඟ කණ්ඩායමකම නම හා දළ ජනගහනය හඳුනා ගන්න. (මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට ඔබට සෑම දේශයක්ම විශ්ලේෂණය කිරීමට සිදුවිය හැකිය. අටවන පාඩම, "ජාතියක් විශ්ලේෂණය කිරීම" භාවිත කරන්න.)

2. ඔබගේ කලාප සිතියමේ ප්‍රධාන සෙනඟ කණ්ඩායම් ලකුණු කරන්න. විවිධ සෙනඟ කණ්ඩායම්වල පිහිටීම මත මෙම කලාපය බොහෝ සුවිශේෂී ප්‍රදේශවලට වෙන් කෙරේද? ප්‍රධාන සෙනඟ කණ්ඩායම් මගින් මෙම කලාපය වෙත යෑමට සැලැස්මක් සකස් කිරීමට ඔබට අවශ්‍ය විය හැකිය. මෙම කලාපය හා එහි සිටින විවිධ සෙනඟ කණ්ඩායම් ගැන යාච්ඤා කිරීමට පටන් ගන්න (මෙම කණ්ඩායම් වෙන් වෙන්ව විශ්ලේෂණය කිරීමට ඔබට අවශ්‍ය විය හැකිය. ඒ සඳහා හයවන පාඩම, "සෙනඟ කණ්ඩායමක් විශ්ලේෂණය කිරීම" භාවිත කරන්න.)

3. විවිධ දේශවල වෙසෙන සියලුම මිනිසුන්ගේ සම්පූර්ණ ජනගහනය කවරේද? මුළු කලාපයේම ජනගහනය කොපමණද?

## මෙම දේශයන්ටත් කණ්ඩායම්වලටත් අයත් පොදු දේ කවරේද?

මෙම කලාපයේ විවිධ දේශයන් හා සෙනඟ කණ්ඩායම්:

අ. සමාජීයව
ආ. සංස්කෘතිකව
ඇ. භාෂාමයව
ඈ. ආගමිකව
ඉ. දේශපාලනිකව එක සමාන වන්නේ කෙසේද?

මෙම කලාපයේ දේශයන් හා සෙනඟ කණ්ඩායම්:

අ. සමාජීයව
ආ. සංස්කෘතිකව
ඇ. භාෂාමයව
ඈ. ආගමිකව
ඉ. දේශපාලනිකව වෙනස් වන්නේ කෙසේද?

## මෙම කලාපය කවර ආකාරයේද?

**භූගෝලීය විශ්ලේෂණය**

1. මෙම කලාපය තුළ ශුභාරංචිය පැතිරවීමට බාධා කෙරෙන භූගෝලීය සාධක කවරේද?

2. මෙම කලාපය තුළ ශුභාරංචිය පැතිරවීමට උපකාරී වන භූගෝලීය සාධක කවරේද?

3. වර්ෂයක් ඇතුළත මෙම කලාපයේ ඇතැම් දේශයන් තුළ සේවය කිරීමට වඩාත් උචිත

කාලයන් කාල ගුණික රටා මගින් පෙන්නුම් කරයිද?

4. සිතියමක් ලබාගෙන මෙම කලාපයට ළගාවීමට උපකාරී වන පහත දැක්වෙන සාධක එහි සටහන් කරන්න.

 අ. දේශයන්ඃ කලාපයේ විවිධ දේශ හඳුනාගන්න. ඒ සෑම දේශයකට පහත දැක්වෙන ඒවා හඳුනාගන්න.

 ආ. ප්‍රධාන හා අගනගරඃ ඔබගේ සිතියමේ ඒවා ලකුණු කරන්න. අධික ජනගහනයක් ඇත්තේ මෙම නගරවලය. එබැවින් ඒවාට ළගාවීම සඳහා සැලසුම් කිරීමට ඔබට අවශ්‍ය වනු ඇත.

 ඇ. පිළිගත් ගුවන්තොටුපළවල්ඃ ඔබගේ සිතියමේ ඒවා ලකුණු කරන්න.

 ඈ භාවිත කළ හැකි ගුවන් පථඃ හෝ ජල පථ ඔබගේ සිතියමේ ඒවා ලකුණු කරන්න.

 ඉ. දුරකථන පහසුකම් ඇත්තේ මෙම කලාපයේ කුමන දේශයකටද?

 ඊ. විදුලි සංදේශ පහසුකම් ඇත්තේ කුමන දේශයකටද?

 උ. හොඳ දුම්රිය හෝ බස්රිය පහසුකම් ඇත්තේ කුමන දේශයනටද?

 ඌ. භාවිත කළ හැකි රථ-මාර්ග ඇත්තේ කෙහේද? ඒවා සිතියමේ ලකුණු කරන්න.

 ඒ. යාත්‍රා කළ හැකි ගංගා හෝ ජලාශ හෝ තිබේද? (යාත්‍රා කළ හැකි යනු බෝට්ටුවකින් යා හැකි ඒවා වේ.) ඒවා ඔබේ සිතියමේ ලකුණු කරන්න.

**සමාජ විශ්ලේෂණය**

1. පොදුවේ ලත් කළ පිටතින් පැමිණෙන්නන්ට විවෘත මෙම කලාපයේ කුමන දේශයන්ද? ශුභාරංචිය බෙදා ගැනීම සඳහා ඔබ පළමුවෙන්ම මෙම කලාපයට ළගා වූ විට ඔබ අත්දකින පිළිගැනීමේ මට්ටමට සූදානම් විය හැකිය. එමෙන්ම ශුද්ධ ලියවිල්ල සමඟ ඔවුන්ට ළගා වීමේ ඔබගේ සැලැස්මේ ප්‍රමුඛස්ථානය කලාපයේ වඩාත් පිළිගැනීමක් ඇති දේශයන්ට දීම ඔබට අවශ්‍ය විය හැකිය.

2. පොදුවේ ගත් කළ මෙම කලාපයේ මූල්‍යමය හා ද්‍රව්‍යමය සම්පත් පාලනය කරනුයේ කවුරුන්ද?

**සංස්කෘතික විශ්ලේෂණය**

1. විශ්වාසයන් හා වටිනාකම්

 අ. ශුභාරංචිය අවබෝධ කර ගැනීමට සෙනඟ උපකාරී වන මෙම කලාපයේ සංස්කෘතික වටිනාකම්, විශ්වාස හෝ පුරුදු කවරේද?

 ආ. ඔවුන්ට ශුභාරංචිය අවබෝධ කරගැනීමට බාධා කෙරෙන සංස්කෘතික අගයන්, විශ්වාස හා පුරුදු කවරේද?

2. සංස්කෘතික පුරුදු:

පැහැදිලිවම ශුද්ධ ලියවිල්ලෙන් තහනම් කර ඇති පොදු සංස්කෘතික පුරුදු මෙම කලාපයේ තිබේද? එසේ නම් ඒවා කවරේද? ඔබ ඒ ගැන කටයුතු කළ යුතුය.

3. අවශ්‍යතා:

අ. මෙම කලාපයේ සියලුම දේශයනට පොදු වූ අවශ්‍යතා තිබේද?
-ප්‍රමාණවත් තරම් ආහාර නොතිබීම
-දුර්වල සෞඛ්‍ය හා වෛද්‍ය සේවාවන්
-දුර්වල අධ්‍යාපනය
-අක්‍රමවත් හා /හෝ දුර්වල ජල සැපයුම්
-ප්‍රමාණවත් නොවන භූගෝලීය සම්පත්
-දුර්වල ප්‍රවාහන පහසුකම්
-දුර්වල සන්නිවේදන පද්ධති
-ප්‍රමාණවත් තරම් නිවාස නොතිබීම
-වෙනස්වීම් වලට මුහුණ දීමට නොහැකි වීම
-දේශපාලනික පීඩාවන්
-වෙනත් _______________

කලාපයේ සියලුම දේශයනට පොදුවූ ඇතැම් අවශ්‍යතා තිබේ නම්, ශුද්ධ ලියවිල්ල එම කලාපයට ගෙන යෑමේ ප්‍රධාන මාර්ගය ලෙස එය භාවිත කිරීමට ඔබට අවශ්‍ය විය හැකිය.

ආ. මෙම කලාපයේ ඉතා හොඳින් සපුරා ඇතැයි සිතන අවශ්‍යතාවන් කවරේද? මෙම දේශයට නොමැති අවශ්‍යතා කවරේද?

4. අධ්‍යාපනය:

මෙම කලාපයේ සිටින සෙනඟ බහුතරයක සාමාන්‍ය අධ්‍යාපන මට්ටම කවරේද? සාමාන්‍ය සාක්ෂරතා මට්ටම් කවරේද? ඔබ මෙම කලාපයේ භාවිත කිරීමට බලාපොරොත්තු වන භාෂාව කතා කිරීමට හා කියවීමට හැකි මිනිසුන් සංඛ්‍යාව කොපමණද?

මෙය දැනගැනීම වැදගත් වේ. මන්ද කියවීමට හා ලිවීමට නොහැකි මිනිසුන් බොහෝමයක් සිටී නම් ශුභාරංචිය පැතිරවීමේ ලිඛිත ක්‍රම එම කලාපයට ඔබ භාවිත නොකරනු ඇත.

මුළු කලාපයටම පොදු වූ සාමාන්‍ය අධ්‍යාපන අවශ්‍යතා තිබේද? නිදසුනක් වශයෙන්, සාමාන්‍යයෙන් මූලික, ද්විතික විද්‍යාල හෝ බයිබල් පාසල්වල හිගයක් තිබේද? අතිරේක පාසල්වල පොදු අවශ්‍යතාවක් තිබේ නම් මෙම කලාපයට ළඟාවීමේ එක් ක්‍රමයක් ලෙස අධ්‍යාපනික වැඩසටහන් භාවිත කළ හැකිය.

5. සන්නිවේදනය:

අ. මෙම දේශය තුළ ශුභාරංචිය ඉදිරිපත් කිරීමට වඩාත් සුදුසු භාෂාව (හෝ භාෂාවන්) කවරේද? පළමුවෙන්ම ඔබට අවශ්‍ය වන්නේ යම් කලාපයක වැඩි සෙනඟ සංඛ්‍යාවක් වෙතට ළඟා වීමටය. එබැවින් පළමුව වැඩි සෙනඟක් කතා කරන භාෂාව තෝරා ගන්න.

මෙම කලාපය තුළ කතා කරන ප්‍රධාන භාෂාව _____________

ඉතිරි සෙනඟ වෙතට ළඟා වීමට අවශ්‍ය අනෙකුත් භාෂාවන් _______________

ආ. මෙම කලාපය වෙතට ළඟා වීමට වඩාත් උචිත භාෂාවේ ශුද්ධ ලියවිලි පරිවර්තනයේ තත්ත්වය කුමක්ද?

නව ගිවිසුම

පැරණි ගිවිසුම

ඇ. මෙම කලාපයේ බහුතර සෙනඟක් වෙතට පහත දැක්වෙන ඒවායින් ළඟා විය හැකිද?

-පුවත්පත් (මේවා කිතුනු දැන්වීම් බාර ගන්නෙහිද?)
-මුද්‍රිත ද්‍රව්‍ය (සෙනඟ බහුතරයකට කියවිය හැකිද?)
-ගුවන් විදුලිය (ප්‍රචාරක මධ්‍යස්ථාන කිතුනු වැඩසටහන් ප්‍රචාරය කරයිද?)
-රූපවාහිනිය ( ප්‍රචාරක මධ්‍යස්ථාන කිතුනු වැඩසටහන් ප්‍රචාරය කරයිද?)
-තැටි වාදක (සෙනඟට තැටි වාදක තිබේද?)
-චිත්‍ර පටි, දෘශ්‍ය පටි (මෙම කලාපය තුළ අදාළ උපකරණ තිබේද?
-දුරකථනය (මෙම කලාපයේ සෙනඟ බහුතරයකට දුරකථන තිබේද?)

ඊ. මුළු කලාපයටම පොදු වූ ප්‍රධාන සන්නිවේදන මාර්ගය කවරේද?

**බාහිර බලපෑම්**

1. බාහිර දේශපාලන බලවේග හෝ නවීකරණයන් හෝ නිසා මෙම කලාපය තුළ සිදුවන වෙනස්වීම් කවරේද?

2. මේ කිසියම් වෙනස් වීමක් ශුභාරංචිය පැතිරවීම සඳහා භාවිත කළ හැකිද?

3. මෙම කලාපයේ ශුභාරංචිය පැතිරවීමට විරුද්ධ විය හැකි කලාපයෙන් බාහිර දේශයන් කවරේද? ඒ මන්ද?

දෙවියන් වහන්සේ විසින් ඔබ කැඳවා ඇතැයි හැඟෙන කලාපයක සේවය කිරීම වැළැක්වීමට ක්‍රියා කරන බාධක හෝ විරෝධතා හෝ වලට කිසි විටෙකත් ඉඩ නොදෙන්න. ඒවාට ළඟා වීමට එක් ක්‍රමයකට ඉඩ නොදෙන්නේ නම් වෙනත් ක්‍රම භාවිත කරන්න.

**දේශපාලන විශ්ලේෂණය**

1. මෙම කලාපයේ දේශපාලන පද්ධතිය විශ්ලේෂණය කරන්න. කලාපයේ පිහිටි එක් එක් දේශය තුළ එය සමාන වන්නේ කෙසේද? වෙනස් වන්නේ කෙසේද?

2. ශුභාරංචිය පැතිරවීමට බාධා කෙරෙන දේශපාලන පද්ධති ඇත්තේ කවර දේශයන්හිද?

3. ශුභාරංචිය පැතිරවීමට උපකාරී වන දේශපාලන පද්ධති ඇත්තේ කවර දේශයන්හිද?

4. ඔබගේ සේවයට බාධා පමුණුවන, මෙම කලාපය තුළ ඇති පොදු නීති කවරේද?

5. මෙම කලාපය තුළ ඔබගේ සේවයට උපකාරී විය හැකි පොදු රජයේ නීති කවරේද?

6. මෙම කලාපයේ ප්‍රධාන දේශපාලන නායකයෝ කවරහුද? ඔවුන්ව හැඳිනගෙන ඔබගේ කලාපීය සේවයට ඔවුන්ගෙන් සහය ලබා ගන්න/ සහය ලබා ගැනීමට උත්සාහ කරන්න.

**ආත්මික විශ්ලේෂණය**

1. මෙම කලාපයේ දේශයනට පොදු වූ ආගමික කණ්ඩායම් කවරේද?

2. මෙම ආගම් අනුගමනය කරන සෙනග කොපමණ සිටිත්ද?

3. ඕනෑම ආකාරයක ආගමික වෙනසක් කෙරෙහි මෙම කලාපයේ වෙසෙන සෙනඟ දක්වන ආකල්පය කවරේද? ඔබට මුහුණ පෑමට සිදුවිය හැකි ආගමික විරෝධතාවලට සූදානම් වීමට මෙම ප්‍රශ්නයෙහි පිළිතුරෙන් හැකි වනු ඇත.

4. මෙම කලාපයේ ක්‍රියාකාරී කිතුනුවන් සංඛ්‍යාව කොපමණද?

5. මෙම කලාපයේ ප්‍රධාන කිතුනු නායකයින් ඔබට හඳුනාගත හැකිද?

6. මෙම කලාපය:

-සම්පූර්ණයෙන්ම කිතුනු ආගම නොපැතුරුණ
-අර්ධ වශයෙන් කිතුනු ආගම් පැතුරුණ
-ප්‍රමාණවත් ලෙස කිතුනු ආගම පැතුරුණ
කලාපයක් ලෙස ඔබ සලකන්නෙහිද?

7. සාමාන්‍යයෙන් ඔබ විශ්වාස කරන්නේ මෙම කාලය මෙම කලාපයේ ශුභාරංචිය වැපිරීමේ කාලයක් ලෙසද? නැතහොත් නෙළා ගැනීමේ කාලයක් ලෙසද?

8. මෙම කලාපයේ අසාර්ථක වූ කිතුනු සභාවන් හෝ සේවාවන් කවරේද? මෙම අසාර්ථක වීමට හේතුව ඔබ සිතන අන්දමට කවරක්ද? අන් අයගේ අසාර්ථක වීම් තුළින් ඔබට උගත හැකිය. එම වැරදීම ඔබ නැවත නොකළ යුතුය.

9. මෙම කලාපය තුළ දැනට ක්‍රියාත්මක වැදගත් කිතුනු සභාවන් හෝ සේවාවන් හෝ කවරේද?

10. මේවා අතුරින් ඵලදායි ඒවා කවරේද? ඒවා ඵලදායි වී ඇත්තේ මන්ද? මේ කණ්ඩායම්ව, සාර්ථකත්වයෙන් ඔබට බොහෝ දේ උගත හැකිය. එමෙන්ම මෙම කලාපය තුළ ශුභාරංචිය පැතිරවීමට ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඔබට අවශ්‍ය වනු ඇත.

11. මෙම කලාපයට ළඟා වීමට උත්සාහ කරන දැනට පවතින සේවාවන් සමඟ ඔබට සහයෝගයෙන් කටයුතු කළ හැක්කේ කෙසේද?

12. දැනට පවතින සේවාවන් ක්‍රියා කරන්නේ කවර කලාපයන් හා සෙනඟ කණ්ඩායම් සමඟද?

13. තවම කිතුනු සාක්ෂිකරුවෙකු නොමැති හෝ සෙනඟ කණ්ඩායම් හෝ තිබේද?

14. තවම කිතුනු සාක්ෂිකරුවෙකු නොමැති කිසියම් භාෂා කණ්ඩායමක් මෙම කලාපය තුළ සිටීද?

15. මෙම කලාපය තුළ දැනට කරනු ලබන කිතුනු සේවාවන් කවරේද? ඔබගේ සැලැස්ම පිළියෙල කරන විට දැනට පවතින ඒවා නොකිරීමට හා ඒවා සමඟ තරග නොකිරීමට වගබලා ගන්න.

16. මෙම දැනට පවතින කිතුනු සේවාවන් වෙත සෙනඟ දක්වන සාමාන්‍ය ආකල්පය කුමක්ද?

-සතුරු
-උදාසීන
-මිතුරු

17. සැබෑ ශුභාරංචි සභා මෙම කලාපයේ කොපමණ තිබේද?

18. ඒවා වර්ධනය වෙන්නේ කුමන වේගයකින්ද?

19. ඒවා අත්දකින අසීරුතාවන් කවරේද? ඒ මන්ද?

20. සාර්ථක කවර ඒවාද? ඒ මන්ද?

21. තවත් සභා පිහිටුවීමේ අවශ්‍යතාවක් තිබේද?

22. මෙම කලාපයේ ක්‍රියාත්මක වන නැතහොත් පාලනය කරන සාතන්ගේ අධිපතිධාරීන් හා බලවේග මොනවාද? (සාතන්ගේ අධිපතිධාරීන් හා බලවේග හයවන පරිච්ඡේදයේ පැහැදිලි කර ඇත.)

## මෙම කලාපය වෙත යා යුත්තේ කවුරුන්ද?

මෙම කලාපය වෙත යා යුත්තේ කවුරුන්ද? මෙම කලාපය වෙතට යෑමට අවශ්‍ය ප්‍රමාණවත් සේවක පිරිස කවරේද? ඔබගේ ජනගහන ඇස්තමේන්තුව මෙය නිර්ණය කිරීමට උපකාරී වනු ඇත.

මෙම කලාපයේ ශුභාරංචිය පැතිරවීමට සේවකයින්ට තිබිය යුතු සුදුසුකම් කවරේද? මෙම කලාපයේ ශුභාරංචිය බෙදා ගැනීමට යන ඕනෑම කෙනෙක්:

-තම ජීවන රටාවෙන්, ආකල්පවලින් හා චර්යාවෙන් මේ පිළිබඳව සාක්ෂි සහිත ඇදහිලිවන්තයෙක් විය යුතුය.

- පෞද්ගලික බයිබල් අධ්‍යයන හා යාච්ඤා කිරීම වැනි යහපත් පුරුදු සහිත විය යුතුය.

-මෙම කලාපයේ දේශ වෙතට යෑමට භාවිත කෙරෙන ක්‍රමවේදවලට ගැළපෙන ආත්මික දීමනා සහිත විය යුතුය.

-යෑමට සිටිය යුතුය. කාලය නොමැති නම් හැකියාවෙන් වැඩක් නැත. ඒ පුද්ගලයා යෑමට කැමැත්තෙන් හා සූදානමෙන් සිටින්නේද?

-කණ්ඩායමට හොඳින් ගැළපිය යුතුය. (එම කලාපය වෙතට ශුභාරංචිය සමඟ යෑමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා අන් අය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට කැමති විය යුතුය).

-මෙම සුවිශේෂී කලාපයේ සේවය කිරීමට දෙවියන් වහන්සේ කැඳවීම ලද්දෙක් විය යුතුය.

-මෙම කලාපයට යෑමට ශාරීරිකව, ආත්මිකව හා අධ්‍යාපනිකව ප්‍රමාණවත් සූදානමක් තිබිය යුතුය.

## මෙම කලාපය වෙත ළඟා විය යුත්තේ කෙසේද?

මෙම කලාපය වෙත ළඟාවිය යුත්තේ කෙසේද? කලාපය මුළුල්ලේම භාවිත කළ හැකි සමාන ක්‍රමවේද කවරේද? වඩාත්ම ඵලදායි වනු ඇත්තේ කවරෙක්ද? මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට මෙම කලාපය පිළිබඳ ඔබ උගත් භූගෝලීය, භාෂාමය, සංස්කෘතික, දේශපාලනික හා ආත්මික විශ්ලේෂණයන් භාවිත කරන්න.

ඔබගේ ක්‍රම ශිල්ප බයිබලයට අනුකූල වීමට වගබලා ගන්න. බයිබලීය මූලධර්ම වලට පටහැනි කිසිඳු ක්‍රමශිල්පයක් භාවිත නොකරන්න. අටවන පරිච්ඡේදයේ සඳහන් ලෝකයේ විවිධ ප්‍රදේශවල ශුභාරංචිය පැතිරවීමට භාවිත කරන විවිධ උපක්‍රමික ලයිස්තුව බලන්න. මෙම කලාපයේ වඩාත්ම ඵලදායි වන්නේ මේවායින් කවරක්ද? ඔබ භාවිත කරන නව ශිල්පක්‍රම කවරක්ද?

ඔබ යාච්ඤාවෙන් හා විශ්ලේෂණයෙන් ක්‍රමශිල්ප නිර්ණය කළ පසු මෙම ප්‍රශ්න අසන්න. මෙම ක්‍රමශිල්ප වලට එරෙහිව, අභ්‍යන්තර හෝ බාහිර හෝ බලවේග, පැනනැගිය හැකි විරෝධතාවන් කවරේද? මෙම විරෝධතාවලට ඔබ මුහුණ දෙන්නේ කෙසේද?

## සැලැස්මක් සකස් කරන්න

ඔබ අධ්‍යනය කළ කලාපය ගැන ඔබ උගත් දේ භාවිත නොකරන්නේ නම් ඔබ සම්පූර්ණ කළ විශ්ලේෂණයෙන් පලක් නැත. අධ්‍යයනයෙන් පමණක් මෙම කලාපයට ළඟාවිය නොහැකිය. ශුභාරංචිය සමඟ එහි යෑමට සැලැස්මක් ඔබ සකස් කළ යුතුය. ඔබ විශ්ලේෂණය කළ කලාපයට යෑම සඳහා සැලැස්මක් සකස් කිරීමට එකළොස්වන පරිච්ඡේදය, "සැපසුම් කිරීම සඳහා උපාය මාර්ග, ඔබට උපකාරී වනු ඇත"

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. “කලාපය” යන පදය අර්ථවිග්‍රහ කරන්න.

3. කලාපීය විශ්ලේෂණයක අන්තර්ගතය කුමක්ද?

4. කලාපීය විශ්ලේෂණයක පරමාර්ථය කුමක්ද?

5. මෙම පාඩම අධ්‍යයනයේ කොටසක් ලෙස ඔබ සැබවින්ම කලාපයක විශ්ලේෂණය සම්පූර්ණ කළෙහිද?

6. මෙම කලාපය මුළුල්ලේම ශුභාරංචිය පැතිරවීම සඳහා ඔබ උගත් දේ භාවිත කිරීමට සැලැස්මක් සකස් කළෙහිද?

(ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම පොතේ අවසාන පරිච්ඡේදයට පසු සඳහන් කර ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

මෙම REAP නමැති සංවිධානාත්මක සැලැස්ම ලෝකයේ දේශයන් වෙත ශුභාරංචිය ගෙන යෑමේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමට හැකි වනු ඇත.

කලාපඃ( R-Regions) ලෝකය ප්‍රධාන භූගෝලීය කලාපවලට බෙදන්න. මේ සෑම කලාපයකම සේවය කිරීමට කලාපීය සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කරන්න.

සෑම දේශයක්ඃ ( E- Every Nation) සෑම කලාපයකම සෑම දේශයකටම ළඟා විය යුතුය. කලාපීය සම්බන්ධීකරණ නිලධාරී යටතේ සේවය කිරීමට දේශීය අධක්ෂවරයෙකු පත්කළ යුතුය.

දේශයක් තුළ ඇති ප්‍රදේශඃ
( A Areas wthin Nations) දේශයක් ඇතුළත ඇති සංස්කෘතිමය, භාෂාමය හා භූගෝලීය විවිධත්වයන් නිසා සෑම දේශයක්ම ඉහත දැක්වෙන සාධක යටතේ ප්‍රදේශවලට බෙදා වෙන් කළ යුතුය. දේශිය අධක්ෂක යටතේ ප්‍රාදේශීය නියෝජිතයෙකු සේවය කරනු ඇත.

සෙනඟ කණ්ඩායම්ඃ
( P -People Groups) ළඟ නුවූවන් පිළිබඳ අභියෝගය දෙස නවීන මිෂනාරී සංවිධානය බලන්නේ සෙනඟ කණ්ඩායම්, කණ්ඩායම් පරිපාලකයෙකු මගින් නියෝජනය කළ හැකිය.

REAP- සංවිධානාත්මක සැලැස්ම අනුගමනය කරන්නේ ස්වාමී වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින් දෙන ලද ව්‍යාප්ති සැලැස්ම වේ.

**නුඹලා යෙරුසලමෙහිද, මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය. (ක්‍රියා 1:8)**

ජේසුස් වහන්සේගේ සැලැස්මෙහි කලාපද, සෑම දේශයක්ද, ප්‍රදේශද හා සෙනඟ කණ්ඩායම් ද ඇතුළත්ය.

| **ස්ථානය** | **නියෝජනය** |
|---|---|
| පොළොවේ සීමාව | කලාප |
| සමාරිය | සෑම දේශයක්ම |
| යුදය | යෙරුසලම අවට ප්‍රදේශය |
| යෙරුසලම | සෙනඟ කණ්ඩායම් |

# දසවන පරිච්ඡේදය

# දැනට පවතින කිතුනු සංවිධානයක් විශ්ලේෂණය කිරීම

**අරමුණ :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට :

- මතකයෙන් ප්‍රධාන පදය ලිවීමට
- කිතුනු සංවිධානයක විශ්ලේෂණයේ අන්තර්ගතය පැහැදිලි කිරීමට
- කිතුනු සංවිධානයක් විශ්ලේෂණය කිරීමේ පරමාර්ථය හඳුනා ගැනීමට
- දැනට පවතින කිතුනු සංවිධානයක් විශ්ලේෂණය කිරීමට
- දෙවියන්වහන්සේගේ සැලැස්මේ අද්විතීය පරමාර්ථය ඉටු කිරීම සඳහා සංවිධානයට උපකාරී වීමට ඔබගේ විශ්ලේෂණයේ ප්‍රතිඵල භාවිත කිරීමට හැකි වනු ඇත.

**ප්‍රධාන පදය**

**ආත්මයාණන්වහන්සේ සභාවලට කියන දේ කන් ඇත්තේ අසාවා. (එළිදරව් 2:29)**

## හැඳින්වීම

නැවත උත්පාදනය ලැබූ සියලු සැබෑ ඇදහිලිවන්තයන් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය ලෙස ශරීරය ලෙසින් හැඳින්වෙන එකම සැබෑ සභාවේ කොටස් කරුවෝ වන්නහුය.

**අපි සියල්ලෝ එකම ආත්මයාණන්වහන්සේ තුළ එකම ශරීරයට බව්තීස්ම... කරනු ලැබීමුව. (1 කොරින්ති 12:13)**

(මෙම අත්දැකීම ආත්මයාණන්වහන්සේගෙන් වන "නැවත උත්පාදනයක්" ලෙස යොහන් 3 පරි. විස්තර කරයි)

මෙම "ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය" හෙවත් සභාව ලෝකය මුළුල්ලේම විවිධ ආකාරයෙන් සංවිධානය කර තිබේ. බොහෝ ප්‍රාදේශීය කිතුනු සභාවන් ද, ධර්මදූත සංවිධාන ද, නිකායන් ද, සහභාගිකත්වයන් ද, කිතුනු සේවා සංවිධාන ද ඇත. මේ විවිධ සංවිධාන ප්‍රාදේශීය මට්ටමේදී සභාවේ පරමාර්ථයන් වඩාත් හොඳින් ඉටු කිරීම සඳහා සකස් කොට ඇත. එවැනි කිතුනු සංවිධාන විශ්ලේෂණය කරන අයුරු ඔබ මෙම පාඩමින් ඉගෙන ගන්නෙහිය.

## සංවිධානයක් විශ්ලේෂණය කිරීමේ පරමාර්ථය

ලෝකයේ සියලු ජාතීන් වෙත ශුභාරංචිය පැතිරවීම සඳහා සභාව ආත්මික බලවේගයක් වීම දෙවියන්වහන්සේගේ සැලැස්ම වේ.

**සියල්ල මැවුවාවූ දෙවියන්වහන්සේ තුළ සියලු කාලවල පටන් සැඟවී තිබුණාවූ රහසේ නියමය කිමෙක්ද කියා සියල්ලන්ට පෙන්වන පිණිසය. එසේ කළේ අපගේ ස්වාමිවූ**

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ විසින් අභිප්‍රාය කරන ලද සදාකාල අභිප්‍රායේ ප්‍රකාරයට ස්වර්ගීය ස්ථානවල අධිපතීන්ටත් බලධාරීන්ටත් මේ කාලයෙහි සභාව කරණකොටගෙන උන්වහන්සේගේ අනේකවිධ ප්‍රඥාව දැනගන්ට ලැබෙන පිණිසය. (එපීස 3:9-11)**

බයිබලය පෙන්වා දෙන්නේ මෙම මෙහෙවර ඉටු කිරීමට සිටින ආත්මික කම්කරු පිරිස සීමා සහිත බවය.

**එවිට උන්වහන්සේ තම ගෝලයින්ට කථාකොට: ගොයම නම් බොහෝය, නමුත් ගොවියෝ ස්වල්ප දෙනෙක්ය යි... කීසේක. (මතෙව් 9:37)**

කම්කරුවන් ඇත්තේ ස්වල්ප දෙනෙක් නම්, සභාව මගින් ලෝකයා වෙත කෙරෙන ධර්මදූත සේවය සාර්ථකව සම්පූර්ණ කිරීමට ඔවුන්ව මනා සේ සංවිධානය කළ යුතුය.

දැනට පවතින කිතුනු සංවිධාන විශ්ලේෂණය කරන්නේ පහත දැක්වෙන පරමාර්ථයන් සඳහා වේ.

1. සංවිධානයේ පරමාර්ථයත්, ශුභාරංචිය පැතිරවීමට සභාවට දී ඇති සුවිශේෂී කාර්යය සම්පූර්ණ කිරීම පිළිබඳවත් දැන ගැනීමට.

2. සංවිධානයේ දැනට ඇති ඵලදායිත්වය නිර්ණය කිරීමට, එහි පරමාර්ථය දැනට කෙතරම් හොඳින් සම්පූර්ණ වන්නෙහිද? එය සාර්ථක වන්නේ කෙසේද? එය අසාර්ථක වන්නේ කෙසේද?

3. මෙම සංවිධානයට දෙවියන්වහන්සේ දී ඇති පරමාර්ථයන් වඩාත් හොඳින් සම්පූර්ණ කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමට.

ඔබ විශ්ලේෂණය කරන සංවිධානයේ ඔබද සාමාජිකයෙකු වේ නම්, එම සංවිධානයට එහි පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා ඔබ උපකාරී වන අයුරුද ඔබ නිර්ණය කරනු ඇත.

## එහි අන්තර්ගතය කුමක්ද?

දැනට පවතින සංවිධානයක විශ්ලේෂණයෙහි, එහි පරමාර්ථය, සැලැස්ම, ශක්තීන්, දුර්වලතා, වාතාවරණය, සම්පත් හා වැඩසටහන අධ්‍යයන කිරීම අන්තර්ගත වේ.

## තොරතුරු රැස් කරන්නේ කෙසේද?

පහත දැක්වෙන ක්‍රම මගින් ඔබට තොරතුරු රැස් කරගත හැකිය:

**යාච්ඤාව :**

සංවිධානය පිළිබඳව ඔබ දන ගත යුතු දේ එළිදරව් කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

**ලිඛිත ද්‍රව්‍ය අධ්‍යයනය :**

සංවිධානය සතු ලිඛිත ද්‍රව්‍ය අධ්‍යයනය කරන්න. නිදසුනක් වශයෙන් ඊට දේව ධාර්මික ප්‍රකාශනයක්, පරමාර්ථ ප්‍රකාශනයක්, ලිඛිත සැලැස්මක්, සාමාජික අවශ්‍යතා, ව්‍යවස්ථාවක්,

නිර්මාණයන්, උප-නීති හෝ ඉතිහාසයක් තිබේද?

**නිරීක්ෂණය :**

පෞද්ගලිකවම සංවිධානය නිරීක්ෂණය කරන්න. එහි සාමාජිකයින් හා නායකයින් දෙවියන්වහන්සේ ඔවුන්ව කැඳවා ඇතැයි හැඟෙන දේව සේවයේ නිරත වන විට නිරීක්ෂණය කරන්න.

**සම්මුඛ සාකච්ඡා :**

සංවිධානයේ සාමාජිකයින්ගෙන් හා නායකයින්ගෙන් ප්‍රශ්න අසන්න.

## සංවිධානාත්මක විශ්ලේෂණය

ඔබ සංවිධානයක් විශ්ලේෂණය කරන විට, අධ්‍යයනය කළ යුතු කරුණු සමහරක් මෙසේ වේ:

**පරමාර්ථය :**

1. සංවිධානයට එහි පරමාර්ථය පිළිබඳ ලිඛිත ප්‍රකාශනයක් තිබේද? මෙය සංවිධානයේ පරමාර්ථය විස්තර කෙරෙන ලිඛිත ප්‍රකාශනයකි. එය සංවිධානය විශ්වාස කරන දේ පිළිබඳ ප්‍රකාශනයක් නොවේ. එය ඔවුන් පවතින්නේ මන්ද යන්න පිළිබඳ ප්‍රකාශනයකි. ඔවුන් පවතින සුවිශේෂී හේතුව කුමක්ද?

2. මෙම පරමාර්ථය සංවිධානයේ සාමාජිකයින්ට තේරුම් ගෙන ඇත්ද? (මෙය සොයා ගැනීම සඳහා සංවිධානයේ සාමාජිකයින් කිහිප දෙනෙකුගෙන් මෙසේ අසන්න: "මෙම සංවිධානයේ, සභාවේ, පරමාර්ථය කුමක්ද?"

3. සංවිධානයේ පරමාර්ථය ඉටු කිරීම සඳහා සාමාජිකයින්ගෙන් සිදුවිය යුතු කොටස පිළිබඳව ඔවුන්ට අවබෝධයක් තිබේද?

4. සංවිධානය එහි පරමාර්ථය ඉටු කරන්නේද? ස්වාමීන්වහන්සේ සංවිධානයෙන් බලාපොරොත්තු වන දේ සංවිධානය ඉෂ්ට කරන්නේද?

5. සංවිධානයේ පරමාර්ථය දෙවියන්වහන්සේගේ පරමාර්ථය හා සම්බන්ධව ඇත්තේ කෙසේද? (දෙවියන්වහන්සේගේ පරමාර්ථ ඔබට එපීස 1:9-11 හා 3:9-11 හි කියවිය හැක)

**සැලසුම් :**

1. සංවිධානයට ලිඛිත සැලසුම් තිබේද?

2. මේ සැලසුම් සංවිධානයේ පරමාර්ථ සමඟ එකඟ වේද? සෑම සැලැස්මක්ම සංවිධානයේ පරමාර්ථය ඉෂ්ට කරගැනීමට දායක වන්නේද?

3. සැලසුමෙන් කළ යුතු දේ, කළ යුතු තැනැත්තා හා කළ යුතු දිනය පෙන්නුම් කෙරෙන්නේද?

4. ඒවා ඉටු වූ බව ප්‍රකාශ කිරීමට එම සැලසුම් ලේඛන ගත කර තිබේද?

5. සැලසුම් කිරීමේ රැස්වීම් සංවිධානය පවත්වන්නේද? ඒවායේදී යාච්ඤා කිරීමට හා දෙවියන්වහන්සේගේ මඟ පෙන්වීම දැන ගැනීමට කාලයක් වෙන් කර ඇත්ද?

6. සංවිධානය වෙනුවෙන් සැලසුම් සකස් කරන්නේ කවරෙක්ද?

**ශක්තීන් :**

සංවිධානයේ ශක්තීන් විශ්ලේෂණය කරන්න. හොඳින් සිදුවන්නේ කවරක්ද? වර්තමාන සංවිධාන ව්‍යුහයේ යහපත් දේ කවරෙක්ද?

**දුර්වලතා :**

සංවිධානයේ දුර්වලතා විශ්ලේෂණය කරන්න. අසාර්ථක කොතැනකද? වැඩි දියුණු කිරීම් අවශ්‍ය කොතැනකද?

**පරිසරය :**

1. සංවිධානය දේව සේවයේ යෙදෙන්නේ කුමන පරිසරයකද? (එය සේවය කරන්නේ සුවිශේෂී කණ්ඩායමකටද? ප්‍රදේශයකටද? ජාතියකටද? නැතහොත් ලෝකයේ කුමන කලාපයකද?)

2. සංවිධානය එහි පරිසරය අධ්‍යයනය කර තිබේද? එය, සේවය කරන සෙනඟ, ප්‍රදේශය, ජාතිය හෝ කලාපය විශ්ලේෂණය කර තිබේද?

3. මීළඟ වසර කීපය ඇතුළත පරිසරය පිළිබඳව වෙනස් විය හැක්කේ කවරක්ද?

4. නොවෙනස්ව පවතින්නේ කවර ඒවාද?

**සම්පත් :**

ඕනෑම සංවිධානයක ප්‍රධානතම සම්පත් වන්නේ පුද්ගලයින්, මුදල් හා පහසුකම් වේ.

1. පුද්ගලයින් :"පුද්ගලයින්" යනු සංවිධානයේ සිටින සෙනඟ වේ. පහත දැක්වෙන ප්‍රශ්න අසන්න.

   අ. සේවයේ කාර්යයන් ඉෂ්ට කරගැනීම සඳහා මෙම සංවිධානයේ සෙනඟ තම ආත්මික දීමනා යොදා ගනිත්ද?

   ආ. දෙවියන්වහන්සේගේ සැලැස්මේ තම කොටස සෑම කෙනෙක්ම අවබෝධ කරගෙන සිටින්නේද?

   ඇ. ඔවුන් සංවිධානයේ යම් කිසි නිලයක් දරන්නේ නම්, එහි නිලකාර්යයන් හා වගකීම් පිළිබඳ අවබෝධයක් ඔවුන්ට තිබේද?

   ඈ. නායකයින් හා සෙනඟ අතර මනා සන්නිවේදනයක් තිබේද?

ඉ. තව සේවකයින් අවශ්‍යද? එසේ නම්, ඒ කවර ස්ථාන වලටද?

ඊ. සෙනඟ අතරත් සෙනඟ හා නායකයින් අතරත් මනා සබඳතාවක් පවතින්නේද? එසේ නොමැතිනම් ඒ කවර ගැටලු නිසාද? මෙම ගැටළු නිරාකරණය කිරීමට ආත්මික විනයක් හෝ පෞද්ගලික උපදේශනයක් අවශ්‍යද?

උ. සංවිධානයේ නායකයෝ "සේවක-නායකයින්" පිළිබඳ බයිබලීය රටාවට අනුකූල වෙත්ද? (සේවක නායකත්වය විස්තරාත්මකව හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් සපයන්නා වූ පුහුණුවෙහි *"බයිබලීය කළමනාකරණ ප්‍රතිපත්ති"* : පාඩම් මාලාව ද සාකච්ඡා කරයි)

ඌ. මෙම සංවිධානයේ සෙනඟට, ඔවුන් කිරීමට බලාපොරොත්තු වන සේවය උදෙසා ප්‍රමාණවත් පුහුණුවක් ලැබී තිබේද? ඔවුන්ව වඩාත් හොඳින් සූදානම් කළ හැක්කේ කෙසේද?

එ. සෙනඟ සංවිධානය කර ඇත්තේ කෙසේද? දෙවියන්වහන්සේගේ පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා ඔවුන් සංවිධානය කිරීමේ සැලැස්මක් තිබේද? ගොවියෝ ඇත්තේ ස්වල්ප දෙනෙක් නම්, අස්වැන්න නෙළා ගැනීමට ඔවුන්ව හැකි තරම් හොඳින් සංවිධානය කළ යුතුය.

ඒ. ඇතැම් සංවිධානවලට සාමාජිකත්ව සුදුසුකම්, දේව සේවයට බැඳීම සඳහා ප්‍රමිතීන් ඇත. මෙම සංවිධානයට සාමාජිකත්වයක් (එනම්, සභා සාමාජිකත්වයක්) අවශ්‍ය නම්, සාමාජිකත්වය ලැබීමේ සුදුසුකම් බයිබලීයද? දැනට සිටින සාමාජිකයෝ එම ප්‍රමිතීන්ට අනුකූලව ජීවත් වන්නෝද?

2. මුදල් :

දෙවියන්වහන්සේගේ වැඩ කිරීම සඳහා මුදල් අවශ්‍ය වේ. මුදල් හා ආත්මික දීමනා පිළබඳ වගකීම අප සතුය. මෙම ප්‍රශ්න අසන්න :

අ. ලිඛිත අය-වැය ලේඛණයක් තිබේද? අය-වැය ලේඛණයක් යනු ඔබට ලැබෙන මුදල් ඔබ වියදම් කරන ආකාරය පිළිබඳ සැලැස්මකි. එවැනි සැලසුම් බයිබලීය වේ. (ලූක් 14:28-30 බලන්න)

ආ. මෙම සංවිධානය අය-වැය ලේඛණයට අනුකූලව කටයුතු කරයිද?

ඇ. දෙවියන්වහන්සේ මෙම සංවිධානයට දෙනු ලබන අරමුදල් භාවිත කරන්නේ ක්‍රමානුකූලවද? නිවැරදි කරගත හැකි මුදල් නාස්තිය හෝ වැඩිපුර වියදම් කිරීම් හෝ තිබේද? දේව රාජ්‍යයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා මෙම මුදල් වඩාත් හොඳින් පරිහරණය කළ හැක්කේ කෙසේද?

ඈ. මාසිකව හෝ වාර්ෂිකව හෝ ඉදිරිපත් කරන මූල්‍යමය වාර්තාවක් තිබේද? (අය වැය ලේඛනයක් යනු මුදල් වියදම් කිරීමට බලාපොරොත්තු වන ආකාරය පිළිබඳ සැලැස්මකි. එය මුදල් වියදම් කිරීමට පෙර සකස් කරනු ලැබේ. මූල්‍යමය වාර්තාවක් සැබවින්ම මුදල් වියදම් කළ ආකාරය පෙන්නුම් කරයි)

ඉ. සංවිධානය නගරයක පිහිටා තිබේ නම් ඊට බැංකු ගිණුමක් තිබේද?

ඊ. මූල්‍යමය කටයුතු වාර්තා කිරීමට, අය-වැය ලේඛනය සැකසීමට හා මූල්‍යමය වාර්තා සූදානම් කිරීමට යම් කෙනෙක් පත් කර තිබේද? ඔහුට පුහුණුවක් දී තිබේද?

උ. මූල්‍යමය කටයුතු පිළිබඳව රජයේ අවශ්‍යතා මෙම සංගමය මගින් ඉටු කරන්නේද? (නිදසුනක් ලෙසඃ රජයට යවන වාර්ෂික වාර්තා, බදු මුදල් ආදිය)

ඌ. මෙම සංවිධානය මූල්‍යමය කටයුතු පිළිබඳව බයිබලීය මූලධර්ම කිසිවක් කඩ කරන්නේද?

එ. එවැන්ජලිස්ත කටයුතු සඳහා අය-වැයෙන් වෙන් කර ඇති ප්‍රතිශතය කොපමණද? (ශුභාරංචිය පැතිරවීම සඳහා)

ඒ. මෙම සංවිධානයට ඇති මුදල් ඉපයීමේ මාර්ග කවරේද? වැඩි දියුණු කළ හැකි නව මාර්ග තිබේද?

ඔ. අත්හැරිය යුතු හිඟ මුදල් කවරේද?

3. පහසුකම් :

සේවයේ වැඩය සඳහා භාවිත කරන උපකරණ හා ගොඩනැගිලි සංවිධානයක සතු පහසුකම් වේ. මෙම ප්‍රශ්න අසන්න :

අ. මෙම සංවිධානයට අයත් හෝ භාවිත කරන හෝ ගොඩනැගිලි පහසුකම් කවරක්ද? මෙම සංවිධානයේ වැඩ සටහන්වලට ඒවා ප්‍රමාණවත් ද? දැනට ඇති පහසුකම් දියුණු කළ හැක්කේ කෙසේද?

ආ. තම සේවාව ප්‍රමාණවත්ව ඉටු කිරීම සඳහා මෙම සංවිධානයට අනාගතයේදී අවශ්‍ය වන නව පහසුකම් කවරේද?

ඇ. ගොඩනැගිලි සඳහා රජයේ ප්‍රමිතීන් තිබේ නම් දැනට ඇති ගොඩනැගිලි පහසුකම් එම ප්‍රමිතීන් වලට අනුකූලද? නිවැරදි කර ගත යුත්තේ කවර ඒවාද? (නිදසුන්ඃ ගිනි ගැනීම් පිළිබඳ ව්‍යවස්ථා, ඇතුල්වීම් හා පිටවීම්, හදිසි අවස්ථාවකදී අවශ්‍ය වන උපකරණ ආදිය)

ඈ. සංවිධානයට අයත් බඩුබාහිරාදියේ ලැයිස්තුවක් සාදන්න. මේ ලැයිස්තුව "ඉන්වෙන්ටරිය" ලෙස හැඳින්වේ. මේ ඇතැම් බඩු බාහිරාදිය අලුත්වැඩියා කළ යුතුද? නැතහොත් අලුත්ම ඒවා ගත යුතුද?

ඉ. දෙවියන්වහන්සේගේ සැලැස්ම වඩාත් හොඳින් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අලුත් බඩු බාහිරාදිය කවරේද?

ඊ. අදාළ අවස්ථාවන්වල, ගොඩනැගිලි හා බඩු බාහිරාදිය වෙනුවෙන් රක්ෂණයක් ලබා ගෙන තිබේද?

උ. අදාළ අවස්ථාවල, ගොඩනැගිල්ල රත් කිරීමට, සිසිල් කිරීමට හා විදුලිය සැපයීමට යන වියදම කොපමණද?

උ෬.    අදාළ අවස්ථාවල, වාහන නැවැත්වීම සඳහා අවශ්‍ය තරම් ඉඩකඩ තිබේද?

**වැඩසටහන් :**

වැඩසටහන් යනු සංවිධානයක පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා දියත් කරනු ලබන ව්‍යාපෘති වේ.

1. සංවිධානයේ සුවිශේෂී පරමාර්ථය සඳහා දායක වන වර්තමාන වැඩසටහන් කවරේද? එසේ දායක නොවන්නේ කවර ඒවාද?

2. සියලු ජාතීන්ට ශුභාරංචිය පැතිරවීමේ දෙවියන්වහන්සේගේ පරමාර්ථය සඳහා දායක වන වැඩසටහන් කවරේද? එසේ දායක නොවන්නේ කවර ඒවාද?

3. වඩාත් ඵලදායී වීම සඳහා නැවත සකස් කළ යුතු දැන් ඇති වැඩසටහන් කවරක්ද? ඒ සඳහා කළ යුත්තේ කුමක්ද?

4. දැන් කෙරෙන වැඩ සටහන් වලින් නැවැත්විය යුත්තේ කවර ඒවාද?

5. සංවිධානයේ පරමාර්ථ වඩාත් හොඳින් ඉෂ්ට කර ගැනීම සඳහා සලකා බැලිය යුතු අලුත් වැඩ සටහන් කවරේද?

6. ශුද්ධලියවිලි මූලධර්ම වලට පටහැනි කිසියම් වැඩ සටහනක මෙම සංවිධානය ක්‍රියාත්මක කරන්නේද?

7. සංවිධානය සාමාජිකයින්ගේ ආත්මික වර්ධනයට දායක වන කිසියම් වැඩසටහනක් තිබේද?

**විවිධ කාරණා :**

1. සංවිධානයට දේව ධාර්මික ප්‍රකාශනයක් තිබේද? මෙය සංවිධානය විශ්වාස කරන එක් එක් විශ්වාසයන් ගැන බයිබලීය යොමු කිරීම් සහිත ලිඛිත ප්‍රකාශනයක් වේ.

2. මෙම විශ්ලේෂණයෙන් අනාවරණය නොවූ නිවැරදි කළ යුතු වෙනත් ගැටලු කවරේද?

3. අනිකුත් කිතුනු සංවිධාන සමඟ මෙම සංවිධානය කෙතරම් යහපත් ලෙස සහයෝගයෙන් කටයුතු කරන්නේද? කිසියම් ගැටළුවක් තිබේද? එසේ නම් එය කවරක්ද?

4. ඔබ, ඔබ අධ්‍යයන කරන සංවිධානයේ සාමාජිකයෙකු වේ නම්, එහි ඔබගේ තත්වය කුමක්ද? ඔබ, ඔබගේ ආත්මික දීමනා භාවිත කරන්නෙහිද? දෙවියන්වහන්සේ දී ඇති පරමාර්ථයන් ඉෂ්ට කර ගැනීමට ඔබ සංවිධානයට කරන උදව්-උපකාර කවරේද?

## ඔබගේ විශ්ලේෂණයේ ප්‍රතිඵල යොදන්න

ඵලදායී වීම සඳහා ඔබගේ විශ්ලේෂණයේ ප්‍රතිඵල උපයෝගී කරගත යුතුය. එය කරන අයුරු පහත දැක්වේ.

**පරමාර්ථය :**

1. සංවිධානය පැවතෙන්නේ කවර හේතුවක් නිසාද යන්න ලිඛිතව නොමැති නම්, එහි පරමාර්ථයන් ඉෂ්ට වූයේද, නැද්ද යන්න ඔබ දැන ගන්නේ කෙසේද? පරමාර්ථය පිළිබඳව ප්‍රකාශනයක් ලිවීමට සංවිධානයේ නායකයින් සමඟ කටයුතු කරන්න. මෙම පරමාර්ථ ප්‍රකාශනය සියල්ල ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙන එමින් සියලු ජාතීන් වෙත ශුභාරංචිය ගෙන යෑමේ දෙවියන්වහන්සේගේ පරමාර්ථය පෙන්නුම් කෙරෙන බවට සහතික වන්න.

   පරමාර්ථ ප්‍රකාශනය ලිවීමට උපකාරී වීම සඳහා පළමුව මෙම පාඨමාලාවේ එකොළොස් වන පරිච්ඡේදය නැවත බලන්න. ඉන්පසු හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් සපයන්නා වූ "අරමුණු මගින් කළමනාකරණය" නම් පාඨමාලාව ලබා ගන්න.

2. ඔබ පරමාර්ථ ප්‍රකාශනයක් ලියූ පසු, සංවිධානයේ හෝ සභාවේ හෝ සියලු සාමාජිකයින් එම පරමාර්ථය අවබෝධ කරගත් බවට සහතික වන්න. සංවිධානයේ සුවිශේෂී සේවාවත්, මෙම පරමාර්ථය ඉෂ්ට කරගැනීම සඳහා එක් එක් සාමාජිකයාගේ භූමිකාවත් පැහැදිලි කරන්න.

3. සංවිධානයට දැනටමත් පරමාර්ථ ප්‍රකාශනයක් තිබේ නම්, දෙවියන්වහන්සේ එය කැඳවා ඇති පරමාර්ථය වඩා හොඳින් ඉටු කර ගැනීමට කළ යුතු දේ සැලසුම් කරන්න.

**ශක්තීන් :**

ඔබ හඳුනාගත් ශක්තීන්වල ලැයිස්තුව විශ්ලේෂණය කරන්න. මෙම සංවිධානය සඳහා වූ දෙවියන්වහන්සේගේ පරමාර්ථය ඉෂ්ට කර ගැනීමට මේවා වඩාත් හොඳින් භාවිත කරන්නේ කෙසේද? ලෝකයා වෙත ශුභාරංචිය ගෙන යෑමට මෙම ශක්තීන් භාවිත කරන්නේ කෙසේද? භාවිත නොකරන ශක්තිය දුර්වල වී විනාශ වනු ඇත.

**දුර්වලතා :**

ඔබ හඳුනාගත් දුර්වලතා ලයිස්තුව විශ්ලේෂණය කරන්න. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ බලය විදහා දැක්වීම සඳහා මෙම දුර්වලතා තුළ ක්‍රියා කරන්නේ කෙසේද? මෙම දුර්වලතා වලට යෙදිය හැකි බයිබලීය මූලධර්ම කවරේද?

**පරිසරය :**

පරිසරය පිළිබඳව සංවිධානය විශ්ලේෂණයක් කර නොමැති නම්, එහි සේවය කරන සෙනඟ, ප්‍රදේශය, ජාතිය හෝ කලාපය පිළිබඳව විශ්ලේෂණයක් කරන්න. ඔබ ඔවුන් වෙතට ළඟා වීමට නම්, ඔබ සේවය කරන්නේ කවරෙකුටදැයි ඔබ දැනගත යුතුය.

සැලසුම් සකස් කිරීම සඳහා ඊළඟ වසර පහ ඇතුළත එම පරිසරයේ වෙනස්වන හා වෙනස් නොවන දේ ගැන ඇති ඔබගේ විශ්ලේෂණය භාවිත කරන්න. නිදසුනක් වශයෙන් සභාව අසල විශාල නිවාස ව්‍යාපෘතියක් යෝජනා කර තිබේ නම්, එය ඔබ සේවය කරන පරිසරයේ සිදුවන වෙනසකි. ශුභාරංචිය පැතිරවීම සඳහා එවැනි වෙනසක් පිළිබඳව කටයුතු කරන ආකාරය ගැන සැලසුම් සකස් කළ යුතුය.

**සම්පත් :**

පහත දැක්වෙන ක්ෂේත්‍ර පිළිබඳව සැලසුම් කිරීමට හා සංවිධානය කිරීමට, හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් සපයන්නා වූ පාඨමාලාවේ *"අරමුණු මගින් කළමණාකරනය"* නම් පාඨමාලාව ද ඔබට උපකාරී වනු ඇත.

1. පෞද්ගලික :

   අ. මෙම සංවිධානයේ සෙනඟ, සේවයේ කාර්යයන් සඳහා තම ආත්මික දීමනා ක්‍රියාශීලීව යෙදවීමට සැලසුමක් සකස් කරන්න.

   ආ. සම්පූර්ණ සැලසුම තුළ තමාගේ කොටසද කාර්යයන් හා වගකීම්ද නොදන්නේ නම්, එය නිවැරදි කළ යුතුය. සංවිධානයේ සැලසුමක් සකස් කරන්න.

   ඇ. සෙනඟ හා නායකයින් අතර සන්නිවේදනය දුර්වල නම්, එය වැඩි දියුණු කර ගැනීමට සැලසුමක් සකස් කරන්න.

   ඈ. සංවිධානයට තව සේවකයින් අවශ්‍ය නම්, සේවකයින් ලබාගෙන සේවාවන් සඳහා ඔවුන්ව පුහුණු කිරීම ආරම්භ කරන්න.

   ඉ. සෙනඟ අතර හා / හෝ සෙනඟ හා නායකයින් අතර සම්බන්ධතාව දුර්වල නම්, ඔබ හඳුනාගත් ගැටලු විසඳීමට කටයුතු කරන්න. මෙම ගැටලු නිරාකරණය කරන්නේ කෙසේද? මතෙව් 18 හි සඳහන් හික්මවීමේ ශුභාරංචි මූලධර්ම භාවිත කිරීමට අවශ්‍ය වන්නේද? මෙම ගැටලු නිරාකරණය කිරීමට උපකාරී වීමට පෞද්ගලික උපදේශනය භාවිත කරන්නේ කෙසේද?

   ඊ. "සේවක නායකයින්" සඳහා වූ බයිබලීය රටාවට මෙම සංවිධානයේ නායකයින් නොගැළපේ නම්, ඒ සඳහා හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් සපයන්නා වූ පාඨමාලාවේ *"බයිබලීය කළමනාකරණ ප්‍රතිපත්ති"* පාඩම් මාලාව ද, :උපකාරී වනු ඇත.

   උ. මෙම සංවිධානයේ සෙනඟ, ඔවුන් කිරීමට බලාපොරොත්තු වන සේවය සඳහා ප්‍රමාණවත් පුහුණුවක් ලබා නොමැති නම්, ඒ සඳහා පුහුණු වැඩසටහනක් ආරම්භ කරන්න."වඩා පුහුණුවක් ලබා දිය යුත්තේ කාටද? ඒ පුහුණුව අවශ්‍ය කවර අංශ සඳහාද?" යන්න ඔබෙන්ම අසන්න. මේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා පුහුණු වැඩසටහනක් ආරම්භ කරන්න.

   ඌ. සංවිධානය සඳහා සාමාජික අවශ්‍යතාවක් තිබේනම්, හා ඒවා බයිබලීය නොවේ නම්, ඒවා නැවත ලියන්න.

2. මුදල් කටයුතු :

   අ. ලිඛිත අයවැය ලේඛනයක් නොමැති නම්, එකක් සකස් කරන්න.

   ආ. මෙම සංවිධානය ලිඛිත අයවැය ලේඛනය අනුගමනය නොකරන්නේ නම්, අරමුදල් සැබවින්ම වියදම් කරන ආකාරය අනුව අයවැය ලේඛනය නැවත ලියන්න.

ඈ. ඔබ හඳුනාගත් මුදල් නාස්තිය හා අනවශ්‍ය වියදම් නවතාලන්න.

ඉ. සැබවින්ම මුදල් වියදම් කරන අයුරු සංක්ෂිප්ත කිරීමට මාසික හා වාර්ෂික මූල්‍යමය වාර්තාවක් සකස් කරන්න.

ඉ. සංවිධානය නගරයක පිහිටුවා තිබේ නම්, බැංකු ගිණුමක් අරඹා සංවිධානයේ අරමුදල් නිසියාකාරව පවත්වාගෙන යෑමට උපකාරී කරන ලෙස බැංකුවෙන් ඉල්ලා සිටින්න.

ඊ. බැංකු වාර්තා අවංකව හා ක්‍රමවත්ව පවත්වාගෙන යෑමට යම් කෙනෙකුට පවරා ඔහුට පුහුණුවක් දෙන්න.

උ. රජයේ අවශ්‍යතා අනුව මුදල් කටයුතු නොකෙරෙන්නේ නම්, එය වහාම නිවැරදි කර ගන්න. අවශ්‍ය වාර්තා, බදු ආදී සියල්ල රජයට ඉදිරිපත් කරන්න.

ඌ. මුදල් කටයුතු පිළිබඳව යම්කිසි බයිබලීය මූලධර්මයක් සංවිධානය කඩකරන්නේ නම්, එය වහාම නිවැරදි කරගන්න.

එ. එවැන්ජලිස්ත කටයුතු සඳහා (සැබවින්ම ශුද්ධ ලියවිල්ල පැතිර වීම සඳහා) අයවැය ලේඛණයෙන් වෙන් කර ඇති ප්‍රතිශතය වැඩි කිරීමේ ක්‍රම හඳුනා ගන්න.

ඒ. මෙම සංවිධානය සඳහා ආදායම වැඩි කරගත හැකි නව සම්පත් හඳුනා ගන්න.

ඔ. සංවිධානයේ ණය නැති කරගැනීමට සැලසුම් සකස් කරන්න.

3. පහසුකම් :

අ. දැනට ඇති, වැඩි දියුණු කළ යුතු පහසුකම්වල ලයිස්තුවක් සකස් කරන්න. නිදසුනක් ලෙසඃ අලුත් වැඩියා කළ යුතු, සායම් කළ යුතු, නව සංඥා අවශ්‍ය, පිරිසිදු කිරීම් අවශ්‍ය ආදි දේ කවරක්ද? එය කළ යුත්තේ කවුරුන්ද? කවදාද? යන්න සැලසුම් කරන්න.

ආ. අවශ්‍ය වන නව පහසුකම් සැලසුම් කරන්න. සංවිධානය කෙතරම් කුඩා වුවත්, එහි සාමාජිකයින් කෙතරම් දුප්පත් වුවත් අවශ්‍යතා සපුරාලීමට ස්වාමින්වහන්සේගේ උපකාරය ඇදහිල්ලෙන් යුතුව සැලසුම් කරන්න.

ඇ. පහසුකම්, ප්‍රාදේශීය සභාවේ ප්‍රමිතියට අනුකූල නොවන්නේ නම්, ඒවා ප්‍රමිතියට පත් කිරීමට අවශ්‍ය අලුත් වැඩියාවන් කරන්න.

ඉ. සංවිධානයේ පරමාර්ථයන් ඉටුකර ගැනීමට අවශ්‍ය නව බඩුබාහිරාදිය සඳහා මුදල් ඉතිරි කිරීම ආරම්භ කරන්න.

ඊ. අදාළ අවස්ථාවන්හිදී, ගොඩනැගිලි හා බඩුබාහිරාදිය සඳහා ප්‍රමාණවත් රක්ෂණයන් ලබා ගන්න.

උ. අදාළ අවස්ථාවල වියදම් අඩු කිරීමට (රත් කිරීමට, සිසිල් කිරීමට, විදුලියට) වෙනස්කම් කරන්න.

**සැලසුම් කිරීම :**

1. ලිඛිත සැලසුම් නොමැති නම්, සැලසුම් සකස් කිරීම සඳහා සංවිධානයේ ප්‍රධාන නායකයින් හමුවන්න.

2. ලිඛිත සැලසුම් ඇතත් ඒවා ඵලදායී නොවන්නේ නම්, ප්‍රධාන නායකයින් හමුවී නව සැලසුම් සකස් කරන්න.

3. සැලසුම්...

- දෙවියන්වහන්සේගේ පරමාර්ථයන්ට අනුකූල විය යුතුය.
- සංවිධානයේ පරමාර්ථ වලට අනුකූල විය යුතුය.
    -... කවුරුන්
    -... කොතැනක
    කළ යුතුද යන්න සඳහන් විය යුතුය.
    -... අදාළ නම්, වියදමද ඇතුලත් කරන්න.
- ලිවිය යුත්තේ ඒවා ඉටු කළේද නැද්ද යන්න නිර්ණය කිරීම සඳහා ඇගයීම් කළ හැකි ආකාරයෙනි.
- සංවිධානයේ දුර්වලතා නැති කරලීමේ ක්‍රම අන්තර්ගත විය යුතුය.
- සංවිධානයේ ශක්තීන් උපයෝගී කරගැනීමේ ක්‍රම අන්තර්ගත විය යුතුය.
- සම්පත් (පුද්ගල, මූල්‍යමය, පහසුකම්) වැඩි දයුණු කරගැනීමේ ක්‍රම අන්තර්ගත විය යුතුය.
- සේවාවේ වැඩසටහන් දියුණු කරලීමේ ක්‍රම අන්තර්ගත විය යුතුය.

**වැඩසටහන් :**

1. සංවිධානයේ සුවිශේෂී පරමාර්ථයට දායක නොවන දැනට ඇති වැඩසටහන් අධ්‍යයනය කරන්න. පරමාර්ථයට දායක විය හැකි වන සේ නැවත සංවිධානය කළ හැක්කේ කෙසේද? ඒවා ඉවත් කළ යුතුද?

2. සියලු ජාතීන් වෙත ශුභාරංචිය ගෙන යෑමේ දෙවියන්වහන්සේගේ පරමාර්ථයට දායක නොවන දැනට ඇති වැඩසටහන් අධ්‍යයනය කරන්න. උන්වහන්සේගේ පරමාර්ථයට දායක වීමට ඒවා නැවත සැලසුම් කළ හැකිද? නොහැකි නම් ඒවා ඉවත් කරන්න.

3. නැවත සංවිධානය විසින් කළ යුතු දැනට ඇති වැඩසටහන් සංවිධානය කිරීමට සැලසුම් සකස් කරන්න. කළ යුත්තේ කවරක්ද කවුරුන් විසින්ද කවදාද යන්න ලයිස්තු ගත කරන්න.

4. දෙවියන්වහන්සේගේ සැලසුමේ පරමාර්ථයන් වඩාත් හොඳින් ඉෂ්ට කරගැනීම සඳහා සංවිධානයට උපකාරී වන අලුත් වැඩසටහන් ආරම්භ කිරීමට සැලසුම් සකස් කරන්න.

5. ශුද්ධ ලියවිලි මූලධර්මයන්ට පටහැනි යම්කිසි වැඩසටහන්වල සංවිධානය නිරත වී ඇත්නම්, ඒවා ඉවත් කරන්න.

6. මෙම සංවිධානයේ සාමාජිකයින්ගේ ආත්මික වර්ධනයට දායක වන වැඩසටහන් නොමැති නම්, එකක් අරඹන්න. සංවිධානයක පරමාර්ථයන් ඉටුවීමට නම් එහි

සාමාජිකයින් ආත්මිකව වර්ධනය විය යුතුය. යාච්ඤාවට, නමස්කාරයට, බයිබල් අධ්‍යයනයට හා එකිනෙකා වෙනුවෙන් සේවය කිරීමට කාලය වෙන් කිරීමට සැලසුම් කරන්න.

**විවිධ කරුණු :**

1. දේවධාර්මික ප්‍රකාශනයක් නොමැතිනම්, නායකයින් හමුවී ලිඛිත ප්‍රකාශනයක් සකස් කරන්න. සංවිධානයේ විශ්වාසයන් හා එවැනි විශ්වාසයන්ගේ බයිබලීය පදනම සෙනඟ දැනගත යුතුය. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් *"අරමුණු මගින් කළමණාකරනය"* නම් පාඨමාලාව හි දේවධාර්මික ප්‍රකාශනයක සාම්පලයක් අන්තර්ගතය.

2. ඔබගේ අවධානය යොමු විය යුතු හෝ නිවැරදි කළ යුතු වෙනත් විවිධ කරුණු ඔබගේ විශ්ලේෂණයේදී හමුවූයේද? ඒවා ලයිස්තු ගත කර ඒවා වෙනුවෙන් කළ යුතු දේ සැලසුම් කරන්න.

3. ශුභාරංචිය පැතිරවීම සඳහා ඔබගේ ප්‍රදේශයෙහි ඇති අනෙකුත් කිතුනු සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට සැලැස්මක් සකස් කරන්න. දැනට ඇති ගැටලු නිරාකරණය කර දෙවියන්වහන්සේගේ රාජ්‍යය උදෙසා එක්සත්ව වැඩකටයුතු කළ හැක්කේ කෙසේද?

4. ඔබ, විශ්ලේෂණය කළ සංවිධානයේ සාමාජිකයෙකු නම්, මෙම සංවිධානය වෙනුවෙන් දෙවියන්වහන්සේගේ පරමාර්ථයන් ඉටු කිරීම සඳහා ඔබගේ ආත්මික දීමනා භාවිත කළ හැක්කේ කෙසේද?

## සංවිධානයක හරි-වැරදි බැලීමේ ලයිස්තුවක්

යම් සෙනඟක් වෙනුවෙන් සේවය කිරීමට සංවිධානය සූදානම්ද නැද්ද යන්න නිර්ණය කිරීම සඳහා ඇසිය හැකි ප්‍රශ්න බොහොමයක් ඇත. පහත දැක්වෙන්නේ සලකා බැලිය හැකි එවැනි ප්‍රශ්න කීපයකි.

1. මේ සෙනඟ පිළිබඳ අවශ්‍ය තරම් තොරතුරු අප සතුද? සැබවින්ම අපි ඔවුන්ව අවබෝධ කරගෙන සිටිමුද?

2. ප්‍රමාණවත් තරම් තොරතුරු දැන් අප ළඟ තිබේද? ප්‍රමාණවත් තරම් පර්යේෂණ අපි කළෙමුද?

3. අපි දැනටමත් මෙම රටෙහි ක්‍රියා කරන්නෙමුද?

4. අපි මේ රටේ වැඩ නොකරන්නෙමු නම්, මෙම ජාතික දේශ සීමාවන් තුළ වැඩ කිරීමේ සංකීර්ණ භාවය අපි අවබෝධ කරගෙන සිටින්නෙමුද?

5. අප කෙදිනක හෝ මේ හා සමාන සෙනඟ සමඟ, මේ හා සමාන සංස්කෘතියක් සමඟ කටයුතු කර තිබේද? අප ඒවායින් ඉගෙන ගෙන ඇත්තේ කවරක්ද? අපි එලදායී වුනෙමුද? අප එලදායී නුවූයේ නම්, දැන් එලදායී වනු ඇතැයි සිතන්නේ මන්ද?

6. අපට අවශ්‍ය පුද්ගලයෝ සිටිත්ද?, නැතහොත් ඔවුන්ව පුහුණු කළ යුතුද?

7. ක්ෂේත්‍රයට යෑම සඳහා ප්‍රමාණවත් පරිණත නායකත්වයක් අපට තිබේද?

8. මෙම සෙනඟ වෙත යෑමට අවශ්‍ය වන කණ්ඩායමේ ප්‍රමාණය කෙතරම් විය යුතුදැයි සිතන්නේද?

9. සභාවක් පිහිටුවීමට කෙතරම් කාලයක් ගතවේයයි අපි සිතමුද?

10. තම කණ්ඩායමේම සිටින සෙනඟ එවැන්ජලිස්ත කිරීම සඳහා සභාවට හැකියාව ලබා ගැනීමට කෙතරම් කාලයක් ගත වනු ඇත්ද?

11. අතිරේක වගකීම් ඉටු කිරීම සඳහා වර්තමාන සංවිධානය පුළුල් කළ හැකිද? දැනට අප වැඩකටයුතු වල නිරත වන තැනින් ඉවත් විය යුතුද? මේ එතැනින් ඉවත් වීමට කාලෝචිත අවස්ථාවක්ද?

12. අපට මූල්‍යමය ආධාර දෙන අයගෙන් සහයෝගය බලාපොරොත්තු විය හැකිද?

13. අවශ්‍ය යාච්ඤා සහයෝගය ගොඩනඟාගත හැකි ආකාරයෙන් අප කරන කාර්යයන් පිළිබඳව සන්නිවේදනය කළ හැකිද?

14. අපගේ වර්තමාන ව්‍යුහය නව අවශ්‍යතා හා ගැළපේද? නැතහොත් අපගේ ව්‍යුහය වෙනස් කළ යුතුද? අපට වෙනස් විය හැකිද?

15. මෙම රටේ හෝ මෙම සෙනඟ සමඟ හෝ වැඩ කරන අනෙකුත් අය සමඟ අපට වැඩ කළ හැකිද? ප්‍රදේශයේ දැනට පවතින සභාව හෝ සෙනඟ සමඟ දැනට වැඩ කරන අය හෝ අපව පිළිගනීද?

16. අප කරන කාර්යය හා සමානවම හොඳින් කළ හැකි තවත් සංවිධානයක් තිබේද? අප පමණක් යහපත් මන්ද? අපි සැබවින්ම ආත්මයේ මනස සෙවීමුද?

17. මේ සෙනඟ වෙනුවෙන් දෙවියන්වහන්සේ සුවිශේෂීව අපව කැඳවා අපට බරක් දී තිබේද?

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. කිතුනු සංවිධානයක් විශ්ලේෂණය කිරීමේ පරමාර්ථය කුමක්ද?

3. සංවිධානයක විශ්ලේෂණයේ අන්තර්ගත වන්නේ කුමක්ද?

4. මෙම පාඩම අධ්‍යයනය කිරීමේ කොටසක් වශයෙන්, ඔබ සැබවින්ම කිතුනු සංවිධානයක් විශ්ලේෂණය කිරීම සම්පූර්ණ කළෙහිද?

5. ලෝකයේ ජාතීන් වෙත ශුභාරංචිය පැතිරවීම සඳහා මෙම සංවිධානයට උපකාරී වීමට ඔබ උගත් දේ භාවිත කෙරෙන සැලැස්මක් ඔබ සකස් කළෙහිද?

(ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම පොතේ අවසාන පරිච්ඡේදයට පසු සඳහන් කර ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

එළිදරව් 1:10-3:22 අධ්‍යයනය කරන්න. ආසියාව මුළුල්ලේ පිහිටුවා තිබූ සභාවන් වන කිතුනු සංවිධාන හතක් දෙවියන්වහන්සේගේ විශ්ලේෂණය මෙම පරිච්ඡේද ඉදිරිපත් කරයි. පහත දැක්වෙන වගු සටහන සම්පූර්ණ කරන්න.

| සභාව පිහිටුවා ඇති ස්ථානය | ශක්තීන් | දුර්වලතා | වැඩිදියුණු කිරීමේ දේව සැලැස්ම |
|---|---|---|---|
| එපීස | | | |
| ස්මර්ණා | | | |
| පර්ගමම් | | | |
| තියාතිරා | | | |
| සර්දිස් | | | |
| පිලදෙල්පියා | | | |
| ලවොදික | | | |

# එකළොස්වන පරිච්ඡේදය

# සැලසුම් කිරීම සඳහා උපක්‍රම

**අරමුණ :**

මෙම පරිච්ඡේදය අධ්‍යයනයෙන් පසු ඔබට:

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ඇදහිලිවතුන් තම පරිසරය කෙරෙහි ආත්මිකව බලපෑම් කළ හැකි අන්දම විදහා දක්වන ස්වභාවික නිදසුන් දෙකක් හඳුනා ගැනීමට
- "පරමාර්ථය" යන වචනය අර්ථ දැක්වීමට
- "සැලැස්ම" යන වචනය අර්ථ දැක්වීමට
- "අරමුණ" යන වචනය අර්ථ දැක්වීමට
- ඵලදායි සැලසුමක ඇති පියවර පහක් ලයිස්තුගත කිරීමට

## ප්‍රධාන පදය

> **නුඹලා ලෝකයේ ආලෝකයය. කන්දක් මුදුනෙහි තිබෙන නුවරක් සඟවන්ට නොහැකිය. (මතෙව් 5:14)**

## හැඳින්වීම

මෙම පාඨමාලාවේ ඇති පාඩම්, ඔබව විවිධාකාර පරිසරයන්ගෙන් යුත් විශ්ලේෂණයන් තුළින් ගෙන ගියේය. ඔබගේ පෞද්ගලික පරිසරයත්, සෙනඟ කණ්ඩායම්, ප්‍රදේශ, ජාතීන්, කලාප හා සංවිධානයක් විශ්ලේෂණය කිරීමට ඔබ උගත්තෙහිය. පරිසරය විශ්ලේෂණය කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බව මෙම පාඩම් ඔබට අවධාරණය කළේය. ඔබ, ඔබගේ විශ්ලේෂණයන්ගේ ප්‍රතිඵල ශුභාරංචිය පැතිරවීම සඳහා භාවිත කළ යුතුය.

ස්වභාවික ලෝකයේ පැසෙන ධාන්‍ය කෙතක් අධ්‍යයනය කිරීමෙන් එහි වර්ගය හා අස්වැන්න නෙලා ගැනීමේ උචිතම ක්‍රමය නිර්ණය කළ හැකිය. එහෙත් ඔබ උගත් දේ නොයෙදවුවහොත් ඔබ සැබවින්ම අස්වැන්න නෙලා නොගතහොත් ඒ වටිනා ධාන්‍ය කෙතෙහි වැටී කුණු වී යනු ඇත. ආත්මික ලෝකයටද මේ දෙය සත්‍යයකි.

## පරිසරය කෙරෙහි ඇතිවන බලපෑම්

ඇදහිලිවන්තයින් වශයෙන්, ලුණු හා ආලෝකය ලෙස ඔබ ජීවත්වන ලෝකයේ පාපී පරිසරයට ඔබ බලපෑම් කළ යුතුය. යේසුස්වහන්සේ, තමන්වහන්සේ ලෝකයේ අලෝකය බව පැවසූ සේක.

> **මා කෙරෙහි අදහාගන්නා කවරෙක් නුමුත් අන්ධකාරයෙහි නොසිටින පිණිස මම ලෝකයට ආලෝකයක්ව ආවෙමි. (යොහන් 12:46)**

ලෝකයා කෙරෙහි යේසුස්වහන්සේගේ "ආලෝකය" කෙතරම් බලපෑමක් ඇති කළේද? උන්වහන්සේගේ "ආලෝකය" පාපතර අන්ධකාර ජීවිතයෙන් ගැළවීමේ මහිමාන්විත ආලෝකය

කරා යෑමට මාර්ගය පෙන්වීය.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මුහුණෙහි දෙවියන්වහන්සේගේ තේජස දැන ගැන්ම නමැති ආලෝකය බැබළෙන පිණිස, අපගේ සිත්වල බැබළුවේ අන්ධකාරයෙන් ආලෝකය බැබලෙන්ට කීවා වූ දෙවියන්වහන්සේය. (2 කොරි 4:6)**

ඇදහිලිවතුන් ලෝකයේ ආලෝකය විය යුතු යයි යේසුස්වහන්සේ කී සේක.

**නුඹලා ලෝකයේ ආලෝකයය. කන්දක් මුදුනේ තිබෙන නුවරක් සඟවන්නට නොහැකිය.**

**මනුෂ්‍යයෝ පහනක් දල්වා කුරුණිය යට නොව පහන් රුක උඩ තබති. එවිට එයින් ගෙයි සිටින සියල්ලන් කෙරෙහි ආලෝකය බබළයි.**

**මනුෂ්‍යයින් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින නුඹලාත් පියාණන් වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියෙහි බබළාවා. (මතෙව් 5:14-16)**

ස්වභාවික ලෝකයේ, ආලෝකයක් මගින් අන්ධකාරයේ ඇති දේ දැක ගැනීමට හැකිවේ. ඔවුන් මහපාරක ගමන් කරන විට. ඒ මගින් ඔවුන්ට මඟ පෙන්වයි. ඔවුන්ගේ වැඩ කටයුතු කර ගැනීමට ඉන් හැකිවේ. මිනිසුන් කියවන්නේ, ඉගෙනගන්නේ හා පාඩම් කරන්නේ ආලෝකයේ උපකාරයන් වේ.

ආත්මික ලෝකයේ ද, ඇදහිලිවන්තයින් ස්වභාවික ලෝකයට සමාන වූ පරමාර්ථයන් ඉටු කළ යුතුය. අන්ධකාරය තුළ නැතිවී සිටින සෙනඟට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ගැළවීමේ "නිවෙස" කරා යෑමට මගපෙන්වීමට පාපී පරිසරයේ අපි බැබළිය යුතු වෙමු. ඔබගේ ආත්මික ආලෝකය මගින් ඔබ වටා සිටින ඇදහිලිවතුන්ට ඔවුන්ගේ සේවය ඉෂ්ට කිරීමට හැකි විය යුතුය. ඔබගේ ආත්මික ආලෝකයේ බැබළීම, මිනිසුන්ට දෙවියන්වහන්සේ ගැන අධ්‍යායනය කිරීමට හා දැන ගැනීමට අභියෝගයක් විය යුතුය.

**නුඹලා පොළොවේ ලුණුය. නුමුත් ලුණුවල රස නැතිවුණොත් ඒවා කුමකින් රස කරනු ලබන්නේද? එතැන් පටන් ඒවා පිටත දමනු ලබන්ටද මනුෂ්‍යයින් පයින් පාගනු ලබන්ටද මිස අන් කිසිවකට නොවටනේය. (මතෙව් 5:13)**

ස්වභාවික ලෝකයේ ලුණු භාවිත කරනු ලබන්නේ ආහාර රස කිරීමට හා නරක් නොවී ආරක්ෂා කර ගැනීමටය. ආත්මික ලෝකයේද, ස්වභාවික ලුණුවල කාර්යයම ඔබ කළ යුතු වේ. ඔබ අවට ඇති පාපී පරිසරය පිරිසිදු කිරීමටත්, රස ගැන්වීමටත්, නම්, ආරක්ෂා කිරීමටත් දායක විය යුතුය. ඔබ පරිසරයට බලපෑමක් ඇති නොකරන්නේ නම් ඔබත් රස නැති වූ ලුණු වැනිය. ඔබගෙන් කිසි ඵලක් නැත.

ලුණු හා ආලෝකය යන නිදසුන් මගින්, ඇදහිලිවතුන් ලෝකයා කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ යුතු බව යේසුස්වහන්සේ පැහැදිලි කළ සේක. අප පරිසරය කෙරෙහි බලපෑමක් ඇති කරන්නේ ශුභාරංචියේ ආලෝකය වෙත සියලු මිනිසුන් ඇද ගැනීම පිණිස වේ.

බයිබලය යනු ලුණු හා ආලෝකය මෙන් තම පරිසරය කෙරෙහි බලපෑම් ඇති කළ පුරුෂයන් හා ස්ත්‍රීන්ගේ කථාවලින් පිරුණු පොතකි

## සැලසුම් කිරීම

සැලැස්මක් යනු යමක් කිරීමේ ක්‍රමවේදය හෝ මාර්ගය හෝ වේ. එය ක්‍රියාවන් ඉදිරියට ගෙන යෑමේ උපක්‍රමයකි. ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීම යටතේ එවැන්ජලිස්ත සේවය සඳහා සැලසුම් කිරීම ප්‍රබල ආයුධයකි. එය දර්ශනය, සත්‍යයක් බවට පත් කරයි. ආශාවන්, ආදර්ශනයන් කරයි. එය ඔබව වඩාත් ඵලදායි එවැන්ජලිස්ත වැඩ සඳහා යොමු කිරීමට දෙවියන්වහන්සේට අවස්ථාව ලබා දෙයි. ඔබ සැලසුමක් කරන විට, දෙවියන්වහන්සේ වෙනුවෙන් වැඩ කිරීමට ඔබ සූදානම් වෙයි. සැලසුම් කිරීම මගින්, උන් වහන්සේගේ පරමාර්ථයන් ඉටු කිරීමට ඔබ කළ යුතු දෙයත් එය කළ යුතු ආකාරයත් නිර්ණය කිරීමට ඔබට උපකාරී වේ.

## සැලසුම් කිරීම සඳහා උපක්‍රම

ලෝකයේ සෑම ජන කණ්ඩායමක් වෙත ළඟාවීමට දෙවියන්වහන්සේට උපක්‍රම ඇත. සෑම ප්‍රදේශයකටම, ජාතියකටම හා කලාපයකටම උපක්‍රමයක් උන්වහන්සේට තිබේ. එම උපක්‍රමය සොයා ගෙන එය ක්‍රියාත්මක කිරීම අපගේ වගකීම වේ. දෙවියන්වහන්සේගේ පරමාර්ථයන් ඉෂ්ට කිරීම සඳහා සැලසුම් සැකසීමට ඔබට උපකාරී කෙරෙන පියවර කීපයක් පහත දැක්වේ. මේ සෑම එකක්ම විස්තරාත්මකව හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් සපයන්නා වූ "අරමුණු මගින් කළමණාකරනය" නම් පාඨමාලාවේ සඳහන් වේ.

### පළමු පියවර: සූදානම්වන්න.

ඕනෑම පරමාර්ථයක් ඉෂ්ට කර ගැනීමේ පළමු පියවර, යාච්ඤාවෙන් හා දේව කැමැත්ත සෙවීමෙන් ඊට නියමාකාරයෙන් සූදානම් වීමය.

ශුභාරංචිය සමඟ ජන කණ්ඩායමක්, ප්‍රදේශයක්, ජාතියක් හෝ කලාපයක් වෙත යෑමට උන්වහන්සේගේ උපක්‍රමය හෙළිදරව් කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

> **සිත පිළියෙල කිරීම මනුෂ්‍යයාට අයිතිය. එහෙත් දිවේ උත්තරය පැමිණෙන්නේ ස්වාමීන්වහන්සේගෙන්ය. (හිතෝපදේශ 16:1)**

ඔබ පරිසරය විශ්ලේෂණය කිරීමෙන්ද සූදානම් වන්නෙහිය. ඔබගේ පරමාර්ථය හා සැලැස්ම වර්ධනය වන්නේ මෙම විශ්ලේෂණයෙනි. ඔබ සේවය කිරීමට බලාපොරොත්තු වන ප්‍රදේශයේ, ජාතියේ හා කලාපයේ සෙනග ඔබ දැනගත යුතුය. ඔබ මෙම පාඨමාලාව මගින් දියුණු කරගත් හැකියාවන්, පරිසරය විශ්ලේෂණය කිරීමට භාවිත කරන්න.

### දෙවැනි පියවර: ඔබගේ පරමාර්ථය නිර්ණය කරන්න.

මෙම සෙනග වෙනුවෙන් දෙවියන්වහන්සේගේ සැලැස්ම තුළ ඔබගේ පරමාර්ථය නිර්ණය කරන්න. පරමාර්ථයක් යනු ඔබ ඉෂ්ට කරගැනීමට බලාපොරොත්තු වන යම්කිසි දෙයකි. එය ඔබ වෙහෙස වන දෙයෙහි අවසාන ප්‍රතිඵලයක් දෙස නැවත බලන්න. ශුභාරංචිය සමග මෙම සෙනග වෙත යෑමට, උන්වහන්සේගේ පොදු සැලැස්මේ, ඔබ සඳහා වූ සුවිශේෂී පරමාර්ථය එළිදරව් කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න.

දෙවියන්වහන්සේගේ පොදු පරමාර්ථය වන්නේ ශුභාරංචිය පිළිගැනීම තුළින් සියලුම සෙනග යේසුස්වහන්සේ තුළ ඒකත්වයට පැමිණෙන බවය.

**එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට තමන්වහන්සේ තුළ අදහස් කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වා දීමෙන්ය. (එපීස 1:9-10)**

දෙවියන්වහන්සේගේ සැලැස්ම වන්නේ උන්වහන්සේගේ පරමාර්ථය ඉටුකර ගැනීමට සභාව යොදා ගැනීම වේ.

**එසේ කළේ අපගේ ස්වාමිවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ විසින් අභිප්‍රාය කරන ලද සදාකාල අභිප්‍රායේ ප්‍රකාරයට, ස්වර්ගීය ස්ථානවල අධිපතීන්ටත්, බලධාරීන්ටත් මේ කාලයෙහි සභාව කරණකොටගෙන උන්වහන්සේගේ අනේක විධ ප්‍රඥාව දැනගන්නට ලැබෙන පිණිසය. (එපීස 3:10-11)**

සභාව සියලු ඇදහිලිවතුන්ගෙන් සමන්විත වේ. සභාව එහි පරමාර්ථය ඉටුකර ගැනීමට නම් සෑම ඇදහිලිවන්තයෙක්ම එකිනෙකාට අයත් පරමාර්ථයන් හඳුනාගෙන ඒවා ඉටු කළ යුතුය. සෑම ඇදහිලිවන්තයෙක් වෙනුවෙන්ම සුවිශේෂී පරමාර්ථයක්, ශුභාරංචිය පැතිරවීම සඳහා ඔහු සේවය කළ යුතු ආකාරයත්, දෙවියන්වහන්සේට ඇත. ඔබ, ඔබගේ පරමාර්ථය නිර්ණය කළ විට, දෙවියන්වහන්සේගේ සැලැස්මේ ඔබගේ කොටස, ඔබට සොයා ගත හැකිය.

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පරමාර්ථය ඔබට එළිදරව් කළ විට, එය ලියා ගන්න. මෙය "පරමාර්ථයේ ප්‍රකාශනය" ලෙස හැඳින්වේ. එය ඔබ ධර්මය අනුව විශ්වාස කරන දෙයක් නොවේ. එය ඔබ විශ්ලේෂණය කළ පරිසරයේ සේවය කිරීම පිණිස දෙවියන්වහන්සේගේ පරමාර්ථය විස්තර කෙරෙන ප්‍රකාශනයකි.

හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ජාලයෙහි (Harvestime International network) හි පරමාර්ථ ප්‍රකාශනය නිදසුනක් වශයෙන් මෙම අත්පොතේ ඇමුණුමේ සපයා ඇත. එම ප්‍රකාශනයෙන් මෙම සංවිධානය සඳහා වූ දෙවියන්වහන්සේගේ සැලැස්මේ සුවිශේෂී පරමාර්ථය කියවේ.

## තෙවෙනි පියවර: සැලැස්ම

දෙවියන්වහන්සේගේ පරමාර්ථයේ ඔබගේ කොටස ඔබ දැනගත් විට, එය ඉටු කිරීම සඳහා සැලැස්මක් ඔබ සකස් කළ යුතුය. ඔබ මෙය කරන්නේ "අරමුණ" තීරණය කිරීම මගිනි. අරමුණ යනු:

-ඔබට ඉෂ්ට කර ගැනීමට අවශ්‍ය දෙවියන්වහන්සේගේ පරමාර්ථ හා සබැඳි

-කළ යුතු දෙය සඳහන් කරන

-එය කළ යුතු පුද්ගලයා හැඳින්වෙන

-එය කළ යුතු දින තීරණය කෙරෙන

-අදාළ නම් වැය වෙන මුදල නිර්ණය කෙරෙන (ආතැම් සැලසුම් නියමිත වියදමක් නොමැතිව ඉෂ්ට කරගත හැකිය.) ලිඛිත සැලැස්මකි.

ඔබගේ සැලැස්ම ලිඛිතව තබා ගැනීම හොඳ අදහසකි. සෑම අරමුණක්ම ලිවිය යුත්තේ ඔබ එය ඉෂ්ට කර ගත්තේද නැද්ද යන්න නිර්ණය කළ හැකි පරිදි වේ.

## සතරවැනි පියවර: නිරතවීම

ක්‍රියාවන් නැති ඇදහිල්ල නිෂ්ඵල බව බයිබලය පැහැදිලිව සඳහන් කරයි (ජාකොබ් 2 පරිච්ඡේදය) මින් අදහස් වන්නේ යාච්ඤාව, ඇදහිල්ල හා සැලසුම් කිරීම වුවද ක්‍රියාවන් නොමැතිව ඵලදායි නොවන බවය. සැලසුම් කරන්නේ ක්‍රියා කිරීම සඳහා මිස සැලසුමක් තිබිය යුතු නිසා නොවේ. ඔබ තැබුවාවූ අරමුණක්ම ඉටු කිරීමට ඔබ ක්‍රියා කළ යුතුය. ඔබ සමග වැඩ කරන අන් අයටද අරමුණක් දිය යුතුය. මේ අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා සෙනගගේ අදාළ හැකියාවන් පුහුණු කළ යුතුය. පෙලඹවිය යුතුය. සංවිධානය කළ යුතුය.

දෙවියන්වහන්සේගේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අපි උන්වහන්සේගේ ආයුධ වෙමු.

> **නුඹලාගේ අවයවයන් අධර්මිෂ්ඨකමේ ආයුධ කොට පාපයට භාරනොදී, නුඹලාම මළවුන්ගෙන් ජීවත්ව සිටින්නන් මෙන් දෙවියන්වහන්සේට භාරවී, නුඹලාගේ අවයවයන් ධර්මිෂ්ඨකමේ ආයුධ කොට උන්වහන්සේට භාරදීපල්ලා. (රෝම 6:13)**

ක්‍රියාවන් නැති ඇදහිල්ල නිෂ්ඵල සේම ක්‍රියාවන් නැති සැලසුමද නිෂ්ඵලය.

## පස්වැනි පියවර: පරිපූර්ණත්වය

යේසුස්වහන්සේ, තමන්වහන්සේගේ ගෝලයන් සේවය සඳහා පිටත් කර හැරිය පසු, ඔව්හු ආපසු පැමිණ ප්‍රතිඵල දැන්වූහ. යේසුස්වහන්සේ ඔවුන්ගේ සේවා උත්සාහයෙන් ඇගයීමට ලක් කළ සේක. සාර්ථක සේවාවක් සඳහා ඇගයීම වැදගත් වේ. ඔබ යමක් ඇගයීමට ලක් කරනවිට, එහි අගය නිර්ණය කිරීම සඳහා ඔබ එය ඉතා පරෙස්සමෙන් පරීක්ෂාකර බලනු ඇත.

ඔබ අරමුණ ඇගයීමට ලක් කරන විට, ඔබ දෙවියන්වහන්සේගේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීමට ඒවායේ අගය නිර්ණය කරනු ඇත. ඔබ, ඔබගේ සේවයේ ප්‍රතිඵල අධ්‍යයනය කරනු ලබන්නේ, ඔබගේ සැලසුම් සාර්ථක වූයේ දැයි නිර්ණය කිරීමට වේ. ඔබගේ සාර්ථකත්වයත් ඇගයීමට ලක් කෙරෙනු ඇත. ඉන්පසු ඔබ සැලසුම් පර්පූර්ණ කරනු ඇත. සැලසුම් තව දුරටත් ඉදිරියට ගෙන යාම සඳහා ඔබ යාච්ඤාවෙන් යුතුව ඇගයීමට ලක් කළ ප්‍රතිඵල සලකා බලනු ඇත.

ඔබගේ පරමාර්ථය සෑම විටම නොවෙනස්ව පවතිනු ඇත. එහෙත් එම පරමාර්ථයන් ඉෂ්ට කරගන්නා සැලසුම් වෙනස් වේ. පරිසරය වෙනස් වන බැවින් ඒ අනුව ඔබගේ සැලසුම් සකස් කළ යුතුය. එමෙන්ම දෙවියන්වහන්සේගේ පරමාර්ථයන් ඉටුකර ගැනීමට දායක නොවූ අරමුණ ඉවත් කර, ඒ වෙනුවට අලුත් ඒවා එක් කර ඒ අනුව ක්‍රියා කළ යුතුය.

ඔබගේ පරමාර්ථය නොවෙනස්ව පවතින අතර, සැලසුම් චක්‍රයේ ඉතිරි පියවර හත දෙවියන්වහන්සේගේ පරමාර්ථ ඉටුවන තුරු නැවත නැවත නිරත විය යුතුය. සූදානම් කරන්න, සැලසුම් කරන්න, නිරත වන්න, පරිපූර්ණ කරන්න.

ඔබගේ පරමාර්ථය සෑම විටම සිත්හි තබා ගන්න. පරමාර්ථය ආත්මික දැක්මක් වැනිය. පරමාර්ථයක් නොමැතිව ඔබ අසාර්ථක වනු ඇත.

> **දර්ශනයක් නැති කළ සෙනග හිතුවක්කාර වෙති. (හිතෝපදේශ 29:18)**

# සැලසුම් කිරීම අධ්‍යයනය

මෙම පාඩමෙන් ඉදිරිපත් කර ඇත්තේ සැලසුම් කිරීම නමැති විෂයයට කෙටි හැඳින්වීමක් පමණි. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් සපයන්නා වූ පෙළෙහි ඊළග පාඨමාලාව "අරමුණු මගින් කළමනාකරණය" නම් පාඨමාලාව මෙම විෂය පිළිබඳව විස්තරාත්මකව උපදෙස් සපයනු ඇත. එය, දෙවියන්වහන්සේ ඔබගේ ආත්මික ආරක්ෂාව යටතේ තබා ඇති දේ විශ්වාස-වන්තව කළමනාකරණය කිරීමට උගන්වනු ඇත.

ඔබට අද සිට යේසුස්වහන්සේ නැවත පැමිණෙන දින දක්වාම අස්වනු භූමිය පිළිබඳව උගත හැකිය. එහෙත් අස්වැන්න නෙලීම පිළිබඳව සැලැස්මක් නොමැති නම් හා එම සැලැස්ම ක්‍රියාත්මක නොකරන්නේ නම් කිසි දිනෙකත් අස්වැන්න නෙලා ගත නොහැකි වනු ඇත.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

2. "පරමාර්ථය" යන වචනය අර්ථ විග්‍රහ කරන්න.

3. "සැලැස්ම" යන වචනය අර්ථ විග්‍රහ කරන්න.

4. අරමුණ යනු මොනවාද?

5. ඇදහිලිවතුන්ට පරිසරයට බලපෑම් කළ හැකි ආකාරය පැහැදිලි කරදීම සඳහා යේසුස්වහන්සේ පෙන්වූ ස්වභාවික නිදසුන් දෙක කවරේද?

6. මෙම පාඩම් වල දී ඇති සැලසුම් කිරීමේ උපක්‍රම පහ ලයිස්තුගත කරන්න

(ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු මෙම පොතේ අවසාන පරිච්ඡේදයට පසු සඳහන් කර ඇත.)

# තවදුරටත් අධ්‍යනය සඳහා

1. බයිබලයේ සඳහන් ශ්‍රේෂ්ඨ නායකයින් සමහරකගේ ජීවිත අධ්‍යයනය කරන්න. ඔවුන්ගේ පරිසරයට ඔවුන් බලපෑම් ඇති කළේ කෙසේද?

   නිදසුනක් ලෙස, යෝසෙප්, මෝසෙස්, එස්තර්, දානියෙල්, නෙහෙමියා, එස්රා හා අනෙකුත් දිවැසිවරුන්ගේද පැරණි ගිවිසුමේ කාලයේ සිටි විනිසුරුවන් හා රජවරුන්ගේද ජීවිත සලකා බලන්න.

2. ලෝකයේ ආලෝකය ලෙස යේසුස්වහන්සේ හා ඇදහිලිවතුන් ගැන තව දුරටත් අධ්‍යයනය කරන්න.
   මතෙව් 4:16, 5:14-16, 6:22-23
   ලූක් 1:79, 2:32, 8:16, 11:33, 12:35, 15:8
   පිලිප්පි 2:5
   යොහන් 1:4-9, 3:19-21, 5:35, 8:12, 9:5, 11:9-10, 12:35-46
   රෝම 13:12
   එපීස 5:8
   1 තෙසලෝනික 5:5
   1 පේතෘස් 2:9
   2 පේතෘස් 1:19
   1 යොහන් 1:5-7, 2:8-10
   එළිදරව් 21:23

   ඔබගෙන්ම අසන්නː ආලෝකය ලෙස මාගේ පරිසරයට මා බලපෑම් ඇති කරන්නේ කෙසේද?

3. ඇදහිලිවතුන් ලෝකයේ ලුණු මෙන් වීම පිළිබඳව තව දුරටත් අධ්‍යයනය කරන්න.
   මතෙව් 5:13
   මාක් 9:50
   ලූක් 14:34
   කොලොස්සි 4:6

   ඔබගෙන්ම අසන්නː ලුණු ලෙස මාගේ පරිසරයට මා බලපෑම් ඇති කරන්නේ කෙසේද?

4. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මගින් සපයන්නා වූ පාඨමාලාවේ "අරමුණු මගින් කළමනාකරණය"නම් පාඨමාලාව සමඟ අධ්‍යයනය තවදුරටත් කරගෙන යන්න. එය "සංවිධානය අධ්‍යයන ඒකකයෙහි" (Organizing) නැමැති අධ්‍යයන ඒකකයේ අවසාන පාඨමාලාව වේ.

# උප ග්‍රන්ථය

## තොරතුරු ලැබෙන ප්‍රභව

පරිසරය විශ්ලේෂණය කිරීම සඳහා තොරතුරු ලබා ගත හැකි ප්‍රභව සමහරක් පහත දැක්වේ. මේ සියලුම ප්‍රභව සෑම අධ්‍යයනයන් සඳහාම අදාළ, නොවිය හැකිය. එහෙත් අදාළ ඒවා භාවිතයට ගන්න.

-ග්‍රාමීය කණ්ඩායම්, කුල හෝ ගෝත්‍රික නායකයන්
-රජයේ නිලධාරීන්
-ආගමික නායකයින්/මිෂනාරීවරුන්/මිෂනාරී මන්ත්‍රණ සභාවන්
-සභා මන්ත්‍රණ සභාවන්
-විවිධ ආගමික නිකායන් මූලස්ථාන
-රජයේ ආගමික දෙපාර්තමේන්තුව හෝ ආගමික අමාත්‍යාංශය
-අධ්‍යාපනඥයින් (ගුරුවරුන්, මහාචාර්යවරුන් ආදිය)
-නගර සභාව
-කලාප කාර්යාල
-නගර සැලසුම් දෙපාර්තමේන්තු
-ගොඩනැගිලි දෙපාර්තමේන්තු
-උපයෝගී සමාගම්
-වාණිජ මණ්ඩලය
-ව්‍යාපාර මණ්ඩලය
-දිස්ත්‍රික් පාසල් කාර්යාල
-වතු අධිකාරී මණ්ඩලය
-නිවාස සංවර්ධන ව්‍යාපෘති
-පුවත් පත් කාර්යාල
-ගමනා ගමන මණ්ඩලය
-ජනගහන හෝ සංගණන වාර්තා
-දුරකථන සමාගම්
-දුරකථාන නාමාවලිය
-ගුවන් විදුලි හා/හෝ රූපවාහිනි සංස්ථා කාර්යාල
-ගමනාගමන සමාගම්
-පුස්තකාල
-රැකියා, ආගම් හා ජාතීන් පිළිබඳ අධ්‍යාන වාර්තා දෙපාර්තමේන්තු
-ප්‍රදේශයේ වාසය කරන්නවුන්
-ඓතිහාසික හා සංස්කෘතික කෞතුකාගාරය

# සම්මුඛ සාකච්ඡා සාම්පලය

පහත දැක්වෙන්නේ විවිධ නායකයින්ගෙන් ඇසිය හැකි ප්‍රශ්න සාම්පලයකි. මේ සියල්ල සෑම විශ්ලේෂණයකටම අදාළ නොවිය හැකිය. එහෙත් අදාළ, ඒවා භාවිත කරන්න. තවද ඔබ කරන සුවිශේෂී අධ්‍යයනයට අදාළ වන ප්‍රශ්න ද මීට එකතු කර ගන්න. මේ ප්‍රශ්න නිදසුන් පමණක් බව සලකන්න.

## සියලුම නායකයන්ගෙන් ඇසිය යුතු ප්‍රශ්නඃ

1. ඔබගේ නම කුමක්ද?

2. මේ ------------- (නගරයේ, ගමේ, ගෝත්‍රයේ, ප්‍රදේශයේ ආදිය) ඔබගේ තත්ත්වය කුමක්ද?

3. මෙම සෙනඟගේ ප්‍රධාන ප්‍රශ්න හෝ අවශ්‍යතා හෝ ලෙස ඔබ දකින්නේ කවරක්ද?

4. ආගමික වෙනස්වීම්වලට මේ සෙනඟ කෙතරම් විවෘතද?

5. එවැන්ජලිස්ත වැඩවලට බලපාන කිසියම් රජයේ නීති තිබේද?

6. මෙම ------------------ (නගරයේ, ගමේ, ගෝත්‍රයේ, ප්‍රදේශයේ ආදිය) සඳහා ජනගහන, අධ්‍යාපනික හා ආගම් තොරතුරු ඔබ සතුව තිබේද?

7. මොවුන් කතා කරන ප්‍රධාන භාෂාව කුමක්ද?

8. මොවුන් කතා කරන අනෙකුත් භාෂාවන් මොනවාද?

9. මොවුන්ගේ සාක්ෂරතා මට්ටම කවරේද?

## රජයේ හා පුරා නායකයින් සඳහා ප්‍රශ්න

ඔබගේ විශ්ලේෂණයේ භූගෝලීය, සංස්කෘතික, සමාජීය හා බාහිර බලපෑම් අංශයන් සඳහා වූ ප්‍රශ්න බලන්න. ඒවා ඔබට උපකාරී වනු ඇත.

## කිතුනු නායකයින් සඳහා ප්‍රශ්න

1. ඔබ මෙහි කොපමණ කාලයක් සේවයේ යෙදී සිටියෙහිද?

2. ඔබගේ සේවය සාර්ථකද?

3. ඔබ ආර්ථික වූයේ කෙසේද නැතහොත් ඔබ තවදුරටත් දියුණු විය යුත්තේ තුමන අංශවලද?

4. ඔබ ළඟා නුවූ සෙනඟ කණ්ඩායම් තිබේද? එසේ නම් ඒ කවුරුන්ද? ඔවුන් සිටින්නේ කොහේද? ඔවුන් කතා කරන භාෂාව කුමක්ද?

5. ප්‍රමාණවත් තරම් සැබෑ බයිබලීය සභා තිබේද? නැතහොත් තව අවශ්‍යද?

6. ඔබ මෙහි කරන සේවය කවර ආකාරයේද?

7. ඔබ සහයෝගයෙන් කටයුතු කරන්නේ කුමන නිකායන් සමඟ ද?

8. කිතුනු සාහිත්‍යයේ අවශ්‍යතාවක් තිබේද?

9. කවර ආකාරයේ කිතුනු පුහුණු ආයතන මෙහි තිබේද?

10. මෙම පාඩම්මාලාවේ සෑම කොටසකම ඇති විශ්ලේෂණයන් හි "ආත්මික" විශ්ලේෂණ භාවිත කරන්න. විශ්ලේෂණයේ මෙම කොටස සම්පූර්ණ කිරීමට උපකාරී වන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න.

11. මෙම කොටසේ ඔබගේ ආත්මික පරමාර්ථ පැහැදිලි කරන්න. ඉන්පසු ඔවුන්ගේ සේවයට ඔබට උපකාරී විය හැක්කේ කෙසේදැයි අසන්න.

12. ඔවුන්ගේ මතය විමසන්න: මෙම ප්‍රදේශයේ මෙම කාලය ආත්ම වැපිරීමේ කාලයක්ද නැතහොත් නෙලා ගැනීමේ කාලයක්ද?

13. මෙහි ඔබගේ සේවය පිළිබඳ සෙනඟගෙන් ආකල්පය කුමක්ද?

## පරමාර්ථ ප්‍රකාශනවල සාම්පලය

සේවය සඳහා පරමාර්ථ ප්‍රකාශනයක වැදගත්කම මෙම පාඨමාලාවේ සාකච්ඡා කෙරිනි. හාවස්ටයිම් ජාත්‍යන්තර ජාලයෙහි (Harvestime International Network) සඳහා වූ පරමාර්ථ ප්‍රකාශනයක සාම්පලයක් මෙහි දැක්වේ.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නිරන්තරයෙන්ම තම ගෝලයින්ගේ අවධානය යොමු කළේ ලෝකයේ ආත්මික අස්වැන්නේ කෙත් වෙතය.

> **තව සාරමසක් ගිය කල ගොයම කලන කාලය පැමිණෙන්නේ යයි නුඹලා කියනවා නොවේද? මම නුඹලාට කියමි-නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා, ගොයම දැනටම කැපීමට පැහී තිබෙන බව බලාපල්ලා. (යොහන් 4:35)**

අපගේ ස්වාමීන් වහන්සේ අභියෝගයක් දී ඇත්තේ සේවකයන්ටය. එනම් දේව රාජ්‍යය උදෙසා ලෝකයේ ආත්මික අස්වැන්නේ කෙත් කැපීමට දන්නා පුරුෂයින්ට හා ස්ත්‍රීන්ටය. හාවස්ටයිම් ජාත්‍යන්තර ජාලයෙහි (Harvestime International Network) පහත දැක්වෙන සේ සඳහා හැකියාවක් ඇති අය බඳවා ගන්නත්, පුහුණු කරන්නත්, පොලඹවන්නන් කැපවී ඇත්තේ මේ නිසාය.

**1. ජාත්‍යාන්තර ආත්මික අස්වැන්නක් සඳහා මැදිහත් යාච්ඤාවට**

> **ගොයම නම් බොහෝය. නුමුත් ගොවියන් ස්වල්ප දෙනෙක්ය. එබැවින් තමන් ගොයම් කැපීමට ගොවියන් එවන ලෙස ගොයමේ ස්වාමියාට යාච්ඤා කරපල්ලා යයි කීසේක. (මතෙව් 9:37-38)**

**2. ආත්මික අස්වැන්නේ මූල ධර්ම පැහැදිලිව ප්‍රකාශ කිරීමට**

> **බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථ වූ විශ්වාස වූ මනුෂ්‍යයන්ට භාර දීපන්න. (2 තිමෝති 2:2)**

**3. ආත්මික අස්වැන්නේ මූල ධර්ම ප්‍රදර්ශනය කිරීමට**

> **මාගේ කථාවත් මාගේ දේශනා කිරීමත් ප්‍රඥාවේ සිත් පොළඹවන්නා වූ වචන වලින් නොව ආත්මයාණන් වහන්සේගේ ද බලයේ ද ප්‍රකාශ කිරීමෙන් විය. එසේ වුනේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය. (1 කොරින්ති 2:4-5)**

**4. ලෝකය මුළුල්ලේම ආත්මික අස්වැන්න කැපීම සඳහා කෙරෙන ආඥාවේ සන්නිවේදනයේ අවශ්‍යතාව**

> **ගොයම කපන කාලය පසු විය. කාලය කෙළවර විය. එහෙත් අපි නොගැළවෙන්නෙමුව. (යෙරෙමියා 8:20)**

**5. ලෝක පුරා අවසාන කාලයේ නියම කරන ලද කෙත්වතු වල අස්වැන්න කැපීමට යේසුස් වහන්සේගේ ශරීරයේ සාමාජිකයින් යෙදවීම.**

> **ගොයම කැපීමට නියම සති අපට සලස්වා දෙන්නා වූ (යෙරෙමියා 5:24)**

# ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු

**පළමුවන පරිච්ඡේදය**

1. මනුෂ්‍යයාගේ දුෂ්ටකම පොළොවෙහි මහත් බව ද, ඔහුගේ සිතේ කල්පනාව, කවර අරමුණත් නිරන්තරයෙන්ම නපුරුවම තිබෙද බව ද ස්වාමීන්වහන්සේ දුටු සේක (උත්පත්ති 6:5).

2. "පරිසරය" ට භෞතික, සමාජීය, සංස්කෘතික හා ආත්මික සාධක අයත්ය. පුද්ගලයෙකු ජීවත්වන වැඩ කටයුතු කරන හා සේවය කරන සමාජයේ සියලු අංග ඊට අන්තර්ගත වේ.

3. මිනිසාගේ පළමු පරිසරය වූයේ ඒදන් උයනය. එය අලංකාර, පරිපූර්ණ එකක් විය.

4. අද ලෝකයේ පරිසරය වන්නේ සාතන් තවමත් ක්‍රියා කරන, පාපි මිනිසා ජීවත්වන පාපි ලෝකය වේ.

5. පරිසරය වෙනස් වීමට හේතු වූයේ පාපය යි.

6. ලෝකය වෙනස් වීමට හේතු වූයේ පාපය යි.

7. සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාපය උදෙසා මරණයට පත්වීමට දෙවියන් වහන්සේ යේසුස් වහන්සේව එවූ සේක. යේසුස් වහන්සේ පිළිගෙන පසුතැවිලි වන ඕනෑම කෙනෙක් ආත්මික මරණයෙන් (සදාතනිකවම දෙවියන් වහන්සේගෙන් වෙන් වීම) හා ශාරීරික මරණයේ සදාතනික බලපෑම්වලින් ගැළවීම ලබනු ඇත. දැන් පවතින නපුරු ලෝකය විනාශ කර අලුත් ලෝකයක් මැවීම දෙවියන් වහන්සේගේ සැලසුම වේ.

8. ඔබ සේවය කරනු ලබන්නේ මූලිකවම නපුරු වූ ලෝකයක පරසරයක වේ. එහෙත් ලෝකයේ විවිධ පරසරයන් ඇත. සාමාන්‍යයෙන් ලෝකයේ නපුරු පරසරයෙන් සියලුම මනුෂ්‍යයන්ට බලපෑමක් ඇති වන්නා සේම ඔවුන් ජීවත්වන සුවිශේෂී පරසරය අවබෝධ කර ගත් විට ශුභාරංචිය ඉදිරිපත් කිරීම වඩාත් ඵලදායි වනු ඇත.

**දෙවන පරිච්ඡේදය**

1. මක්නිසාද දෙවියන් වහන්සේගෙන් උපන් යමක් ඇත්ද එය ලෝකයෙන් ජයගන්නේය. ලෝකයෙන් ජයගෙන තිබෙන්නේ අපේ ඇදහිල්ලය.(1 යොහන් 5:4)

2. පාරිසරික විශ්ලේෂණයක් යනු භෞතික, සමාජීය, සංස්කෘතික හා ආත්මික සාධක ඇතුලත් සුවිශේෂී පරිසරයක විස්තරාත්මක අධ්‍යයනයකි.

3. මෙම පාඩම්මාලාවේ ඔබ අධ්‍යයනය කරන පාරිසරික විශ්ලේෂණ වර්ග සමහරක් මෙසේය.
   පෞද්ගලික - සෙනඟ කණ්ඩායම්
   කලාප - දැනට පවතින කිතුනු සංවිධාන
   ක්ෂේත්‍ර - ජාතීන්(දේශයන්)

4. දෙවැනි පරිච්ඡේදයේ සඳහන්, පාරිසරික විශ්ලේෂණය වැදගත් වන කරුණු හත බලන්න.

5. පාරිසරික විශ්ලේෂණයේදී මගහැරිය යුතු උපද්‍රව සය
   - ස්වභාවික දෘෂ්ටියෙන් පමණක් දේවල් විශ්ලේෂණය නොකරන්න.

- කාර්යයයේ බැරෑරුම්කමින් පරාජය නොවන්න.
- සෘණාත්මක වාර්තා මගින් ඇතිවන බලපෑම් නොසලකා හරින්න.
- බිය නොවන්න. අවිශ්වාස නොකරන්න.
- කරුණු ඒවා කරුණු නිසාම රැස් නොකරන්න.
- සිදු වෙයිද යන්නට වඩා කෙසේද යන්න කෙරෙහි අවධානය යොමු කරන්න.

**තෙවෙනි පරිච්ඡේදය**

ප්‍රශ්න නැත.

**හතරවන පරිච්ඡේදය**

ප්‍රශ්න නැත.

**පස්වන පරිච්ඡේදය**

1. නුඹලා ඇදහිල්ලෙහි සිටිනවාද කියා නුඹලාම පරීක්ෂා කර බලාපල්ලා: (2 කොරින්ති 13:5)

2. පෞද්ගලික පරිසර විශ්ලේෂණයක් යනු ඔබගේම පරිසරය විශ්ලේෂණය කිරීමකි.

3. පෞද්ගලික පරිසර විශ්ලේෂණයක, ඔබගේ සම්බන්ධකම් හා ඔබගේ භෞතික, අධ්‍යාපනික, මූල්‍යමය හා ආත්මික පරිසරයන් ද ඇතුළත් සියලුම ක්ෂේත්‍රයන්ගේ විශ්ලේෂණයන් අන්තර්ගතය.

4. පෞද්ගලික විශ්ලේෂණයක අවශ්‍යතාවන් මෙසේය.
   - ඔබගේ ආත්මික තත්ත්වය නිර්ණය කිරීමට
   - ඔබගේ ආත්මික දුර්වලතා හඳුනාගැනීමට
   - ඔබගේ ආත්මික ශක්තීන් හඳුනාගැනීමට
   - ඔබගේ ආත්මික දීමනා හඳුනාගැනීමට
   - ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය තුළ ඔබගේ ස්ථානය සොයා ගැනීමට
   - ඔබගේ සේවය ඉෂ්ට කිරීමට සැලසුමක් සකස් කිරීමට.

**සයවන පරිච්ඡේදය**

1. උන්වහන්සේ ඉදිරියෙහි ප්‍රකාශ නුවූ කිසි මැවිල්ලක් නැත. උන්වහන්සේගේ ඇස් ඉදිරියෙහි සියල්ල වැස්මක් නැතුව ඇරී තිබේ. අපෙන් ගණන්ගන්නේ උන්වහන්සේය. (හෙබ්‍රෙව් 4:13)

2. ජන සමූහයක් යනු එම සමාජය තුළ පමණක් විවාහයන් හා සමීපතම සම්බන්ධකම් පමණක් සාමාන්‍යයෙන් පවතින ජන සමූහයක් යනු සුවිශේෂී ගෝත්‍රයක්, කුලයක් වංශයක් හෝ පෙළපතක් වේ.

3. ඔබ ඔවුන්ට සමාජිකව, සංස්කෘතිකව හා ආත්මිකව අධ්‍යයනය කරනු ඇත. එමෙන්ම ඔවුන්ගේ ශුභාරංචිය පිළිගැනීම කෙරෙහි බලපාන ඔවුන්ගේ කණ්ඩායමට පිටතින් පැමිණෙන බාහිර බලපෑම් ද ඔබ විශ්ලේෂණය කරනු ඇත.

4. ජන සමූහයක් විශ්ලේෂණයක් මගින් ශුභාරංචිය ගෙන යා යුතු සෙනඟද, ඔවුන්ගේ කවර ආකාරයේ අයද යන්නද, ඔවුන් වෙතට යා යුත්තේ කවුරුන්ද යන්නද ඔවුන් වෙතට ළඟාවන ක්‍රමශිල්පද හඳුනාගනු ලැබේ.

5. ඔබ මෙම පාඩමින් අධ්‍යයනය කළ ආකාරයට සැබවින්ම ජන සමූහයක් විශ්ලේෂණය නොකළේ නම්, මෙම අධ්‍යනයෙහි තවදුරටත් යෙදීමට පෙර එසේ කරන්න.

6. ශුභාරංචිය සමඟ ඔබ අධ්‍යයනය කළ කණ්ඩායම වෙත යෑමට සැලසුමක් සකස් නොකළේ නම් කරුණාකර මෙම අධ්‍යනයෙහි තව දුරටත් යෙදීමට පෙර එය කරන්න.

**සත්වන පරිච්ඡේදය**

1. නැගිට දේශයෙහි දිගටත්, හරහටත් පලයන්න. මක්නිසාද ඒක නුඹට දෙන්නෙමි (උත්පත්ති 13:17).

2. මෙම අධ්‍යයනය සඳහා ප්‍රදේශයෙක් යන්න අර්ථ විග්‍රහකර ඇත්තේ භූගෝලීය, භාෂාමය, සංස්කෘතික හෝ දේශපාලන කරුණු මත නිර්ණය කර ඇති රටක සුවිශේෂී කොටසකි.

3. දේශයක් ඇතුළත සුවිශේෂී ප්‍රදේශයෙක් ඔබ විස්තරාත්මකව විශ්ලේෂණය කරනු ඇත. එය සුවිශේෂි ප්‍රදේශයෙක් බවට පත් කෙරෙන දේශපාලනික, භූගෝලීමය, භාෂාමය, හා සංස්කෘතික කරුණු ඔබ නිර්ණය කරනු ඇත. ඔබ එහි ආත්මික තත්ත්වය විශ්ලේෂණය කරනු ඇත. එමෙන්ම ඔබ, ශුභාරංචිය පිළිගැනීම කෙරෙහි බලපාන මේ ක්ෂේත්‍ර පිටත ඇති බාහිර බලවේගද විශ්ලේෂණය කරනු ඇත.

4. ප්‍රදේශයෙක් විශ්ලේෂණයකින් හඳුන්වාගනු ලබන්නේ එම ප්‍රදේශයේ සිටින සෙනඟ ආකාරයද, එහි ළඟාවිය යුත්තේ කවුරුන්ද යන්නද හා ශුභාරංචිය සමඟ එහි යෑමට භාවිත කළ යුතු ක්‍රම ශිල්පද වේ. එමෙන්ම නිර්ණය කරනු ඇත.

5. ඔබ මෙම පාඩමින් අධ්‍යයනය කළ ප්‍රදේශය පිළිබඳව සැබවින්ම විශ්ලේෂණයක් නොකළේ නම් මෙම අධ්‍යයනයෙහි තවදුරටත් යෙදීමට පෙර එසේ කරන්න.

6. ශුභාරංචිය සමඟ එහි යෑමට ඔබ සැලැස්මක් සකස් නොකළේ නම් කරුණාකර එය කරන්න.

**අටවන පරිච්ඡේදය**

1. යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශකරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ (ලූක් 24:47).

2. ජාතියක්, පොදු දේශපාලනමය පද්ධතියකින් එක් වූ සෙනඟ සමූහයකින් සමන්විත වේ එය පිළිගත් දේශ සීමාවන් මගින් වෙන් වූ ප්‍රදේශයකි.

3. ඔබ ජාතියක් විශ්ලේෂණය කරන විට එහි දේශපාලනමය, භූගෝලීය, භාෂාමය, සංස්කෘතික හා ආත්මික සාධක හා දේශය පුරාම ශුභාරංචිය පැතිරවීම කෙරෙහි බලපාන බාහිර බලවේගද විස්තරාත්මකව අධ්‍යයනය කරනු ඇත.

4. ජාතියක් විශ්ලේෂණය කරනු ලබන්නේ, දේශයේ සිටින සෙනඟ කණ්ඩායම් කවරේද? ශුභාරංචිය ගෙන ගොස් ඇත්තේ කොතැනකටද? මේ කණ්ඩායම්වලට පොදු වූ දේ කුමක්ද?

දේශය කවරාකාරයේද, ශුභාරංචිය සමඟ මේ ජාතියට යා යුත්තේ කවුරුන්ද, එය කළ යුත්තේ කෙසේද හා මේ ජාතිය වෙනුවෙන් ඇති දෙවියන්වහන්සේගේ සැලැස්ම කවරක්ද යන මේවා නිර්ණය කිරීමට වේ.

5. මෙම පාඩමෙන් අධ්‍යයනය කළ පරිදි ඔබ සැබවින්ම ජාතියක විශ්ලේෂණය නොකළේ නම්, කරුණාකර තව දුරටත් අධ්‍යයනයෙහි යෙදීමට පෙර එසේ කරන්න.

6. ශුභාරංචිය සමඟ ඔබ අධ්‍යයනය කළ ජාතියට යෑමට සැබවින්ම සැලැස්මක් සකස් නොකළේ නම් කරුණාකර එය කරන්න.

### නවවන පරිච්ඡේදය

1. උන්වහන්සේ ඔවුන්ට කියනසේක්ඃ නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා. (මාක් 16:15)

2. මෙම අධ්‍යනය උදෙසා කලාපයක් යනු, භූගෝලීයව එකිනෙක ආසන්නව පිහිටි දේශ කිහිපයක් සමන්විත ලෝකයේ කොටසක් වන අතර එහි භාෂාමය, සංස්කෘතිමය, ආගමික හෝ දේශපාලනික සමානකම් තිබේ.

3. ඔබ කාලාපයක් විශ්ලේෂණය කරන විට එහි දේශපාලනික, භූගෝලීය, භාෂාමය, සංස්කෘතික හා ආත්මික කරුණු හා කලාපය පුරාම ශුභාරංචිය පැතිරවීම කෙරෙහි බලපාන බාහිර සාධක ද විස්තරාත්මකව නිර්ණය කරනු ඇත.

4. කලාපයක විශ්ලේෂණයක් කරනු ලබන්නේ, කලාපයේ ඇති දේශයන් කවරේද, මේ දේශයනට පොදු වූ දේ කවරක්ද, කලාපය කවරාකාරයේද, ඊට ළඟාවිය යුත්තේ කවුරුන්ද හා එයට ළඟා වන්නේ කෙසේද යන්න නිර්ණය කිරීමට වේ.

5. මෙම පාඩමෙන් අධ්‍යනය කළ පරිදි ඔබ සැබවින්ම කපාලයක් විහ්ලේෂණය නොකළේ නම්, කරුණාකර තව දුරටත් අධ්‍යයනයෙහි යෙදීමට පෙර එසේ කරන්න.

6. ශුභාරංචිය සමඟ ඔබ අධ්‍යයනය කළ කලාපයට යෑමට සැබවින්ම සැලැස්මක් සකස් නොකළේ නම් එය කරන්න.

### දසවන පරිච්ඡේදය

1. ආත්මයාණන්වහන්සේ සභාවලට කියන දේ කන් ඇත්තේ අසාවා. (එළිදරව් 2:29)

2. කිතුනු සංවිධානයක් විශ්ලේෂණය කිරීමේ පරමාර්ථයන් වන්නේඃ
-සංවිධානයේ පරමාර්ථය හඳුනාගැනීමට, ශුභාරංචිය පැතිරවීම සඳහා සභාවේ පැවරුම සම්පූර්ණ කිරීමට.
-සංවිධානයේ දැනට ඇති ඵලදායිකත්වය නිර්ණය කිරීමට, එහි පරමාර්ථය දැනට කෙතරම් සාර්ථකව ඉටු කෙරෙන්නේද? එය සාර්ථකව සිදුවන්නක්ද? එය අසාර්ථක වී ඇත්තේ කෙසේද?
-සංවිධානය සඳහා වඩාත් කාර්යක්ෂමව දෙවියන්වහන්සේ දී ඇති සැලැස්මයන් සකස් කිරීමට වේ.

3. දැනට පවතින සංවිධනයක විශ්ලේෂණයක්, එහි පරමාර්ථ, සැලසුම්, ශක්තීන්, දුර්වලතා, වටාපිටාව, සම්පත් හා වැඩසටහන් අධ්‍යයනයෙන් සමන්විත වේ.

4. මෙම පාඩමෙන් උගත් පරිදි ඔබ සැබවින්ම කිතුනු සංවිධානයක් විශ්ලේෂණය නොකළේ නම්, තවදුරටත් අධ්‍යනයේ යෙදීමට පෙර, කරුණාකර එසේ කරන්න.

5. ඔබගේ විශ්ලේෂණයේ ප්‍රතිඵල යෙදීම සඳහා සැලැස්මක් සකස් නොකළේ නම් තව දුරටත් අධ්‍යයනයෙහි යෙදීමට පෙර එය කරන්න.

**එකළොස්වන පරිච්ඡේදය**

1. නුඹලා ලෝකයේ ආලෝකයය. කන්දක් මුදුනෙහි තිබෙන නුවරක් සඟවන්ට නොහැකිය. (මතෙව් 5:14)

2. පරමාර්ථයක් යනු ඔබ ඉෂ්ට කරගත යුතු දේ වේ. එය අන්ත ප්‍රතිඵලයකි. ඔබ වෙහෙස වූ ඉලක්ක වේ.

3. සැලැස්මක් යනු ක්‍රමවේදයකි නැතහොත් පරමාර්ථය ඉෂ්ට කර ගන්න ක්‍රමයකි.

4. අරමුණ යනු පරමාර්ථයක් ඉෂ්ට කරගන්නා ක්‍රමයේ ප්‍රකාශනයකි.

5. ආලෝකය හා ලුණු

6. - සූදානම් වන්න.
   - පරමාර්ථය නිර්ණය කරන්න
   - සැලසුම් කරන්න
   - ඉදිරියට කරගෙන යන්න
   - පරිපූර්ණව කරන්න